ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2020
වාර්ෂික වාර්තාව





ජල සම්පාදන අමාත්‍යාංශය

දැක්ම :

තාක්ෂණ හා සේවා විශිෂ්ඨත්වය තුලින් ශ්‍රී ලංකාවේ අභිමානවත්ම උපයෝගීතා සැපයීමේ ආයතනය බවට පත්වීම.

මෙහෙවර:

පාරිභෝගික තෘප්තිමත්භාවය සහතික කෙරෙන තිරසාර විසඳුම් තුලින් ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැලසීමෙන් ජාතියට සේවය කිරීම.

ඉලක්ක:

- ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වර්ධනය කිරීම.
- ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.
- වැඩි වගවීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම.
- ග්‍රාමීය හා ඌණසේවිත ප්‍රජාවන් වෙත ආරක්ෂිත පානීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණ පහසුකම් සැලැස්වීම.

අන්තර්ගතය

ජල සම්පාදන අමාත්‍යංශයේ
ලේකම්තුමාගේ පණිවුඩය iii
වාර්තාව පිළිබඳ දැනුම් දීම 01
සභාපතිවරයාගේ ප්‍රකාශය 02

සංස්ථානික පාලනය හා සංඛ්‍යාලේඛනාත්මක සමාලෝචනය
ප්‍රධාන භූමිකාධාරීන් 08
දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම 11

සාමූහික සැලසුම 12
ජල සම්පාදනයේ හා මල අපවහනයේ ප්‍රධාන කාර්ය සාධනය 15
මෙහෙයුම් සාරාංශය 18
ආයෝජන සාරාංශය 22
කාර්ය මණ්ඩලය 24

තිරසාර භාවය පිළිබඳ වාර්තාව
තොරතුරු තාක්ෂණය 30
වාණිජ කටයුතු 31
ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය 32
ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන 32
බලශක්ති කළමනාකරණය 33
මධ්‍යම රසායනාගාරය 33
අදායම් රහිත ජල පරිමාව අඩු කිරීම 34
භූ ගත ජලය 34
සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය 34
හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩසටහන සංවර්ධනය 35
පර්යේෂණය හා සංවර්ධනය 36
භූගෝලීය තොරතුරු පද්ධතිය හා සිතියම්කරණය 36
ජල සුරක්ෂිතතා සැලැසුම් 37

යටිතල පහසුකම් සංවර්ධනය
කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන 40

ජල සම්පාදනය
විදේශීය/දේශීය බැංකු මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින ජල සම්පාදන ව්‍යාපෘතීන් 51
ශ්‍රී ලංකා රජයේ මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින සුළු හා මධ්‍ය පරිමාන ජල සම්පාදන ව්‍යාපෘතීන් 60
පෙළ ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන් (ජල සම්පාදන ව්‍යාපෘතීන්) 66
ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (ජල සම්පාදන ව්‍යාපෘතීන්) 66

මලාපවහනය
දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා මලාපවහන යෝජනා ක්‍රම 68
ක්‍රියාත්මක කෙරෙමින් පවතින මලාපවහන ව්‍යාපෘති 69
ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (මල අපවහනය) 72
අපේක්ෂිත ප්‍රධාන කාර්ය සාධනය 73
තිරසාර භාවය හා හදිසි අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීම 73

මූල්‍ය හා විගණන වාර්තා
විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව 75
මූල්‍ය ප්‍රකාශන 80
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 106
කෙටි යෙදුම් 131
සංස්ථානික තොරතුරු - පසු කවරය ඇතුල් පැත්තේ 133

ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පණිවුඩය



"සියළුම දෙනා වෙත ආරක්ෂිත ජලය සම්පාදනය කර දීම" යන්නෙහි වැදගත් කම රටේ ජාතික ප්‍රතිපත්ති රාමුව වූ "සෞභාග්‍යය හා විභූතිය පිළිබඳ දර්ශන පථ" තුළ පිළිගනු ලැබ ඇත. මේ හේතුව නිසා ජල අංශය වෙනස් වූ ස්ථිතියක් වශයෙන් වෙන් කොට ජල සම්පාදන අමාත්‍යාංශය ස්ථාපිත කිරීමට රජය විසින් තීරණය කරන ලදි. එසේ කිරීමෙන් අනතුරුව එකී අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ පුර වැසියන් වෙත නල මාර්ගික ජලය බෙදා හැරීමේ හා නල මාර්ගික මල අපවහන පහසුකම් සම්පාදනය කර දීමේ මිළ කළ නොහැකි සේවාව ලබා දීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත මග පෙන්වා දීමේ කටයුතු වල නියැලෙමින් සිටී.

2016 - 2020 කාලය දක්වා පිළියෙල කරන ලද සංයුක්ත සැලැසුම මගින් ඉලක්ක කරන ලද්දේ 2020 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ මුළු ජන ගහණයෙන් 55% ක් වෙත නල මාර්ගික ජල සම්පාදන සේවාවන් සම්පාදනය කර දීම හා ජන ගහණයෙන් 2.22 % ක් වෙත නල මාර්ගික මල අපවහන සේවාවන් සම්පාදනය කර දීම ද විය. ඒ කෙසේ වුව ද, ගෝලීය වසංගත තත්ත්වය මධ්‍යයේ වුව ද 2020 වර්ෂය තුළදී රටේ නල මාර්ගික ජල සම්පාදන ආවරණය 53.1 % ක් දක්වා හා සම්බන්ධ කරන ලද මල අපවහන සේවා ආවරණය 2.05 % ක් දක්වා ද වර්ධනය කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි.

2020 වර්ෂය තුළදී ජල සම්පාදන අමාත්‍යාංශය වෙත පැවැරුණ වැදගත් වගකීම් වලින් එකක් වූ ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය වෙනුවෙන් සර්ව ව්‍යාපී ක්‍රමෝපායික ආයෝජන වැඩ සටහනක් පිළියෙල කිරීමේ කටයුත්ත එකී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලදි. මීට සමගාමී ලෙස එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන 06 වැනි ඉලක්කය වන "සියල්ලන් සඳහා පවිත්‍ර ජලය හා සනීපාරක්ෂණය" හා සම තත්ත්වයේ ඇති රටේ ජාතික ප්‍රතිපත්ති රාමුව වූ "සෞභාග්‍යය හා විභූතිය පිළිබඳ දර්ශන පථ" තුළ අන්තර්ගත "සියළුම දෙනා වෙනුවෙන් ජල සම්පාදනය කර දීම" නම් වූ පොරොන්දුව සාක්ෂාත් කර ගැනීම අරමුණු කොට ගත් ක්‍රමෝපායික සැලැසුම් සංවර්ධනය කිරීම පිණිස අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (2020 - 2025) සංයුක්ත සැලැසුම තුළ 2025 වර්ෂය වන විට නල මාර්ගික ජල ආවරණය 79% ක් දක්වා වර්ධනය කිරීම අරමුණු කොට ගත් ක්‍රමෝපායයන් පිළිබඳ දළ සැලැසුම් අන්තර්ගත කරනු ලැබ ඇත. ඉතිරි 21% ක ප්‍රතිශතය ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව විසින් ආවරණය කරනු ලබනවා ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආවරණය කළ නොහැකි ප්‍රදේශයන් ආවරණය කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රමෝපායික සැලැසුම් ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරගෙන යනු ලබමින් පවතී.

06 වැනි තිරසාර සංවර්ධන ඉලක්කයට අනුව 2030 වර්ෂය වන විට නල මාර්ගික මල අපවහන ආවරණය 6.8% ක් දක්වා වර්ධනය කිරීමට යෝජිතව ඇත. ඒ අනුව 2030 වර්ෂය වන විට සුරක්ෂිත ලෙස කළමනාකරණය කරනු ලබන හා මූලික ස්ථානගත සනීපාරක්ෂණ පහසුකම් ඇතුලත් ශ්‍රී ලංකාවේ මුළු සනීපාරක්ෂණ ආවරණය 100% ක් වනු ඇත. පිහිටුවා ගනු ලැබ ඇති ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කොට ගත් ප්‍රධාන සනීපාරක්ෂණ සැලැස්ම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දැනට පිළියෙල කරගෙන යනු ලබමින් පවතින අතර 2021 වර්ෂය තුළදී එය සම්පූර්ණයෙන් නිම කරනු ලබනවා ඇත.

ජල සම්පාදනය හා සනීපාරක්ෂණය සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා දෙනු ලබන තමන්ගේ නායකත්වය හා මග පෙන්වීම් වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමන් වෙත, ගරු අග්‍රාමාත්‍ය තුමන් වෙත හා ගරු ජල සම්පාදන අමාත්‍ය තුමන් වෙත මාගේ අවංක කෘතඥතාවය පිරිනැමීම සඳහා මෙම අවස්ථාව යොදා ගැනීමට මම කැමැත්තෙමි. මෙම ප්‍රයත්නයන් තුළදී අප සියළු දෙනා වෙත දෙනු ලබන මග පෙන්වීම් වෙනුවෙන් ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය ඇමැති තුමන් වෙත මාගේ විශේෂ ස්තුතිය හිමි වේ. ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය තුළ ක්‍රියාත්මක කර ගෙන යනු ලබන සියළුම වැඩ සටහන් හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිණිස ඔවුන් වෙතින් අබන්ඩ ලෙස ලැබෙන්නා වූ සහාය සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම් වරයා වෙත හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ද මම ස්තුතිය පිරිනමන්නෙමි. ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයන් සංවර්ධනය කිරීමෙහි ලා ලැබෙන්නා වූ විවිධ දායකත්වයන් සම්බන්ධයෙන් අපගේ ආයෝජකයින් වෙත මම කෘතඥ වෙමි.

ජාතිය වෙත ඉහළ ගුණාත්මයකින් යුක්ත වූ හා කාර්යක්ෂම නල මාර්ගික ජල සම්පාදන සේවාවන් හා මල අපවහන සේවාවන් සම්පාදනය කර දීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දරනු ලබන ප්‍රයත්නයන් මෙන්ම සිය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා 2021 වර්ෂය වෙනුවෙන් පෙළ ගස්වනු ලැබ ඇති විවිධ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ද සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කර සිටින්නෙමි.

ආචාර්ය (ඉංජිනේරු) ප්‍රියත් බී. වික්‍රම
ලේකම්
ජල සම්පාදන අමාත්‍යාංශය





ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

පානීය ජලය සැපයීමේ වගකීම මුලින්ම පැවරී තිබුනේ පොදු වැඩ දෙපාර්තමේන්තුවට වන අතර පසුව එය 1965 දී ජල සම්පාදන දෙපාර්තමේන්තුව බවට පත් කරන ලදි. ඉන් පසුව 1975 දී සම්මත කළ පාර්ලිමේන්තු පණත මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිහිටුවන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය දැනට ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබමින් පවතියි.

වාර්තාව පිළිබඳ දැනුම් දීම.

ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා
ජල සම්පාදන අමාත්‍යාංශය
ලක්දිය මැදුර
අංක 35, සුනිල් මාවත
පැලවත්ත - බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2020
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

1971 අංක 38 දරණ මූල්‍ය පණතේ 14 (2) වගන්තිය අනුව 2020 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔබ තුමන් වෙත මෙයින් ගෞරවයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබේ.

මෙයට, ඔබේ විශ්වාසී

නිශාන්ත රණතුංග
සභාපති
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

සභාපතිතුමාගේ ප්‍රකාශය



“ වසරක් තුළදී නව ජල සැපයුම් සම්බන්ධන 122,733 ක් ලබා දීම තුළින් මුළු ජලසම්බන්ධන සංඛ්‍යාව 2,560,237 දක්වා වර්ධනය කිරීමට සහ සමස්ත පානීය නල ජල ආවරණය 53.1% ක් සපුරමින් රටේ ජනගහනයෙන් 43.2% ක ප්‍රමාණයකට නල ජල පහසුකම් සැපයීමට හැකි විය. ”

2019 වසරේ අග භාගයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් මා විසින් වගකීම භාරගත් අතර, මණ්ඩලයේ මෙහෙවරට අනුකූලව, පාරිභෝගික තෘප්තිමත් භාවය සහතික කෙරෙන තිරසාර විසඳුම් තුළින් ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැලසීමෙන් ජාතියට සේවය කිරීම සඳහා 2020 වසර පුරාවට මාගේ කාර්ය මණ්ඩලය සමඟ එක්ව කටයුතු කළේය.

රජයේ සංවර්ධන ප්‍රතිපත්තිය වන සෞභාග්‍යයේ දැක්මෙහි ඉතා පැහැදිලිව සඳහන්කර ඇත්තේ, 2025 වසර අවසන් වන විට, ශ්‍රී ලංකාවේ සියලුම ජනතාවට ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය උපාය මාර්ග සකස් කළ යුතු බවයි.

මෙම ප්‍රයත්නයේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරි පස් වසර ඉලක්ක කර ගනිමින් මනාව සැකසුණු සාමූහික සැලැස්මක්/ ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම ඉතා වැදගත් කරුණක් බව අවබෝධ කරගන්නා ලදී. පාරිභෝගිකයින්ට විශිෂ්ඨ සේවාවක් ලබා දීමේ අරමුණින් ඉතා විශ්ලේෂණාත්මක සාමූහික / ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම සඳහා මණ්ඩලීය නිලධාරීන්ට නිසි මග පෙන්වීමක් ලබා දීම මගේ ප්‍රමුඛ කාර්යයන්ගෙන් එකක් විය.

සාමූහික සැලැස්මේ/ ව්‍යාපාර සැලැස්මේ පළමු පියවර ලෙස, අමාත්‍යාංශය ඇතුළු ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ආදී සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් උපදේශන ප්‍රවේශයක් හරහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය අධ්‍යයන සහ සියලුම සේවකයින්ගේ අදහස් කෙරෙහි අවධානය යොමු කර උපදේශන වැඩමුළුවක්, 2020 පෙබරවාරි මස මොලීඩා ආයතනයෙහිදී පවත්වන ලදී. ඉන් අනතුරුව, පාරිභෝගිකයන් හට සපයනු ලබන සේවාවේ ගුණාත්මක භාවය ඉහළ නංවමින් රජය අපේක්ෂා කරන පරිදි ජල සම්පාදන ආවරණය වර්ධනය කිරීමේ අපගේ අවසාන ඉලක්කය සපුරා ගැනීම සඳහා වන ඉදිරි ගමන පිළිබඳ අවසන් එකඟතාවකට පැමිණීමට සාකච්ඡා වාර කිහිපයක්, උපදේශන සැසි මෙන්ම ඉදිරිපත් කිරීම් ද පවත්වන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ පැවති කොවිඩ් -19 (Covid-19) රට අගුලු දැමීමේ කාලසීමාවේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සිය සාමූහික සැලැස්ම සකස් කරන ලදී.

ඒ අනුව සකසන ලද සාමූහික සැලැස්ම (2020-2025) ගරු අග්‍රාමාත්‍යතුමන් වෙත 2020 නොවැම්බර් මස පිළිගන්වන ලද්දේ, 2025 වර්ෂය වන විට ජන ආවරණය 79 % ක් දක්වා ඉහළ නංවමින් පිරිසිදු පානීය ජලය සැපයීමේ ඉලක්කය සාක්ෂාත් කරගැනීමේ අපේක්ෂාවෙනි

සැමට ජලය (Water for All) සංකල්පය මෙම සාකච්ඡාවල මුඛ්‍ය ප්‍රතිඵලයක් විය. මෙම සාමූහිකව එක්රැස් වී ගැටළු සාකච්ඡා කිරීම තුළින් මූල්‍ය බාධාවන් සහ වෙනත් අභියෝග මධ්‍යයේ වුව ද 2025 වසර වන විට රටම ආවරණය වන පරිදි කෙටි, මධ්‍ය සහ දිගු කාලීන පදනමින් ජනතාවට ජලය සැපයීම සඳහා 2020 - 2025 සාමූහික සැලැස්ම සංවර්ධනය කළ හැකි විය.

පහත සැලසුම් යටතේ දීපව්‍යාප්ත පානීය ජල සම්පාදන සහ සනීපාරක්ෂක ආවරණය වැඩි කිරීමට යෝජනා කෙරිණි.

i. මධ්‍ය කාලීන : පවතින ජල සම්පාදන ක්‍රම සහ මළාපවහන යෝජනා ක්‍රමවල සම්පූර්ණ ධාරිතාවය ප්‍රයෝජනයට ගැනීම සඳහා සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

ii. දීර්ඝ කාලීන : සාමූහික සැලැස්මේ (2020-2025) හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීම මගින් සෞභාග්‍යයේ දැක්ම තුළ ඇති ප්‍රතිපත්තීන් සාක්ෂාත් කර ගැනීම.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2020 වර්ෂය පුරාම 2016 - 2020 සාමූහික සැලැස්ම මගින් ළඟා කර ගතයුතු ඇති ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කළේය. වසරක් තුළදී නව ජල සැපයුම් සම්බන්ධන 122,733 ක් ලබා දීම තුළින් මුළු ජලසම්බන්ධන සංඛ්‍යාව 2,560,237 දක්වා වර්ධනය කිරීමට

සහ සමස්ත පානීය නල ජල ආවරණය 53.1% ක් සපුරමින් රටේ ජනගහනයෙන් 43.2% ක ප්‍රමාණයකට නල ජල පහසුකම් සැපයීමට හැකි විය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල, සාමූහික සැලැස්මට අනුව 2025 වර්ෂය වන විට සමස්ත නල ජල ආවරණය 79% දක්වා වැඩි කිරීමට ඇස්තමේන්තු කර ඇත. ඉතිරි 21% ප්‍රමාණය ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම සහ ආරක්ෂිත ජල මූලාශ්‍ර මගින් ආවරණය කෙරේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2020 වසරේ පානීය ජලය ඝන මීටර් මිලියන 782 ක් නිෂ්පාදනය කර ඇති අතර එය 2019 වසරේ නිෂ්පාදනය කරන ලද ඝන මීටර් මිලියන 746 හා සසඳන විට 4.83% ක වර්ධනයකි. මෙයට අමතරව, වර්ෂය තුළ නල මළාපවහන සම්බන්ධන 1,364 ක් ලබා දී ඇති අතර, මුළු සංඛ්‍යාව 25,858 දක්වා වර්ධනය වී ඇත. එමෙන්ම පූර්ණ අපජල පිරිපහදු ධාරිතාව දිනකට ඝන මීටර් 90,600 ක් වේ.

ජල සම්පාදන හා මළාපවහන අංශයේ සංවර්ධන කටයුතු සඳහා 2020 වසර තුළදී රුපියල් බිලියන 100.86 ක් ආයෝජනය කර ඇති අතර එය 2019 වසරට සාපේක්ෂව 30.24% ක වර්ධනයකි. මූල්‍යමය වශයෙන් රජය විසින් රුපියල් බිලියන 43.03 ක්, විදේශීය/ දේශීය බැංකුවලින් ලබාගත් ණය බිලියන 52.94 ක් සහ දේශීය බැංකුවලින් රුපියල් බිලියන 3.35 ක් සහ එහි අරමුදල් වලින් බිලියන 1.54ක් ජල සම්පාදන ව්‍යාපෘති සඳහා ආයෝජනය කර ඇත.

මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති 23 ක්, මළාපවහන ව්‍යාපෘති 03 ක්, ප්‍රාදේශීය බැංකු ආධාර යටතේ ජල සම්පාදන ව්‍යාපෘති 11 ක් ද කුඩා හා මධ්‍ය ජල සම්පාදන ව්‍යාපෘති 03 ක්, ප්‍රජා ජල පහසුකම් ව්‍යාපෘති 01 ක්, ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය සංවර්ධන ව්‍යාපෘති 05 ක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා උක්ත ආයෝජනය යොදවා ඇත. මෙම ව්‍යාපෘති අතුරින්, 2020 වසර තුළදී මහා පරිමාණ විදේශ අරමුදල් සහිත ජල සම්පාදන ව්‍යාපෘති දෙකක් සහ දේශීය බැංකු අරමුදල් සහිත ව්‍යාපෘතියක් නිම කිරීමට මණ්ඩලය සමත් විය.

තවද රුපියල් මිලියන 273.72 ක් වැය කර ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධනය කිරීම තුළින් නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ප්‍රදේශවල ජීවත් වන ජනතාව සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීම කෙරෙහි ද විශේෂ අවධානය යොමු විය. මෙයට අමතරව දිවයින පුරා ජල පහසුකම් නොමැති පාසල් සඳහා ජල සැපයුම ලබාදීමට ද කටයුතු යොදා ඇත.

කැලණි ගං ඉවුර ජල පවිත්‍රාගාරය (කැලණි ගං ඉවුර උඹජ) 2020 නොවැම්බර් මාසයේදී උත්සවාකාරයෙන් විවෘත කරන ලද අතර, එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. තවද අලවිව - පොල්ගහවෙල සහ ගම්පහ - අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘති යළි සක්‍රීය කර ජනතා අයිතියට පත් කරන ලදී.

කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ආදායම් නොලබන ජල ප්‍රමාණය (NRW) අඩු කිරීම වේගවත් කළ අතර, 2020 අවසන් වන විට දිවයින පුරා ආදායම් නොලබන ජල ප්‍රමාණ අනුපාතය නිෂ්පාදනයෙන් 24.63% ලෙස සටහන් විය. ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහාය ඇතිව කොළඹ ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘති මගින් ආදායම් නොලබන ජල ප්‍රමාණය තවදුරටත් අඩු කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම 2020 වර්ෂයේ දී තොරතුරු තාක්ෂණ සංවර්ධන සහ බලශක්ති කළමනාකරණ වැඩසටහන් කෙරෙහි ද අවධානය යොමු කළේය.

2020 වර්ෂයේ දී රජයේ අයවැයෙහි අලාභය රු. මිලියන 3092 ක් වූ නමුත් එම වසරේදීම සේවා සපයන්නෙකු ලෙස රුපියල් මිලියන 528 ශුද්ධ ලාභයක් දක්වා ඉහළ නැංවීමට අප ආයතනයට හැකි විය. රජය ආයතනික පිරිවැය 20% - 25% අතර ප්‍රමාණයකින් අඩු කරන ලෙස ඉල්ලා සිටියත් එය 28% - 32% කින් අඩු කිරීමට අප සමත් වී තිබේ.

කොවිඩ් වසංගතය හේතුවෙන් මුහුණ දීමට සිදුවූ විශාල අභියෝග මධ්‍යයේ වුවද, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ත්‍රිවිධ හමුදාව සමඟ සහයෝගයෙන්, දීපව්‍යාප්ත රෝහල් සහ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන වෙත පිරිසිදු පානීය ජල පහසුකම් සහ අපජලය ආරක්ෂිතව බැහැර කිරීමේ පහසුකම් නිසි ලෙස සැපයීමට ද අපට හැකි වී තිබේ.

විශේෂ කරුණක් ලෙස, 2030 වන විට ශ්‍රී ලංකාවේ පවතින සම්පූර්ණ මූලික සනීපාරක්ෂක ආවරණය 100% දක්වා ඉහළ නැංවීම අරමුණු කරගනිමින් සනීපාරක්ෂාව පිළිබඳ ප්‍රධාන සැලැස්ම (2021-2030) සකස් කිරීමේ මූලික කටයුතු 2020 නොවැම්බර් මාසයේ දී ආරම්භ වීම පෙන්වා දිය හැකියි.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක මාර්ගෝපදේශ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආයතනික ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම, වනම් ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය, කාර්යය මණ්ඩල සම්මතයන්, බඳවා ගැනීමේ පටිපාටිය සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක සංවර්ධනය කිරීම යනාදිය ආරම්භ කර ඇත. කෙසේ වෙතත්, කෙටුම්පත් යෝජනා ඉදිරිපත් කරන විට සේවකයන්ගෙන් දිගින් දිගටම විල්ල වූ විරෝධය හේතුවෙන් එය සාර්ථක වී නොතිබුණි. ඒ අනුව සේවක ගැටලූ විසඳීම මා භාරගත් එක් අභියෝගයක් වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාව ලබාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අනුකූල වන පරිදි අනිවාර්ය අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන ලදී.

තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ තීරණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය යහපාලන මූලධර්ම අනුව අනුගමනය කෙරුණි. සම්පත් භාවිතය අවම කිරීම සඳහා "අවම කඩදාසි" සංකල්පය ක්‍රියාත්මක කරමින් අපි අවම ලේඛන කටයුතු ආරම්භ කර ඇත්තෙමු. දූෂණය අවම කරන බවට මම සහතික වෙමි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි වර්තමාන සහ අනාගත අවශ්‍යතා සඳහා අවශ්‍යය තීරණ ගැනීමේදී සුළු සේවක අදහස් ද සැලකිල්ලට ගත් අතර මණ්ඩලයේ සහ පාර්ශවකරුවන්ගේ වඩාත් අවධානමකට ලක්විය හැකි පිරිසගේ හට ද සවන් දෙන ලදී.

ජල පාරිභෝගිකයින්ට තිරසාර ජල ගාස්තු ක්‍රමයක් හඳුන්වාදීම සඳහා මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර මෙම පහසුකම් හරහා ගාස්තු එකතු කිරීමේ ප්‍රතිශතය 123% දක්වා වර්ධනය කිරීමට හැකිවී තිබේ. මෙයට අමතරව, ජල සැපයුම් පද්ධතියේ ජල සම්බන්ධන සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා ජංගම සේවාවන් සක්‍රීය කර ඇත. එමෙන්ම, ජංගම ජල තත්ත්ව නියාමන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාදේශීය රසායනාගාර සඳහා 5S සහතිකය ලබා ගැනීම කැපී පෙනෙන ජයග්‍රහණ ලෙස හැඳින්විය හැකිය.

වසර 45 ක පමණ සිට නඩත්තු නොකළ වත්කම් ලේඛනයක් පරිගණක ගත කර සැකසීමට සමත් වී ඇති අතර, මාස 16 ක් වැනි කෙටි කාලයකදී එසේ සකසන ලද වත්කම් කළමනාකරණ මෘදුකාංගය ඩොලර් බිලියන 294 ක් වටිනා වත්කම් ඒකක 75,000 ක තොරතුරු ඇතුළත් කිරීමට සමත්ව ඇත.

පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් දීප ව්‍යාප්ත නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම 281 ක ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කර ඇත. මෙයට අමතරව, මණ්ඩලය විසින් 2020 දී ජල සාම්පල පරීක්ෂාව සහ දත්ත විශ්ලේෂණයන් අනුව අනාවරණය වූයේ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණවලින් 99.2% ක් ලෙස ජලගුණාත්මක භාවය සතුටුදායක බවයි. තවද ඕනෑම නිලධාරියෙකුට අවශ්‍ය අවස්ථාවක ජල තත්ත්ව දර්ශක පරීක්ෂා කළ හැකි මාර්ගගත ජල තත්ත්ව නිරීක්ෂණ පද්ධතියක් සකස් කර ඇත.

මේ වන විට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රසායනාගාර කිහිපයක් ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලයෙන් ISO 17025 : 2017 තත්ත්ව සහතිකය ලබාගෙන ඇත. මධ්‍යම රසායනාගාරය, අඹතලේ සහ බියගම නිෂ්පාදන රසායනාගාර සහ බටහිර - දකුණ, යාපනය, වවුනියාව යන ප්‍රාදේශීය රසායනාගාර වීම තත්ත්ව සහතිකයන් ලබාගෙන ඇත.

ජල සම්පාදන අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආයතනික සහ ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ සහාය සහ මගපෙන්වීම අඛණ්ඩවම සපයයි. 2012 වසරේ සිට අය ක්‍රම වැඩි කිරීමකින් තොරව පිරිවැය ප්‍රතිසාධන ගැටළු වලට අමතර සිය සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමට මණ්ඩලය සමත් වී තිබීම විශේෂත්වයකි.

කෙසේ වෙතත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන්, පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම සඳහා ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට මණ්ඩලයේ ව්‍යුහාත්මක වෙනස්කම්, එනම් පාරිභෝගික තෘප්තිය වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා වාණිජ, අලෙවිකරණය සහ මහජන සම්බන්ධතා වැනි නව ක්‍රියාකාරී ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවමා විසින් හඳුනා ගන්නා ලදී.

තොරතුරු තාක්ෂණ සංවර්ධන සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇති අතර 2020 සිට 2025 දක්වා ක්‍රියාත්මක වන පරිදි තොරතුරු තාක්ෂණ අංශය සඳහා පුළුල් සැලැස්මක් මෑතකදී සකස් කරන ලදී. එමෙන්ම,

- ව්‍යාපෘති ප්‍රගති අධීක්ෂණ පද්ධතිය (Project Progress Monitoring System)
- ස්මාර්ට් මනු කියවීමේ යෙදවුම (Smart Meter Reading App)
- මාර්ගගත ගෙවීම් විසඳුම් (Online Payment Solutions)
- ස්මාර්ට් සෝන් වෙබ් ද්වාරය (Smart Zone Web Portal)
- පාරිභෝගික සේවා සඳහා ජංගම යෙදුම් (Self - Care App) SMART Pay App)
- අභ්‍යන්තර සේවකයින් සඳහා ජංගම දුරකතන යෙදුම් (Field Service App & Navigator App)
- පැමිණීමේ ලේඛන කළමනාකරණ පද්ධතිය (Attendance Management System)
- ජල තත්ත්ව අධීක්ෂණ පද්ධතිය (Water Quality Monitoring System)
- භාණ්ඩ කළමනාකරණ පද්ධතිය (Inventory Management System)
- මණ්ඩල රැස්වීම් කළමනාකරණ පද්ධතිය (Board Meeting Management System) පවතින ගැටළු නිරාකරණය කර කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා)

වැනි මෘදුකාංග යෙදුම් පද්ධති සංවර්ධනයකර ක්‍රියාත්මක කිරීමට තොරතුරු තාක්ෂණ අංශය සමත්වී ඇත.

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල බිල්පත් මාර්ගගත ක්‍රමයට ගෙවීම, ජල බිල්පත් ගෙවීම සඳහා ජංගම ලෙස අවශ්‍ය පහසුකම් සපයමින් අරමුදල් ප්‍රමාණය වර්ධනය කිරීම, කෝවිඩ් හේතුවෙන් රට අගුලූ දැමීමේ කාලය තුළ පවා මීටර් කියවීම් සහ බිල්පත් නිකුත් කිරීම මෙන්ම නව සම්බන්ධන ලබා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ජනතාව දිරිමත් කිරීම ආදී සියලූම කාර්යයන් සිදුකිරීමට ලැබීම විශේෂත්වයකි. තවද සැමට ජලයී වැඩසටහනේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සකස් කර ඇති නව මෘදුකාංගය මඟින් දීපව්‍යාප්ත ව්‍යාපෘති පිළිබඳ වාර්තා ලබා ගැනීමේ හැකියාව ලැබී තිබේ.

මෙම කර්තව්‍යයේදී, අපගේ ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්, ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම මහතාගේ නායකත්වයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සෑම ප්‍රාදේශිකයකම සංචාරය කරමින් එම ප්‍රාදේශික නිලධාරී කණ්ඩායම් වලට අවශ්‍යතා සහ තාක්ෂණික ගැටලූ හඳුනාගැනීම් සිදු කිරීමට මෙන්ම නිලධාරීන්ගෙ නව අදහස් ඉදිරිපත් කිරීමට අවශ්‍ය චින්තනය සකස් කිරීම සඳහා මඟපෙන්වීම සම්බන්ධයෙන් ලබා දුන් දායකත්වය ඉතා අගය කොට සඳහන් කිරීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ගරු ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමාටත්, ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු සනත් නිශාන්ත මැතිතුමාටත්, ජල සම්පාදන අමාත්‍යාංශ ලේකම් ආචාර්ය (ඉංජිනේරු) ප්‍රියත් බන්දු වික්‍රම මහතාට සහ ඔහුගේ කාර්යය මණ්ඩලයටත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ උප සභාපති චින්. ආර්. රණවක මහතාටත්, සියලූම මණ්ඩලීය අධ්‍යක්ෂක තුමන්ලා ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයටත්, මගේ රාජකාර්ය උපරිමයෙන් ඉටු කිරීමට අවශ්‍ය නොමද සහයෝගය සහ දිරිගැන්වීම් ලබාදීම වෙනුවෙන් මගේ හදපිරි කෘතඥතාවය ප්‍රකාශ කරමි.

අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා සාමූහික සැලැස්ම මඟින් ඉතා ශක්තිමත් පදනමක් සහ පැහැදිලි මංපෙතක් විවෘත කර ඇති අතර එමඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය තිරසාර ආයතනයක් ලෙස නැඟී සිටීමට හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි. මෙම සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියලූම සේවකයින්ගේ වගකීම් සහගත කැපවීම තුළින් රටට සහ සමස්ත ජාතියට මිල කළ නොහැකි සේවාවක් ඉටු කරන, ශක්තිමත් සහ තිරසාර ආයතනයක් නිර්මාණය කිරීම මගේ අපේක්ෂාවයි.



නිශාන්ත රණතුංග
සභාපති
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය



“ජලය යනු සමස්ත ස්වභාව ධර්මයම මෙහෙයවනු ලබන මහා බලවේගය වේ”

ලෙනාර්ඩෝ ඩා වින්සි

සංස්ථාපිත පාලනය හා සංඛ්‍යා ලේඛනාත්මක සාමාන්‍යකරණය



විසල් දඹුල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

සංවිධාන ව්‍යුහය



අධ්‍යක්ෂ මණ්ඩලය

- 1. සභාපති
- 2. උප සභාපති
- 3. අධ්‍යක්ෂ මණ්ඩල සමාජික
- 4. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 5. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 6. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 7. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- ■ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

- 8. සාමාන්‍යාධිකාරී
- 9. අතිරේක සාමාන්‍යාධිකාරීන්
- 10. කොට්ඨාස හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
- 11. පලාත් හාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
- 12. ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්

අධ්‍යක්ෂ මණ්ඩලය

01. නිශාන්ත රණතුංග මහතා
සභාපති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
(2020.1.16 සිට අද දක්වා)

02. නිමල් ආර්. රණවක මහතා
උප සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
(2020. 01. 23 සිට අද දක්වා)

03. වෛද්‍ය එල්. ටී. ගමීලත් මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාරිසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය හා ආහාර සුරක්ෂිතතාව)
සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ, ශ්‍රී ලංකාව
(2019. 06. 04 සිට අද දක්වා

04. ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය
සහකාර අධ්‍යක්ෂ
පොදු ව්‍යවසාය පිළිබඳ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ, ශ්‍රී ලංකාව
(2020. 01. 11 සිට අද දක්වා)

05. ඉංජිනේරු ටී. එම්. ආර්. පී. තෙන්නකෝන්
(2020. 01. 09 සිට අද දක්වා)

06. ඉංජිනේරු ආර්.ඒ.එස්.එල්. රණසිංහ
(2020. 02. 18 සිට අද දක්වා)

07. බී එන් දම්මින්ද කුමාර මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන හා පුහුණු කිරීම්)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය, අංක 330, යුනියන් පෙදෙස,
කොළඹ 2
(2020.06. 22 සිට අද දක්වා)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය

2020 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 16 ක සංඛ්‍යාවක් පවත්වන ලදි.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය

08. සාමාන්‍යාධිකාරී
ඉංජිනේරු ආර්. එච්. රුවිනිස්
(2019 09 05 සිට 2020. 09. 6 දක්වා)
B Sc Eng. (Hons), M Sc in Sanitary Engineering, MBA, C Eng. FIE (SL), MIE (Aust), CP Eng.,

ඉංජිනේරු ටී. එස්. විජේතුංග
(2020. 10. 15 සිට අද දක්වා)
B Sc Eng, MBA, M Sc (Planning),
MA (Financial Economics), MIM (SL), PG Dip. (Finance), ICA (SL), Dip. (Mgt) – DK, C Eng., FIE (SL),

09. අතිරේක සාමාන්‍යාධිකාරී වරුන්
(2020 දෙසැම්බර් 31 දින වන විට)

ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන (උතුරු මැද)
M Sc (Env. Eng) Denmark, PG Dip (Const. Mgt) Moratuwa, C Eng , FIE (SL),

ඉංජිනේරු එන්. එච්.ආර්. කුලනාථ (මළ අපවහන)
B.Sc Eng., PG Dip (Const.Mgmt), PG Dip (Env. Engineering) C. Eng. FIE (SL)

ඉංජිනේරු ටී ඩබ්ලිව් එස් පෙරේරා (ජල සම්පාදන ව්‍යාපෘති)
B Sc Eng (Hons), M Sc (Development Science), C Eng, MIE (SL)

ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු (බස්නාහිර)
B Sc Eng, MPM PG Dip. (OSLO University)
C. Eng, FIE (SL), MIM (SL)

ඉංජිනේරු එස්. පී. පී. රාජ්කුමාර් (සාමූහික සේවා)
B Sc Eng. (Hons), C Eng, FIE (SL), M Sc (Denmark), MBA (PIM – US), M Eng (Moratuwa)

ඉංජිනේරු ආර්. ඒ. ඒ. රණවක (දකුණු / නැගෙනහිර)
B. Sc (Eng) Hons. PG Dip. (Env. Eng & Man) . C Eng., FIE (SL).

ඉංජිනේරු ආචාර්ය අයි. එම්. ඩබ්ලිව්. කේ. ඉලංගසිංහ මහත්මිය
(ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)
B Sc (Eng), M Eng (Japan), Ph D, C Eng. MIE (SL)

ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා (මානව සම්පත් කළමනාකරණය)
B Sc. (B Admin), Dip in Per Mgmt.
MA (Mgmt & Admin) London

ආර් ඒ එම් එස් විරසේන මහතා (මූල්‍ය)
B Com (Sp), PGDBM (Col), ACA

10. අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්
(2020 දෙසැම්බර් 31 වන විට)
එන්. වයි. එස් . අබේගුණවර්ධන මහත්මිය
(කාර්මික සම්බන්ධතා)
BA, PG, Dip. in Management (PIM), Member (IMSL)

ඩබ්ලිව් ඒ එස් සුමනසූරිය මහතා (මානව සම්පත්)
BB Mgt – HR (Special), MBS PgdLS NDIPM, MIPM MISL

ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා
(සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය)
B Sc (Business Administration – Spl)
Diploma in Purchasing & Materials Mgt)

එම්. එම්. එස්. පීරිස් මහත්මිය (මූල්‍ය)
B Sc (Accountancy & Finance Mgmt), ACA (SL)

ඒ. පී. එස්. කුමාර මහතා (පිරිවැයකරණය) - ආවරණ රාජකාරී
B Com (Sp), MSc (Management), FCA

ඉංජිනේරු එස්. ජී. ජී. රාජ්කමාර් (වාණිජ)
BSc Eng (Hons), M Sc (Denmark), MBA (PIM – US), M Eng Moratuwa, C Eng, FIE SL

ඉංජිනේරු අයි. ඒ. ඩබ්ලිව්. එදිරිවීර
(සාමූහික සැලසුම්)
B Sc Eng. M Sc (Water Resources Management), M Sc (Development Studies), C Eng., FIE (SL), MIWA (UK)

ඉංජිනේරු එම්. ඒ.සී. හේමචන්ද්‍ර මහත්මිය
(කුඩා නගර/ග්‍රාමීය ජල සම්පාදන)
BSc Eng, PG Dip (env & mgmt.), PG Dip (Str. Eng), MIE (SL)

ඉංජිනේරු ඩී එම් එල් සී පිටවල (මහත්මිය) - (සංවර්ධන)
BSc Eng. (Hons), MSc Env Eng. DK, C Eng, MIE (SL)

ඉංජිනේරු ජාලිය ලලිත් සීක්කුගේ
(ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති)
BSc Eng. Hons. MBA (PIM – SRJ), PG Diploma (Const. Mgt), PG Dip in Drinking Water Mgmt (Germany), C. Eng, MIE (SL)

ඉංජිනේරු ටී එම් ඩබ්ලිව් සුනිල් බණ්ඩාර (යාන්ත්‍රික හා විද්‍යුත්)
PG Dip (B Admin), PG Dip (Disaster Mgt), C Eng. MIE (SL)

ඉංජිනේරු ඒ. මුණසිංහ (ක්‍රම සම්පාදන හා සැලැසුම්)
BSc Eng (Hons), M Eng, H& WR (Netherlands)

ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණ වේදය) වැඩ බලන
B Sc Eng, PG Dip (e Gov), M Sc (GRS/RS) , MPA (e Gov), C Eng, MIE (SL) , MBSC, MIEEE

ඉංජිනේරු ධනේෂ් ගුණතිලක (මළ අපවහන)
BSc Eng. Hons. PG Dip. Env Eng. & Mgmt (Moratuwa) Msc Sanitary Eng. (UNESCO-IHE-Delf), FIE (SL), MCIWEM (UK), C.Eng. Intpe

ඒ ශ්‍රියාලතා මහත්මිය (අභ්‍යන්තර විගණන) - ආවරණ කටයුතු
B Sc (Busi. Adm), University of SJP, MBA - University of Colombo, PG Dip in Busi & Fin. Mgmt, CUSM UK, Ex Dip (Acc & Fin), CA (SL), Int CA (SL), Member of IMSL.

11 පලාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් (2020 දෙසැම්බර් 31 වැනි දිනට)

ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (බස්නාහිර - මධ්‍යම)
M Sc (Water Supply Eng) – The Netherlands,
M Sc (Env Eng) Moratuwa, C Eng, FIE SL, AM (OACETT) Canada

ඉංජිනේරු එම් ටී එම් රසිල් (බස්නාහිර දකුණ)
B Sc Eng (Hons), PG Dip (Structural Engineering Design), PG Dip (Const.Mgmt), PG Dip (Project Mgmt), C Eng. MIE (SL)

ඉංජිනේරු එන්. යූ. කේ. රණතුංග (බටහිර උතුර)
BSc Eng, PG Dip, Env Eng Master in Dev Studies, FIESL

ඉංජිනේරු ඩබ්ලිව් එන් ප්‍රේමසිරි (නිෂ්පාදනය)
B Sc (Eng), PGD Water Resources Engineering & Mgmt., C Eng, MIE SL

ඉංජිනේරු ඩබ්ලිව්. ජී. සී. එල්. විරසේකර (වයඹ)
BSc Eng, MBA, PG Dip, (Const. Mgmt), MSc (Structural Eng. Design),C Eng, Intl P Eng, FIE (SL)

ඉංජිනේරු ජී. වී. විජේරත්න (උතුරු මැද)
B Sc (Eng), M Sc (Water Resources Eng. & Mgmt), C Eng, MIE (SL)

ඉංජිනේරු එම්. කේ. ඩී. ජේ. එච්. මීගොඩ (මධ්‍යම)
B Sc Eng. M Sc (Water Management), FIE (SL), C. Eng

ඉංජිනේරු ටී බාරතිදාසන් (උතුර)
B Eng (India), M. Eng (Moratuwa), M Sc Eng (UNESCO IHE), PGD (Rajarata), C Eng., MIE (SL)

ඉංජිනේරු ආර්. එස්. ලියනගේ (ඌව)
B Sc (Eng), PG D (Management), M Sc. Eng (Water and Environmental Resources Management), MBA,
M Sc (Water Resources Management, Holland)
C. Eng FIE (SL) MIM

ඉංජිනේරු ඒ. කේ. කපුරුගේ :(සබරගමුව)
BSc Eng, MSc Eng, C Eng. (IESL)

ඉංජිනේරු එම් කේ ඒ ජේ එම් විජේසිංහ මහත්මිය (දකුණ)
B Sc Eng. , M Sc (Sanitary Engineering) Delft, C Eng, MIE (SL)

ඉංජිනේරු එන් සුදේසන් (නැගෙනහිර)
B Sc Eng. M Sc (Const. Mgmt), M Sc (Structural Engineering Design), C Eng, Intl P Eng.,FIE (SL)

12. ව්‍යාපෘති අධ්‍යක්ෂ වරුන් වශයෙන් කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් (2020 දෙසැම්බර් 31 වැනි දිනට)

ඉංජිනේරු එස්. ඒ. රෂිඩ්
(කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය)
B Sc Eng, M Sc (Sanitary Engineering) – The Netherlands, PG Dip (Structural Engineering Design) Sri Lanka
C. Eng. MIE (SL)

ඉංජිනේරු ටී. ආර්. ජේ. ප්‍රනාන්දු
(කලු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය)
BSc Eng, C Eng (IESL), Member CCP enf MIE, Australia, Member (MASCE), pg Dip IR, IRBCTS, PG Dip (Con Mgmt), OUSL

ඉංජිනේරු එන්. ඒ. එස්. ශාන්ත (කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය)
BSc Eng, PG Dip (Str. Desgn), C Eng (IESL)

ඉංජිනේරු එන්. එච්.ඩී. පී. ධර්මපාල (ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc Eng, M Sc (Constr. Project Mgmt), PG Dip (Env.Eng & Mgmt), C Eng, FIE (SL)

දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම

පලාත / කලාපීය සේවා මධ්‍යස්ථානය	ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව
මධ්‍යම	35
නැගෙනහිර	56
උතුරු මධ්‍යම	32
වයඹ	15
උතුර	32
සබරගමුව	23
දකුණ	51
ඌව	35
බටහිර මධ්‍යම	19
බටහිර උතුර	20
බටහිර දකුණ	13
එකතුව	331



" ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය කිරීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගත් ක්‍රියාකාරකම් සමස්ත දේශය පුරාම ක්‍රියාත්මක කරන ලදි."

2016 - 2020 සංස්ථාපිත සැලැසුම ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

සමාලෝචනයට බඳුන් වන වර්ෂය 2016 - 2020 සංස්ථාපිත සැලැසුම ක්‍රියාත්මක කිරීමේ අවසාන වර්ෂය විය. උක්ත සංස්ථාපිත සැලැසුම විසින් ඉලක්ක කරන ලද පරමාර්ථයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වර්ෂය මුළුල්ලේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අඛණ්ඩ ලෙස කටයුතු සිදු කරන ලදි.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ ඉලක්කයන් සපුරා ගැනීම අරමුණු කොට ගත් ක්‍රියාකාරකම් ජල සම්පාදන හා මළ අපවහන අංශයන් හා සියළුම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් විසින් දේශය මුළුල්ලේම ක්‍රියාත්මක කරන ලදි. ජන ගහණයෙන් 93.2% ක ප්‍රතිශතයකට ආරක්ෂාකාරී පානීය ජලය ලබා ගැනීමේ හැකියාව ඇති අතර ඒ අතුරින් 53.1% ක් ආරක්ෂිත පානීය ජලය ලබා ගනු ලබන්නේ රට පුරා විහිදී පවත්නා නල ජල සම්පාදන පද්ධතීන් හරහා වේ. ජන ගහණයෙන් 2.05% ක ප්‍රතිශතයක් වෙත නල මළ අපවහන පහසුකම් සපයනු ලැබ ඇත. ගණු දෙනු කරුවන් වෙත සපයනු ලබන සේවාවන් වැඩි දියුණු කිරීම කෙරෙහි ද ප්‍රමුඛත්වය දෙන අතරම ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කර ගැනීම පිළිබඳ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමෙහි ලා ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමට හා බල ශක්ති පිරිවැය අඩු කර ගැනීමට දරන ලද ප්‍රයත්නයන් සැලැකිල්ලට ගත යුතු වේ. තොරතුරු තාක්ෂණ ක්‍රම වේදයන් වැඩි දියුණු කිරීමේ ආරම්භක ක්‍රියාවන්, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්, ආයතනික සංවර්ධනය හා කාර්ය මණ්ඩල පුහුණු කිරීම් ද මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම කෙරෙහි දායක විය. "වඩාත් ඉහළ වග වීමේ තත්ත්වයක් හා පාරදෘෂ්‍ය භාවයක්" යන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමෙහි ලා අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන ශාඛාව යන අංශ දෙකම විසින් වග වීම හා පාරදෘෂ්‍ය භාවය පිළිබඳව පැහැ නැගුන ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමෙහි නිරත වන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගණුදෙනු කරුවන් නොවන ජන ගහණය විසින් පරිභෝජනය කරනු ලබන පානීය ජලයෙහි තත්ත්වය වැඩි දියුණු කිරීමේ හා එම ජනතාවගේ සනීපාරක්ෂණ තත්ත්වය නංවා ලීමේ සමාජ වගකීම පිළිබඳ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් සලකා බැලීමේදී නොදන්නා හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගයට ගොදුරු වීඇති ප්‍රදේශයන් වෙත හා ආරක්ෂිත පානීය ජල සැපැයුම් පහසුකම් නොමැති ග්‍රාමීය ප්‍රජාවන් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම අරමුණු කර ගනිමින් ලබා ගත හැකි සම්පත් තුළ ප්‍රමුඛත්වය දෙමින් ක්‍රියාකාරකම් කරන ලදි. මෙහි ලා ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් මගින් අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන ලදි.

ජල සුරක්ෂිතතා සැලැසුම් දිගින් දිගටම අඛණ්ඩ ලෙස ක්‍රියාත්මක කිරීම 2020 වර්ෂය තුළදී ද සිදු කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යත්න දරන්නේ ප්‍රජාව විසින් පරිභෝජනය කරනු ලබන සියළු පානීය ජලය සුරක්ෂිත බව සහතික කිරීමටය. ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම සන්දර්භය යටතේය. 2020 වර්ෂයේ අවසානය වන විට මහනුවර ස්ථාපිත කරනු ලැබ ඇති ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකයේ සහාය ලබා ගනිමින් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන් විසින් දීප ව්‍යාප්ත ලෙස විවිධ අදියරයන් තුළ ක්‍රියාත්මක කරනු ලබමින් තිබුණ නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් 281 ක සංඛ්‍යාවක් තිබිණි. මීට අමතර වශයෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ දේශීය කාර්යාලයේ ද සහභාගිත්වය ලබා ගනිමින් ගිනිකොන දිග ආසියාවේ හා දකුණු ආසියාවේ ප්‍රථම වතාවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් බාහිර විධිමත් විගණනයන් 14 ක සංඛ්‍යාවක් පවත්වනු ලැබ ඇත.

පිහිටුවා ගනු ලැබ ඇති අභිමතාර්ථයන්, අරමුණු හා ඉලක්කයන් සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීම පිණිස කාලීන සමාලෝචනයන් පැවැත්වීම වැදගත් වන බව සැලැකිල්ලට ගන්නා ලදි. ඒ අනුව 2019 වර්ෂයේ 4 වැනි කාර්තුවට හා 2020 වර්ෂයේ 1 වැනි, 2 වැනි හා 3 වැනි කාර්තු වලට අදාල සංස්ථාපිත ක්‍රියාත්මක සැලැසුම් හා සම්බන්ධ ප්‍රගති වාර්තාවන් 2020 වර්ෂය තුළ පවත්වන්නට යෙදුන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් සමාලෝචනයට භාජනය කරන ලද්දේය.

ඊට අමතර ලෙස වර්ෂ 2020 - 2025 වෙනුවෙන් පිහිටුවා ගනු ලැබ ඇති ඉලක්කයන් හා ඒවා සාක්ෂාත් කර ගැනීම් ඇතුලත් විස්තර මෙම වාර්තාවේ 11 වැනි පිටුව තුළ පෙළ ගස්වනු ලැබ ඇත.

2020 - 2025 සංස්ථාපිත සැලැසුම

"සෞභාග්‍යයේ දැක්ම" තුළ පෙන්වා දෙනු ලැබ ඇති පරිදි පානීය ජලය සඳහා වන රජයේ දැක්ම වන්නේ 2025 වර්ෂය වන විට රටේ මුළු ජන ගහණය (100%) වෙත ආරක්ෂිත පානීය ජලය හා නල මාර්ගික ජලය ලබා ගැනීමේ පහසුකම් සලස්වා දීම වේ. ඒ අනුව යමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2020 - 2025 වෙනුවෙන් සංස්ථාපිත සැලැසුමක් සකස් කොට එය 2020 වර්ෂයේ නොවැම්බර් මාසයේදී දියත් කරනු ලැබ ඇත.

ප්‍රකාශිත ඉලක්කයන් සපුරා ගැනීමේ ප්‍රගතිය

ඉලක්කය	ප්‍රධාන අරමුණු		2020 අවසානයට ඉලක්කය	2020 අවසානයට සපුරා ගැනීම
1. ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වර්ධනය කිරීම.	1.1.	මුළු නල ජල සම්පාදන ආවරණය	55.00%*	53.10%
	1.2.	නල මළ අපවහන ආවරණය	2.27%*	2.07%
	1.3.	සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව ආවරණය	91.7%	93.2%
2. ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.	2.1	ආදායම් රහිත ජලය (දීප ව්‍යාප්ත)	25.30%	24.63%
	2.2	සම්බන්ධතා 1000 කට මුළු සේවක සංඛ්‍යාව	4.70%	3.66%
	2.3	මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස බල ශක්ති මත වියදම	15.55%	14.57%
	2.4	මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස නඩත්තු වියදම්	6.87%	6.42%
	2.5	මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස ආයතනික වියදම්	12.22%	11.39%
	2.6	මුළු බිල් සංඛ්‍යාවට සාපේක්ෂක ලෙස ඇස්තමේන්තුගත බිල්	1.0%	7.1%
	2.7	අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය	100%	93%
	2.8	ලැබිය යුතු මුදල් :		
		(අ) ගෘහස්තයන්ගෙන් හා වාණිජ ආයතනයන්ගෙන්	දින 30	දින 48**
		(ආ) රාජ්‍ය ආයතනයන්ගෙන්	දින 40	දින 37**
	2.9	මානව සම්පත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම		
		(අ) අභ්‍යන්තරික පුහුණුව (සහභාගි වූ සංඛ්‍යාව)	9300	2552
		(ආ) රට තුළ බාහිර පුහුණු (පුද්ගලයින්ගේ සංඛ්‍යාව)	180	235
		(ඇ) විදේශීය පුහුණුව (පුද්ගලයින්ගේ සංඛ්‍යාව)	120	10
	2.10	ගණුදෙනු කරුවන් වෙත සපයන සේවා වැඩි දියුණු කිරීම හා මහජන පැමිණිළි සම්බන්ධයෙන් ක්ෂණිකව කටයුතු කිරීම - දිවයින පුරා පැවැත්වීමට නියමිත ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් (පාසැල් හා වෙනත්)	100 ක සංඛ්‍යාවක්	37** ක සංඛ්‍යාවක්
	2.11	බල ශක්ති කාර්යක්ෂම ව්‍යාපෘතීන් නිසා වාර්ෂිකව ඉතිරි වන මුදල්	මිලියන 73.36	මිලියන 29.7**
	2.12	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ක්‍රමවත්, විමර්ෂණාත්මක හා පරීක්ෂණාත්මක කටයුතු අඛණ්ඩ ලෙස ඉටු කරමින් සිටින අතර එම කටයුතු කරනු ලබන්නේ ව්‍යාපාරික කටයුතු වල හා මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් නව දැනුම ලබා ගැනීම සඳහා වන්නේය.		
	2.13	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගණුදෙනු කරුවන් හා මණ්ඩලය අතර ඇති සංස්ථානික සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම වාසියට හරවා ගැනීමට සූදානම් අතර, ඊට පෘථුල තොරතුරු හා සංනිවේදන සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථයෙන් එහි ව්‍යාපාරික කටයුතු දියුණු කිරීම පිණිස වන වේදිකාවක් වශයෙන් වෙබ් ද්වාරයක් ඇතුලත් වනු ඇත		

3. වඩාත් පුළුල් වග වීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම.	මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ව්‍යාපාරික සැලැසුම මත පදනම් වූ කළමනාකරණ හා ව්‍යාපාරික මෙවලම් පූර්ණ පරාසයක් සංවර්ධනය කිරීම සඳහා ආරම්භක කටයුතු දියත් කරනු ලැබ ඇත.			
	■ මූල්‍ය අධිකාරි බලය පැවරීම.			
	■ අය වැය පාලනය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණුව			
	■ වත්කම් ආගණනය කිරීම			
	■ වැඩි දියුණු කළ කළමනාකරණ තොරතුරු හා සම්බන්ධීකරණය			
	■ වාණිජ මෙහෙයුම් විගණනයට භාජනය කිරීම	20 ක සංඛ්‍යාවක්	15 ක සංඛ්‍යාවක්	
	■ ගබඩා හා සැපයුම් විගණනයට භාජනය කිරීම	12 ක සංඛ්‍යාවක්	15 ක සංඛ්‍යාවක්	
	■ මුදලින් හා චෙක් පත් මගින් කරන ගෙවීම් විගණනයට භාජනය කිරීම	25 ක සංඛ්‍යාවක්	17 ක සංඛ්‍යාවක්	
	■ ඉදි කිරීම් කොන්ත්‍රාත්තු විගණනයට භාජනය කිරීම	5 ක සංඛ්‍යාවක්	2 ක සංඛ්‍යාවක්	
	■ ක්ෂේත්‍රයන් 14 ක් තුළ සිදු කරන ලද විගණන සංඛ්‍යාව	160 ක සංඛ්‍යාවක්	98 ක සංඛ්‍යාවක්	
4. ග්‍රාමීය හා උෂ්ණ සේවිත ප්‍රජාවන් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කිරීම පහසුකරණය කිරීම.	4.1	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තාක්ෂණික සහාය සහිතව ප්‍රජා මූල සංවිධානයන්, පලාත් පාලන අධිකාරීන් හා වෙනත් පාර්ශවයන් විසින් නඩත්තු කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් සේවාවන් ලබන ජන ගහණ ප්‍රතිශතය	10.0%	9.9 %

* අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඉලක්ක සංශෝධනය කරන ලදි.

** අඩු ප්‍රගතියක් පෙන්නුම් කරනු ලබන්නේ රට තුළ පවත්නා වසංගත තත්ත්වය හේතුවෙන් වේ.

ජල සම්පාදනයේ හා මල අපවහනයේ ප්‍රධාන කාර්ය සාධනය

> " ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රස්තුත වර්ෂය තුළ සපයන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව සමග දීප ව්‍යාප්ත ලෙස මුළු ජන ගහණයෙන් 53.1% ක ජනතාවක් වෙත පානීය නල ජලය සම්පාදනය කර දීම සිදු වේ."

ආරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාව ආවරණය කිරීම



සනීපාරක්ෂණ ආවරණය



ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විෂය පාත්‍රතාව යටතේ මෙහෙයවනු ලබන ප්‍රධාන, මධ්‍ය පරිමාණ හා කුඩා පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රම 331 ක් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

ප්‍රස්තුත වර්ෂය තුළදී නව සේවා සම්බන්ධතාවයන් 122,733 ක් සැපැයීම හරහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පමණක් පානීය නල ජලය සම්පාදනය කිරීම මගින් ආවරණය කරනු ලබන ජන ගහණය 43.2% ක් දක්වා ඉහළ නැංවීම කරන ලදී. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රස්තුත වර්ෂය තුළ සපයන ලද නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව සමග දීප ව්‍යාප්ත ලෙස මුළු ජන ගහණයෙන් 53.1% ක ජනතාවක් වෙත පානීය නල ජලය සම්පාදනය කර දීම සිදු වේ.

මහා භාණ්ඩාගාරය විසින් ලබා ගන්නා ලද විදේශ ණය මුදල් භාවිතා කරමින් විදේශ අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 15 ක සංඛ්‍යාවක් ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලබමින් තිබිණි. මේ අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දේශීය හා විදේශීය බැංකු වලින් සෘජු ලෙසම ලබා ගන්නා ලද ණය මුදල් උපයෝගී කර ගනිමින් විදේශ අරමුදල් යොදා ගනිමින් දියත් කරන ලද තවත් මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 8 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිණි. මීට අමතර වශයෙන් රට තුළ නල මාර්ග ජල සම්පාදන ආවරණය වැඩි කිරීමේ අරමුණ සහිතව දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ජල සම්පාදන ව්‍යාපෘතීන් 11 ක සංඛ්‍යාවක් ද, සුළු හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 03 ක සංඛ්‍යාවක් හා ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘතීන් 5 ක සංඛ්‍යාවක් සංවර්ධනය කිරීම හා ජල අංශයේ ප්‍රජා පහසුකරණ ව්‍යාපෘතීන් 01 ක සංඛ්‍යාවක් ද ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. මේවා අතුරින් ප්‍රස්තුත වර්ෂය තුලදී විදේශීය බැංකු අරමුදල් උපයෝගී කර ගනිමින් රටේ විවිධ ප්‍රදේශයන් තුළ දියත් කරන ලද විශාල පරිමාණයේ ජල සම්පාදන ව්‍යාපෘතීන් 02 ක හා දේශීය බැංකු අරමුදල් උපයෝගී කර ගනිමින් දියත් කරන ලද විශාල පරිමාණයේ ජල සම්පාදන ව්‍යාපෘති 01 ක වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඒ හරහා නව ජල සම්පාදන සම්බන්ධතාවයන් ලබා දීමේ හෝ දැනට සිටින පාරිභෝගිකයින් වෙත සපයනු ලබන සේවාවන්ගේ මට්ටම වැඩි දියුණු කිරීමේ හැකියාව ලැබිණි.

තවද නල මළ අපවහන සේවා ආවරණය වැඩි කිරීමේ හා සනීපාරක්ෂණ පහසුකම් නංවා ලීමේ පරමාර්ථය සහිතව විදේශීය අරමුදල් උපයෝගී කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන මළ අපවහන ව්‍යාපෘතීන් 03 ක සංඛ්‍යාවක් ප්‍රස්තුත වර්ෂය තුළදී දියත් කොට ක්‍රියාත්මක කරන ලදි.

ජල සුරක්ෂිත භාවය සහතික කිරීමේ අරමුණින් සිය කලාපීය රසායනාගාරයන්ගේ සහාය ද ලබා ගනිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම රසායනාගාරය විසින් මෙහෙයුම් පසු විපරම හා සත්‍යාපන පසු විපරම කරගෙන යනු ලැබේ. 2020 වර්ෂයේ විශ්ලේෂණීය දත්තයන් මාර්ගයෙන් හෙලිදරව් වූ පරිදි මුළු පරීක්ෂණ නියැදීන් අතුරින් ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණයන් අනුව 99.2% ක තෘප්තිකර තත්ත්වයක් හා භෞතික සහ රසායනික පරීක්ෂණයන් අනුව 77.3% ක තෘප්තිකර තත්ත්වයක් ද සාක්ෂාත් කරගනු ලැබ ඇත.

ආදායම් රහිත ජලය අවම කිරීමේ ක්‍රියාකාරකම් කිහිපයක් ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාවට නංවන ලද්දේය. කොළඹ නගරය තුළ මෙම ගැටළුවට උග්‍ර ලෙස පාත්‍ර වී ඇති ප්‍රදේශයන් තෝරාගෙන සංවෘත සීමාවන් ඇති කිරීමෙන් අනතුරුව එම ප්‍රදේශයන්හි තුළු ගැලීම් මිණුම් ගන්නා ලදි. ඇසට පෙනෙන කාන්දු වීම් හඳුනා ගැනීම සඳහා රාත්‍රී සමීක්ෂණ, සොරොව් සමීක්ෂණ හා ගෙන් ගෙට කරනු ලබන සමීක්ෂණ පවත්වන ලද්දේය. එම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය අවසන් වන විට බස්නාහිර පලාතේ හා දීප ව්‍යාප්ත මට්ටමේ ආදායම් රහිත ජල පරිමාවන්ගේ ප්‍රතිශතයන් පිළිවෙලින් 25.86% ක් හා 24.63% ක් වශයෙන් දැක ගත හැකි විය.

ගාස්තු සංශෝධනය 2012 වර්ෂයේ සිට සිදු වෙමින් පැවැති මෙහෙයුම් වියදම් වැඩි වීම සමග ගැලැපුනේ නැත. මේ හේතුව නිසා මෑත වර්ෂයන් තුළ සිය මුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලයට දුෂ්කරතා අත් විඳීමට සිදු විය. ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණින් මුළු හිඟ ණය සම කොටස් බවට පරිවර්තනය කිරීමට 2014 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය තිබියදී වුවද අළුත් ණය මුදල් වලට අදාල ණය බැඳීම් නිසා සැලැසුම් කරන ලද පරිදි මේ තත්ත්වයෙහි සාර්ථක වෙනසක් දක්නට ලැබුණේ නැත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2020 වර්ෂය සඳහා ලංකා රුපියල් 528,995,250 ක ලාභයක් වාර්තා කරන ලදි. ඒ කෙසේ වුව ද ගත වූ 2018 හා 2019 යන වර්ෂ දෙක තුළ පිළිවෙලින් ලංකා රුපියල් 568,695,429 ක හා ලංකා රුපියල් 1,176,834,646 ක පාඩු ලබන්නට සිදු වූ හෙයින් 2020 වර්ෂය තුළදී වාර්තා කරන ලද එකී ලාභය පාඩුවක් බවට පත් විය.

ප්‍රධාන සංඛ්‍යා ලේඛන : ජල සම්පාදනය

		2019	2020	විචලනය %
ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව		348	**331**	-
නල ජල නිෂ්පාදනය (ඝණ මීටර මිලියන)		746	**782**	4.83
නල ජල පරිභෝජනය (ඝණ මීටර මිලියන)		560	**589**	5.18
ගෘහස්ත සම්බන්ධතා (සංඛ්‍යා)	(අ) බස්නාහිර පලාත	967,594	**1,005,424**	3.91
	(ආ) වෙනත් පලාත්	1,273,049	**1,349,127**	5.98
මුළු ගෘහස්ත සම්බන්ධතා සංඛ්‍යාව		2,240,643	**2,354,551**	5.08
පොදු ජල කණු (සංඛ්‍යා)	(අ) බස්නාහිර පලාත	480	**471**	1.88
	(ආ) වෙනත් පලාත්	865	**752**	13.06
මුළු පොදු ජල කණු සංඛ්‍යාව		1345	**1,223**	9.07
ගෘහස්ත නොවන සම්බන්ධතා (සංඛ්‍යා)	(අ) බස්නාහිර පලාත	94,895	**97,920**	3.19
	(ආ) වෙනත් පලාත්	101,966	**107,766**	5.69
මුළු ගෘහස්ත නොවන සම්බන්ධතා සංඛ්‍යාව		196,861	**205,686**	4.48
(මුළු පොදු ජල කණු සංඛ්‍යාවද ඇතුළුව)				
සේවා සම්බන්ධතා මුළු සංඛ්‍යාව		2,437,504	**2,560,237**	5.04
සාමාන්‍ය ගෘහස්ත මාසික පරිභෝජනය				
(එක් ගෘහස්ත සම්බන්ධතාවයක් තුළ ඝණ මීටර)				
	(අ) බස්නාහිර පලාත	17.63	**18.52**	-
	(ආ) වෙනත් පලාත්	13.60	**14.26**	-
ජල නිෂ්පාදනයේ ප්‍රවර්තන පිරිවැය සාමාන්‍යය				
(ඝණ මීටරයකට රුපියල්)		41.20	**38.64**	-
අලෙවි කළ ඒකකයක මුළු පිරිවැය සාමාන්‍යය				
(ඝණ මීටරයකට රුපියල්)		51.52	**49.06**	-
ඒකකයකට ලැබුණ ආදායම් සාමාන්‍යය				
(අයපත් නිකුත් කිරීම /පරිභෝජනය)				
(ඝණ මීටරයකට රුපියල්)		42.86	**42.78**	-
මසකට සාමාන්‍ය ගෘහස්ත අයපත් වටිනාකම (රුපියල්)				
	(අ) බස්නාහිර පලාත	801.57	**862.17**	7.56
	(ආ)වෙනත් පලාත්	491.32	**524.93**	6.84
අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය		1.10	**0.93**	(15.45)
ගැඹුරු ළිං (සංඛ්‍යා)	(අ) සාරන ලද	201	**150**	-
	(ආ) සාර්ථක වූ	178	**134**	-
ආදායම් රහිත ජලය (%)	(අ) බස්නාහිර පලාත	26.14	**25.86**	1.07
	(ආ) වෙනත් පලාත්	23.62	**23.31**	1.31
	(ඇ) දීප ව්‍යාප්ත	24.95	**24.63**	1.28

සැලැකිය යුතුයි : " + " ලකුණින් පෙන්වන්නේ විචලනය ගණනය කර ප්‍රතිශතය දැක්වීම අර්ථ විරහිත බවයි.

" - " ලකුණින් පෙන්වන්නේ අගය එකතු කළ බද්ද රහිතව බවයි.

ප්‍රධාන සංඛ්‍යා ලේඛන : මළ අපවහනය

		2019	2020	විචලනය %
ගෘහස්ත සම්බන්ධතා	බස්නාහිර පලාත	16,849	**16,930**	0.48
	වෙනත් පලාත්	2,168	**3,110**	43.45
ගෘහස්ත නොවන සම්බන්ධතා	බස්නාහිර පලාත			
	වෙනත් පලාත්	1,401	**1,402**	0.07
		410	**750**	82.93
නිවාස යෝජනා ක්‍රම සම්බන්ධතා (තොග)	බස්නාහිර පලාත	3666	**3,666**	-
	වෙනත් පලාත්	-	**-**	-
මුළු මල අපවහන සම්බන්ධතා සංඛ්‍යාව	දීප ව්‍යාප්ත	24,494	**25,858**	5.57
	බස්නාහිර පලාත	21,916	**21,998**	0.37
	වෙනත් පලාත්	2,578	**3,860**	49.73

වෙනත් ප්‍රධාන සංඛ්‍යා ලේඛන

මුළු ආදායම (රු. මිලියන - අගය එකතු කළ බද්ද රහිතව)	26,080	**27,762**	6.45
මුළු ප්‍රවර්තන වියදම (රු. මිලියන)	29,969	**30,286**	(1.06)
මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩලය / සම්බන්ධතා 1000	3.36	**3.07**	8.63
මුළු කාර්ය මණ්ඩලය / සම්බන්ධතා 1000	3.99	**3.66**	8.27
මුළු සංවර්ධන වියදම (රු. බිලියන)	77.44	**100.86**	30.24

සැලැකිය යුතුයි : " + " ලකුණින් පෙන්වන්නේ විචලනය ගණනය කර ප්‍රතිශතය දැක්වීම අර්ථ විරහිත බවයි.
" - " ලකුණින් පෙන්වන්නේ අගය එකතු කළ බද්ද රහිතව බවයි.

" 2019 වර්ෂයේ නිෂ්පාදන පරිමාව හා සසඳා බලන විට දක්නට ලැබෙන 4.83% ක ඉහළ යාම සමග 2020 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද පානීය ජලයේ මුළු පරිමාව ඝණ මීටර මිලියන 782 ක් විය."

ජල සම්පාදනය

පානීය ජල නිෂ්පාදනය

2019 වර්ෂයේ නිෂ්පාදන පරිමාව හා සසඳා බලන විට දක්නට ලැබෙන 4.83 % ක ඉහළ යාම සමග 2020 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද පානීය ජලයේ මුළු පරිමාව ඝණ මීටර මිලියන 782 ක් විය. පසු ගිය 10 වසර තුළ පානීය ජල නිෂ්පාදනයේ දක්නට ලැබෙන ප්‍රවණතාවය පහත දැක්වෙන ප්‍රස්තාර සටහනින් පෙන්නුම් කරනු ලබයි. ප්‍රධාන වශයෙන්ම අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන හා කළුතර කෙත්හේන යන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරනු ලබන පරිමාව පදනම් කොට ගෙන නිෂ්පාදනයෙහි ප්‍රධාන පංගුවට බස්නාහිර පලාතේ ජල සම්පාදන පද්ධතිය හිමිකම් කියන අතර එම පද්ධතිය මගින් නිෂ්පාදනය කරනු ලබන ජල පරිමාව ප්‍රස්තුත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද මුළු ජල පරිමාවෙන් 51.87% ක් වේ.



2020 වර්ෂය තුළදී පලාත් අනුව ජල නිෂ්පාදනය



නිෂ්පාදන පිරිවැය

2020 වර්ෂය හා සාපේක්ෂකව මුළු නිෂ්පාදන පිරිවැය (රුපියල් මිලියන) ප්‍රභේදනය මෙහි පහත දක්වනු ලැබ ඇත:

නිෂ්පාදන පිරිවැය

රු. මිලි.



නිෂ්පාදන පිරිවැය ඝණ මීටරයකට රුපියල්

2019	2020
51.52	49.06

නිෂ්පාදන පිරිවැය = මුළු පිරිවැය / අලෙවි කළ ඒකක

සේවා සම්බන්ධතාවයන් සංසන්දනය කිරීම

පලාත / කලාපීය සභාය සේවා මධ්‍යස්ථානය	පලාත / කලාපීය සභාය සේවා මධ්‍යස්ථානය අනුව සම්බන්ධතා සංඛ්‍යාව			ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාප අනුව සම්බන්ධතා සංඛ්‍යාව			
	2019 දෙසැම්බර් අවසානයට	**2020 දෙසැම්බර් අවසානයට**	වෙනස %	**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාපය**	2019 **දෙසැම්බර් අවසානයට**	2020 **දෙසැම්බර් අවසානයට**	**වෙනස %**
බස්නාහිර / මධ්‍යම	494,037	**515,176**	4.28	ප්‍රමුඛතා * කොළඹ නගරය** කෝට්ටේ මහරගම	1,879 145,607 177,054 169,497	**1,885** **145,130** **181,270** **186,891**	0.32 (0.33) 2.38 10.26
බස්නාහිර / උතුරු	293,704	**305,299**	3.95	කැළණිය ගම්පහ	210,942 82,762	**220,646** **84,653**	4.60 2.28
බස්නාහිර / දකුණු	274,748	**282,869**	2.96	දෙහිවල කළුතර පානදුර	111,302 72,903 90,543	**112,796** **74,324** **95,749**	1.34 1.95 5.75
මධ්‍යම	282,214	**291,357**	3.24	මහනුවර උතුර මහනුවර දකුණ මහනුවර නැගෙනහිර	108,741 91,498 81,975	**112,070** **94,122** **85,165**	3.06 2.87 3 3.89
වයඹ	87,855	**95,308**	8.48	කුරුණෑගල	87,855	**95,308**	8.48
උතුරු මැද	131,995	**144,495**	9.47	අනුරාධපුර	131,995	**144,495**	9.47
සබරගමුව	118,854	**127,668**	7.42	රත්නපුර කෑගල්ල	59,182 59,672	**66,587** **61,081**	12.51 2.36
දකුණු	330,915	**343,093**	3.68	හම්බන්තොට මාතර ගාල්ල	113,066 101,954 115,895	**118,673** **193,645** **120,773**	4.96 1.66 4.21
ඌව	109,115	**120,006**	9.98	බණ්ඩාරවෙල මොනරාගල	63,010 46,105	**70,432** **49,574**	11.78 7.52
උතුරු	28,064	**31,575**	12.51	යාපනය මන්නාරම වවුනියාව	28,064	**31,575**	12.51
නැගෙනහිර	286,003	**303,391**	6.08	අම්පාර ත්‍රිකුණාමලය අක්කරෙයිපත්තුව මඩකලපුව	67,459 81,560 81,752 55,232	**71,714** **84,768** **86,836** **60,073**	6.31 3.93 6.22 8.76
එකතුව	2,437,504	**2,560,237**	**5.04**	**එකතුව**	2,437,504	**2,560,237**	**5.04**

* **2020 වර්ෂය තුළදී ප්‍රමුඛතා සම්බන්ධතාවයන්ට ඇතුලත්ව ඇත්තේ කොළඹ මහ නගර සභා ප්‍රදේශය පමණකි.**

** **අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සම්බන්ධතාවයන් නිම කිරීම අත් හැර දමන ලදි**

සම්බන්ධතා වර්ධනය

සම්බන්ධතා සංඛ්‍යාව



වාර්ෂික බිල්කිරීම හා මුදල් අය කරගැනීම් සංසන්දනය කිරීම

රු. මිලි.



මාසික ගෘහස්ථ පරිභෝජන සාමාන්‍යය (සම්බන්ධතාවයකට ඝණ මීටර)



මාසික ගෘහස්ථ බිල් පතෙහි සාමාන්‍යය



බිල් කිරීමට අදාල සංඛ්‍යා ලේඛන

විස්තරය	2019 (රුපියල් මිලියන)	2020 (රුපියල් මිලියන)
බිල් කිරීමේ ඉලක්කය (අඟය වීකතු කළ බද්ද රහිතව)	23,830	**25,056**
සැබෑ බිල් කිරීම (අඟය වීකතු කළ බද්ද රහිතව)	23,579	**25,218**
මුදල් අය කර ගැනීමේ ඉලක්කය (අඟය වීකතු කළ බද්ද රහිතව)	28,437	**28,211**
සැබැවින්ම වීකතු කළ මුදල (අඟය වීකතු කළ බද්ද රහිතව)	28,397	**25,424**

පාරිභෝගික වර්ගය අනුව අලෙවි කරන ලද ජල පරිමාව හා ලැබුණ ආදායම (2020)

පාරිභෝගික වර්ගය	අලෙවි කළ පරිමාව		ආදායම	
	ඝණ මීටර 000	%	රුපියල් මිලියන	%
සෘජු බිල් කිරීම #	452,616	75.85	18,794	66.08
පාඨශාලා	5,421	0.91	121	0.43
කුලී නිවාස වතු	2,272	0.38	101	0.35
පොදු ජල කණු හරහා සැපැයුම	373	0.06	6	0.02
රජයේ ආයතන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පරිශ්‍රයන්	35,516	5.95	2,368	8.32
වාණිජ හා කාර්මික	59,525	9.97	5,696	20.02
සංචාරක හෝටල්	2,552	0.43	231	0.81
නැව් කටයුතු	146	0.02	76	0.27
ආයෝජන මණ්ඩලය	8,486	1.42	570	2.00
ආගමික පරිශ්‍රයන්	5,891	0.99	135	0.48
උප එකතුව	**572,798**	**95.98**	**28,096**	**98.78**
තොග බිල් කිරීම්	18,698	3.13	328	1.15
වෙනත් *	5,310	0.89	19	0.07
මුළු එකතුව	**596,806**	**100.00**	**28,443**	**100.00**

\# ගෘහස්ථ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල නිවාස, රජයේ නිල නිවාස, තට්ටු නිවාස, අගය එකතු කළ බද්ද රහිත ගෘහස්ථ සමෘද්ධි හා සමෘද්ධි කුලී නිවාස

* සෘජු බිල් කිරීමට ඇතුලත් නොවන හෝ මෙහි ඉහත විශේෂයෙන් සඳහන් කර නොමැති අනිකුත් සියළුම බිල් කිරීම් වර්ගයන් "වෙනත්" යන වර්ගය යටතේ පෙන්වනු ලැබ ඇත. ප්‍රතිදාන හිලවු කරනු ලබන බිල්පත් ද මෙම වර්ගයට ඇතුළු කරනු ලැබ ඇත.

පාරිභෝගික වර්ගයන් අනුව ජලය පරිභෝජනය කිරීමේ ප්‍රතිශතය



පාරිභෝගික වර්ගයන් අනුව ආදායම් ප්‍රතිශතය



ආයෝජන සාරාංශය

" මෙම මූල්‍යකරණ ක්‍රමෝපායයන්ගේ එකතුව මගින් ජල සම්පාදන හා මල අපවහන අංශයන්හි සංවර්ධන ක්‍රියාකාරකම් මත 2020 වර්ෂය තුළදී ලංකා රුපියල් බිලියන 100.86 ක ආයෝජනයන් කිරීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත සලස්වා දෙන ලදි ."

පුරා උපයෝගිතා විතැන් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ද, ඉඩම් අත් පත් කර ගැනීම සඳහා සහ රජයේ පාඨශාලාවන් වෙත හා පූජා නගරයන් වෙත සම්පාදනය කරනු ලබන ජලය වෙනුවෙන් වූ බිල් පත් භාරය දැරීම සඳහා ද රුපියල් මිලියන 943.01 ක දේශීය අරමුදල් සම්පාදනය කර දෙන ලදි. මීට අමතර වශයෙන් ජල සම්පාදන අංශයේ ප්‍රජා පහසුකරණ කටයුතු යටතේ වූ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 2.82 ක දේශීය අරමුදල් හා රුපියල් මිලියන 15.0 ක විදේශීය ප්‍රදානයන් ද සම්පාදනය කර දෙන ලද්දේය.

ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඍජු වෙන් කිරීම් වලට වැඩිමනත් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සහතිකය මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විදේශීය හා දේශීය බැංකු වෙතින් ඍජුවම ලබාගන්නට යෙදුන ණය මුදල් මගින් රුපියල් බිලියන 36.52 ක වැයක් ජල සම්පාදන ව්‍යාපෘතීන් මත වියදම් කරන ලදි. ඊට අමතර වශයෙන් 2020 වර්ෂය තුළදී දේශීය බැංකු වෙතින් ලබාගත් රුපියල් බිලියන 3.35 ක ණය මුදල් භාවිතා කරමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් දියත් කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් 11 ක් ක්‍රියාත්මක කරන ලදි.

මෙම මූල්‍යකරණ ක්‍රමෝපායයන් එකතුව මගින් ජල සම්පාදන හා මළ අපවහන අංශයෙහි සංවර්ධන ක්‍රියාකාරකම් මත රුපියල් බිලියන 100.86 ක ආයෝජනයන් කිරීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දෙන ලදි.

මූල්‍ය ප්‍රභවයන්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මුළු 2020 වර්ෂය පුරාම මණ්ඩලය වෙත විවිධ මාර්ගයන්ගෙන් ලැබුණ අරමුදල් ආයෝජනය කරමින් ජල සම්පාදන හා මළ අපවහන අංශයන්ට අදාල සංවර්ධන කටයුතු අඛන්ඩ ලෙසින් ක්‍රියාත්මක කරන ලදි.

මහා පරිමාණ ජල සම්පාදන හා මළ අපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා විදේශ ණය මුදල් වලින් 2020 වර්ෂය සඳහා රුපියල් බිලියන 62.2 ක වෙන් කිරීමක් ලැබුණි. මෙම වෙන් කිරීම ලැබුණේ 2020 වසර තුළ පෙළ ගස්වනු ලැබ තිබුණ වැඩ කටයුතු සඳහා වැය කිරීමට මෙන්ම 2019 වර්ෂය වෙනුවෙන් වූ ගණන් හිලවු නොදී ඇති ගෙවීම් ආවරණය කිරීම සඳහා ද විය. මෙම ව්‍යාපෘති වලට අදාල දේශීය අනුරූපිත අරමුදල් කළමනාකරණය කරන ලද්දේ අගය වකතු කළ බද්ද හා රේගු බදු වියදම් පියවා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද රුපියල් මිලියන 4,589.7 ක දේශීය අරමුදල් උපයෝගි කර ගනිමින් වන අතර ඉතිරි දේශීය සංඝටකය කළමනාකරණය කර ගන්නා ලද්දේ මහා භාණ්ඩාගාරය විසින් පොළී ගෙවීමේ පදනම මත ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ලබා දෙන ලද ණය මුදල හා රුපියල් මිලියන 921.07 ක් වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයටම අයත් අරමුදල් උපයෝගී කර ගනිමින් වේ. මේ අතර එක් මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතියක් හා මහා පරිමාණ මළ අපවහන ව්‍යාපෘතියක් දියත් කිරීම සඳහා රුපියල් මිලියන 101.44 ක විදේශීය ප්‍රදානයන් ද වෙන් කර දෙනු ලැබිණි. මීට අමතර ලෙස මහා භාණ්ඩාගාරය විසින් පොළිය ගෙවනු ලබන ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ලබා ගන්නා ලද රුපියල් බිලියන 30 ක ණය මුදලින් රුපියල් බිලියන 15.49 ක මුදල් ප්‍රමාණයක් ජල සම්පාදන ව්‍යාපෘතීන්ට අදාල ණය මුදල් සඳහා වූ පොළී ගෙවීම් කටයුතු වෙනුවෙන් යොදා ගන්නා ලද අතර රුපියල් මිලියන 865.48 ක මුදල් ප්‍රමාණයක් විදේශ අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්ගේ දේශීය සංඝටකය වෙනුවෙන් වැය කරන ලදි. මේ අතර එයින් රුපියල් මිලියන 69.09 ක මුදලක් සියළුම ව්‍යාපෘතීන් සඳහා ජලය ලබා ගැනීම සඳහා වැය කරන ලදි.

මතු වෙමින් පවතින කුඩා නගර වෙනුවෙන් වූ (කුඩා හා මධ්‍ය පරිමාණ) ජල සම්පාදන හා මළ අපවහන ව්‍යාපෘතීන් දියත් කිරීමේ වැඩ කටයුතු යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කිරීම පිණිස සහ දිවයින

2016 - 2020 කාලය තුළදී ජල සම්පාදන අංශය හා මල අපවහන අංශය මත කරන ලද මුළු ආයෝජනය



2018 / 2019 ප්‍රාග්ධන අය වැය ලේඛනය යටතේ ලැබුණ ප්‍රාග්ධන අරමුදල් යොදා ගැනීම.

විස්තරය	2019		2020	
විදේශීය සහභාගය (රුපියල් මිලියන)	31,551	112%	**39,005**	**62%**
විදේශීය ආධාර හා බැඳි දේශීය සහභාගය (රුපියල් මිලියන)	3,962	90%	**2,640**	**50%**
දේශීය ව්‍යාපෘති සඳහා වූ ඒකාබද්ධ අරමුදල් (රුපියල් මිලියන)	795	46%	**1,387**	**50%**
ණය පොලී ගෙවීම්				
එකතුව	45,491	104%	**40,033**	**61%**

ඉහත සඳහන් කරනු ලැබ ඇති සංවර්ධන ක්‍රියාකාරකම් වලට අමතර ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2020 වර්ෂය තුළදී සිය ආදායම් මුදල් යොදා ගනිමින් පුනරුත්ථාපන ක්‍රියාකාරකම් මත රුපියල් මිලියන 1,152.36 ක මුදලක් ද, ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ කටයුතු මත රුපියල් මිලියන 404.69 ක මුදලක් ද, බල ශක්ති සංරක්ෂණය කිරීමේ කටයුතු මත රුපියල් මිලියන 108.57 ක මුදලක් ද, ප්‍රාග්ධන අයිතමයන් මිළ දී ගැනීම මත රුපියල් මිලියන 70.54 ක මුදලක් හා මළ අපවහන යෝජනා ක්‍රමයන් නඩත්තු කිරීම මත රුපියල් මිලියන 22.6 ක මුදලක් ද ආයෝජනය කරනු ලැබ ඇත. පුනරුත්ථාපන ක්‍රියාකාරකම් යටතේ ප්‍රමුඛත්වය දෙන ලද්දේ අනුග්‍රාහක සහායක් නොලැබෙන්නා වූ හෝ යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම සඳහා විශේෂ අරමුදල් වෙන් කරනු ලැබ නොමැති යෝජනා ක්‍රමයන් වෙත වේ.

වර්ෂය ආරම්භයේදී මුළු වර්ෂය වෙනුවෙන්ම වෙන් කිරීමක් නොතිබුණ හේතුව නිසා 2020 වර්ෂය අතරතුර වැඩ කටයුතු සැලැසුම් කිරීම අතිශයින්ම දුෂ්කර කටයුත්තක් විය. ප්‍රාග් ධන අය වැය ලේඛන වෙන් කිරීම් වැය ශීර්ෂයන් 4 ක් මගින් ලබා දෙන ලද අතර සම්පූර්ණ වර්ෂය වෙනුවෙන් සම්පාදනය කර දීමට යෝජිත අරමුදල් පිළිබඳව දැනුම් දෙන ලද්දේ 2020 නොවැම්බර් මස අවසාන භාගයේදීය.

මෙම තත්ත්වය අඩු මට්ටමේ අරමුදල් උපයෝජ්‍යතාවයකට තුඩු දුන්නේය. තවද වෙන් කර දෙන ලද ප්‍රාග් ධන අරමුදල් වල අඩු උපයෝජ්‍යතාවයට තුඩු දුන් තවත් ප්‍රධාන හේතුවක් වන ලද්දේ කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා සැලැසුම් වලට ඇතුලත් නොවූ ගැටළු වලට මුහුණ පෑමට සිදු වීමයි.

අරමුදල් සපයන නියෝජිත ආයතනයන් හා අදාල ශ්‍රී ලංකා රජයේ අරමුදල් හරහා ලැබුණ විදේශ ආධාර දායකත්වය



2020 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය	ව්‍යාපෘතියේ නම	නියෝජිත ආයතනය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
බස්නාහිර	කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය - පැකේජ අංක 1	දේශීය බැංකු අරමුදල්	5,170.00	373,304
	කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි පියවර	ප්‍රංශය	32,700.00	1,750,000
වයඹ	වීයලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව	17,196.39	453,000

කාර්ය මණ්ඩලය

> “ සේවා සම්බන්ධතාවයන් එක් දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 2019 වර්ෂයේ පැවැති 3.99 සිට 2020 වර්ෂය තුළදී 3.66 ක් දක්වා අඩු කර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි.”

කාර්ය මණ්ඩල සංඛ්‍යා

කාර්ය මණ්ඩලය	2019	2020
(අ). ස්ථිර	9,564	9,227
(ආ). අනියම්	0	0
(ඇ). කොන්ත්‍රාත්	137	132
(ඈ). ආධුනික යන්ත්‍රාගාර තාක්ෂණ ශිල්පීන් හා උපාධිධාරී පුහුණුලාභීන්	24	24
එකතුව	**9,725**	**9,383**

2020 වර්ෂයේ අවසානය වන විට ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 9227 ක සංඛ්‍යාවක් ද, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 132 ක සංඛ්‍යාවක් හා ආධුනික යන්ත්‍රාගාර කාර්මික ශිල්පීන් හා උපාධිධාරී පුහුණුලාභීන් 24 ක සංඛ්‍යාවක් ද සිටියහ. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ කාර්ය මණ්ඩල සාමාජිකයින් වැඩි පිරිසක් බඳවා ගන්නා ලද්දේ විදේශීය අරමුදල් යොදාගනිමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් වෙනුවෙනි.

2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 296 ක සංඛ්‍යාවක් හා කොන්ත්‍රාත් පදනම මත වූ කාර්ය මණ්ඩල සාමාජිකයින් 01 ක සංඛ්‍යාවක් විවිධ කාර්ය මණ්ඩල වර්ගයන් යටතේ බඳවා ගැනීම සිදු කරන ලදි. එම කාලය තුළදීම විශ්‍රාම ගැනීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, නිලය අත හැර යාම් හා අභාවයන් හේතුකොට ගෙන විවිධ කාර්ය මණ්ඩල වර්ගයන්ට අයත් ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 633 කගේ හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 06 කගේ සේවය අවසන් කරන ලදි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2019 වර්ෂයේ දෙසැම්බර් අවසානයට සාපේක්ෂක ලෙස සමස්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව 342 කින් අඩු විය.

සේවා සම්බන්ධතාවයන් එක් දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 2019 වර්ෂයේ පැවැති 3.99 සිට 2020 වර්ෂයේදී 3.66 ක් දක්වා අඩු කර ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි.

ප්‍රධාන කාර්ය කෘත්‍යයන් අනුව කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති අන්දම



ස්ථානය අනුව කාර්ය මණ්ඩලය බෙදී ගොස් ඇති අන්දම



කාර්ය මණ්ඩල ප්‍රතිලාභ.

- වර්ෂය තුළදී ඵලදායිත්ව දිරි ගැන්වීමක් ඇතුළුව රුපියල් 42,000.00 ක වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවන ලදි.
- පෙර වසර වලදී මෙන්ම ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් මුදල් ලබා දීම දිගටම කරන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සහන මිළ ගණන් වලට අනුව ප්‍රවාහන පහසුකම් සපයන ලදි.
- සේවයේ යෙදී සිටින කාලය අතරතුර මිය ගිය ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් මරණ ප්‍රදානයන් ගෙවීම සිදු කරන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත දේශීය හා විදේශීය පුහුණු පහසුකම් ලබා දෙන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත රුපියල් 650.00 ක මාසික තේ දීමනාවක් ප්‍රදානය කරන ලදි.
- (මහජන බැංකුව හා ලංකා බැංකුව වෙතින් පිළිවෙලින් නිවාස ණය හා වාහන ණය ආදී වශයෙන්) රාජ්‍ය බැංකු හරහා කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ණය පහසුකම් සලස්වා දෙන ලදි.
- ඊට අමතර ලෙස (4.2% ක පොලී අනුපාතයක් මත) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත දස මාසයක ණය පහසුකම් හා එක් වර්ෂයක ණය පහසුකම් සලස්වා දෙන ලදි.
- එක් කාර්ය මණ්ඩල සාමාජිකයකුට රුපියල් 10,000.00 බැගින් කාර්ය මණ්ඩලය වෙත උත්සව අත්තිකාරම් ලබා දෙන ලදි.
- 2020 වර්ෂය තුළදී කාර්ය මණ්ඩල සාමාජිකයින් 45 දෙනෙකු අතර මාස 12 ණය වශයෙන් රුපියල් 22,146,770.00 ක මුදලක් හා කාර්ය මණ්ඩල සාමාජිකයින් 1504 දෙනෙකු අතර මාස 10 ණය වශයෙන් රුපියල් 477,775,624.00 ක මුදලක් සහන පොලී අනුපාතිකයක් මත බෙදා දෙනු ලැබිණි.
- ඉතා බරපතල රෝගයන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ වියදම් දැරීමට අමතර ලෙස (පවුලේ සාමාජිකයින්ද ඇතුළු) කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා (දල වශයෙන්) රුපියල් මිලියන 83 ක මුදලක් වැය කරන ලදි.

කාර්ය මණ්ඩලයේ පඩිනඩි හා ප්‍රතිලාභ

2019 හා 2020 වර්ෂයන්හි කාර්ය මණ්ඩල පඩිනඩි සසඳා බැලීම

විස්තරය	2019 රු.මිලි.	2020 රු.මිලි.
වැටුප්	11,985	11,522
සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය	994	968
සේවක භාර අරමුදලට දායකත්වය	248	242
එකතුව	**13,227**	**12,732**

මිනිස් බල සංවර්ධනය හා පුහුණුව

2020 වර්ෂය තුළ සිදු කරන ලද පුහුණු අවශ්‍යතා විශ්ලේෂණය හා විවිධ අංශ ප්‍රධානීන්ගෙන් ලැබුණ විශේෂ පුහුණු කිරීම් අවශ්‍යතා ද පදනම් කර ගනිමින් මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් 2020 වර්ෂය තුළදී විවිධ වර්ගයන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් අභ්‍යන්තර පුහුණු කිරීම් වැඩ සටහන් 310 ක සංඛ්‍යාවක් සැලැසුම් කරන ලදුව ඉන් අභ්‍යන්තර පුහුණු කිරීම් වැඩ සටහන් 131 ක් පවත්වන ලද අතර ඒවායේ සහභාගිත්වය (කළමනාකරණ මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 158 කින් ද, වෙනත් විධායක මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 875 කින් ද, අධීක්ෂණ මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 680 කින් ද, ලිපිකාර සහ ඒ හා අදාල වෙනත් ශ්‍රේණීන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 729 කින් හා මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ කාර්ය මණ්ඩල සාමාජිකයින් 110 කින් ද සමන්විත වූ) කාර්ය මණ්ඩල සාමාජිකයින් 2552 ක් විය. 2020 වර්ෂය තුළ පැවැති කොවිඩ් 19 වසන්ගත තත්ත්වය නිසා එකී වර්ෂයේ මාර්තු මස 13 වැනි දිනයෙන් පසුව පන්ති කාමර තුළ පුහුණු වැඩ සටහන් පැවැත්වීමට නොහැකි වූ අතර ඒ හේතුව නිසා 2020 ජුනි මාසයේ මැද භාගයේ සිට ගූගල් මීට් හරහා දුරස්ථ පුහුණු වැඩ සටහන් පැවැත්වීමට මිනිස් බල සංවර්ධන හා පුහුණු අංශය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිණි.

එසේම මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් 2020 වර්ෂය තුළදී රට තුළ ක්‍රියාත්මක වන වෙනත් පුහුණු කිරීම් ආයතනයන් මගින් සේවකයින් 235 දෙනෙකු වෙත අවශ්‍ය පුහුණු කිරීම් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙල කරන ලදි. එකී බාහිර පුහුණු කිරීම් වලට දේශීය විශ්ව විද්‍යාලයයන් විසින් මෙහෙයවන ලද ශාස්ත්‍රපති හා පශ්චාත් උපාධි වැඩ සටහන් ද, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය (NIBM), සේවා මණ්ඩල කළමනාකරණ වරලත් ආයතනය (CIPM), ඉදි කිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), ඉදි කිරීම් පුහුණුව හා සංවර්ධනය සඳහා වූ ආයතනය (1CTAD), ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනය (1ESL), නිවාස සැලැසුම් කිරීම හා ඉදි කිරීම සඳහා වූ ආයතනය (CHPB) හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) වැනි පිළිගත් ආයතනයන් විසින් මෙහෙයවන ලද ඩිප්ලෝමා හා සහතික පාඨ මාලාවන් ඇතුලත් විය.

දිවයිනෙන් බැහැර පුහුණු හා නිල චාරිකා වැඩ සටහන් යටතේ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ හා ඉන්දියානු තාක්ෂණික ආර්ථික සහයෝගිතාවයේ මූල්‍ය සහාය සහිතව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයින් 09 දෙනෙකු වෙත කෙටි කාලීන පුහුණු වැඩ සටහන් වලට සහභාගි වීමේ අවස්ථාව ලබා දෙන ලදි. මේ අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එක් ඉංජිනේරු වරයකු හට නීති ශිෂ්‍යත්ව වැඩ සටහන යටතේ ශාස්ත්‍රපති උපාධි පාඨ මාලාව හැදෑරීමේ අවස්ථාව ද උදා විය. මීට අමතර ලෙස මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවැති විවිධ ව්‍යාපෘතීන් හා වෙනත් මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාරකම් මගින් නැව්ගත කිරීමට පෙර පරීක්ෂණ පැවැත්වීම සඳහා එතෙර යාම පිණිස නිලධාරීන් 21 දෙනෙකු වෙත විදේශ නිල චාරිකා සඳහා පහසුකම් සලස්වා දෙන ලදි.

මීට අමතර වශයෙන් උපාධි අපේක්ෂකයින් 269 ක සංඛ්‍යාවක් හා තාක්ෂණික, ගිණුම් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේද වර්ගයට අයත් පුහුණු ලාභීන් 243 ක සංඛ්‍යාවක් ඇතුලත් වෘත්තීය ආධුනිකයින් 512 දෙනෙකු වෙත කාර්මික පුහුණුව ලබා දෙන ලදි.

2019 ප්‍රගතිය - සහභාගිවුවන්ගේ සංඛ්‍යාව



මිනිස්බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය මගින් පවත්වන ලද පුහුණු වැඩ සටහන් සාරාංශය



(2019/2020) පුහුණු සහභාගිත්වය සංසන්දනය කිරීම

	2019	2020
අභ්‍යන්තර පුහුණුව	11,560	2,552
බාහිර පුහුණුව	247	235
විදේශ පුහුණුව	88	10
කාර්මික පුහුණුව	547	512



“ පවිත්‍ර ජලය ලෝකයේ ප්‍රථම හා අග්‍රගණ්‍ය ඖෂධයයි.”

ස්ලෝවැකියානු ප්‍රස්තාව පිරුළ



නිරෂාර භාවය සඳහා වර්තාව

කැළණි දකුණු ඉවුර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

සේවාවේ උත්කෘෂ්ඨ භාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම්.

තොරතුරු තාක්ෂණය - මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා සේවා මට්ටම් වැඩි දියුණු කිරීම

රාජ්‍ය ආයතනයන් තුළ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා සේවා මට්ටම් වැඩි දියුණු කිරීම සඳහා යොදා ගත හැකි ඉතාමත්ම ඵලදායී මෙවලම වශයෙන් තොරතුරු තාක්ෂණය සලකනු ලැබේ. එම නිසා සංවිධානමය න්‍යාය පත්‍රයේ ඉහළ ප්‍රමුඛත්වය පරිගණකකරණය වෙත දෙනු ලැබ ඇත. දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින පරිගණකකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විවිධ පියවර ගනු ලැබ ඇත. මෙම ප්‍රයත්නයෙහිදී දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා තොරතුරු තාක්ෂණ විසඳුම් හා ඒවාට අදාල යටිතල පහසුකම් වැඩි දියුණු කරන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් වර්ෂය පුරාම නව මෘදුකාංග විසඳුම් ගණනාවක් එකතු කරමින් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ පියවර ගනු ලැබ ඇත. එසේම නව විසඳුම් ගණනාවක්ම දැනට පෙළ ගස්වනු ලැබ තිබෙන අතර ඒවා ඉක්මනින්ම දියත් කරනු ලැබීමට අපේක්ෂිතය.

වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය වෙත කරනු ලබන වැඩි දියුණු කිරීම්

2016 වර්ෂයේදී දියත් කරන ලද වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය මේ වන විට වසර 4 කට වැඩි කාලයක ක්‍රියාත්මක මෙහෙයුම් සම්පූර්ණ කරනු ලැබ ඇත. නිෂ්පාදනය භාවිතා කරන්නන්ගෙන් ලැබෙන ප්‍රති පෝෂණය හා මෙහෙයුම් ප්‍රාගුණ්‍යයන් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයන් සැලැකිල්ලට ගනිමින් වැඩි දියුණු කිරීම් රැසක් වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධති මෘදුකාංග පද්ධතිය හා සම්බන්ධ කරනු ලැබ ඇත. නව සම්බන්ධතාවයන් ලබා දීම, සම්බන්ධතාවයන් විසන්ධි කිරීම, නැවත සම්බන්ධ කිරීම් ආදිය හා ගනු දෙනු කරුවන් සිටින ස්ථානයන් තුළදී ගෙවීම් රැස් කර ගැනීම වැනි ක්ෂේත්‍ර මට්ටමේ මෙහෙයුම් පහසුකරණය කිරීම සඳහා ක්ෂේත්‍ර සේවා ජංගම යෙදවුම වැඩි දුරටත් වැඩි දියුණු කරනු ලැබ ඇත.

දෘඩාංග හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්

සැපයුම් කරුවන්ගේ හා සේවා සපයන්නන්ගේ සහාය ලබා ගනිමින් දෘඩාංග හා යටිතල පහසුකම් නඩත්තු කිරීම අභ්‍යන්තර දෘඩාංග කණ්ඩායම වෙත පැවරුන එක් ප්‍රධාන කර්තව්‍යයක් විය. ප්‍රස්තුත වර්ෂය තුළදී දෘඩාංග හා යටිතල පහසුකම් වලට අඛණ්ඩ ලෙස වැඩි දියුණු කිරීම් සිදු කරන ලදි. දුරස්ථ කාර්යාලයන් වෙත හා ගබඩාවන් වෙත ජාල සම්බන්ධතාවය දීර්ඝ කිරීමේ වැඩ කටයුතු සිදු කරනු ලැබ ඇත.

තොරතුරු තාක්ෂණ මානව සම්පත්

තොරතුරු තාක්ෂණ පහසුකම් වල ඇති වැදගත් කම හා එම පද්ධතීන්ගේ විශ්වසනීයත්වය සැලැකිල්ලට බඳුන් කළ ඉහළ කළමනාකරණය විසින් අනාගත අවශ්‍යතාවයන්ට ගැලැපෙන පරිදි තොරතුරු තාක්ෂණ පිරිස්බල ව්‍යුහය වැඩි දියුණු කිරීමට හා අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ මානව සම්පත් ශක්තිමත් කිරීමට ද අවශ්‍ය පියවර ගනු ලැබ ඇත. තොරතුරු තාක්ෂණ කණ්ඩායම ශක්තිමත් කිරීමේ අරමුණ සහිතව තොරතුරු තාක්ෂණ අංශය වෙත නව ඉංජිනේරුවන් බඳවා ගැනීම පිණිස තීරණයක් ගනු ලැබ ඇත. එසේම එකී අංශය තුළ දැනට පවත්නා ඇබෑර්තු පිරවීම සඳහා අවශ්‍ය මූලික පියවර දැනට ගනු ලැබ ඇත.

කාර්යාල පරිශ්‍රය වැඩි දියුණු කිරීම

තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යාල පරිශ්‍රය ප්‍රති ව්‍යුහගත කිරීමට හා වැඩ කරන පරිශ්‍රය නවීකරණය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබ ඇත. ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් සපයන ලද සැලැසුම් පදනම් කර ගනිමින් තොරතුරු තාක්ෂණ අංශය අළුත්වැඩියා කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුවක් ක්‍රමවත් ලෙස සකස් කරනු ලැබ ඇති අතර ප්‍රධාන කාර්යාලය වැඩි දියුණු කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇති අරමුදල් වලින් ඒ සඳහා මුදල් වෙන් කරනු ලැබ ඇත.

සයිබර් සුරක්ෂණ හා ආරක්ෂණ පද්ධතීන්

සංවිධානයේ තොරතුරු තාක්ෂණ පද්ධතීන් ආරක්ෂා කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු වැදගත් අංශයක් වශයෙන් සයිබර් සුරක්ෂණය සලකනු ලැබේ. සයිබර් සුරක්ෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමට හා පද්ධතියේ විශ්වාසනීයත්වය නංවා ලීමේ අරමුණ සහිතව විවිධ පියවරයන් ගනු ලැබ ඇත. එහි එක් පියවරක් වශයෙන් අනිසි ප්‍රවේශයන් වලක්වා ලීමේ ප්‍රබල උපකරණයක් :සෙරුෆ්කක* ලබා ගෙන ස්ථාපිත කරනු ලැබ ඇත.

වාණිජ ක්‍රියාකාරකම්

ගනුදෙණු කරුවන්ගේ මනු කියවීම් මගින් ඔවුන් විසින් පරිභෝජනය කරනු ලැබ ඇති ජල පරිමාව ප්‍රමාණනය කිරීම, සැබෑ කාල පදනම මත මාසික බිල් පත් නිකුත් කිරීම හා ජලය අලෙවි කිරීම මගින් ලැබෙන ආදායම රැස් කිරීම පිළිබඳව කටයුතු කරනු ලබන ප්‍රධාන අංශය වාණිජ අංශය වේ. රට වසා තිබුණ කාල සීමාවන් තුළ මද ප්‍රමාදයක් ඇති වුව ද කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බල පෑම මධ්‍යයේ ද බිල් පත් කලට වේලාවට ගනුදෙනු කරුවන් වෙත ලබා දීමේ ක්‍රියාවලිය අඛන්ඩව කරගෙන යන ලදි. ඒ අනුව බිල් කිරීමේ ඉලක්කයන් ඉක්මවා ගොස් තිබුණද මුදල් අය කර ගැනීමේ ඉලක්කයන් සාක්ෂාත් කරගත නොහැකි විය.

ගනුදෙණුකරුවන් වෙත කලට වේලාවට බිල් පත් ලැබීම



බිල් කිරීම හා ගාස්තු රැස් කිරීම

ගනුදෙණු කරුවන්ට පහසු ආකාරයට මාසික බිල් පත් පියවීමට හැකි වන පරිදි පහසු ක්‍රම බොහෝ සංඛ්‍යාවක් ආරම්භ කරනු ලැබ ඇති අතර ගනුදෙණු කරුවන් එවැනි ක්‍රමයන් භාවිතා කරන අයුරු හා ඇතැම් ගණු දෙනු කරුවන් එම පහසුකම් එකින් එක වෙත මාරු වන අයුරු දැක ගත හැකි විය. ඇතැම් ගණු දෙනු කරුවන් විසින් බිල් පත් දෙකක් එක වර පියවීම, කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බල පෑම නිසා ඇති වන ප්‍රමාදයන් හා බිල් නොපියවීම නිසා සැපයුම් සම්බන්ධතාවයන් විසන්ධි කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක නොකිරීම වැනි විවිධ හේතූන් නිසා මාසික බිල් පත් පියවීමේ ප්‍රමාදයක් ඇති වී තිබේ. ඒ හේතූන් නිසා ගණු දෙනු කරුවන්ගෙන් මුදල් රැස් කිරීමේ ජංගම මුදල් රැස් කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි. බිල් පත ලැබී දින 14 ක් ඇතුලත බිල් පත් පියවීමෙන් ලැබෙන වාසි හා ගෙවීම් කිරීම දින 30 කට වඩා ප්‍රමාද කිරීම හේතුවෙන් ගෙවීමට සිදු වන දඩ මුදල් පිළිබඳව ගණු දෙනු කරුවන් දැනුවත් කරනු ලැබ ඇත.



ණය කාලය අඩු කිරීම

ණය කාලය යනු මාසික බිල් පතට සාපේක්ෂක ලෙස ණය මැන බලන මිම්මක් වේ. මෙය 2019 වර්ෂය තුළදී 0.67 සිට 0.40 දක්වා පහළට බැස තිබුණ ද කොවිඩ් 19 තත්ත්වය හේතුකොට ගෙන සමාජ සාධකයන් සැලැකිල්ලට ගනිමින් හිඟ මුදල් අය කර ගැනීමේ ක්‍රියාවලිය ලිහිල් කරන ලද හෙයින් 2020 වසර තුළදී එය 1.73 ක් දක්වා ඉහළ නැංගේය. මේ ා සම්බන්ධ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 1 වේ.



අභ්‍යන්තර හා බාහිර ගනුදෙණුකාර තෘප්තිය

වඩාත් හොඳින් සේවාවන් සැපැයීමට හැකි වන පරිදි ගනුදෙණු කරුවන්ගේ අවශ්‍යතාවයන් සමාලෝචනය කොට විශ්ලේෂණය කිරීම අඛන්ඩ ලෙස සිදු කරන ලදි. ගනුදෙණු කරුවන් සතුටට පත් කිරීමේ අරමුණ සහිතව ස්වයං සේවා ජංගම උපයෝග හා කෙටි පණිවුඩ සේවය මගින් සංනිවේදනය කිරීම වැනි ජංගම උපයෝග යන් හඳුන්වා දීම ද, මාසික බිල් පත් කලට වේලාවට ලබා දීම ද, කාර්ය මණ්ඩලයේ හැකියා මට්ටම වැඩි දියුණු කිරීම හා ගනුදෙණු කරුවන් වෙත සපයනු ලබන සේවාවන්ගේ මට්ටම නංවා ලීමේ අරමුණ ඇතිව සියළුම මට්ටම් වල කාර්ය මණ්ඩල සාමාජිකයින් තුළ දැනුවත් භාවය ඇති කිරීම ආදිය ද සිදු කරන ලදි.

ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය

ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් සිය අංශයට අදාල ප්‍රධාන කර්තව්‍යයන්ට අමතර ලෙස බොහෝ සිද්ධීන් හා සම්බන්ධ වී සහාය භූමිකාවක් ක්‍රියාත්මක කරන ලදි.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා සම්බන්ධිතව ක්‍රියාත්මක වන දේශගුණ ප්‍රත්‍යාස්ථ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනෙහි (UNDP) සහයෝගය සහිතව එකී ව්‍යාපෘතියෙහි 2 වැනි සංඝටකය වූ පානීය ජල සම්පාදනයෙහි සමස්ත ප්‍රගතිය පසු විපරම් කරමින් ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය එම ව්‍යාපෘතිය හා ක්‍රියාත්මක ලෙස සම්බන්ධ විය.

නව ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ යෝජනා ක්‍රමයන්ට අදාල ජලය නිස්සාරණය කිරීම, නළ හා සවි කිරීම්, යාන්ත්‍රික හා විද්‍යුත් අයිතමයන් හා ඉදි කිරීම් ද්‍රව්‍ය, ඉදි කිරීම් ක්‍රියාකාරකම්, ක්‍රම ප්‍රකාශයන් අනුමත කිරීම සඳහා අවශ්‍ය උපදේශකයින්, ඉදි කිරීම් රූප සටහන්, සාධ්‍යතා වාර්තාවන් හා වෙනත් තාක්ෂණික අවශ්‍යතාවයන් පිළිබඳ නිර්දේශයන් හා සහාය ලබා දෙන ලදි. මාසික බිල් පත් සඳහා මිණුම් හා නිර්දේශයන් කිරීම, ඉදි කිරීම් වැඩ හා සම්බන්ධ කර්මාන්ත ශාලා චාරිකාවන් හා පරීක්ෂණයන් සිදු කිරීම, පුත්තලම, අනුරාධපුර, වවුනියා හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක 4 තුළ ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ යෝජනා ක්‍රම 08 ක් වෙත තාක්ෂණික සහාය ලබා දීම, පසු විපරම් කිරීම හා ඉදි කිරීම් අධීක්ෂණය කිරීම ද සිදු කරන ලදි. වහල මත ස්ථාපිත කරන ලද වැසි ජල රැස් කිරීමේ පද්ධතීන් හා දේශගුණ ප්‍රත්‍යාස්ථ ජල සුරක්ෂිතතා හා සුරක්ෂණ සැලැසුම් මෙහෙයුම් හා නඩත්තු කිරීමට අදාල පුහුණු කරන්නන් පුහුණු කිරීමේ කටයුතු සම්බන්ධීකරණය හා පසු විපරම සිදු කරන ලදි.

අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ලැබුණ ඉල්ලීමක් අනුව පලාත් නවයක පිහිටි සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ පහසුකම් නොමැති පාසැල් 689 ක් සම්බන්ධයෙන් තක්සේරු කිරීම් හා විශ්ලේෂණයන් පවත්වන ලදි. එකී පාසැල් වලට අදාල විස්තර හා තොරතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙතින් ලබා ගන්නා ලද අතර එකී ගැටළුවට අදාල දීර්ඝ කාලීන හා කෙටි කාලීන විසඳුම් නිර්දේශ කරමින් ඒ හා සම්බන්ධ වැය ඇස්තමේන්තු ද පිළියෙල කොට අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතියේ (WaSSIP) අතිරේක මූල්‍යකරණය යටතේ ඉදිරි කාලයේදී දියත් කරනු ලැබීමට නියමිත ලෝක බැංකු ව්‍යාපෘතිය හා සම්බන්ධ වාර්තාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තු ආකෘතියේ පිළියෙල කොට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර ඊට නාගරික, අර්ධ නාගරික, ග්‍රාමීය හා වතුකර ප්‍රදේශයන් සඳහා යෝජිත උප ව්‍යාපෘතීන්ගේ ලැයිස්තුවක් ද ඇතුලත් කරන ලදි.

ප්‍රජා මූල සංවිධාන පුනරුත්ථාපන වැඩ සටහන පිළියෙල කරන ලද්දේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ හා නම් කරන ලද ප්‍රදේශයට අනුයුක්ත ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සහාය ලබා ගනිමින් හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ආසන්න වශයෙන් 30 ක සංඛ්‍යාවක් වූ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත තාක්ෂණික වශයෙන් සහාය ලබා දීම සඳහා වේ. මීට අමතර ලෙස කුඩා නගර ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ හැකි හා අවශ්‍ය වුව හොත් පුනරුත්ථාපනය කළ හැකි ස්ථානයන් හඳුනා ගැනීම සඳහා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ඒකකයන් වෙතින් අවශ්‍ය දත්ත ද රැස් කර ගන්නා ලදි. මෙම වැඩ සටහන 2021 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් මෙතෙක් ලැබී නොමැත.

ඇඹිලිපිටිය හා කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ජල සම්පාදනය හා අත් සේදීමේ පහසු කම් සහිත වැසිකිළි ඉදි කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සම්පාදනය කර දීම පිණිස එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලින් අවශ්‍ය අරමුදල් ලබා ගන්නා ලදි. මෙම වැඩ පිළිවෙල එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ පිහිටි ග්‍රාමීය සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයන්හි මරණ අනුපාතිකයන් අඩු කිරීමට තුඩු දෙන පරිදි මව් වරුන්ගේ හා දරුවන්ගේ සෞඛ්‍යය රැක දෙමින් තිරසාර සෞඛ්‍ය සේවාව හා ආසාදන වැලැක්වීම කෙරෙහි දායක වනු ඇත. මෙම වැඩ පිළිවෙලට අදාල ටෙන්ඩර කැඳවීම රත්නපුර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයේ හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයේ සහාය ඇතිව අදාල පලාත් පාලන අධිකාරිය විසින් සිදු කරනු ලබනවා ඇත.

දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ජලයේ ගුණාත්මය වැඩි දියුණු කිරීමේ පියවරක් වශයෙන් යකඩ හුවමාරු යන්ත්‍රාගාරයන් (Iron Exchange Plants) ස්ථාපිත කිරීම පිණිස කළුතර හා පුත්තලම දිස්ත්‍රික්කයන් තුළ ක්‍රියාත්මක වන ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 3 ක් තෝරා ගනු ලැබ ඇත. මේ සඳහා සම්බන්ධීකරණය හා අවශ්‍ය පහසුකරණය පද්ධති කාර්ය සාධන විශ්ලේෂණය සඳහා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් හා පර්යේෂණ හා සංවර්ධන අංශයේ සහභාගිත්වය සහිතව ලබා දෙන ලදි. ඒ අතර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රජා මූල සංවිධානයන් හා ප්‍රදායකයින් සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යන ලදි. පයාගල පිහිටි ප්‍රජා මූල සංවිධානය විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ඉදි කිරීම් කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ගේ සහ ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ හා ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සහාය ලබාගනිමින් දැනට ක්‍රියාත්මක වන ST.RWS දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කරන ලදි.

ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන

මහජන සම්බන්ධතා ඒකකය විසින් ගණුදෙනුකාර කණ්ඩායම්, පාසැල් දරුවන් හා පාරිභෝගික සමිති ඉලක්ක කර ගනිමින් විවිධ අධ්‍යාපනික හා දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් මෙහෙයවීම ක්‍රියාත්මක කරන ලදි. මෙහි ලා ප්‍රධාන අවධානය යොමු කරන ලද්දේ ජල සංරක්ෂණය, පාරිසරික පැතිකඩයන් හා ජලාශයන් ආරක්ෂා කිරීම කෙරෙහි වේ. මෙම වැඩ කටයුතු දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කරන ලද අතර පාසැල් තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් සංඛ්‍යාව 10 ක් හා රජයේ ආයතනයන් හා පුද්ගලික අංශයේ ආයතනයන් තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් සංඛ්‍යාව 07 ක් විය.

ඒකකයේ තවත් එක් කර්තව්‍යයක් වූයේ ජල සම්පාදන සේවාවට අදාල බොහෝ විවිධ පැතිකඩයන් සම්බන්ධයෙන් ඉලක්ක කණ්ඩායම වෙත දැනුම ලබා දීම සඳහා වාර්ක සඟරාවන් පළ කිරීමයි. ජලය නමැති සඟරාවේ මුද්‍රණයන් 2020 වර්ෂයේ මාර්තු, ජූනි හා සැප්තැම්බර් යන මාසයන්හිදී පළ කරන ලදි.

මහජන සම්බන්ධතා ඒකකය විසින් ජල සැපැයුම කපා හැරීම පිළිබඳ පණිවුඩ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විවෘත කිරීමේ උත්සව ආදිය පිළිබඳ විශේෂ වාර්තාවන් පළ කිරීම වැනි ජන මාධ්‍ය ප්‍රචාරක කටයුතු වල ද නියැලෙන ලදි. මාධ්‍යයන්හි පළ වුන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිරූපයට හානිකර ලිපි ආදිය සම්බන්ධයෙන් ඒවා නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ගයන් ද ගන්නා ලදි.

බල ශක්ති කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බල ශක්ති භාවිතය විශ්ලේෂණය කිරීමේ කටයුතු කරනු ලබන්නේ යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් වන අතර බල ශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා හඳුනා ගනු ලැබ ඇති උචිත ව්‍යාපෘතීන් සූදානම් කොට ක්‍රියාත්මක කරනු ලබන අතර එසේ කරනු ලබන්නේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහාය ලබා ගනිමින් විශේෂිත බල ශක්ති පරිභෝජනය අවම කිරීම මගිනි.

2020 වර්ෂය තුළදී විදුලි බල පරිභෝජනය වෙනුවෙන් වැය වූ වාර්ෂික පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 4,624 ක් වූ අතර මෙම මුළු පරිභෝජන පිරිවැයෙන් 96 % ක් හෙවත් රුපියල් මිලියන 4,439 ක් වැය වී ඇත්තේ ජල නිෂ්පාදනය හා පොම්ප කිරීම සඳහා වේ. ඒ අතර මළ අපවහන ප්‍රතිකාරිත කිරීම හා පොම්ප කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 65 ක් වැය වී ඇත. මේ අතර ආසන්න වශයෙන් රුපියල් මිලියන 120 ක මුදලක් කාර්යාල ඉඩ කඩ වෙනුවෙන් වැය කරනු ලැබ ඇත. බල ශක්ති සංරක්ෂණ වැඩ සටහන 2004 වර්ෂයේදී හඳුන්වා දෙන ලද අතර ඒ මගින් ක්‍රම ක්‍රමයෙන් සැලැකිය යුතු ප්‍රගතියක් සාක්ෂාත් කරගනු ලැබ ඇත. ගත වූ දශකයන් තුළදී ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් ක්‍රියාකාරකම් ඉහළ මට්ටමකට ශ්‍රේණිගත කරනු ලැබ ඇත. ගාස්තු වගු වර්ග නිවැරදි කිරීම්, විද්‍යුත් හා යාන්ත්‍රික වැඩි දියුණු කිරීම් කටයුතු හා වර්ෂ 2004 සිට වර්ෂ 2020 දක්වා පවත්වනු ලැබ සම්පූර්ණ කරන ලද බල ශක්ති සංරක්ෂණ වැඩ සටහන් වල ප්‍රතිඵලයක් වශයෙන් බල ශක්තිය හා ඒ වෙනුවෙන් වැය වන පිරිවැය බොහෝ සෙයින් ඉහළ මට්ටමින් ඉතිරි කර ගැනීමට හැකි වී ඇත.

රට තුළ බල පවත්වන ලද කොවිඩ් 19 වසංගත තත්ත්වය තිබියදී පවා 2020 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත යාන්ත්‍රික හා විද්‍යුත් අංශයන්හි සහයෝගය ලබා ගනිමින් බල ශක්ති විගණනයන් හා අධ්‍යයනයන් හයක සංඛ්‍යාවක් පවත්වන ලදි. 2020 වර්ෂය තුළදී ව්‍යාපෘතීන් 11 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන් නිම කරන ලදි. මෙම සම්පූර්ණයෙන් නිම කරන ලද හා ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යනු ලබන ව්‍යාපෘතීන් වෙනුවෙන් 2020 වර්ෂය තුළදී වැය කරන ලද මුළු මුදල ආසන්න වශයෙන් රුපියල් මිලියන 108 ක් විය. මෙම ව්‍යාපෘතීන් වල ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ වාර්ෂික පිරිවැය ඉතිරි කිරීම් රුපියල් මිලියන 29.7 ක් විය. 2021 වර්ෂය තුළදී දැනට ක්‍රියාත්මක කරගෙන යමින් පවතින හා නව ව්‍යාපෘතීන් 26 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලැබ ඇති අතර ඒ සඳහා අවශ්‍ය වනු ඇතැයි අපේක්ෂිත පිරිවැය ආයෝජනය ආසන්න වශයෙන් රුපියල් මිලියන 490 ක් වේ (මෙයට 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලබමින් පැවැති ව්‍යාපෘතීන් ද ඇතුලත් වේ).

ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ අපේක්ෂිත සමස්ත කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයත්වය පවත්වාගෙන යාම සඳහා යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් කිසිදු බිඳ වැටීමකින් තොරව මෙහෙයුම් කටයුතු කර ගෙන යාම සහතික කිරීමේ අරමුණින් එක් එක් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත යාන්ත්‍රික හා විද්‍යුත් අංශයෙහි කාර්ය මණ්ඩල සාමාජිකයින් හරහා කලාපයන්හි ඇති සියළුම යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණයන්ට අදාලව සැලැසුම් කරන ලද නිවාරණ නඩත්තු වැඩ සටහන පසු විපරමට භාජනය කරන ලදි.

සිටින කාර්ය මණ්ඩල සාමාජිකයින් යොදා ගනිමින් මට්ටම් පසු විපරම් හා දුරස්ථ මෙහෙයුම් පද්ධතීන් (SCADA) සැලැසුම් කොට දේශීයව නිපදවන ලද අතර ඒවා කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත යාන්ත්‍රික හා විද්‍යුත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහාය ලබා ගනිමින් තෝරාගත් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ස්ථාපිත කරන ලදි.

වාහන, ජල මනු හා වෙනත් යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ මිළ දී ගැනීම සඳහා අවශ්‍ය යාන්ත්‍රික හා විද්‍යුත් ටෙන්ඩර් ලිපි ලේඛන හා පිරිවිතර පිළියෙල කරන ලදි. යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ වලට අදාල සැලැසුම් කිරීම, නිර්මාණය කිරීම, නඩත්තු කිරීම හා වෙනත් ක්‍රියාකාරකම් හා සම්බන්ධ සහාය දීමේ විධි විධානයන් අවශ්‍යතාවය පැන නැගී ඇති විට කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත හා ව්‍යාපෘතීන් වෙත සපයා දෙන ලදි.

ඉහතින් දක්වනු ලැබ ඇති කටයුතු වලට වැඩිමනත් වශයෙන් ප්‍රවාහන අංශය, මධ්‍යම වැඩ පොල හා ගොඩනැගිලි නඩත්තු කිරීමේ අංශය යනාදී අංශයන් ද පරිපාලනය කරනු ලබන්නේ යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසිනි.

යාන්ත්‍රික හා විද්‍යුත් අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන අංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් සියළුම වාහන හා උපකරණ වලට අදාල බල පත්‍ර, රක්ෂණ කටයුතු, නව ලියා පදිංචි කිරීම් පිළියෙල කිරීම, කාර්යාලයට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රවාහන කටයුතු වෙනුවෙන් වාහන ලබා දීම හා අදාල කටයුතු කිරීම, සුභ සාධන කටයුතු හා හදිසි අවස්ථාවන්හිදී වාහන සැපැයීම, පරිගණක දත්ත ගබඩාව නඩත්තු කිරීම, වැය විස්තර හා හදිසි අනතුරු විස්තර ඇතුලත් වාර්තා නඩත්තු කිරීම ආදී කටයුතු කරනු ලැබේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික හා විද්‍යුත්) යටතේ ක්‍රියාත්මක වන ගොඩනැගිලි නඩත්තු කිරීමේ අංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල සංකීර්ණයට හා සොයිසා පුර, බඩෝවිට හා රාවතාවත්තේ පිහිටි මණ්ඩලීය නිල නිවාසයන්ට අදාල සියළුම නඩත්තු කටයුතු ඉටු කරනු ලබයි.

මධ්‍යම වැඩ පොල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන වැඩ පොල වන අතර එම වැඩ පොල විසින් ජල හා මළ අපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්හි පොම්ප හා උපාංග ඇතුළු සියළුම යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ වලට අදාල මෙහෙයුම් හා නඩත්තු කටයුතු වලට අදාල සහාය කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත සපයා දෙනු ලබයි.

මධ්‍යම රසායනාගාරය

2020 වර්ෂය තුළදී පරීක්ෂණයන්ට අදාල කර ගන්නා ලද මුළු නියැදීන්ට අදාල විශ්ලේෂණාත්මක දත්තයන් මගින් හෙලිදරව් වන ලද්දේ පරීක්ෂණ අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සම්පාදනය කර දෙනු ලබන ජලයෙහි බැක්ටීරියා විද්‍යාත්මක ජල ගුණාත්මය 99.2% ක සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරනු ලබන බව හා භෞතික විද්‍යාත්මක හා රසායන විද්‍යාත්මක ජල ගුණාත්මය පරීක්ෂණ අනුව 77.3% ක සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරනු ලබන බවයි.

ජලය හා ජල ප්‍රතිකාරක රසායනික පරීක්ෂණ පැවැත්වීම වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම රසායනාගාරය, බස්නාහිර දකුණ රසායනාගාරය, බස්නාහිර නිෂ්පාදන රසායනාගාරය, යාපනය රසායනාගාරය හා වවුනියා රසායනාගාරය වෙත ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන ISO / IES 17025 -2018 රසායනාගාර පිළිගැනීමේ තත්ත්වය පිරිනමනු ලැබ ඇත.

තුවක්කු ලෝහ විලි සඳහා වන ද්‍රව්‍ය සංයෝජන පරීක්ෂණයන් සිදු කිරීම මධ්‍යම රසායනාගාරය තුළ දැනට ආරම්භ කරනු ලැබ ඇති අතර වහා ගිනි ඇවිලෙනසුළු රසායන ද්‍රව්‍යයන් සුරක්ෂිත ලෙස ගබඩා කිරීම සඳහා ගින්නට ඔරොත්තු දෙන ආකාරයේ කැබිනට් දෙකක් රසායනාගාරය තුළ ස්ථාපිත කරනු ලැබ ඇත.

රට තුළ පවත්නා සුරක්ෂිත ජල ආවරණය පිළිබඳව කරුණු දැන ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කලාපීය රසායනාගාරයන්ගේ සහාය ලබා ගනිමින් සාරන ලද ලිං වල ජලයේ ගුණාත්මය පරීක්ෂාවට භාජනය කිරීමේ කටයුතු දිප ව්‍යාප්ත අන්දමින් ක්‍රියාත්මක කරමින් යනු ලැබේ.

ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම

බස්නාහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුබද්ධිත ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ අංශය විසින් එකී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශය තුළ පමණක් නොව ඉන් බාහිර බස්නාහිර දකුණු හා බස්නාහිර උතුරු ප්‍රදේශයන් තුළ පවා කාන්දු සොයා ගැනීම, කපාට හඳුනා ගැනීම, නල මාර්ග හඳුනා ගැනීම, ප්‍රවාහ හා පීඩන මිණුම් ගැනීම, නීති විරෝධී භාවිතය සොයා ගැනීම, කාන්දු සමීක්ෂණ, අභ්‍යන්තරික කාන්දු සොයා ගැනීම, දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීම, කාන්දු අළුත්වැඩියා කිරීම වැනි බොහෝ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ ක්‍රියාකාරකම් 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඊට අමතර වශයෙන් එම අංශය විසින් මහ කොළඹ ජල හා අපජල වැඩි දියුණු කිරීම් ආයෝජන වැඩ සටහන (GCWWMIIP) සමග කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලද ආදායම් රහිත ජලය පසු විපරම් කිරීමේ හා කළමනාකරණය කිරීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ කටයුතු ද සිදු කරනු ලැබ ඇත.

මෙම තත්ත්වයන් යටතේ කොළඹ නගරය තුළ ආදායම් රහිත ජල පරිමාව 39.12 % ක් දක්වා අඩු කර ගැනීමේ හැකියාව ලැබී ඇති අතර ප්‍රස්තුත වර්ෂය තුළදී බස්නාහිර මධ්‍යම කලාපයේ ආදායම් රහිත ජල පරිමාව 29.53% ක් දක්වා අඩු කර ගැනීමට හැකි වී ඇත. ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ ක්‍රියාකාරකම් වලට අමතර වශයෙන් ආදායම් රහිත ජල පරිමාව කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා පුහුණු කිරීමේ වැඩ සටහන් ද මෙහෙයවන ලදි.

භූගත ජලය

භූ ගත ජල අංශය ප්‍රධාන වශයෙන්ම නියැලී සිටින්නේ නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත ජල සම්පාදන පහසුකම් සපයා දීම අරමුණු කර ගත් භූ ගත ජලය හා සම්බන්ධ වැඩ කටයුතු වල වන්නේය. 2020 වර්ෂය තුළදී භූ ගත ජල අංශය විසින් භූ ගත ජලය හා සම්බන්ධ වැඩ කටයුතු විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලද්දේය.

ප්‍රස්තුත වර්ෂය තුළදී ජල භූ විද්‍යාත්මක විමර්ෂණ කටයුතු, ගැඹුරු හා නොගැඹුරු මිහි විදමන් ඉදි කිරීම හා දිගු කාලීන ලෙස භූගත ජලය උකහා ගැනීම සඳහා ඇති විභව හැකියාව මැණ බැලීම පිණිස ළිං හා ජලධරයන් සතු විභව හැකියාවන් තක්සේරු කිරීම වැනි භූගත ජලය සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා සම්බන්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ක්‍රියාත්මක කරන ලදි. තවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ගැඹුරු හා නොගැඹුරු නල ළිං සංවර්ධනය කිරීම, ළිං ශීර්ෂ ආරක්ෂා කිරීම, භූ ගත ජලය ප්‍රති ආරෝපණ අධ්‍යයනයන්, අත් පොම්ප අළුත්වැඩියා කිරීම් හා පුනරුත්ථාපනය කිරීම් හා භූ ගත ජලය හා සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් අධ්‍යයනයන් කිරීම ද ප්‍රස්තුත වර්ෂය තුළදී සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදි.

මුළු සංඛ්‍යාවන් වශයෙන් ගත් කල ජල භූ විද්‍යාත්මක විමර්ෂණයන් 340 ක් ද, ගැඹුරු හා නොගැඹුරු මිහි විදමන් ඉදි කිරීම් 150 ක් ද, ළිං සෝදා හැරීම් හා සංවර්ධනය කිරීම් 151 ක් ද, නව අත් පොම්ප ස්ථාපිත කිරීම් 8 ක් ද, අත් පොම්ප නල ළිං අළුත්වැඩියා කිරීම් හා පුනරුත්ථාපනය කිරීම් 221 ක් ද, පොම්ප කිරීමේ පරීක්ෂණයන් 68 ක් ද 2020 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

කෘෂි කාර්මික ක්‍රියාකාරකම් සඳහා හිඹිලියාකඩ ග්‍රාමය වෙත දිනකට ජලය ඝණ මීටර 1000 ක් ලබා ගත හැකි වන පරිදි ක්‍රියාත්මක කරන ලද භූ ගත ජල සංවර්ධන ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබේ. දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නව ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ද, අනිකුත් ආයතනයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ද භූ ගත ජල ප්‍රභව ධාරිතාවය දිනකට ඝණ මීටර 12000 කින් වැඩි වී තිබේ.

භූ ගත ජල අංශයේ හැකියා වර්ධන කටයුතු වශයෙන් භූ ගත ජල ප්‍රභව සංවර්ධනය කිරීම, පොම්ප කිරීමේ පරීක්ෂණ, විදමන් ඉදි කිරීම හා නඩත්තු කිරීම වැනි විෂයයන් ඇතුලත් හැකියාවන් නංවා ලීමේ පුහුණු වැඩ සටහන් භූ ගත ජල අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා තවත් අය වෙනුවෙන් මෙහෙයවන ලදි. භූ ගත ජල අංශයේ නව අනාගත අවධානයන් යොමු වන්නේ භූ ගත ජල ගතිකයන්, අපවිත්‍රන ආකෘතිකරණය, භූ ගත ජල සිතියම්කරණය, භූ ගත ජල ප්‍රති ආරෝපණය හා සමස්ථානික අධ්‍යයනයන් කිරීම කෙරෙහි ද වන්නේය.

සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය අපහසුවකින් තොරව ලබා ගත හැකි තත්ත්වයක තිබිය යුතු අතර එය සහතික කිරීම සඳහා මණ්ඩලය විසින් නිවැරදි මිළ දී ගැනුම් ප්‍රතිපත්තීන් පවත්වාගෙන යා යුතු වන අතර ප්‍රතිසම්පාදන හා භාණ්ඩ ගබඩා කිරීමේ නිවැරදි ක්‍රියා පටිපාටීන් ද අනුගමනය කළ යුතු වේ. වර්ෂය මුළුල්ලේම පැවැති කොවිඩ් 19 තත්ත්වය යටතේ වුව ද ප්‍රස්තුත 2020 වර්ෂය පුරාම කිසිදු බාධාවකින් තොරව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 342 ක් සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය සම්පාදනය කර දීමෙහි හා සම්බන්ධතා ද්‍රව්‍යයන් කිසිදු බාධාවකින් තොරව සපයා දීමෙහි ලා සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශය විසින් ඉතා සාර්ථක ලෙස කටයුතු කරනු ලැබ ඇත.

බොහෝ රාජ්‍ය හා පුද්ගලික ආයතනයන් සමග සම්බන්ධීකරණය වෙමින් නැවි භාණ්ඩ නිෂ්කාශනය කිරීමේ ඉහළ ප්‍රමිතියක් පවත්වාගෙන යන අතර ප්‍රමාද ගාස්තු ගෙවීම වලක්වා ගැනීම සඳහා කාර්යක්ෂමතාවය සහතික කරමින් නැවි භාණ්ඩ තොග 425 ක සංඛ්‍යාවකට අධික සංඛ්‍යාවක් නිෂ්කාශනය කර ගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන ලදි. මීට අමතර වශයෙන් දේශීය මිළ දී ගැනුම් වෙනුවෙන් 2020 වර්ෂය තුළදී රුපියල් මිලියන 270 ක් සඳහා වූ මිළ දී ගැනුම් ඇණවුම් 639 ක සංඛ්‍යාවක් හා ආසන්න වශයෙන් ප්‍රදාන ලිපි 125 ක සංඛ්‍යාවක් නිකුත් කරනු ලැබ ඇත. තවද අවශ්‍ය ද්‍රව්‍ය අළුතින් මිළ දී ගැනීමකින් තොරව දීප ව්‍යාප්තව පිහිටි කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් තුළ තිබුණ අතිරේක භාණ්ඩ අවශ්‍ය ස්ථානයන් අතර නැවත බෙදා හැරීම මගින් රුපියල් මිලියන 100 කට අධික මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමේ හැකියාව ද ලැබිණි.

තොග අඩු කිරීම සඳහා මෙම අංශය විසින් ක්‍රම කිහිපයක් අනුග මනය කරන ලදි. මෙම වර්ෂය තුළදී අළුතින් ද්‍රව්‍ය මිළයට නොගෙන අතිරික්ත වශයෙන් තිබෙන ද්‍රව්‍ය දිවයින පුරා පිහිටි කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත නැවත බෙදා දීම මගින් රුපියල් මිලියන 115 කට වැඩි මුදලක් ඉතිරි කර ගැනීමේ හැකියාව ලැබිණි.

ඉන්වෙන්ටරි කළමනාකරණ මෘදුකාංගයක් හඳුන්වා දීම මගින් මුළු දිවයින පුරාම පිහිටි 327 ක සංඛ්‍යාවක් වූ ගබඩාවන් සියල්ල සම්බන්ධ කිරීමේ අරමුණින් දියත් කරන ලද ක්‍රියාවලියක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි. දිවයින පුරා පිහිටි ගබඩාවන් වෙත පරිගණක යන්ත්‍ර 143 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දීමේ සැලැසුම සාර්ථක වූ අතර ගබඩා 327 ක සංඛ්‍යාව අතුරින් ගබඩා 252 ක සංඛ්‍යාවක් දැනට තොරතුරු තාක්ෂණය සමග ක්‍රමාණුකූල ලෙස සකස් කරනු ලැබ ඇත. තොග වටිනාකම සලකා බැලීමේදී රුපියල් මිලියන 9,000 ක වටිනාකමින් යුත් තොග අතුරින් රුපියල් මිලියන

5,200 ක වටිනාකමකින් යුත් තොග පද්ධතිය තුළට ගනු ලැබ ඇති අතර දැනට ඒ සම්බන්ධ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

ප්‍රස්තුත වර්ෂය තුළදී රුපියල් මිලියන 1,224.21 ක් වටිනා කොන්ත්‍රාත් ලියවිලි 26 ක සංඛ්‍යාවක් පිළියෙල කොට රුපියල් මිලියන 47 ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් අතිරික්ත හා යල් පැන ගිය අයිතමයන් ගොඩවල් 85 ක් විකිණීම සඳහා ලංසු කැඳවන ලදි. 2020 වර්ෂය තුළදී තමන් වෙත වෙන් කර දෙන ලද අය වැය වෙන් කිරීම් තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙම අංශයට හැකි වූ අතර සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශයේ සමස්ත කාර්ය සාධනය අපේක්ෂා කරන ලද මට්ටමට තිබුණ බව කිව හැකි වේ.

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩ සටහන

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සෞඛ්‍ය ගැටළුවක් බවට පත් වී තිබේ. ආරම්භක අවස්ථාවන්හිදී එම ගැටළුව සීමා වී තිබුනේ උතුරු මැද හා ඌව පලාත් වලටය. එහෙත් දැනට එය වයඹ, උතුරු, මධ්‍යම, නැගෙනහිර, සබරගමුව හා දකුණු යන පලාත් වල ද බහුල ලෙස ව්‍යාප්ත වී තිබේ.

ඒ අනුව ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා වෛද්‍ය වෘත්තිකයින්ගේ නිර්දේශයන් පරිදි හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමේ අරමුණින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන ක්‍රමෝපායයන් හා කාර්ය සැලැසුම් සකස් කරනු ලැබ ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහයෝගිතාවය සහිතව 2020 වර්ෂය තුළදී රුපියල් මිලියන 273.72 ක මුදලක් ආයෝජනය කරමින් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකු ගඩු රෝගය නිවාරණය කිරීමේ අරමුණ සහිතව බොහෝ නිවාරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් සපයා ස්ථාපිත කිරීම, නල මාර්ග දීර්ඝ කිරීම්, නව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් දියත් කිරීම හෝ ක්‍රියාත්මක වෙමින් පවතින ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම, මිහි විදමන් ඉදි කිරීම, කුඩා පරිමාණ විලෝම ආශ්‍රිති යන්ත්‍රාගාර සපයා ස්ථාපිත කිරීම, වැසි ජලය රැස් කිරීම සඳහා ටැංකි ස්ථාපිත කිරීම, බවුසර මගින් ජලය සම්පාදනය කර ලීම, ජලයේ ගුණාත්මක භාවය පරීක්ෂා කිරීම, විලෝම ආශ්‍රිති යන්ත්‍රාගාර හා අත් පොම්ප අළුත්වැඩියා කිරීම මෙම වෙන් කිරීම මගින් ප්‍රධාන වශයෙන් ආවරණය කරන ලදි.

සංවර්ධනය

2020 වර්ෂය තුළදී සංවර්ධන අංශය විසින් ප්‍රධාන වශයෙන්ම නිරත වන ලද්දේ ජල ප්‍රභවයන් හා ජල සුරක්ෂිතතා සැලැසුම් සකස් කිරීමේ කටයුතු හා බැඳුන ක්‍රියාකාරකම් වල වේ.

මුහුණ දුන් හා අත් විඳින්නට සිදු වුන ජලය උකහා ගැනීමේ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඉහළ මට්ටමේ මෙහෙයුම් කමිටුවක් 2019 වර්ෂයේදී පිහිටුවා ගන්නා ලද අතර අදාල සංවිධානයන් වෙතින් ජලය උකහා ගැනීමේ හිමිකම් ලබා ගැනීමකින් තොරව නව ජල සම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට තැත් කිරීමේදී හමු වන දුෂ්කරතාවයන් හා ඒ මෙන්ම නව ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑමට සිදු වන විවිධාකාර ගැටළු සම්බන්ධයෙන් ද එකී මෙහෙයුම් කමිටුව විසින් දිගින් දිගටම පුළුල් ලෙස සාකච්ඡා කිරීමෙහි නියුක්ත වන ලදි. ඒකාබද්ධ ජල ප්‍රභව කළමනාකරණය සඳහා පොදු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිණිස සංවර්ධන අංශය දායක වූ අතර අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එකී පොදු යාන්ත්‍රණය අග්‍රාමාත්‍ය තුමන්ගේ ලේකම් වරයා විසින් පත් කරනු ලබන විශේෂඥ කමිටුවක් විසින් පිහිටුවනු ලබනවා ඇත.

සියළුම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයන් තුළ දක්නට ලැබෙන 2020 - 2025 සංස්ථාපිත සැලැසුමට අදාල ජල ප්‍රභවයන් හා සම්බන්ධ ගැටළු පසු විපරම් කිරීම හා සමාලෝචනය කිරීම, නව සංස්ථාපිත සැලැසුමට අදාල ජල ප්‍රභව දත්ත පද්ධතියක් පිළියෙල කිරීම, නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම, ජලය උකහා ගැනීමේ අවශ්‍යතාවයට අදාල අවබෝධතා ගිවිසුම සම්පූර්ණ කිරීම හා තුළු මුව සැලැසුම් ආදිය සඳහා අනුමැති ලබා ගැනීමේ වැඩ කටයුතු කිරීම ආදිය නිම කිරීම සඳහා මහවැලි අධිකාරිය හා වාරි මාර්ග දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් යුතුව වැඩ කරන ලදි.

තවද විශේෂයෙන්ම ගෘහස්ත හා කර්මාන්ත අංශයන් තුළ වර්ධනය වන ජල භාවිතය හේතුකොට ගෙන මෙන්ම දේශගුණික විපර්යාසයන් හේතුවෙන් ද එම තත්ත්වය සඳහා විසඳුමක් වශයෙන් පානීය ජලය උකහා ගැනීමේ පරමාර්ථය සඳහා රැස්කුරු ජලාශයන් හඳුන්වා දීම කළ යුතුව තිබේ. ඒ අනුව රැස්කුරු ජලාශයන් වශයෙන් ඉදි කරනු ලැබීමට යෝජිත වී ඔය, යටිමහන හා වඳුරාපිනුඇල්ල හා සම්බන්ධ සක්‍යතා අධ්‍යයනයන් ආරම්භ කරනු ලැබ ඇත. ඒ අතුරින් යටිමහන වෙනුවෙන් කරන ලද සක්‍යතා අධ්‍යයනය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර පාරිසරික බලපෑම් තක්සේරුව දැනට සිදු කරනු ලබමින් පවතී.

ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද අනිකුත් වැඩ කටයුතු අතර කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයන් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම සඳහා මග පෙන්වීම් සිදු කිරීම, ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකය සමග බුද්ධි කළම්බන සැසි පැවැත්වීම හා ජල සුරක්ෂිතතා සැලැසුම් පුහුණු වැඩ සටහන් පැවැත්වීම මගින් එකී කලාපයන් තුළ අවිධිමත් අභ්‍යන්තර විගණනයන් පැවැත්වීම හා විධිමත් අභ්‍යන්තර විගණනයන් පැවැත්වීම ද විය.

ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකය හා සංවර්ධන අංශයේ ජල සුරක්ෂිතතා ඒකකය ඒකාබද්ධ වී 2020 ජූලි මාසයේදී ජල සුරක්ෂිතතා සැලැසුම් වැඩ මුළුවක් පවත්වන්නට යෙදුන අතර එහි පරමාර්ථය වූයේ විධිමත් බාහිර විගණනයෙන් හෙලි වූ කරුණු හා ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ඉදිරියට ගෙන යන ආකාරය පිළිබඳ කරුණු කළමනාකරණය සමග බෙදා හදා ගැනීම විය. "සියළුම දෙනා වෙනුවෙන් සුරක්ෂිත පානීය ජලය ලබා දීම සඳහා යන ගමනක්" යන මැය යටතේ පිළියෙල කරන ලද ජල සුරක්ෂිතතා සැලැසුම් දේශීය වාර්තාව ද ඒ දිනම එම වැඩ මුළුව තුළ දී දියත් කරන ලදි.



ජල සුරක්ෂිතතා සැලැසුම් පිළිබඳ වැඩමුළුව

පර්යේෂණය හා සංවර්ධනය

ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් පර්යේෂණ හා සංවර්ධන කටයුතු බොහෝ සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදි. පලංජිය ආරක්ෂක මාස්ටික් ද්‍රව්‍ය හා මල නොකන වානේ මුරච්චි සහ පොට ඇණ සන්ධි එකිනෙක සමාන කර බැලීම ඇතුළු පලංජිය ආරක්ෂක මාස්ටික් ද්‍රව්‍ය සම්බන්ධ අධ්‍යයනයන් සිදු කිරීම හා කොළඹ දකුණ කළුබෝවිල ශික්ෂණ ආරෝග්‍ය ශාලාවේ තුළු මුව ආශ්‍රිත පානීය ජලයේ ගුණාත්මය පරීක්ෂා කිරීම ද, වියලි ආරු ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ඇල්ගී මට්ටම් අඩු කිරීම ද ප්‍රස්තුත වර්ෂය තුළදී සිදු කරන ලද්දේය. තවද කොතලාවල ආරක්ෂණ විශ්ව විද්‍යාලයයට සම්බන්ධ ශිෂ්‍යයකු සහභාගි කර ගනිමින් භූ ගත ජලයෙහි ඇති යකඩ ඵලදායී ලෙස ඉවත් කිරීම අරමුණු කොටගත් පර්යේෂණ අධ්‍යයනයක් මීරිගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයෙහිදී පවත්වන ලදි.

යුනිච්චායි, පූගොඩ, මාවතගම, හා ගොකරුල්ල යන ස්ථානයන්හි ක්‍රියාත්මක කරනු ලබන පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් සම්බන්ධයෙන් පැන නැඟී ඇති ඇතැම් ගැටළු වලට විසඳුම් ලබා දීම සඳහා සමුපදේශයන් ලබා දීම, මීගමුවේ ස්ථාපිත කරනු ලැබීමට යෝජිත විලෝම ආශ්‍රැති පෙරණය සඳහා පිරිවිතර පිළියෙල කිරීම, සැලැසුම් සමාලෝචනයට භාජනය කිරීම හරහා පැකේජ යන්ත්‍රාගාර වැඩි දියුණු කිරීම, මෙහෙයුම් හා නඩත්තු කටයුතු වලට අදාල ගැටළු විසඳීමට ක්‍රියා කිරීම හා අවශ්‍ය දත්ත සංචිතයන් පිළියෙල කිරීම ද ප්‍රස්තුත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන්නට යෙදුන පර්යේෂණ හා සංවර්ධන අංශයේ සෙසු කර්තව්‍යයන්ට අයත් විය.

තවද ග්‍රාමීය සන්දර්භය තුළ අයන භූවමාරු ජල ප්‍රතිකාර ක්‍රමයේ තිරසාර භාවය තක්සේරු කර බැලීම පිණිස හා අඩු ධාරිතා ප්‍රතිකාර පද්ධතීන් (නැනෝ පරිශ්‍රවණ, ෆ්ලුඔරයිඩ් ඉවත් කිරීම හා EDR) සම්බන්ධයෙන් වැඩි දියුණු කළ ජල ප්‍රතිකාර ක්‍රමයන් යොදා ගැනීමේ තිරසාර භාවය මැන බැලීම සඳහා ඉන්දියාවේ සීමා සහිත අයන් එක්ස්චේන්ජ් සමාගම සමග සහයෝගිත්ව අධ්‍යයනයක් පවත්වන ලදි.

ඉහත දක්වනු ලැබ ඇති කරුණු වලට අමතර වශයෙන් ප්‍රස්තුත වර්ෂය තුළදී භූ ගත ජලය, ස්වයංකරණ පද්ධතීන් හා ජලය ප්‍රතිකාරිත කිරීම යනාදී මාතෘකාවන්ට අදාලව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ඇතැම් වෙනත් අධ්‍යයනයන් ද කරන ලද අතර එම අධ්‍යයනයන් පහසුකරණය කරන ලද්දේ පර්යේෂණ හා සංවර්ධන අංශය විසිනි.

භූගෝලීය තොරතුරු පද්ධතිය හා සිතියම්කරණය

(පිළියෙලින් කිලෝ මීටර 75 ක, 176 ක හා 144 ක දිග ප්‍රමාණයන්ගෙන් යුත් නල මාර්ගයන්ගෙන් හා කපාට ස්ථානයන් 75 කින්, 105 කින් හා 120 කින් සමන්විත) අම්බලන්තොට, වීරකැටිය හා කතරගම ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල ගෝලීය ස්ථානගත කිරීම් පද්ධති ක්ෂෙත්‍ර සමීක්ෂණයන් සම්පූර්ණයෙන් නිම කොට අදාල සිතියම් දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත භාර දෙන ලදි. ඒ අතර (පාලම් 19 කින් සමන්විත) ලබුගම - කලටුවාව ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ගයට අදාල ගෝලීය ස්ථානගත කිරීම් පද්ධති ක්ෂෙත්‍ර සමීක්ෂණය නිම කොට අදාල සිතියම් ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය වෙත භාර දෙන ලදි.

ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ පිහිටි බුත්තල හා සෙවනගල, නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ පිහිටි ලිහිණියාගම හා සඳුන්පුර, දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ පිහිටි අම්බලන්තොට සහ වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ පිහිටි ගල්ගමුව මූලික සිතියම් හා ජල උපයෝගතාවයන් සංඛ්‍යාංක බවට පරිවර්තනය කිරීම සිදු කිරීමෙන් අනතුරුව සියළුම දත්ත අදාල කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත භාර දෙන ලදි.

ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමේ දැනට ක්‍රියාත්මක වන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන ආවරණය, දැනට නිම කරනු ලබමින් පවතින ව්‍යාපෘතීන්, ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන්, 2020, 2025, 2030 හා 2050 යන වර්ෂයන් සඳහා ප්‍රක්ෂේපිත ජන ගහණ ඝණත්ව සිතියම් හා ජලය උකහා ගන්නා තුළු මුව සහිත ප්‍රධාන ගංගා ද්‍රෝණීන් දැක්වෙන තොරතුරු විස්තර කෙරෙන පුළුල් පරාසයක සිතියම් සෑම දිස්ත්‍රික්කයක් වෙනුවෙන්ම පිළියෙල කොට ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය වෙනුවෙන් විස්තීර්ණ ක්‍රමෝපායික ආයෝජන සැලැසුමක් (ප්‍රධාන සැලැසුම) පිළියෙල කිරීමේදී භාවිතා කිරීම සඳහා සූදානම් කරනු ලැබ ඇත.

ගබඩා පිහිටුවනු ලැබ ඇති ස්ථානයන්, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා ගංගා ද්‍රෝණි හා සම්බන්ධ ගංගා වලින් හා වැව් වලින් ජලය උකහා ගනු ලබන ස්ථානයන් දැක්වෙන සිතියම් වැනි වෙනත් වැදගත් සිතියම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් පිළියෙල කරන ලදි. බාහිර සංවිධානයන්ගේ ඉල්ලීම් අනුව පිළියෙල කොට භාර දෙනු ලැබූ සිතියම් වලට පිළියෙලින් ලංකා විදුලි බල මණ්ඩලය, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පිළියෙල කරන ලද බත්තරමුල්ල, කොළඹ නගරය හා කැස්බෑව ජල උපයෝගිතා සිතියම් ඇතුලත් වේ. මීට අමතර ලෙස පරන්තන් රසායන ද්‍රව්‍ය සමාගම වෙනුවෙන් පිළියෙල කරන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්හි පිහිටීම දැක්වෙන සිතියම හා පරිසර අමාත්‍යංශය සහ මධ්‍යම පාරිසරික අධිකාරිය වෙනුවෙන් පිළියෙල කරන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් (දැනට ක්‍රියාත්මක තත්ත්වයේ තිබෙන හා යෝජිත) තුළු මුව දැක්වෙන සිතියම පෙන්වා දිය හැකි වේ.

එසේම ජල උපයෝගිතා ජාල පද්ධතියේ ගොඩ නැගීමෙන් පසු තත්ත්වය දැක්වෙන රූප සටහන් (as built drawings) පිළියෙල කිරීම සඳහා සහාය කර ගැනීම සඳහා ජල උපයෝගිතා පිරිවිතර භූගෝලීය තොරතුරු පද්ධති ආකෘතිය අනුව පිළියෙල කිරීම කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. ඉන් පසු එම භූගෝලීය තොරතුරු පද්ධති ආකෘතිය අනුව පිළියෙල කරන ලද රූප සටහන අදාල ටෙන්ඩර් ලිපි ලේඛනයන්හි ඇතුලත් කිරීම සඳහා ප්‍රලේඛන අංශය වෙත භාර දෙන ලදි. ශේෂ නල ජාලය සංඛ්‍යාංක බවට පරිවර්තනය කිරීම පිළිබඳව වූ සාමාන්‍යාධිකාරී වරයාගේ චක්‍ර ලේඛය අනුගමනය කිරීම සඳහා වූ ක්‍රම ප්‍රකාශයක් ද සහිතව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

ජල සුරක්ෂිතතා සැලැසුම්

ලෝක සෞඛ්‍ය සංවිධානයේ පානීය ජලයේ ගුණාත්මය සම්බන්ධයෙන් වූ මග පෙන්වීම් මගින් පානීය ජල සම්පාදනයක සුරක්ෂිතතාවය ස්ථාවර ලෙස සහතික කිරීමේ ඉතාම කාර්ය සාධක මාර්ගය වශයෙන් නිර්දේශ කරන ලද්දේ ජල සුරක්ෂිතතා සැලැසුම් වේ.

එසේ වාසි සහගත තත්ත්වයන් අවබෝධ කර ගැනීමෙන් පසුව (2020 දෙසැම්බර් 31 වැනි දින වන විට) නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රම 281 ක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කොට තිබුණ අතර එම සංඛ්‍යාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරමින් පැවැති ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාවෙන් ආසන්න වශයෙන් 82 % ක ප්‍රතිශතයක් විය. මීට අමතර වශයෙන් ඊ ළඟ වසර 05 ක කාලය තුළදී ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ මට්ටම පසු විපරම් කිරීම සඳහා සුරක්ෂික පානීය ජලය හා සම්බන්ධ ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය යටතේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් තුනක සංඛ්‍යාවක් ද හඳුන්වා දෙනු ලැබිණි.

තවද, බිම් මට්ටමේ යොදා ගැනීම් වල ඵලදායීතාවය සහතික කිරීම පිණිස අභ්‍යන්තර විධිමත් විගණනයන් 29 ක් හා අභ්‍යන්තර අවිධිමත් විගණනයන් 34 ක් පවත්වන ලදි. මීට වැඩිමනත් වශයෙන් අග්නි දිග ආසියානු හා දකුණු ආසියානු කලාපයන් තුළ ප්‍රථම වරට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වරුන්ගේ ආයතනයේ හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙරට පිහිටි කාර්යාලයේ සහයෝගිතාවය ලබා ගනිමින් විධිමත් බාහිර විගණනයන් 14 ක සංඛ්‍යාවක් සිදු කරනු ලැබ ඇත.

මේ හැරුණ විට රටේ දිස්ත්‍රික්ක 7 ක ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ලෝක බැංකු සහායෙන් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) ද අප හා අත්වැල් බැඳගෙන ඇත. තවද රට පුරා පිහිටි ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරවීමේ කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීමෙහි ලා ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව නායකත්වය ගෙන කටයුතු කරන ලදි.

ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම මගින් "සියළු දෙනා වෙනුවෙන්ම ජලය" නම් වූ රජයේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා තිරසාර ප්‍රවේශයක් විවෘත වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දැක්ම වූ "පොහොසත් ජීවිතයක් සඳහා සුරක්ෂිත ජලය" යන්න සාක්ෂාත් කර ගැනීමට ද එය උපකාරී වනු ඇත.



“ ජලය නොමැති නම් ජීවිතය හුදෙක් පර්වතයක් බවට පත් වනු ඇත.”

ඇන්තනි ටී. හින්ක්ස්



ජාතික පාසල් සංවර්ධනය

රුහුණුපුර ජල සම්පාදන යෝජනා ක්‍රමය

කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන.

පළාත/ කලාපීය සේවා මධ්‍යස්ථානය	සම්බන්ධතා සංඛ්‍යාව
මධ්‍යම	291,357
නැගෙනහිර	303,391
උතුරු මැද	144,495
වයඹ	95,308
උතුර	31,575
සබරගමුව	127,668
දකුණ	343,093
ඌව	120,006
බටහිර මධ්‍යම	515,176
බටහිර උතුර	305,299
බටහිර දකුණ	282,869
එකතුව	2,560,237



කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන

බටහිර - මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය කොළඹ නගරයේ උතුර, කොළඹ නගරයේ දකුණ, කෝට්ටේ හා මහරගම කළමනාකරණ ප්‍රදේශයන්ගෙන් සමන්විත වේ.

බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුබද්ධිත ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ අංශය විසින් රාත්‍රී කාන්දු සමීක්ෂණ, කාන්දු සොයා ගැනීම්, නීති විරෝධී භාවිතයන් සොයා ගැනීම්, දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීම්, ජල කාන්දු අළුත්වැඩියා කිරීම් හා දිස්ත්‍රික් මිණුම් ප්‍රදේශයන් හුදෙකලා කිරීම් වැනි ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම හා සම්බන්ධ බොහෝ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එසේම මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන :ධඤදඋඑෂෂජ* මගින් ද ආදායම් රහිත ජල පරිමාව පසු විපරම් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලද අතර පුහුණු කිරීම් අංශය සමග සම්බන්ධීකරණය වෙමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කලාපීය කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් ආදායම් රහිත ජලය කළමනාකරණය කිරීම හා සම්බන්ධ පුහුණු වැඩ සටහන් ද පවත්වන ලදි. ඒ අනුව කොළඹ නගරයේ ආදායම් රහිත ජල පරිමාව 40.2% සිට 39.12% දක්වා අඩු කර ගැනීමට හැකි වූ අතර බටහිර මධ්‍යම කලාපයේ ආදායම් රහිත ජල පරිමාව 30.7% සිට 29.53% ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය.

මහරගම හා කෝට්ටේ කළමනාකරණ ප්‍රදේශයන් තුළ සිදු කරන ලද වේගවත් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු හේතුකොට ගෙන මහරගම හා ගලවිලවත්ත පොම්පාගාරයන් ආශ්‍රිතව පැන නැගුන තීරණාත්මක තත්ත්වයක් හඳුනාගන්නා ලදි. අළුත් පොම්ප සපයාගෙන ස්ථාපිත කිරීම සඳහා මාස කිහිපයක් කල් ගත වන ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය විය. එම නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ තිබෙන මිනිස් බලය උපයෝගි කර ගනිමින් ධාරිතා වැඩි දියුණු කිරීම් ආයෝජන නොමැති ව්‍යාපෘතීන් යටතේ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අතර ඒ අනුව එකී වැඩ බිම් දෙක සඳහා සුදුසු පොම්ප වෙනත් වැඩ බිම් වලින් ලබා ගනිමින් 2020 අගෝස්තු මාසයට පෙර එකී ව්‍යාපෘතීන් සම්පූර්ණයෙන් නිම කරන ලදි.

මහරගම පොම්පාගාරයේ සවි කරනු ලැබ තිබුනේ පැයකට ඝණ මීටර 1580 ක ධාරිතාවයකින් යුත් පොම්ප 4 කි. එවකට එම පොම්ප 4 ම එක් විට සේවයේ යෙදවිය යුතුව තිබිණි. එම පොම්ප 4 වෙනුවට පැයකට ඝණ මීටර 1770 ක ධාරිතාවයකින් යුත් පොම්ප 4 ක් ස්ථාපිත කරන ලද අතර ඒ අනුව වැඩි දියුණු වූ ධාරිතාවය හේතුකොට ගෙන එක් වරකට පොම්ප 3 ක් පමණක් සේවයේ යෙදවීමේ හා එක් පොම්පයක් පොරොත්තු සේවයේ යෙදවීමේ හැකියාව ලැබුණි. එසේ පොම්ප 4 ක් අළුතින් සවි කරනු ලැබීමෙන් ධාරිතාවය පැයකට ඝණ මීටර 190 කින් ඉහළ ගිය හෙයින් අනාගතයේදී එම පොම්ප ප්‍රතිස්ථාපනය කරන තෙක් පොම්ප 4 ම එක් විට සේවයේ යෙදවීමේ අවශ්‍යතාවය මග හැරී ගියේය.

එසේම ගලවිලවත්ත පොම්පාගාරයේ සවි කරනු ලැබ තිබුනේ පැයකට ඝණ මීටර 190 ක ධාරිතාවයකින් යුත් පොම්ප 3 කි. එම පොම්ප 3 වෙනුවට පැයකට ඝණ මීටර 370 ක ධාරිතාවයකින් යුත් පොම්ප 3 ක් ස්ථාපිත කරන ලද අතර ඒ අනුව වැඩි දියුණු වූ පැයකට ඝණ මීටර 180 ක ධාරිතාවය හේතුකොට ගෙන එක් වරකට පොම්ප 1 ක් පමණක් සේවයේ යෙදවීමේ හා පොම්ප 2 ක් පොරොත්තු සේවයේ යෙදවීමේ හැකියාව ලැබුණි. එසේ පොම්ප 3 ක් අළුතින් සවි කරනු ලැබීමෙන් ධාරිතාවය පැයකට ඝණ මීටර 180 කින් ඉහළ ගිය හෙයින් අනාගතයේදී එම පොම්ප ප්‍රතිස්ථාපනය කරන තෙක් පොම්ප 3 ම එක් විට සේවයේ යෙදවීමේ අවශ්‍යතාවය මග හැරී ගියේය.

පුබිලි පොම්පාගාරයෙහි සේවයේ යොදවනු ලැබ ඇති පැයකට ඝණ මීටර 200 ක ධාරිතාවයකින් යුත් පොම්ප දෙක වෙනුවට ඉල්ලුම උපරිම තත්ත්වයට පත් අවස්ථාවන්හිදී සේවයේ යෙදවීම සඳහා පැයකට ඝණ මීටර 300 ක ධාරිතාවයකින් යුත් පොම්ප දෙකක් ලබාගෙන සවි කිරීමට හා දැනට සේවයේ යොදවනු ලැබ ඇති පැයකට ඝණ මීටර 800 ක ධාරිතාවයකින් යුත් පුබිලි බෙදා හැරීමේ පොම්පය වෙනුවට පොරොත්තු සේවා පහසුකම ලබා ගැනීමට හැකි වන පරිදි පැයකට ඝණ මීටර 1300 ක ධාරිතාවයකින් යුත් පොම්පයක් ලබාගෙන ස්ථාපිත කිරීම සඳහා පුනරුත්ථාපන වෙන් කිරීම යටතේ කටයුතු කරනු ලැබ ඇති අතර දැන එය ලංසු ප්‍රදානය කිරීමේ තත්ත්වයේ පවතී.

බල ශක්ති ඉතිරි කිරීමේ වැඩ කටයුතු වශයෙන් මාලිගාවත්ත නව ගොඩනැගිල්ලේ සෝපාන හා වායු සම්කරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේ වේලාවන් පාලනය කිරීම මගින් මසකට රු.40,000 ක මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වී ඇති අතර පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම් යටතේ නාගස්වත්ත පොම්පාගාරය තුළ ස්වයංක්‍රීය පොම්ප කිරීමේ ක්‍රමය යොදා ගැනීම තුළින් මසකට රු. 8,000 ක මුදලක් ඉතිරි කර ගත හැකි විය.

2020 වර්ෂය තුළදී කලාපය තුළ නිත්‍ය නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ සටහන් යටතේ (මිලි මීටර 90 හා මිලි මීටර 225 නල යොදාගනිමින්* කිලෝ මීටර 41 ක පමණ දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලද අතර මහරගම සංවර්ධනය වේගවත් කිරීමේ වැඩ සටහන හා සම්බන්ධව මෙහෙයුම් හා නඩත්තු අය වැය වෙන් කිරීම් යටතේ (මිලි මීටර 63 හා මිලි මීටර 90 නල යොදා ගනිමින් කිලෝ මීටර 198 ක පමණ දිගින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් / පොදු නල මාර්ග වළලීම් හා දේපල සංවර්ධන ඉඩම් සඳහා ජල සම්පාදන නල මාර්ග වළලීම් ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය සඳහා මුළු බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙනුවෙන් බිල් කිරීම රුපියල් මිලියන 8,890 ක් වූ අතර එය 106% ක සාක්ෂාත් වීමකි. ඒ අතර මුදල් අය කර ගැනීම රුපියල් මිලියන 7,725 ක් විය. ඒ අනුව මුදල් එකතු කර ගැනීමේ කාර්යක්ෂමතාවය 87% ක් වූ අතර ණය කාලය මාස 2. 2 ක් විය.

අවිස්සාවේල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් පෙන්ර්ත්වත්ත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වර්ධනය කිරීමේ කටයුතු දැනට ලංසු කැඳවීමේ අදියරේ ඇති අතර එම ජල සම්පාදන යෝජනා ක්‍රමයටම අයත් හල්තොටවත්ත තුළු මුව වැඩි දියුණු කිරීමේ කටයුතු ප්‍රලේඛන පිළියෙල කිරීමේ අදියරේ පවතී.

බටහිර - දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය බටහිර - දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්යාලයෙන් හා දෙහිවල කලාප කළමනාකාර කාර්යාලය, පානදුර-හොරණ කලාප කළමනාකාර කාර්යාලය හා කළුතර කලාප කළමනාකාර කාර්යාලය යන කලාප කළමනාකාර කාර්යාල 3 න් ද සමන්විත වේ.

ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ බොහෝ විශේෂ සිදු වීම් ක්‍රියාත්මක කරන ලද අතර 2020 වර්ෂය සඳහා පෙළ ගස්වනු ලැබ තිබි ඇතැම් විශේෂ වැඩ සටහන් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන කල් තැබීමට සිදු විය. 2018 / 2019 ජාතික ඵලදායිතා ත්‍යාග සඳහා සහ **S 5** සහතිකකරණය ලබා ගැනීමේ තරඟයට සහභාගි වීම සඳහා බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් අයැදුම් කරන ලදි. බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය විසින් කලාප කළමනාකරණ කාර්යාල තුන සමග එක් වී කළුතර ප්‍රදේශයේ තෝරාගත් පාඨශාලා කිහිපයක් තුළ චිත්‍ර ප්‍රදර්ශනයක් හා ජලය සංරක්ෂණය කිරීම පිළිබඳව දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් කිහිපයක් සංවිධානය කරන ලද අතර ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය තුළ භෞතික හා ජාලගත පුහුණු වැඩ සටහන් 17 ක සංඛ්‍යාවක් පවත්වන ලදි.

බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාල පරිශ්‍රය තුළ වාහන තුළ සිටියදීම බිල් ගෙවන ක්‍රමය ස්ථාපිත කිරීමේ කටයුතු දැනට සම්පූර්ණයෙන්ම නිමවනු ලැබ ඇති අතර එය ගණුදෙනු කරුවන් වෙනුවෙන් විවෘත කරනු ලැබ ඇත.

සියළු කළමනාකරණ කලාපයන් තුළ ඇති තොග මණු අළුත්වැඩියා කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම, බේරුවල හා දෙහිවල / මොරටුව ප්‍රදේශයන් තුළ ඇස්බෙස්ටෝ සිමෙන්ති නල මාර්ග ප්‍රතිස්ථාපනය කිරීම හා අල්විස් පෙදෙස ජලාශයෙහි කාන්දු අළුත්වැඩියා කිරීම මගින් ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමට ක්‍රියා කරන ලදි. විශේෂිත වශයෙන්ම ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය මගින් ප්‍රදානය කරන ලද "ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ මෙහෙයුම් කාර්යක්ෂතාවය හා වත්කම් කළමනාකරණ හැකියාව නංවා ලීම" නම් වූ ව්‍යාපෘතිය පානදුර තෝරාගත් නියමු කලාපය තුළ ක්‍රියාශීලී කාන්දු පාලනය වෙත අවධානය යොමු කරමින් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

බේරුවල හා සොයිසාපුර පොම්පාගාරයන් තුළ ඉහළ ඔසොව් පොම්ප කිරීමේ කට්ටල ස්ථාපිත කිරීම වැනි බල ශක්ති ඉතිරි කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා අරමුදල් ලැබුණ ප්‍රභවයන් වූයේ පිළිවෙලින් බල ශක්ති හා පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම් විය.

ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම කිහිපයක් ඇතුළු ප්‍රදේශ කිහිපයක් තුළ ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ කටයුතු හා ජල සුරක්ෂණ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ප්‍රජා මූල සංවිධාන යෝජනා ක්‍රම 132 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරනු ලබමින් තිබුණ අතර එවැනි යෝජනා ක්‍රම 20 ක සංඛ්‍යාවක් ප්‍රතිලාභී පවුල් 76500 ක සංඛ්‍යාවක් වෙත සේවා සම්බන්ධතාවයන් 17000 ක් සපයා දෙමින් දැනට සේවා සම්පාදනය කරමින් පවතී. කලාපයේ ජල සුරක්ෂිතතා සැලැසුම් මුළු සංඛ්‍යාව වූ 10 ම මේ වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඒ අතුරින් ජල සුරක්ෂිතතා සැලැසුම් පහක් සංශෝධනයට භාජනය කරනු ලැබ ඇත.

මීට අමතර වශයෙන් (කළුතර කලාපය තුළ කිලෝ මීටර 20.17 ක දිග ප්‍රමාණයකින් ද, පානදුර - හොරණ කලාපය තුළ කිලෝ මීටර 35.16 ක දිග ප්‍රමාණයකින් හා දෙහිවල කලාපය තුළ කිලෝ මීටර 2.57 ක දිග ප්‍රමාණයකින් සමන්විත වූ) කිලෝ මීටර 57.9 ක මුළු දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් ප්‍රස්තුත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. ප්‍රස්තුත වර්ෂය මුළුල්ලේ සියළුම කළමනාකරණ කලාපයන් තුළ බොහෝ ප්‍රති ආරෝපණය කළ හැකි ක්‍රියාකාරකම් හා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රදේශය තුළ බල පැවැත්වූ වියලි කාල ගුණික තත්ත්වය හේතුකොට ගෙන කළුතර කළමනාකරණ කලාපය උග්‍ර ලවණතා ආක්‍රාන්තියකට මුහුණ දුන්නේය. එම ගැටළුවට තාවකාලික විසඳුමක් වශයෙන් මුළු කළුතර කළමනාකාර කලාපය ආවරණය වන සේ බවුසර මගින් ජලය සැපැයීමේ වැඩ පිළිවෙලක් දියත් කරන ලදි. එකී ගැටළුවට මධ්‍ය කාලීන විසඳුමක් වශයෙන් වියලි දේශගුණික කාලය තුළදී කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත අමු ජලය සම්ප්‍රේෂණය කිරීම පිණිස කොලේමෝදර තුළු මුවක් ඉදි කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි. ඊට වැඩිමනත් වශයෙන් කළු ගඟේ පුනිල මෝය ආසන්නයේ ලවණතා බාධකයක් ඉදි කිරීම සඳහා වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් දැනට සාධ්‍යතා අධ්‍යයනයක් කරනු ලබමින් පවතී.

පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘතීන් 2020 - 2025 සංස්ථානික සැලැසුම තුළට ඇතුලත් කරනු ලැබ ඇත: ඉංගිරිය ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමේ කටයුතු හා කඳාන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව වැඩි දියුණු කිරීම වසේ ඇතුළු කරනු ලැබ ඇති ප්‍රධාන ව්‍යාපෘති දෙකකි, ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී සැලැසුම් කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලද ව්‍යාපෘතීන් වූයේ අල්විස් පෙදෙස සිට වාද්දුව දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය එලීම හා කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට මධ්‍යම හන්දිය දක්වා මිලි මීටර 500 ක විෂ්කම්භයකින් යුත් මෘදු යකඩ නල මාර්ගය එලීම ද වේ. ඊට අමතර ලෙස කළුතර දිස්ත්‍රික්කයේ මතුගම - අගලවත්ත ප්‍රදේශයේ බෙදා හැරීම් විස්තාරණය කිරීමට හා කෙත්හේන වැඩි දියුණු කිරීම් හා විස්තාරණ ව්‍යාපෘතියට අදාල පෙර සාධ්‍යතා අධ්‍යයනය ආරම්භ කරනු ලැබ ඇත. කළු ගඟ ජලාධර ආරක්ෂණය සඳහා වූ බහු පරදු ධාරී ප්‍රවේශය හා සම්බන්ධ පෙර සාධ්‍යතා අධ්‍යයනය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

පානදුර - හොරණ කලාප කළමණාකරණ ප්‍රදේශයේ සේවා ආවරණය වැඩි දියුණු කිරීම සඳහා ඉන්ගිරිය - හඳපාන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය යෝජනා කරනු ලැබේ.

සියළු කලාපයන් තුනම තුළ මණු කියවීම් උපයෝග මෘදුකාංගය භාවිතා කරමින් මණු කියවීම් 100 % ක් ලබාගනු ලැබ ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විශේෂ විමර්ෂණ ඒකකය විසින් 2020 වර්ෂය තුළදී බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ නීති විරෝධී සම්බන්ධතාවයන් 26 ක සංඛ්‍යාවක් තිබුණ බවට තහවුරු කරනු ලැබ ඇත.

බටහිර උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථාන කලාපය වීම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයෙන් හා කළමනාකරු (කැළණිය) කලාප කාර්යාලයෙන් හා කළමණාකරු (ගම්පහ) කලාප කාර්යාලයෙන් ද සමන්විත වේ.

බටහිර උතුර කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය හා කලාප කළමනාකාර කාර්යාල දෙක විසින් 2020 වර්ෂයේදී 2018 / 2019 ජාතික ඵලදායිතා ප්‍රදානයන් හා **5 S** සහතික තරඟය සඳහා අයැදුම් කරන ලදි. මීගමුවේ රසායනාගාරය ජාතික ඵලදායිතා ආයතනයේ **5 S** සහතිකය දිනා ගත්තේය. බටහිර උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් තොරතුරු තාක්ෂණ යෙදවුම් හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ කටයුතු ඉලක්ක කරමින් භෞතික හා මාර්ගස්ථ පුනුණු කිරීම් වැඩ සටහන් 12 ක සංඛ්‍යාවක් පවත්වන ලදි. මෙහෙයුම් හා නඩත්තු කටයුතු පහසුකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ යෙදවුම් කිහිපයක් හඳුන්වා දෙන ලද අතර ගණු දෙනුකාර ස්ථාන අතුරින් ආසන්න වශයෙන් 90 % ක් පමණ හා නල මාර්ග ජාලයෙන් 85 % ක් පමණ මේ වන විට සංඛ්‍යාංක බවට පරිවර්තනය කරනු ලැබ ඇත.

ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ කටයුතු සඳහා වැය කරනු ලැබීමට බටහිර උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත රුපියල් මිලියන 19.9 ක වෙන් කිරීමක් ලැබුණ අතර එම වෙන් කිරීම ජල කුළුණු අළුත්වැඩියා කිරීම හා ඒවායේ නඩත්තු කටයුතු කිරීම සඳහා මෙන්ම රන්පොකුණගම ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් දිස්ත්‍රික් මානක ප්‍රදේශ (DMA) පද්ධතියක් ස්ථාපිත කිරීමට හා එම ප්‍රදේශයන් තුළ ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම ඉලක්ක කරමින් ඇස්බෙස්ටෝ සිමෙන්ති නල පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ද වැය කරන ලදි.

බල ශක්ති ඉතිරි කර ගැනීමේ වැඩ කටයුතු යටතේ ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී පොම්ප භාවිතය ප්‍රශස්තිකරණය කිරීම හා සූර්ය බල ශක්ති පැනල ස්ථාපිත කිරීම වැනි වැඩ කටයුත ක්‍රියාත්මක කරන ලදි.

භාණ්ඩ තොග මට්ටම් අඩු කිරීම සඳහා කුඩා ගබඩා ඒකාබද්ධ කිරීම හා වසර දහයකට වැඩි කාලයක් මුළුල්ලේ නිකුත් නොකර ඇති භාණ්ඩ හඳුනා ගැනීම හා එම භාණ්ඩ තෙලවල පිහිටි ප්‍රධාන ගබඩාව වෙත භාර දීම සිදු කරන ලදි. ගබඩාරණය හා සම්බන්ධ ක්‍රියාකාරකම් පහසුකරණය කිරීමේ පරමාර්ථය සහිතව බඩු වට්ටෝරු (Inventory) කළමනාකරණ ක්‍රමය හඳුන්වා දෙන ලදි.

ගම්පහ හා කැළණිය ප්‍රදේශයන් තුළ ඇති මහජන ආයතන, ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම, පෞද්ගලික ආයතන හා පොදු ලිං ආශ්‍රිතව ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ වැඩ කටයුතු හා ජල සුරක්ෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය තුළ ආසන්න වශයෙන් රුපියල් මිලියන 14 ක් වටිනා වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදි. ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 6 ක සංඛ්‍යාවක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමට අදාලව අභ්‍යන්තර විධිමත් විගණනයන් පැවැත්වීම සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඒවා අතුරින් බියගම ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රදේශයේ බෙදා හැරීම් පද්ධතිය විසින් ලකුණු 107 ක් ලබා ගන්නා ලද අතර එය ශ්‍රී ලංකාව තුළ වාර්තා වී ඇති ඉහළම ලකුණු සංඛ්‍යාව විය.

මීට අමතර වශයෙන් ප්‍රස්තුත වර්ෂය තුළදී ආසන්න වශයෙන් කිලෝ මීටර 50 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් සම්පූර්ණයෙන් නිම කරන ලදි. තවද රුපියල් මිලියන 115 ක අගයකින් යුත් ප්‍රති ආරෝපණය කළ හැකි හා පුනරුත්ථාපන වැඩ කටයුතු ද වර්ෂය පුරාම කලාපය තුළ ක්‍රියාත්මක කරන ලදි.

වියලි කාල ගුණ කාලය තුළදී ජල හිඟතාවයන් පාලනය කිරීම පිණිස බවුසර මඟින් ජලය සැපැයීම හා කපාට පාලනය වැනි ක්‍රමයන් භාවිතා කරන ලද අතර එමෙන්ම ජල ගැටළු සම්බන්ධයෙන් මහජනයාගෙන් ලැබෙන විවිධ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම හා එම ඉල්ලීම් වෙනුවෙන් කෙටි කාලීන විසඳුම් ලබා දීම ද සිදු කරන ලදි.

මීරිගම හා බටලීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජලයෙහි අන්තර්ගත අතිරික්ත යකඩ සංයුතිය ඉවත් කොට ජලයේ ගුණාත්මය වැඩි දියුණු කිරීම ඉලක්ක කොට ගනිමින් පර්යේෂණ අධ්‍යයනයන් සිදු කරන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2020 - 2025 සංස්ථානික සැලැසුම තුළට ඇතුලත් කළ යුතු කරුණු ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් පිළියෙල කරන ලද අතර කලාපය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා පරිමාණ ව්‍යාපෘති දෙකක් වූ මීරිගම හා දිවුලපිටිය ව්‍යාපෘතීන්ට අදාල විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම එම අංශය විසින් ආරම්භ කරනු ලැබ ඇත. ඒ අතර මධ්‍ය කාලීන ක්‍රමෝපායික ව්‍යාපෘතීන් හයක් වෙනුවෙන් විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම ඇතුළු ප්‍රතිසම්පාදනය සඳහා අවශ්‍ය සියළුම වැඩ කටයුතු ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත.

මාර්ග සංවර්ධන අධිකාරියේ කිලෝ මීටර 100000 වැඩ සටහන වෙනුවෙන් ප්‍රතිසම්පාදන කටයුතු හා නල වැලීමේ කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සමග සමීප ලෙස සම්බන්ධීකරණය වෙමින් ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී ආරම්භ කරන ලදි. එම අදාල කටයුතු වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා සහ ගැටළුසහගත තත්ත්වයන් සාකච්ඡා කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත නිලධාරීන් සමග සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදි.

දකුණු පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

දකුණු පලාත තුළ රුහුණුපුර හා මුරුතවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා සම්බන්ධ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව පවත්වන ලද අභ්‍යන්තර විධිමත් විගණනයක ප්‍රතිඵල අනුව 100 කට අධික ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන ඇති අතර ඒ අනුව "හොඳයි" යන ශ්‍රේණිය දිනාගනු ලැබ ඇත.

බල ශක්ති සංරක්ෂණය කිරීමේ අරමුදල යටතේ විසල් ගාල්ල තුළු මුව සඳහා පැනල් පුවරුව සහිත සිරස් වා රෝද පොම්ප 3 ක සංඛ්‍යාවක් සවි කිරීම හා දික්වැල්ල අරාගේන ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා කේන්ද්‍රාපසාරී පොම්ප කිරීමේ කට්ටලයක් සවි කිරීම ද සිදු කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම් යටතේ බොහෝ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ බද්දේගම හා වක්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සඳහා රසායනික මාත්‍රා පෝම්ප මිළයට ගැනීම හා සවි කිරීම ද, වැවහමන්දුව පොම්පාගාරය සඳහා ඉහළ ඔසොවි පොම්පයක් සවි කිරීම ද, නාදුගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා පිළි සෝදු වාත ධමනිකරයක් හා පාලන පැනලයක් සවි කිරීම ද, දකුණු පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ අකුණු වලින් ආරක්ෂා වීමේ උපකරණ ක්‍රම පද්ධතියක් සවි කිරීම හා තිහගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ නව විදුලි ජනන යන්ත්‍රයක් ස්ථාපිත කිරීම ද සිදු කරන ලදි. වක්වැල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සම්පිණ්ඩක ව්‍යුහයන් හා ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීම ද, බතිගම හා කුඩාවැල්ල පාලම් වල වානේ කාප්පය පුනරුත්ථාපනය කිරීම හා කච්චේරිය කන්ද ජල කුළුණ පුනරුත්ථාපනය කිරීම ද ක්‍රියාත්මක කරන ලදි. වැවහමන්දුව පොම්පාගාරය හා ප්‍රවේශ මාර්ගය සහ රුවන්වැල්ල ජල කුළුණ ඉදි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. කුඩාවැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් ඌරාපිලිස්සු පාරේ පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය නැවත වැලීමේ කටයුතු සිදු කරන ලදි. මුරුතවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය හා සම්බන්ධ පෙරන මාධ්‍යය හා කිරිඳිඔය ඇලම් මාත්‍රා ටැංකිය ප්‍රතිස්ථාපනය කරන ලදි.

පැරණි ජල මණු වෙනුවට නව ජල මණු යෙදීම මඟින්, නීති විරෝධී සම්බන්ධතාවයන් පරීක්ෂණයට බඳුන් කිරීම මඟින්, දෝෂ සහගත ජල මණු වෙනුවට අළුත් ජල මණු යෙදීම මඟින්, ශූන්‍ය අගයක් පෙන්නුම් කරන බිල් පත් හා ඇස්තමේන්තු කරන ලද බිල් පත් පරීක්ෂණයට බඳුන් කිරීම මඟින් හා රාත්‍රි කාලයේ සිදු වන කාන්දු වීම් සමීක්ෂණයට භාජනය කිරීම මඟින් ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා පියවර ගන්නා ලදි.

ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ කටයුතු හා ජල සුරක්ෂණ ක්‍රියාකාරකම් ඇතැම් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ඇතුළු ප්‍රදේශ කිහිපයක් තුළ ක්‍රියාත්මක කරන ලදි. ආරක්ෂිත ජල සම්පාදනයක් සහතික කිරීම සඳහා මාතර ප්‍රදේශය තුළ ජල නියැදි 3108 ක් ද, හම්බන්තොට ප්‍රදේශය තුළ ජල නියැදි 5583 ක් හා ගාල්ල ප්‍රදේශය තුළ ජල නියැදි 2123 ක් පරීක්ෂණයට භාජනය කරන ලදි.

මාතර හා හම්බන්තොට ප්‍රදේශයන් තුළ සිතියම්කරණ වැඩ කටයුතු 100 % ක් සම්පූර්ණ කරනු ලැබ ඇති අතර ගාල්ල ප්‍රදේශය තුළ සිතියම්කරණ කටයුතු වල ප්‍රගතිය 85 % ක් වේ.

ප්‍රථමාධාර දීම, ස්ථාවර වත් කම් හරි වැරදි බැලීම, මූලික MS Exel – Word, නව සම්බන්ධතා ඇස්තමේන්තු පිළියෙල කිරීමේ ක්‍රම, වට්ටෝරු පොත් (Inventory) කළමනාකරණ ක්‍රම, ආදායම් රහිත ජලය කළමනාකරණය කිරීම හා භූගෝලීය තොරතුරු පද්ධතිය පදනම් කර ගත් ජල වත්කම් කළමනාකරණය, පෙරීම් කිරීමේ ක්‍රියාවලිය, මාර්ගස්ථ ගබඩා කළමනාකරණ ක්‍රමය හා මැණුම් උපකරණ ක්‍රමාංකනය කිරීම වැනි ක්ෂේත්‍රයන් කිහිපයක් සම්බන්ධ පුහුණු වැඩ සටහන් පවත්වන ලදි.

ගාල්ල කලාපය තුළ පවත්වාගෙන යනු ලබන තොග මට්ටම් අඩු කිරීම සඳහා ඉල්ලුමක් නොමැති හා අඩු ඉල්ලුමක් ඇති අයිතමයන් හඳුනා ගැනීමෙන් පසුව ඒවා අවශ්‍ය වැඩ බිම් වෙත මාරු කර යවන ලදි.

සියළුම කලාපයන් තුළ කිලෝ මීටර 50 ක පමණ දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරනු ලැබ ඇත. ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යටතේ හක්මන මාර්ගයේ කිලෝ මීටර 4 ක් දිග ව නල වැලීම් 100 % ක් නිම කරනු ලැබ ඇති අතර අඟුනකොලපැලැස්ස පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය වැලීම 95 % ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. ඒ අතර හම්බන්තොට ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාලව ප්‍රමාණාධිකතාව වැඩි දියුණු කිරීමේ කටයුතු යටතේ උඩමලල ප්‍රදේශයේ කිලෝ මීටර 1.5 ක දිගින් යුත් නල වැලීම සිදු කරනු ලැබ ඇත. ගොන්නෝරුව, සූරියවැව හා මවුසිරිගම යන හේතුවක් නොදන්නා නිදන්ගත වකුගඩු රෝගයට තදින්ම ගොදුරු වී ඇති ප්‍රදේශයන් තුළ නල වැලීමේ වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත.

2020 - 2025 සංස්ථානික සැලැසුම තුළට මාතර කලාපය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හතක් ද, ගාලු කලාපය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හතරන හා හම්බන්තොට කලාපය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් එකොලහක ද වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම අරමුණු කොට ගත් ප්‍රධාන ව්‍යාපෘතීන් වලට අදාල වැඩ කටයුතු ඇතුලත් කරනු ලැබ ඇත.

ඒ අතුරින් ඇතැම් ව්‍යාපෘතීන්ට අදාල සැලැසුම් කිරීමේ හා ප්‍රලේඛනගත කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිමා කොට ඇති අතර අනිකුත් ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් වූ සාධ්‍යතා අධ්‍යයනයන් සම්පූර්ණයෙන් නිමා කොට හෝ දැනට කරගෙන යන තත්ත්වයේ ඇත.

බොහෝ ප්‍රදේශයන් තුළ ඇති ජල සැපැයුම ප්‍රමාණවත් නොවීම හේතුකොට ගෙන දකුණු පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට බොහෝ ගැටළු වලට මුහුණ දීමට සිදු විය. නාදුගල හා කනංකේ තුළු මුව තුළට සිදු වන ලවණ ආක්‍රාන්තිය වැලැක්වීම සඳහා නිල්වලා ගඟ

හා පොල්වතුමෝදර ගඟ හරහා තාවකාලික ලවණතා බාධකයන් ඉදි කරනු ලැබීමට සිදු විය. ඇතැම් ප්‍රදේශයන් තුළ දිගින් දිගටම ජල ගුණාත්මය හා සම්බන්ධ ගැටළු පවතී. මාතර හතර වැනි ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමෙන් අනතුරුව ඇතැම් ගැටළු විසඳගත හැකි විය.

උතුරු මැද පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

අනුරාධපුර කලාපය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රම 20 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. 2020 වර්ෂය සඳහා වූ බිල් කිරීමේ ඉලක්කය රුපියල් මිලියන 843.83 ක් වූ අතර ඉලක්කය සාක්ෂාත් කර ගැනීම රුපියල් මිලියන 940.16 ක් විය. එය 111.42 % ක සාක්ෂාත් වීමක් විය. 2020 වර්ෂය සඳහා වූ මුදල් රැස් කර ගැනීමේ ඉලක්කය රුපියල් මිලියන 871.18 ක් වූ අතර එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම රුපියල් මිලියන 889. එය 102.15 % ක සාක්ෂාත් කර ගැනීමක් විය.

පොලොන්නරුව කලාපය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රම 12 ක මුළු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් පවතී. 2020 වර්ෂයේ අවසානය වන විට පිහිටුවනු ලැබ තිබි බිල් කිරීමේ ඉලක්කය හා එය සාක්ෂාත් කර ගැනීම පිළිවෙලින් රුපියල් මිලියන 395.33 ක් හා රුපියල් මිලියන 482.91 ක් වූ අතර එය 122.15% ක සාක්ෂාත් වීමකි. 2020 දෙසැම්බර් අවසානය වන විට පිහිටුවාගනු ලැබ තිබුණ මුදල් රැස් කර ගැනීමේ ඉලක්කය හා එය සාක්ෂාත් කර ගැනීම පිළිවෙලින් රුපියල් මිලියන 410.44 ක් හා රුපියල් මිලියන 445.65 ක් වූ අතර ය 108.58 % ක සාක්ෂාත් වීමක් විය.

උපයෝගිතා විතැන් කිරීම, හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය, පුනරුත්ථාපන, ප්‍රති ආරෝපණය කළ හැකි, මෙහෙයුම් හා නඩත්තු හා ග්‍රාමීය ජල සම්පාදන යන අරමුදල් වෙනුවෙන් ටෙන්ඩර් ප්‍රලේඛන 22 ක සංඛ්‍යාවක් පිළියෙල කොට ක්‍රියා සන්තතිගත කරන ලදි. අදාල වැඩ වල වටිනාකර රුපියල් මිලියන 144.44 ක් විය. ගල්නෑව, තුරුවිල, නුවර වැව, තිසා වැව, මින්නේරිය හා ගල්ලෑල්ල යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා සම්බන්ධ මා වැඩ වැඩි දියුණු කිරීම් වලට අදාල සැලැසුම් ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයේ සහාය ලබා ගනිමින් උතුරු මැද පලාතේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් නිම කරන ලදි.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 22 ක සංඛ්‍යාවක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් වලට අදාල වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. ජල සුරක්ෂිතතා සැලැසුම් 12 ක් තුළ 11 ක් දක්වා වූ මොඩියුල සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර අවධිමත් අභ්‍යන්තර විගණනයන් 4 ක සංඛ්‍යාවක් පවත්වනු ලැබ ඇත. අනුරාධපුර උතුර ව්‍යාපෘති ප්‍රදේශය තුළ ප්‍රජා මූල සංවිධානයන් වෙත භාර දීමේ වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි.

පුනරුත්ථාපන අය වැය වෙන් කිරීමේ හා ආදායම් රහිත ජලය අය වැය වෙන් කිරීමේ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 84 % ක් හා 8.6 % ක් විය. පිබිදෙමු පොලොන්නරුව සංවර්ධන ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 96.23% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 71.08% ක් විය. ඒ අතර මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 99% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 86% ක් විය.

නිෂ්පාදන ලිං 35 ක සංඛ්‍යාවක විදමන් ක්‍රියාකාරකම් සිදු කරන ලදි. මේ අතර් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 4 ක් තුළ අළුත් ලිං 40 ක විදමන් කටයුතු කරන ලදි. මීට අමතර වශයෙන් ලිං 34 ක සංඛ්‍යාවක් සෝදා හැර සංවර්ධනය කරන ලද අතර ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී අත් පොම්ප 30 ක සංඛ්‍යාවක් අළුත්වැඩියා කරන ලදි. තවද ප්‍රස්තුත වර්ෂය තුළදී ජල විද්‍යාත්මක අධ්‍යයනයන් 35 ක සංඛ්‍යාවක් පවත්වන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 වැනි අදියරට අදාල වැඩ කටයුතු හා තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ කටයුතු සිදු කරනු ලබමින් පැවැතිනි. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 11 වැනි අදියරට අදාල උපදෙස් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 90% ක් වූ අතර එහි ඉදි කිරීම් කටයුතු 2021 වර්ෂය තුළදී ආරම්භ කරනු ලැබීමට නියමිත වේ.

අනුරාධපුර හා පොලොන්නරුවේ යෝජිත ව්‍යාපෘතීන් සඳහා ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු (ඉඩම් කොටස් 68 ක සංඛ්‍යාවක්) දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. වාර්ෂික වත් කම් හරි වැරදි බැලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර උතුරු මැද පලාතේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය භාරයේ ඇති වත් කම් වල වටිනාකම රුපියල් මිලියන 1.718.9 ක් වේ. දැයට කිරුළ, මින්නේරිය, මැදිරිගිරිය, කලාවැව හා රණවිරුගම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ප්‍රාග්ධනායන කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදි.

ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (ISO) 17025 ලබා ගැනීම සඳහා රසායනාගාර පහසුකම් හා ජල ගුණාත්ම ක්‍රියාකාරකම් වැඩි දියුණු කරනු ලැබ ඇත. අවශ්‍ය පුහුණු කිරීම් Physikalisch Technische Bundesansdalt (PTB) ව්‍යාපෘතිය මගින් ලබා දෙන ලදි.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ ඵලදායිතාව නංවා ලීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. දෙසැම්බර් මාසයේ අවසානය වන විට ජල කාන්දු වීම් 10568 ක් හඳුනාගෙන නිවැරදි කිරීම මගින් අනුරාධපුරයේ ආදායම් රහිත ජල පරිමාව 15.6% ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. ඒ මෙන්ම දෙසැම්බර් මාසයේ අවසානය වන විට ජල කාන්දු වීම් 5418 ක් හඳුනාගෙන නිවැරදි කිරීම මගින් පොළොන්නරුවේ ආදායම් රහිත ජල පරිමාව 22.8 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය.

ප්‍රස්තුත වර්ෂය තුළදී රුපියල් 41,398.00 ක මුදලක් ආයෝජනය කරමින් සේවක මණ්ඩල සාමාජිකයින් සඳහා පුහුණු කිරීමේ වැඩ සටහන් 04 ක සංඛ්‍යාවක් මෙහෙයවන ලදි.

වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

2020 වර්ෂය සඳහා වූ පාරිසරික ආරක්ෂණ බල පත්‍රය විසල් කුරුණෑගල ජලය බේරා ගැනීමේ පද්ධතිය විසින් දිනා ගන්නා ලදි. වර්ෂය තුළදී නව පල්දෝරු සම්බන්ධතාවයන් 45 ක් ලබා දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් රුපියල් මිලියන 9 ක මුදල් ප්‍රමාණයක් උපයාගන්නා ලදි.

වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා කළමනාකරු (මෙහෙයුම් හා නඩත්තු) කාර්යාලයන් විසින් 2019.11.01 දින සිට 2022.10.30 දිනය දක්වා බල පවත්වනු ලබන පරිදි ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශයේ (ISO) 9001 : 2015 පද්ධති සහතික කිරීම ලබා ගැනීමට සමත් වන ලදි. විසල් කුරුණෑගල ජලය බේරා ගැනීමේ පද්ධතිය තුළ කිලෝ වොට් 130 ක නව සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපනය කරන ලදි. මාකඳුර පිහිටි වයඹ විශ්ව විද්‍යාලය හා දන්කොටුව මාළු වෙළෙඳ පොල වෙනුවෙන් සැලැසුම් හා උපදේශක කාර්යයන් කිහිපයක් ඉටු කර දෙන ලද අතර මාවතගම ආයෝජන මණ්ඩලය වෙනුවෙන් සාධ්‍යතා අධ්‍යයනයක් පවත්වන ලදි.

රජයේ ඉලක්කය අවබෝධ කර ගැනීමෙන් පසුව එය අනුගමනය කරමින් විසල් කුරුණෑගල ජලය බේරා ගැනීමේ පද්ධතිය තුළ සනීපාරක්ෂණ ප්‍රධාන සැලැසුමට අදාල කටයුතු ආරම්භ කරන ලදි. ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී යෝජිත විසල් කුරුණෑගල පුතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා අක්කර 13 ක ඉඩමක් අත් පත් කර ගන්නා ලදි.

නව පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා වූ සැලැසුම් කිරීමේ වැඩ කටයුතු විසල් කුරුණෑගල ජලය බේරාගැනීමේ පද්ධතිය තුළදී සිදු කරනු ලැබේ.

කිලෝ මීටර 14 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නල මාර්ග දීර්ඝ කිරීමට අදාල සැලැසුම් පිළියෙල කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම ප්‍රස්තුත වර්ෂය තුළදී සිදු කරන ලද අතර කිලෝ මීටර 4.5 ක දිග ප්‍රමාණයකින් යුත් සරල කරන ලද නල මාර්ග දීර්ඝ කිරීමේ යෝජනා දැනට ප්‍රතිසම්පාදන අවස්ථාවෙහි ඇත.

පුනරුත්ථාපන අය වැය වෙන් කිරීමෙන් 69% ක්, එනම් රුපියල් මිලියන 83.73 ක් නාත්තන්ඩිය හා කාක්කාපල්ලිය යන දැනට ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමයන් හා රහමත්නගර්හි පිහිටි පැරණි ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සහ පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීමේ කටයුතු සඳහා වැය කරන ලදි.

දඹදෙනියේ පිහිටි පැරණි මිහි විදමන හා සම්බන්ධ කිරීම මගින් ගිරිඋල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ නිෂ්පාදන මට්ටම ඉහළ නංවන ලදි. ආදායම් රහිත ජල පරිමාව අවම කිරීම සඳහා වූ අය වැය වෙන් කිරීමෙන් 27.14% ක්, එනම් රුපියල් මිලියන 24.42 ක මුදල් ප්‍රමාණයක් විද්‍යුත් චුම්බක ප්‍රවාහ මනු ස්ථාපිත කිරීම සඳහා ද, වෑල්ව කූට් ඉදි කිරීම සඳහා සහ දඹදෙනිය, නිකවැරටිය, වාරියපොල හා ගිරිඋල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ බෙදා හැරීමේ පද්ධතීන් වැඩි දියුණු කිරීම සඳහා සහ වීලුවන්කුලමේ ඉදි කරනු ලැබ ඇති තුළු මුව අමුණ කඩා වැටීම නිසා පැන නැග ඇති විශාල ගැටළුව තාවකාලික ලෙස අබිභවා යාම සඳහා ද වැය කරන ලදි. මීට අමතර ලෙස වීලුවන්කුලමේ ඉදි කරනු ලැබ ඇති අමුණ වැඩි දියුණු කිරීමේ ගාස්තුව වශයෙන් වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 3.4 ක මුදල් ප්‍රමාණයක් ද ගෙවන ලදි.

බිංගිරියේ ක්‍රියාත්මක කරන ලද කිලෝ මීටර 52 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් ආසියානු සංවර්ධන බැංකුවේ 5 වැනි ව්‍යාපෘතිය වෙතින් ලබා ගන්නා ලදි. මදුරන්කුලියේ ස්වශක්ති ප්‍රජා මූල සංවිධානය පුත්තලම බෙදා හැරීමේ පද්ධතිය හා සම්බන්ධ කරන ලද අතර වී හරහා නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 1600 ක සංඛ්‍යාවක් පද්ධතියට එකතු කරන ලදි.

පිහිටුවන ලද ඉලක්කයෙන් 136% ක් සාක්ෂාත් කර ගනිමින් නව සම්බන්ධතාවයන් 7455 ක සංඛ්‍යාවක් සම්පාදනය කර දෙන ලදි. බිල් කිරීමේ ප්‍රගතිය රුපියල් මිලියන 788.81 ක් වූ අකර එය පිහිටුවන ලද ඉලක්කය 105% කින් සාක්ෂාත් කර ගැනීමකි. පිහිටුවන ලද ගාස්තු රැස් කිරීමේ ඉලක්කයෙන් 93% ක් සාක්ෂාත් කර ගන්නා ලද අතර ඒ අනුව රැස් කර ගැනීමට හැකි වූ මුළු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 711.38 ක් විය. ඒ අතර ජලය විකිණීම සඳහා පිහිටුවා ගනු ලැබ තිබුණ ඉලක්කයෙන් 93% ක් සාක්ෂාත් කර ගත හැකි වූ අතර එයින් රුපියල් මිලියන 65 ක මුදලක් වාරියපොල ක්‍රියාත්මක කරමින් තිබුණ පොම්ප වෙනුවට අළුත් පොම්ප සවි කිරීම සඳහා වැය කරන ලද අතර බල ශක්ති ඉතිරි කිරීමේ අය වැය වෙන් කිරීම උපයෝගී කර ගනිමින් විසල් කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතිය තුළ, නාත්තන්ඩිය ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ හා වෙන්නප්පුව ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ සූර්ය බල ශක්ති පද්ධති ස්ථාපනය කරන ලද අතර ඒ හරහා වාර්ෂිකව ඉතිරි කර ගත හැකි වන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 8.5 ක් වනු ඇත. ආරක්ෂක තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 8 ක සංඛ්‍යාවක් තුළ සංවෘත පරිපථ රූප වාහිනී (CCTV) කැමරා සවි කරන ලදි. ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ අරමුදල් භාවිතා කරමින් ඉදි කරන ලද නව කර්මාන්ත ශාලාවේ සියළුම වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා වූ අය වැය වෙන් කිරීමෙන් රුපියල් මිලියන 13.76 ක මුදල් ප්‍රමාණයක් හෙට්ටිආරච්චිගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් හා අම්බුක්කගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් වැය කරනු ලැබ ඇති අතර හෙට්ටිආරච්චිගම වැඩ කටයුතු වලින් 95% ක ප්‍රතිශතයක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර අම්බුක්කගම වැඩ කටයුතු 100% ක්ම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මාරගම, දිද්දෙනිය වත්ත, මුසල්පිටිය හා තොරනෙගෙදර ජල සම්පාදන ව්‍යාපෘතීන්ට අදාල වැඩ කටයුතු වෙනුවෙන් ග්‍රාමීය ජල සම්පාදන අය වැය වෙන් කිරීමෙන් රුපියල් මිලියන 35.77 ක මුදල් ප්‍රමාණයක් වැය කරන ලද අතර ඒ අතුරින් මාරගම හා දිද්දෙනිය වත්ත වැඩ කටයුතු 100% ක් සම්පූර්ණයෙන් නිමවනු ලැබ ඇති අතර මුසල්පිටිය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු 85% ක් හා තොරනෙගෙදර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු 50% ක් නිම කරනු ලැබ ඇත.

මාකඳුර, පන්නල, බිංගිරිය හා උඩුබද්දාව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල සාධ්‍යතා වාර්තාව අනුමැතිය සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව (P A C) වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

බෙදා හැරීම් පද්ධතිය තුළින් ලබා ගන්නා ජල නියැදි 250 ක සංඛ්‍යාවක් මාස් පතා රසායනික, භෞතික හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ගුණාත්මක තත්ත්වය මැණ බැලීම සඳහා පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. මුළු කලාපයම ආවරණය වන සේ ජල සුරක්ෂිතතා සැලැසුම් 11 ක් ක්‍රියාත්මක කරනු ලැබේ. නාරම්මල, බිංගිරිය හා දන්කොටුව වෙනුවෙන් වූ සියළුම ජල සුරක්ෂිතතා සැලැසුම් මොඩියුල සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර සෙසු මොඩියුලයන්ගෙන් කොටසක් නිම කරනු ලැබ තිබේ.

ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 20 අතුරින් යෝජනා ක්‍රමයන් 7 ක වැඩ සම්පූර්ණයෙන් නිමවනු ලැබ ඇති අතර යෝජනා ක්‍රමයන් 5 ක වැඩ කටයුතු කොටස් වශයෙන් නිම කරනු ලැබ තිබේ. මෙම වැඩ කටයුතු සඳහා භාවිතා කරන ලද්දේ වයඹ සංවර්ධන අරමුදල වෙතින් මුදා හරින ලද ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් වේ. බිංගිරිය අපනයන ප්‍රවර්ධන කලාපය දක්වා නල මාර්ගය දීර්ඝ කිරීම සඳහා ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදලින් රුපියල් මිලියන 69.5 ක මුදල් ප්‍රමාණයක් වැය කරන ලද අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යොදා ගනිමින් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම් සිදු කරන ලදි.

මිලි මීටර 63, මිලි මීටර 90, මිලි මීටර 110 හා මිලි මීටර 160 විෂ්කම්භයෙන් යුත් නල යොදා ගනිමින් කලාපය තුළ කිලෝ මීටර 170 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී රුපියල් මිලියන 15.14 ක මුදල් ප්‍රමාණයක් වැය කරමින් භූ ගත ජල අංශය විසින් නල ලිං සඳහා විමර්ෂණයන් 64 ක සංඛ්‍යාවක් ද, මිහි විදමන් 13 ක සංඛ්‍යාවක් ද, නල ලිං සොදා හැරීම් 14 ක සංඛ්‍යාවක් හා පොම්ප කිරීමේ පරීක්ෂණ 21 ක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

මධ්‍යම පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

ප්‍රස්තුත වර්ෂය තුළදී වර්ෂය වෙනුවෙන් ඉලක්ක කරන ලද විකුණුම් පරිමාවෙන් සියයට 109% ක් සාක්ෂාත් කර ගනිමින් ජලය ඝණ මීටර මිලියන 57 ක් අලෙවි කරමින් රුපියල් මිලියන 2,066 ක මුදල් ප්‍රමාණයක් රැස් කර ගත හැකි වූ අතර එය ඉලක්ක කරන ලද මුදල් රැස් කිරීම සියයට 102% ක සාක්ෂාත් කර ගැනීමක් විය.

ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයන් තුළ ප්‍රධාන කාන්දු වීම් තුනක් හා ඇසට නොපෙනෙන කාන්දු වීම් 73 ක සංඛ්‍යාවක් සොයා ගන්නා ලදි. 2020 වර්ෂය සඳහා ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ කටයුතු වෙනුවෙන් වෙන් කරනු ලැබ තිබුණ රුපියල් මිලියන 100 ක මුදල් ප්‍රමාණයෙන් රුපියල් මිලියන 21 ක් වැය කරමින් එම අය වැය වෙන් කිරීම යටතේ ඉටු කිරීමට නියමිතව තිබී ක්‍රියාකාරකම් සංර්ථක ලෙස සම්පූර්ණයෙන් නිම කිරීමට හැකි විය. ඊට අමතර වශයෙන් ප්‍රධාන හා සුළු කාන්දු වීම් 4570 ක සංඛ්‍යාවක් නිවැරදි කිරීම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිදු කරන ලදි.

යටිවාවල ඉහළ ඔසොව් පොම්ප කිරීමේ පද්ධතිය, අඟුනාවල පොම්ප කිරීමේ පද්ධතිය හා මැදකුඹුර පොම්ප කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීම රුපියල් මිලියන 94 ක වැය ප්‍රමාණයක් දරමින් ක්‍රියාත්මක කරන ලදි. ඊට අමතර වශයෙන් ජල භූ විද්‍යාත්මක විමර්ෂණයන් 4 ක සංඛ්‍යාවක් ද, මිහි විදමන් ලිං 22 ක සංඛ්‍යාවක් ඉදි කිරීමේ කටයුතු ද, මිහි විදමන් ලිං දස වාරයක් සෝදා පවිත්‍ර කිරීම හා අත් පොම්ප පුනරුත්ථාපනය කිරීමේ කටයුතු වාර 3 ක් ක්‍රියාත්මක කිරීම ද මගින් රුපියල් මිලියන 11.45 ක මුදල් ප්‍රමාණයක් උපයා ගැනීමේ හැකියාව ලැබිණි.

සමස්තයක් වශයෙන් ගත් කල කලාපය තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිශතය 90% ක් වූ අතර ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක වීම හරි වැරදි බැලීම් යෝජනා ක්‍රමයන් 7 ක සංඛ්‍යාවක් තුළ ක්‍රියාත්මක කරන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නියැදි 6,195 ක් ඇතුළු නියැදි 22515 ක මුළු සංඛ්‍යාවක් ප්‍රස්තුත වර්ෂය තුළදී රසායනාගාරයන් විසින් පරීක්ෂණයට භාජනය කරනු ලැබූ අතර බාහිර ඇණවුම් අනුව රසායනික පරාමිතීන් හඳුනා ගැනීමේ පරීක්ෂණ 5307 ක් පවත්වා නිම කරන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් සාම්පල 6203 ක් ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණ වලට භාජනය කරන ලද අතර බාහිර ඇණවුම් වෙනුවෙන් සාම්පල 4810 ක සංඛ්‍යාවක් ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරීක්ෂණයන්ට භාජනය කරන ලදි. ප්‍රජා මූල සංවිධාන ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ වැඩ සටහන යටතේ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක නියැදි 240 ක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර ඒ අතුරින් සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කරන ලද්දේ නියැදි 53 ක සංඛ්‍යාවක් පමණකි.

ප්‍රස්තුත වර්ෂය තුළදී මධ්‍යම නැගෙනහිර කළමනාකාර කලාපය තුළ මාලිගාතැන්න පොම්පාගාරය තුළ සූර්ය බල ශක්ති පද්ධතිය ස්ථාපිත කිරීම ද, ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) විසින් සපයා දෙනු ලැබූ රුපියල් මිලියන 3.3 ක් වටිනා නව මෙවලම් හා උපකරණ භාවිතා කරමින් රසායනාගාරය ඉහළ ශ්‍රේණිගත කිරීම ද, මස්කෙලියහ ා රාගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ මාවර පුවරු ප්‍රති ස්ථාපනය කිරීම ද, හාරගම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම ද, මැද දුම්බර ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ නල ප්‍රති ස්ථාපනය කිරීම හා ශ්‍රී පාදයෙහි නව තුළු මුව පොම්පය ස්ථාපිත කිරීම ද ක්‍රියාත්මක කරනු ලැබ ඇත. එසේම පුස්සතැන්න ප්‍රජා මූල සංවිධානය විසින් කළමනාකරණය කරනු ලබමින් පැවති ජල සම්පාදන යෝජනා ක්‍රමයරීට අයත් ස්ථාවර වත් කම් ද සහිතව අත් පත් කර ගන්නා ලද අතර ඉන් පසු එම පද්ධතිය තුළට නව සේවා සම්බන්ධතාවයන් 230 ක සංඛ්‍යාවක් එකතු කරන ලදි.

තවද ප්‍රස්තුත වර්ෂය තුළදී මධ්‍යම උතුරු කළමනාකාර කලාපය තුළ ගලගෙදර, උඩතැන්න හා මාතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් පුනරුත්ථාපනය කිරීම ද, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ නල වැලීමේ වැඩ කටයුතු හා මාතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ නල ප්‍රදායකයන් ප්‍රති ස්ථාපනය කිරීම ද සිදු කරනු ලැබිණි.

කිලෝ මීටර 8.8 ක දිග ප්‍රමාණයකින් යුත් නව නල මාර්ග වැලීම හා කිලෝ මීටර 2.86 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග ප්‍රති ස්ථාපනය කිරීම ද සිදු කරන ලදි.

තවද ප්‍රස්තුත වර්ෂය තුළදී මධ්‍යම දකුණ කළමනාකාර කලාපය තුළ හන්තාන ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ පෙරණ මාධ්‍ය ප්‍රති ස්ථාපනය කිරීම, ගම්පොලවත්ත හා පාර දෙක ජල සම්පාදන ව්‍යාපෘතීන් තුළ තුළු මුව වැඩි දියුණු කිරීම්, හන්තාන මළ අපවහන යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම හා ඇල්පිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙනුවෙන් ආරක්ෂක කුටියක් ඉදි කිරීම වැනි පුනරුත්ථාපන ක්‍රියාකාරකම් සිදු කරනු ලැබ ඇත. මීට අමතර ලෙස ගම්පොල - දොළොස්බාගේ මාර්ගය දිගට නල මාර්ග නැවත වැලීමේ කටයුතු සිදු කිරීම හා කන්දෙ පන්සල - සක්කරන්කොටුව සම්ප්‍රේෂණ නල මාර්ගයේ පැරණි නල වෙනුවට අළුත් නල යෙදීම ද සම්පූර්ණයෙන් නිම කරන ලදි. ප්‍රස්තුත වර්ෂය තුළදී මීවතුර යන්ත්‍රාගාරය තුළ අධීක්ෂණාත්මක පාලන හා දත්ත අත් පත් කර ගැනීමේ (SCADA) මෘදුකාංග ස්ථාපිත කිරීම හා උඩු යටිනුවර ප්‍රදේශය තුළ ගුවන් විදුලි ඒකක තුනක් සපයා ස්ථාපනය කිරීම හා කපාට කූටි ඉදි කිරීම ද ක්‍රියාත්මක කරන ලදි. අකුරන ජල සම්පාදන යෝජනා ක්‍රමයේ බෙදා හැරීමේ නල මාර්ග වෙනුවට අළුත් නල මාර්ග වැලීම හා මහනුවර දිස්ත්‍රික්කය තුළ දැනට පවත්නා සේවා ආවරණය 63% සිට 77% දක්වා නංවා ලීමේ ද, මාතලේ දිස්ත්‍රික්කය තුළ දැනට පවත්නා සේවා ආවරණය 30% සිට 80% දක්වා නංවා ලීමේ හා නුවරඑලිය දිස්ත්‍රික්කය තුළ දැනට පවත්නා සේවා ආවරණය 10% සිට 14% දක්වා නංවා ලීමේ ද පරමාර්ථයෙන් සංවර්ධන අධ්‍යයනයන් සිදු කිරීම ද ක්‍රියාත්මක කරන ලදි. නව ජල සම්පාදන ව්‍යාපෘතීන් 14 ක සංඛ්‍යාවක් දියත් කිරීමේ වැඩ කටයුතු 2020 - 2025 සංස්ථානික සැලැසුම තුළ ඇතුලත් කරනු ලැබ ඇති අතර එම කටයුතු දැනට ක්‍රියායනය කරනු ලබමින් පවතී.

පැකේජ යන්ත්‍රාගාර දෙකක් සඳහා ද, නව යන්ත්‍රාගාරයක් සඳහා ද, ප්‍රජා මූල සංවිධානයකට සම්බන්ධ යන්ත්‍රාගාරයක් ද ඇතුළු යන්ත්‍රාගාරයන් තුනක සංඛ්‍යාවක් වර්ධනය කිරීම සඳහා ද, විශ්ව විද්‍යාලයේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය නල මාර්ග නැවත වැලීම සමගින් පුනරුත්ථාපනය කිරීම සඳහා ද, සම්ප්‍රේෂණ මාර්ගයන් දෙකක් වැඩි දියුණු කිරීම සඳහා සහ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 10 ක සංඛ්‍යාවක් වැඩි දියුණු කිරීම සඳහා ද ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් මිළ ගණන් කැඳවනු ලැබ ඇත. පුරාණේගම ව්‍යාපෘතියහ ා සම්බන්ධව බෙදා හැරීම් ආකෘතිකරණය කිරීම හා විශ්ලේෂණ කටයුතු සහ මධ්‍යම පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය නවීකරණය කිරීමේ කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි.

2019 වර්ෂයට අදාල ස්ථාවර වත් කම් හරි වැරදි බැලීමේ වාර්තාව සම්පූර්ණයෙන් නිම කිරීම ද, විසල් මහනුවර 11 වැනි අදියර හා විසල් දඹුල්ල ව්‍යාපෘතිය හා සම්බන්ධ ව්‍යාපෘති ප්‍රාග්ධනායනය කිරීම හා ස්ථාවර වත් කම් දත්ත සංචිතය තුළට කලාපීය දත්ත ඇතුලත් කිරීම ද ප්‍රස්තුත වර්ෂය තුළදී සිදු කරන ලද අතර 2020 වර්ෂය සඳහා වූ ස්ථාවර වත් කම් ලේඛනය 90% ක් සම්පූර්ණ කිරීම ද සිදු කරන ලදි.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුයුක්ත පුහුණු කිරීම් අංශය විසින් අභ්‍යන්තර පුහුණු කිරීම් වැඩ සටහන් 6 ක සංඛ්‍යාවක් පවත්වන ලද අතර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ වැඩ කටයුතු වල ප්‍රගතිය නංවා ලීමේ අරමුණින් කළමනාකාර කලාපයන් වෙත ඵලදායිතා සංකල්පය හඳුන්වා දෙන ලදි.

සබරගමුව පලාත කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබන වැඩ කටයුතු සඳහා රුපියල් මිලියන 8.2 ක මුදල් ප්‍රමාණයක් වැය කරමින් කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ කටයුතු සිදු කරන ලද අතර 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබීමට යෝජිත ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ නව වැඩ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 10.00 මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබ ඇත.

ව්‍යාපෘතියේ ග්‍රාමීය ජල සම්පාදන අංගය යටතේ වැලිකැටිආර, ගල් අමුණ හා රන්දොල ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල වැඩ කටයුතු ආසන්න වශයෙන් රුපියල් මිලියන 22 ක මුදල් ප්‍රමාණයක් වැය කරමින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එම යෝජනා ක්‍රමයන් වෙතින් පිළිවෙලින් පවුල් 221 ක් වෙත, පවුල් 185 ක් වෙත හා පවුල් 113 ක් වෙත ජල සම්පාදන සේවාවන් ලැබෙනු ඇත. එසේම ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (WaSSIP) නාගරික ජල සම්පාදන අංගය යටතේ ක්‍රියාත්මක කරනු ලබන පඹහින්න ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් සාකෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 62% කි. එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු වලට දිනකට ජලය ඝණ මීටර 4500 ක ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම ද, තුළු මුව ඉදි කිරීම ද, සේවා ජලාශයන් සමග සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ පද්ධතිය ඉදි කිරීම ද ඇතුලත් වන අතර ව්‍යාපෘතිය ග්‍රාම නිලධාරී වසම් 05 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් 6312 ක ජන ගහණයක් වෙත හා සබරගමුව විශ්ව විද්‍යාලය වෙත ජල සම්පාදන සේවාවන් ලබා දීමට නියමිත වේ. ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වෙතැයි අපේක්ෂා කරනු ලබන මුළු පිරිවැය රුපියල් මිලියන 1.100 ක් වේ.

එසේම ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (WaSSIP) නාගරික ජල සම්පාදන අංගය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ගලිගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් සාකෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 88% කි. ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වෙතැයි අපේක්ෂා කරනු ලබන මුළු පිරිවැය රුපියල් මිලියන 2.300 ක් වේ.

ඇඹිලිපිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට පදලන්ගල ප්‍රදේශය දක්වා එක් දිනකට පානීය ජලය ඝණ මීටර 5000 ක ප්‍රමාණයක් සම්පාදනය කර දීමට යෝජනා කරන ලද අතර එකී යෝජිත යෝජනා ක්‍රමය වෙනුවෙන් අරමුදල් සැපයීම සිදු කරනු ලබන්නේ ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) හා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත

වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇති අරමුදල් යටතේ වේ. ඇඹිලිපිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට පදලන්ගල ඉදි කරනු ලැබීමට යෝජිත ජල කුළුණ දක්වා මිලි මීටර 400 ක විෂ්කම්භයෙන් යුත් හා කිලෝ මීටර 4.5 ක් දිගින් යුත් පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය ඉදි කරන ලද්දේ හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇති අරමුදල් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වන අතර එහි ඉදි කිරීම් කටයුතු දැනට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබේ. එම කාර්යය සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ වටිනාකම රුපියල් මිලියන 92.97 ක් විය. පදලන්ගල පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය පෝෂණය කිරීම සඳහා ඇඹිලිපිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ ඉදි කරනු ලබන ප්‍රතිකාරිත ජල පොම්පාගාරය ඉදි කිරීමේ කටයුතු හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇති අරමුදල් යටතේ රුපියල් මිලියන 3.5 ක ඇස්තමේන්තුගත පිරිවැයක් වැය කරමින් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

උඩවලව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු පුනරුත්ථාපන අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබීමට නියමිත වේ. එම ව්‍යාපෘතිය සඳහා වැය වෙතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති පිරිවැය රුපියල් මිලියන 9.0 ක් වන අතර ඉදි කිරීම් කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

මිලි මීටර 280 ක විෂ්කම්භයකින් හා කිලෝ මීටර 7 ක දිග ප්‍රමාණයකින් යුත් පොලිවිනිල් ක්ලෝරයිඩ් :ජඑක* ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය කහවත්ත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට පැල්මඩුල්ලේ බටලන්ද හන්දිය දක්වා විලීම සඳහා වූ කහවත්ත - පැල්මඩුල්ල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ග ව්‍යාපෘතිය ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යටතේ ආසන්න වශයෙන් රුපියල් මිලියන 160 ක ව්‍යාපෘති පිරිවැයක් දරමින් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 10% ක් වේ.

අත් හැර දමන ලැබ තිබී නැවත සැලැසුම් කරනු ලැබ ඇති පැකේජ ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඇහැලියගොඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ නැවත ස්ථාපනය කිරීම ප්‍රාග්ධන අය වැය වෙන් කිරීම් යටතේ රුපියල් මිලියන 19.0 ක පිරිවැයක් දරමින් ක්‍රියාත්මක කරන ලදි.

2020 වර්ෂය තුළදී ජල සුරක්ෂිතතා සැලැසුම් රත්නපුර හා කෑගල්ල යන කලාපයන් තුළ අඛන්ඩ ලෙස ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි. පරදු ධාරන්ගේ දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් එකී කලාපයන් දෙක තුළම ක්‍රියාත්මක කරන ලදි. රත්නපුර කලාපය තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් මොඩියුල සම්පූර්ණ කිරීමේ වැඩ කටයුතු 50% ක ප්‍රතිශතයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. මේ අතර උඩ වලව ජල සම්පාදන ව්‍යාපෘතියේ හා කහවත්ත ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල සුරක්ෂිතතා සැලැසුම් හා නම්බන්ධ අභ්‍යන්තර අවධිමත් විගණනයන් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලදි. කෑගල්ල කලාපය තුළ මොඩියුල සම්පූර්ණ කිරීමේ කටයුතු වලින් ආසන්න වශයෙන් 40% ක ප්‍රතිශතයක් නිමා කරනු ලැබ ඇත.

ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී ආසන්න වශයෙන් පැල වර්ග 6000 ක සංඛ්‍යාවක් කෑගල්ල හා රත්නපුර යන දිස්ත්‍රික්කයන් තුළ බෙදා දෙනු ලැබූ අතර පැල වර්ග 3000 කට අධික සංඛ්‍යාවක් ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හරහා රත්නපුර දිස්ත්‍රික්කය තුළ බෙදා හරින ලදි. තවත් පැල වර්ග 3000 ක සංඛ්‍යාවක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව සමග එක් වී ප්‍රජා මූල සංවිධානයන්ට අනුබද්ධ ජලාධර ප්‍රදේශයන් තුළ රෝපණය කරන ලදි.

කෑගල්ල කලාපය තුළ නැවත පදිංචි කරවීමේ හා උපයෝජ්‍යතා විතැන් කිරීමේ අරමුදල් යටතේ බොහෝ ඉදි කිරීම් කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය බණ්ඩාරවෙල හා මොනරාගල යන කලාපයන් දෙකින් සමන්විත වේ. බදුල්ලේ පිහිටි ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය වෙත හා දෙමෝදර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (ISO) 9001 - 2015 QMS සහතිකකරණය ප්‍රදානය කරන ලද අතර එය විශාල ජයග්‍රහණයක් විය.

බණ්ඩාරවෙල හා මොනරාගල යන කලාපයන් දෙක තුළම ආදායම් රහිත ජල පරිමාව පසු විපරම් කිරීමේ හා එම පරිමාව අඩු කිරීමේ වැඩ කටයුතු භාරව කටයුතු කිරීම සඳහා ප්‍රධාන ඉංජිනේරු (ඉදි කිරීම්) යටතේ ආදායම් රහිත ජල අංශය පිහිටුවන ලදි. රාත්‍රී කාන්දු වීම් සමීක්ෂණ, විසන්ධි කිරීම් පසු විපරම් කිරීම හා නීති විරෝධී සම්බන්ධතාවයන් සොයා ගැනීම එම අංශය විසින් ක්‍රියාත්මක කරන ලදි. දැනට ක්‍රියාත්මක වන සේවා සම්බන්ධතාවයන්ගේ දොස් නිදොස් කිරීම හා අඩු පීඩන ලෙස හඳුනාගනු ලැබ ඇති නල හා පැරණි නල වෙනුවට අළුත් නල යෙදීම ආදී ක්‍රියාකාරකම් 2020 වර්ෂය වෙනුවෙන් වූ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා වූ අය වැය වෙන් කිරීම යටතේ ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව 2019 වර්ෂයේ දක්නට ලැබුණ 27% ක් වූ ආදායම් රහිත ජල පරිමාව 2020 වර්ෂය තුළදී 26% ක් දක්වා අඩු කර ගැනීමේ හැකියාව ලැබිණි.

ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද බල ශක්ති සංරක්ෂණය කිරීමේ ඇතැම් ක්‍රියාකාරකම් වන්නේ අකාර්යක්ෂම පොම්ප වෙනුවට අළුත් පොම්ප යෙදීම හා ඉල්ලුම අධික කාල වේලාවන් තුළ පෝම්ප කිරීමෙන් වැලකී සිටීමත් වේ. සියළුම පොම්පාගාරයන් තුළ නිවාරණ නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදුලි බලය සඳහා වැය කරනු ලබන පිරිවැය අඩු වීමට අමතර වශයෙන් පොම්පාගාරයන් නඩත්තු කිරීමේ පිරිවැය මෙන්ම පොම්ප ක්‍රියා විරහිත තත්ත්වයේ තිබෙන කාලය ද අඩු වී ඇත.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ඇති භාණ්ඩ තොග පවත්වාගෙන යාමේ කාර්යය සඳහා අයිතමයන් බොහෝ ප්‍රමාණයක් වට්ටෝරු පොත් කළමනාකරණ පද්ධතිය :ෂවී* තුළට ඇතුළු කරන ලදි. කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ ඇති තොග මට්ටම් අඩු කිරීමේ අරමුණ සහිතව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව තිබුණ නල හා සවි කිරීම් භාවිතා කරමින් ආසන්න වශයෙන් කිලෝ මීටර 35 ක දිගින් යුත් නල වැලීම් සිදු කරන ලදි. පුහුණු කිරීම් සඳහා වූ අය වැය වෙන් කිරීම මෙන්ම වෙනත් අනුග්‍රාහකත්වයන් උපයෝගී කර ගනිමින් මාර්ගස්ථ වැඩ සටහන් ද ඇතුළු පුහුණු කිරීමේ වැඩ සටහන් 30 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදි.

ජලාධර ප්‍රදේශයන් රැක ගැනීමේ වැඩ සටහන යටතේ කහගොල්ල ජලාධර ප්‍රදේශය රැක ගැනීමේ ශ්‍රම දාන ව්‍යාපාරයක් ද, දෙමෝදර ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් රුක් සිටුවීමේ වැඩ සටහනක් හා පාසැල් දරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් දෙකක් ද පවත්වන ලදි. සෑම ජල සම්පාදන යෝජනා ක්‍රමයක් සඳහාම මෙන් ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර පලාත තුළ ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමයන් දහ හතක් වෙනුවෙන් වූ මොඩියුල සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත. 2020 වර්ෂය තුළදී මොනරාගල, බුත්තල, දෙමෝදර, මහියංගනය හා කැප්පෙටිපොල ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල අභ්‍යන්තර විගණන පරීක්ෂණයන් සම්පූර්ණයෙන් නිම කරන ලදි.

බණ්ඩාරවෙල, බදුල්ල, දෙමෝදර හා හාලිඇල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ කිලෝ මීටර 40 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරන ලද අතර බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ කිලෝ මීටර 54 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීමක් සිදු කරන ලදි. මොනරාගල ක්‍රියාත්මක වන මොනරාගල, වැල්ලවාය හා ඔක්කම්පිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ කිලෝ මීටර 21 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලද අතර ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය යටතේ මඩුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ කිලෝ මීටර 76 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් අවසන් කොට ජාතික ජල

සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දෙන ලදි.

ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යටතේ ක්‍රියාත්මන කරනු ලබන ක්‍රියාකාරකමක් වශයෙන් බදුල්ල හා මොනරාගල යන දිස්ත්‍රික්කයන් දෙකම තුළ වී 5 මාර්ගය දිගේ ආසන්න වශයෙන් කිලෝ මීටර 43 ක දිගින් යුත් නල එලීමේ ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක කරනු ලැබීමට යෝජනා කරන ලද අතර දැනට ඉන් කිලෝ මීටර 30 ක දිග ප්‍රමාණයක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට හැකි වී තිබේ. පාසැල් වෙත සිදු කරනු ලබන ජල සම්පාදනයේ තත්ත්වය පිළිබඳ තොරතුරු රැස් කර ගන්නා ලද අතර එම තොරතුරු පදනම් වූ තක්සේරු ඇස්තමේන්තු කටයුතු පලාතේ ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් සිදු කරන ලදි. රිදීමාලියද්ද ප්‍රදේශය වෙත පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය දීර්ඝ කිරීමේ කටයුතු හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා වූ අය වැය වෙන් කිරීම යටතේ දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම් හා ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා වූ අය වැය වෙන් කිරීම් යටතේ රුපියල් මිලියන 244 ක මුළු කොන්ත්‍රාත් අගයකින් යුත් කොන්ත්‍රාත්තු 100 කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පුනරුත්ථාපනය කිරීම ද, ස්ථාන භාර නිලධාරි කාර්යාලයන් හා නිල නිවාසයන් වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු හා කලාපය තුළ සම්ප්‍රේෂණ මාර්ගයන් හා බෙදා හැරීමේ පද්ධතීන් එලීමේ වැඩ කටයුතු හා කලාපය තුළ යාන්ත්‍රික හා විද්‍යුත් කටයුතු වැඩි දියුණු කිරීම ද ක්‍රියාත්මක කරන ලදි. වැඩි දියුණු කිරීම් වැඩ කටයුතු කෙරෙහි කොවිඩ් 19 වසංගතයේ බල පෑම් වල්ල වුව ද වෙන් කරනු ලැබ ඇති පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම ඉක්මවා යමින් මෙම වැඩ කටයුතු කිරීම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ලබා ගන්නා ලද විශාල ජයග්‍රහණයකි.

හම්බෙගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ද, බදුල්ල දිස්ත්‍රික්කය තුළ ජලය ප්‍රතිකාරිත කිරීම වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු සඳහා ද, දෙමෝදර ජල සම්පාදන යෝජනා ක්‍රමයේ බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා හ මොනරාගල දිස්ත්‍රික්කය තුළ ජල ප්‍රතිකාරක වැඩ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ද ප්‍රස්තුත වර්ෂය තුළදී වනපෘති අනුමත කිරීමේ කමිටුවේ අනුමැතිය ප්‍රස්තුත වර්ෂය තුළදී ලබා ගන්නා ලදි.

උතුරු පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

උතුරු පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් යාපනය කලාපීය කළමනාකරු හා වවුනියා කලාපීය කළමනාකරු යටතේ යාපනය, කිලිනොච්චි, මුලයිතිවු, වවුනියා හා මන්නාරම යන දිස්ත්‍රික්ක 5 ආවරණය කරමින් උතුරු පලාතේ ජීවත් වන මහ ජනතාව හා උතුරු පලාත තුළ ඇති ආයතනයන් වෙත පානීය ජල සම්පාදන පහසුකම් හා උපදෙස් සපයනු ලබයි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම කලාපය තුළ ජීවත් වන මුළු ජන ගහණයෙන් 10.12% ක් වෙත නල මාර්ග යෙන් ජලය සම්පාදනය කර දෙනු ලබන අතර ග්‍රාමීය ජල සම්පාදන ආවරණය ජන ගහණයෙන් 1.73% ක් වේ.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය යටතේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 33 ක් ක්‍රියාත්මක වේ. නයිනතීවු හා තයියඩ්ඩි නව යෝජනා ක්‍රමයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවරා ගන්නා ලදි. ප්‍රස්තුත වර්ෂය තුළදී කිලෝ මීටර 51.4 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ පියවර වශයෙන් කිලෝ මීටර 2.77 ක දිග ප්‍රමාණයකින් යුත් ඇස්බෙස්ටෝ සිමෙන්ති නල මාර්ග වෙනුවට නව නල මාර්ග යෙදීම ද, කපාට 12 ක් වෙනුවෙන් නව කපාට යෙදීම හා දෝෂ සහිත මණු 1843 ක් වෙනුවෙන් නව මණු සවි කිරීම ද සිදු කරන ලදි. තවද නව කපාට 81 ක් ද ස්ථාපනය කරන ලදි. කපාට කුටි කිහිපයක් ඉදි කරනු ලැබ ඇති අතර තවත් කපාට කුටි දැනට ඉදි කරනු ලබමින් පවතී. මඩු ජල සම්පාදන ව්‍යාපෘතිය තුළ රුපියල් මිලියන 274 ක වැයක් දරමින් බෙදා හැරීමේ පද්ධතීන් තුළ දීර්ඝ කිරීමේ නල මාර්ග එලීම සිදු කර නිම කරන ලදි. නිකවැව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කොට ප්‍රජාව වෙත භාර දෙන ලදි.

ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හතක සංඛ්‍යාවක් Arc GIS භාවිතා කරමින් WAMS යටතේ සම්පූර්ණයෙන් සංඛ්‍යාංක බවට පරිවර්තනය කරන ලදි.

කලාපීය රසායනාගාරයන් දෙකම ඉහළ ශ්‍රේණිගත කරනු ලැබ ඇති අතර රසායනික පරීක්ෂා කිරීම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (ISO) 17025 - 2017 සඳහා පිළිගනු ලැබ ඇති අතර ක්ෂුද්‍ර ජෛව විද්‍යාත්මක පරීක්ෂා කිරීමේ කටයුතු වෙනුවෙන් පිළිගැනීම ලබා ගැනීමේ කටයුතු දැනට සිදු කර ගෙන යමින් පවතී. විවිධ පරදු ධාරීන් වෙත රසායනාගාර සේවාවන් ලබා දීම හරහා රුපියල් මිලියන 3.5 ක මුදල් ප්‍රමාණයක් උපයා ගැනීමට හැකි විය. ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 5 ක සංඛ්‍යාවක් සඳහා වූ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඩෙල්ෆ්ට් ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් වූ ජල සුරක්ෂිතතා සැලැසුම විගණනයට භාජනය කරන ලද අතර එහි ප්‍රතිඵලය වශයෙන් 120 න් 82 ක මුළු ලකුණු සංඛ්‍යාවක් ලබා ගත හැකි විය. ඒ අතර ගුණාත්මක තක්සේරුව "සාමාන්‍ය" විය. කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් වූ ජල සුරක්ෂිතතා ලේඛනය ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක ඒකකය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

පොම්පාගාරයන් ඉදි කිරීමේ කටයුතු හා කුළුණු, බිම් දෙණ හා කපාට කුටි අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කරනු ලැබ ඇත. උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් මඩු දේවස්ථානයේ ගැසට් කරන ලද උත්සවය සඳහා වික් රැස් වන හා ශිව දෙවියන් වෙනුවෙන් වූ තිරුකෙතීස්වරම් දේවස්ථානය වෙත වික් රැස් වන ආසන්න වශයෙන් 500000 ක් පමණ වූ බැතිමතුන්ගේ ප්‍රයෝජනය උදෙසා පානීය ජලය සම්පාදනය කර දීමෙන් හා වෙනත් අවශ්‍යතාවන් සඳහා වන ජලය සම්පාදනය කර දීමෙන් සහාය ලබා දෙනු ලබයි.

2020 පශ්චාත් හරි වැරදි බැලීමේදී ලැයිස්තුගත කරනු ලැබ ඇති කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ තිබෙන ප්‍රයෝජනයට ගත නොහැකි හා ඉල්ලුමක් නොමැති අයිතමයන් (මුළු අගය රුපියල් මිලියන 1.54) ලැයිස්තුගත කරන ලදුව එම ලැයිස්තුව අදාල අයිතමයන් ප්‍රධාන කාර්යාලය වෙත යැවීමට අනුමැතිය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ප්‍රධාන කාර්යාල වෙත ඉදිරිපත් කරන ලදි. පේදුරුතුඩුව ජල සම්පාදන යෝජනා ක්‍රමයට අනුයුක්ත හා කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමයට අනුයුක්ත පොම්පාගාරයන් තුළ සූර්ය බල ශක්ති පද්ධතීන් ස්ථාපනය කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිමවනු ලැබ ඇත.

රුපියල් මිලියන 38 ක වැයක් දරමින් සියළුම දිස්ත්‍රික්කයන් තුළ යාන්ත්‍රික හා විද්‍යුත් කටයුතු සිදු කරන ලද අතර රුපියල් මිලියන 200 ක් වටිනා යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ මිළ දී ගැනීම සඳහා වූ ටෙන්ඩර් ලිපි ලේඛන පිළියෙල කරනු ලැබ ඇත.

විසල් මන්නාරම ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා කල් ආරු හරහා ජලාශයක් ඉදි කිරීම පිණිස පලාත් වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙතින් ලිඛිත අනුමැතිය ලබා ගන්නා ලදි. විසල් වවුනියා ව්‍යාපෘතිය වෙනුවෙන් සැලැසුම අනුව පිළියෙල කරන ලද ලංසු ප්‍රලේඛනය ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් සමාලෝචනයට බඳුන් කරන ලදි. මේ අතර 2020ී 2025 සංස්ථානික සැලැසුමට ඇතුලත් කිරීම සඳහා ව්‍යාපෘතීන් 21 ක සංඛ්‍යාවක් හඳුනාගනු ලැබ ඇත.

රුපියල් මිලියන 1,127 ක ඇස්තමේන්තු කරන ලද පිරිවැයක් සහිත ජල සම්පාදන ව්‍යාපෘතීන් 3 ක් වෙනුවෙන් සැලැසුම් කටයුතු නිම කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වරුන්ගේ ආයතනය (IESL) විසින් සිය සාමාජ සාමාජිකත්වය පිරිනැමීම සඳහා උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සැලැසුම් හා ඉදි කිරීම් සම්බන්ධයෙන් ඉංජිනේරු වරුන් පුහුණු කිරීම සඳහා සුදුසු ආයතනයක් ලෙස පිළිගනු ලැබ ඇත.

නූ ගත ජල තුළු මුව ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 828

ක් දක්වා ඉහළ නැංවීමේ වැඩ කටයුතු මිහි විදමන් ලිං ඉදි කිරීම මගින් සම්පූර්ණයෙන් නිම කරන ලදි. තුළු මුව ලිං හා සම්බන්ධයෙන් පැවැති මෙහෙයුම් ගැටළු ලිං සංවර්ධනය කිරීමේ වැඩ සටහන මගින් නිරාකරණය කර ගන්නා ලදි.

නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු කළමනාකරණය කිරීම සිදු කරනු ලබන්නේ ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව හා අක්කරෙයිපත්තු නමින් යුත් කොට්ඨාශ කළමනාකරුවන් සිව් දෙනෙකු විසිනි.

ප්‍රස්තුත වර්ෂය තුළදී ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ සටහන යටතේ ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම ඉලක්ක කර ගනිමින් බොහෝ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. දැනට තිබෙන පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) සේවා සම්බන්ධතාවයන් පොලි එතිලින් (PE) සම්බන්ධතාවයන් බවට මාරු කිරීම දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. ත්‍රිකුණාමලය, අම්පාර හා මඩකලපුව කලාපයන් තුළ නව සේවා සම්බන්ධතාවයන් සපයනු ලබන්නේ පොලි එතිලින් නල හා සවි කිරීම් භාවිතා කරමින් වේ. මීට වැඩිමනත් වශයෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යක්ෂමතාවය නංවා ලීම සඳහා පුනුණු වැඩ සටහන් කිහිපයක් මෙහෙයවීම ද සිදු කරන ලදි.

බල ශක්ති ඉතිරි කිරීමේ වැඩ පිළිවෙල යටතේ පොම්ප හා උපකරණ නිරන්තර නිවාරණ නඩත්තුවට භාජනය කිරීම, බල ශක්ති විගණනයන් පැවැත්වීම හා කාර්යක්ෂමතා / කාර්ය සාධන පරීක්ෂණ පැවැත්වීම, පොම්ප දත්ත සංචිතය ස්ථාපිත කිරීම හා අඩු කාර්ය සාධන තත්ත්වයක් පෙන්නුම් කරන උපකරණ වෙනුවට අළුත් උපකරණ යෙදීම යන වැඩ කටයුතු ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. මීට අමතර වශයෙන් ත්‍රිකුණාමලය කළමනාකාර කාර්යාලය වෙනුවෙන් කිලෝ වොට් 80 ක හා මඩකලපුව කළමනාකාර කාර්යාලය වෙනුවෙන් කිලෝ වොට් 40 ක ආදී වශයෙන් කළමනාකාර කාර්යාලයන් වෙනුවෙන් සූර්ය බල ශක්ති පැනල පද්ධතීන් ප්‍රතිසම්පාදනය කිරීමේ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී.

ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ක්‍රියාකාරකම් වශයෙන් ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර හා අක්කරෙයිපත්තු යන ප්‍රදේශයන්හි පිහිටි පාසැල් තුළ පවත්නා සනීපාරක්ෂණ තත්ත්වයන් පිළිබඳ තොරතුරු එක් රැස් කොට ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදි.

තොග මට්ටම් පවත්වාගෙන යා සඳහා රුපියල් මිලියන 46 ක් වටිනා ඉල්ලුමක් නැති හා අඩු ඉල්ලුමක් සහිත ද්‍රව්‍ය වෙනත් ව්‍යාපෘතීන් වෙත මාරු කර යවන ලද අතර යාවත්කාලීන කරන ලද ද්‍රව්‍ය තොග ලැයිස්තුව අනිකුත් කලාපීය කාර්යාලයන් අතර සංසරණය කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී රුපියල් මිලියන 2,082 ක බිල් කිරීම් වලට එරෙහිව රුපියල් මිලියන 1,902 ක මුදල් රැස් කිරීමක් වාර්තා කරනු ලැබ ඇත. තවද ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ ආදායම රුපියල් මිලියන 2,286.05 ක මුදල් ප්‍රමාණයක් වූ අතර වියදම රුපියල් මිලියන 3,491.73 ක් විය. ප්‍රස්තුත වර්ෂය තුළදී ටෙන්ඩර 120 ක සංඛ්‍යාවක් හා සම්බන්ධ වැඩ කටයුතු සිදු කරන ලද අතර රුපියල් මිලියන 261 ක් වටිනා කොන්ත්‍රාත්තු 49 ක සංඛ්‍යාවක් ප්‍රදානය කරනු ලැබ ඇත.

ප්‍රස්තුත වර්ෂය තුළදී රසායනික හා බැක්ටීරියා විද්‍යාත්මක පරීක්ෂණයන් 6000 ක මුළු සංඛ්‍යාවක් සිදු කරන ලදි. ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා කලාපීය කාර්යාලයන් වෙත ඉලක්ක දිනයන් දීමට කටයුතු කරන ලදි. ජල සුරක්ෂිතතා සැලැසුම් මොඩියුල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගත් කල සියළුම කලාපීය කාර්යාලයන් විසින් සැලැකිය යුතු ජයග්‍රහණයන් සාක්ෂාත් කර ගනු ලැබ ඇත. ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී කිලෝ මීටර 90 ක මුළු දිග ප්‍රමාණයකින් යුත් නල එලීම් කටයුතු සිදු කරනු ලැබ ඇත.

2020 වර්ෂය තුළදී වත් කම් කළමනාකරණ කටයුතු යටතේ ස්ථාවර වත් කම් හරි වැරදි බැලීමේ සමීක්ෂණ සිදු කිරීම ද, කලාපීය කාර්යාලයන් තුළ ඇති ස්ථාවර වත් කම් ලේඛන යාවත්කාලීන කිරීම හා කලාපීය මට්ටමේ ඇති වාහන, යටිතල පහසුකම්, යන්ත්‍රාගාර හා යන්ත්‍ර සූත්‍ර හා වෙනත් උපකරණ, ජංගම උපකරණ, පරිගණක යන්ත්‍ර හා ඉඩම් පිළිබඳ විස්තර පිළියෙල කරන ලදි.

පුනරුත්ථාපන අය වැය වෙන් කිරීම් යටතේ පුනරුත්ථාපන වැඩ කටයුතු වෙනුවෙන් හා ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ වැඩ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රුපියල් මිලියන 120 ක හා රුපියල් මිලියන 80 ක මුදල් ප්‍රමාණයන් වෙන් කරනු ලැබ ඇත. ඒ අතුරින් රුපියල් මිලියන 73.3 ක මුදල් ප්‍රමාණයක් වැය කරනු ලැබ ඇති අතර රුපියල් මිලියන 35.49 ක වටිනාකමකින් යුත් බිල් පත් පියවීම සඳහා අතේ ඇත. ප්‍රති ආරෝපණය කළ හැකි වැඩ යටතේ වෙනත් ආයතනයන් විසින් සපයන ලද අරමුදල් උපයෝගි කර ගනිමින් රුපියල් මිලියන 19 ක් වටිනා ජල සම්පාදන වැඩ කටයුතු මඩකලපුව කලාපය තුළ ද, රුපියල් මිලියන 8 ක් වටිනා වැඩ කටයුතු අක්කරෙයිපත්තු කලාපය තුළ හා රුපියල් මිලියන 17 ක් වටිනා වැඩ කටයුතු ත්‍රිකුණාමලය කලාපය තුළ ද ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පාලනය කිරීමේ වැඩ සටහන යටතේ රුපියල් මිලියන 7 ක් වටිනා ජල සම්පාදන වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ත්‍රිකුණාමලයේ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ හා මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කොට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

කොවිඩ් 19 වසංගත තත්ත්වය තිබියදී ඒ තත්ත්වය යටතේ හා නියං සමයේදී පොතුවිල් ප්‍රදේශයේ ඇති වන ජල හිඟය, තිරුක්කෝවිල් ප්‍රදේශයේ ඇති වන ජල හිඟය, නියං සමයේදී වේරුගල් ගඟ මුහුණ දෙන ලාවණ්‍ය ආක්‍රාන්තිය, පුල්මුඩ්ඩෙයි ජල සම්පාදන ව්‍යාපෘතිය වෙත ජලය ලබා ගන්නා තූ ගත ජල ප්‍රභවය වෙත සිදු වන ලාවණ්‍ය ආක්‍රාන්තිය, නියං සෘතුව තුළදී මහවැලි ගංගාවේ ජල ධාරා අඩු වීම හා කන්තලේ වාරි වැව වෙතින් ජලය ලබා ගැනීමේදී වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන සීමාවන් වැනි වෙනත් විවිධ ගැටළු වලට මුහුණ දෙමින් වුව ද සියළුම කලාපීය වැඩ කටයුතු ඉටු කරන්නට හැකි විය.

බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය

බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් මේ වන විට අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන, කෙත්හේන හා නවගමුව යන ප්‍රදේශයන් අට තුළ පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 8 ක සංඛ්‍යාවක මෙහෙයුම් කටයුතු කරමින් නඩත්තු කර ගෙන යනු ලබන අතර ඒ අතුරින් විශාලතම පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය දිනකට ආසන්න වශයෙන් පානීය ජලය ඝණ මීටර 550,000 ක් පමණ නිෂ්පාදනය කරනු ලබන අඹතලේ පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වන්නේය. බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු පානීය ජල පරිමාවෙන් ආසන්න වශයෙන් 45% ක පමණ පානීය ජල පරිමාවක් නිෂ්පාදනය කරනු ලබන්නේ හුදෙක්ම අඹතලේ පානීය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විසින් වේ. දිනකට ජලය ඝණ මීටර 180000 ක් නිපදවීමේ නිෂ්පාදන ධාරිතාවයකින් යුත් කැළණිය දකුණු ඉවුර 11 ව්‍යාපෘතිය 2020 නොවැම්බර් මාසයේදී සේවයේ යෙදවීමත් සමග බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ මුළු නිෂ්පාදනය දිනකට පානීය ජලය ඝණ මීටර මිලියන 1.27 ක් දක්වා ඉහළ ගියේය. බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දෛනිකව නිපදවනු ලබන මුළු පානීය ජල පරිමාවෙන් 50% ක ප්‍රතිශතයක් ඉක්මවා යන ජල පරිමාවක් නිෂ්පාදනය කරනු ලබයි. දෛනික නිෂ්පාදන ධාරිතාවය ඝණ මීටර 72000 ක් දක්වා ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයෙහි දැනට කරගෙන යනු ලබන වර්ධන කටයුතු 2021 වර්ෂයේ මාර්තු මාසය වන විට සම්පූර්ණයෙන් නිම කළ හැකි වෙතැයි

අපේක්ෂා කරනු ලැබේ. අඹතලේ දෛනික නිෂ්පාදන ධාරිතාවය ඝණ මීටර 50000 කින් හා වැලිවිට ජල ප්‍රතිකාරක මධ්‍යස්ථානයේ දෛනික නිෂ්පාදන ධාරිතාවය ඝණ මීටර 180000 කින් ඉහළ නැංවීමට දැනට කරගෙන යන වැඩ කටයුතු නිම වීමත් සමග බස්නාහිර පලාතේ වැඩි වෙමින් පවතින ජල ඉල්ලුම සම්පාදනය කර දීමට හැකි වන පරිදි බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ නිෂ්පාදන ධාරිතාවය නුදුරු අනාගතයේ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. කඳන 11 වැනි අදියර දියත් කිරීමේ ආරම්භක රැස්වීම 2020 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලද අතර ඊට අදාල වැඩ කටයුතු නුදුරු අනාගතයේදී ඉදිරියට යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් කොළඹ දිස්ත්‍රික්කය වෙත, ගම්පහ දිස්ත්‍රික්කය වෙත හා කළුතර දිස්ත්‍රික්කයේ කොටසක් වෙත පානීය ජලය සපයනු ලබයි. පානීය ජලය බෙදා හරිනු ලබන්නේ බටහිර මධ්‍යම, බටහිර උතුර හා බටහිර දකුණ නම් වූ කලාපීය සහාය මධ්‍යස්ථානයන් මගින් වේ. කිසිදු බාධාවකින් තොරවූ ආරක්ෂිත පානීය ජල සම්පාදනයක් සහතික කිරීම සඳහා බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් එහි මෙහෙයුම් හා නඩත්තු කටයුතු මෙහෙයුම් කළමනාකරු, කළමනාකරු කඳාන, කළමනාකරු බියගම හා නඩත්තු කළමනාකරු යන කළමනාකරුවන් සිවු දෙනා අතර බෙදා දෙනු ලැබ ඇත.

OLD 30" හා OLD 20" යන පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග යන් දෙක අතර අළුතින් ඇති කරන ලද අන්තර් සම්බන්ධතාවය සමග 2020 වර්ෂය තුළදී කොලොන්නාව ජලාශය වෙත ලැබෙන ජල සැපැයුම වැඩි දියුණු වී ඇත. ඒ අනුව ජලාශය වෙතින් පැය 24 පුරාම ජල සම්පාදනය කිරීම සහතික කිරීමට කොලොන්නාව ජලාශයට හැකියාව ලැබී ඇත. අඹතලේ ධාරිතාවය වැඩි දියුණු කරන තෙක් වසර 2 ක කාලයක් තුළ අළුතින් සේවයේ යොදවන ලද බියගම 11 වැනි අදියර යන්ත්‍රාගාරයේ සිට අඹතලේ ජලාශය වෙත අතිරික්ත ජලය ගෙන යාම සඳහා මීටර 258 ක දිග ප්‍රමාණයකින් හා මිලි මීටර 800 ක විෂ්කම්භයකින් යුත් මෘදු යකඩ නල මාර්ගයක් වලන ලදී.

අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, බියගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාග ාරය හා බම්බුකුලිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය නම් වූ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ත්‍රිත්වය විසින් ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ (ISO) 9001 - 2015 ගුණාත්ම කළමනාකරණ පද්ධති සහතිකකරණය දිනා ගනු ලැබ ඇත. අඹතලේ රසායනාගාරය විසින් ශ්‍රී ලංකා පිළිගැනීම් මණ්ඩලය (Sri Lanka Accreditation Board) විසින් 2020 දෙසැම්බර් මාසයේදී පවත්වන්නට යෙදුන ප්‍රති සහතිකකරණ විගණනයට අනුග ාමික ලෙස සිය ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ (ISO) 17025 - 2005 පිළිගැනීම ජාත්‍යන්තර ප්‍රමිති කාර්යාංශ (ISO) 17025 - 2017 පිළිග ැනීම දක්වා ඉහළ ශ්‍රේණිගත කරගනු ලැබ ඇත. මේ කරණකොට ගෙන මැග්නීසියම් ඔක්සයිඩ් අන්තර්ගත නව නුනු ප්‍රමිතිය වූ 1577 - 2017 නම් ශ්‍රී ලංකා ප්‍රමිතිය දිනා ගැනීමේ හැකියාව අඹතලේ රසායනාගාරයට ලැබිණි. මීට වැඩිමනත් ලෙස දැනට පවත්නා ජල ගුණාත්ම පරාමිතීන් (pH, බොර භාවය, සන්නායකත්වය, ක්ලෝරයිඩ්, කඨිනත්වය, ක්ෂාරීය තාවය) සමග APHA 23 වැනි සස්කරණය භාවිතා කරමින් සීනක්කාරම් තුළ ලෝහ මිශ්‍රිත භාවය, ෆ්ලෝරයිඩ්, ෆොස්ෆේට් හා නයිට්‍රේට් නමින් යුත් ජල ගුණාත්ම පරාමිතීන් 4 ක සංඛ්‍යාවක් එකතු කරනු ලැබ ඇත. දැනට අඹතලේ රසායනාගාරය සතුව (කැඩ්මියම්, ඊයම්, ක්‍රෝමියම්, මැන්ගනීස් හා යකඩ වැනි බැර ලෝහ ඇතුළු) පරාමිතීන් 25 ක් සඳහා ලබාගත් පිළිගැනීම් තිබේ. බියගම හා කඳාන රසායනාගාරයන් වෙත ද ශ්‍රී ලංකා පිළිගැනීම් මණ්ඩලයේ 17025 - 2017 සහතිකය ලබා ගැනීම සඳහා 2020 වර්ෂයේදී ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරනු ලැබ ඇත.

දවස මුළුල්ලේම ස්ථාවර ලෙස සුරක්ෂිත පානීය ජල සම්පාදනයක් පවත්වාගෙන යාම ඉලක්ක කර ගත් ජල සුරක්ෂිතතා සැලැසුම් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 7 ක හා ජල සම්පාදන ව්‍යාපෘතීන් 3 ක සංඛ්‍යාවක් තුළ ක්‍රියාත්මක වන අතර 2019 වර්ෂය තුළදී වීම ජල සුරක්ෂිතතා සැලැසුම් වල ක්‍රියාකාරිත්වය බාහිර විධිමත් විගණනයට භාජනය කරන ලදුව "හොඳයි" යනුවෙන් ශ්‍රේණිගත කරනු ලැබ ඇත. ලබුගම ජල සම්පාදන ව්‍යාපෘතිය හා සම්බන්ධ ජල සුරක්ෂිතතා සැලැසුමේ අභ්‍යන්තර අවිධිමත් විගණනය 2020 වර්ෂය තුළදී පවත්වන ලද අතර ඉතිරි ජල සුරක්ෂිතතා සැලැසුම් ද විගණනය සඳහා සූදානම්ව පවතී. බියගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත 2018 වර්ෂය තුළදී මධ්‍ය පරිමාණ කර්මාන්ත ඵලදායිතාවය පිළිබඳ 2 වැනි ස්ථානය ප්‍රදානය කරනු ලැබ ඇත. සියළුම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර වැඩ බිම් තුළ "ඵලදායිතාවය" හා "5" වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩ සටහන් හා වැඩමුළු මෙහෙයවන ලදි.

අඹතලේ පද්ධතියේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව දියත් කරන ලද අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය (AWSS1ESP) විසින් එහි වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. එම වැඩ පිළිවෙල මගින් පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ, බල ශක්ති සංරක්ෂණය කිරීමේ හා පද්ධතිය අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත්පත් කර ගැනීම (SCADA) මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ ශ්‍රේණිගත කිරීමේත් අරමුණ සහිතව පද්ධතිය තුළ ඇති බොහෝ පැරණි පෝම්ප හා වෑල්ව වෙනුවට අළුත් පෝම්ප හා වෑල්ව ස්ථාපිත කරනු ලබනවා ඇත. පාරිසරික ආරක්ෂාව කෙරෙහි ඇති කැප වීම වැඩි දියුණු කරමින් දිනකට ඝණ මීටර 8000 ක ගොහොදු මඩ ප්‍රතිකාරිත කිරීමේ ධාරිතාවයකින් යුත් ගොහොදු මඩ ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද ව්‍යාපෘතිය විසින් සේවයෙහි යොදවනු ලබනවා ඇත. ජලයේ ගුණාත්මය ප්‍රවීක්ෂණය කිරීම බටහිර නිෂ්පාදන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් විදිනෙදා ඉටු කරනු ලබන කාර්යයකි. ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) 614:2013 ප්‍රමිතියට අනුකූල වීම සහතික කිරීම සඳහා නල මාර්ග පානීය ජලය පාරිභෝගිකයන් වෙත බෙදා හරින තැන් දක්වාම පසු විපරමට භාජනය කරනු ලැබේ.

තිබෙන භාණ්ඩ හා ද්‍රව්‍ය තොග අතර ඇති ප්‍රයෝජනයට ගත නොහැකි හා ඉල්ලුමක් නැති අයිතමයන් හඳුනා ගැනීම සඳහා වාර්ෂික තොග හා ස්ථාවර වත් කම්හරි වැරදි බැලීම ක්‍රියාත්මක කරනු ලැබේ. තොග මට්ටම් අඩු කිරීමේ හා වත්කම් කළමනාකරණ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙන් තොග හරි වැරදි බැලීමේ ප්‍රතිඵලය විශ්ලේෂණය කරනු ලැබේ.

දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින විදේශීය / දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්.

නගර සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘති විසින් සාක්ෂාත් කරගනු ලැබ ඇති ජයග්‍රහණයන්.

2020 වර්ෂය තුළදී ඉදි කෙරෙමින් / වර්ධනය කෙරෙමින් පැවැතුන විදේශීය අරමුදල්/දේශීය බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් පෙන්නුම් කරනු ලබන සිතියම.



විදේශීය ඒජන්සි විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති.

	ව්‍යාපෘතියේ නම	අරමුදල් සපයන ඒජන්සිය
1	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 1 වැනි අදියර	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය.
2	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 2 වැනි අදියර	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය.
3	වීයලි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව
4	යාපනය - කිඩිනොච්චි ජල හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව
5	මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජනය	ආසියානු සංවර්ධන බැංකුව
6	අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලබන ප්‍රදේශ සඳහා ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 111	ආසියානු සංවර්ධන බැංකුව
7	ගම්පහ, අත්තනගල්ල හා මීතුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය	CDBC - චීනය
8	අම්පාරේ ජල සම්පාදන යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය
9	ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ICO - ස්පාඤ්ඤය
10	කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 11	CACIB - ප්‍රංශය
11	අලුත්ගම, මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ඉන්දියානු අපනයන ආනයන බැංකුව හා ලංකා බැංකුව
12	පොල්ගහවෙල, පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ඉන්දියානු අපනයන ආනයන බැංකුව
13	වීසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය	CACIB - ප්‍රංශය
14	මහනුවර උතුර පානදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතිය	චීන අපනයන ආනයන බැංකුව
15	ඔරුගොඩවත්ත සිට කඩුවෙල දක්වා වූ සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් මාර්ගය ප්‍රති ස්ථාපනය කිරීම	යුනික්‍රෙඩිට් බැංකුව, ඕස්ට්‍රියාව හා මහජන බැංකුව
16	කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය	EDFC - කොරියාව
17	හඹුන්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය	චීන සංවර්ධන බැංකුව
18	කිරම කඩුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	යුනික්‍රෙඩිට් බැංකුව, ඕස්ට්‍රියාව
19	හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය	අයිඑන්ජී බැංකුව, නෙදර්ලන්තය
20	රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය	අපනයන ආනයන බැංකුව, කොරියාව
21	මාතර පියවර iv	ජාතික සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකාව
22	දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය	EDFC - කොරියාව
23	කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය.

දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතීන්

	ව්‍යාපෘතියේ නම	අරමුදල් සපයන ඒජන්සිය
A	ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය	මහජන බැංකුව
B	ලඟ්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය	හැටන් නැෂනල් බැංකුව
C	ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය	DFCC
D	ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය	මහජන බැංකුව / ලංකා බැංකුව
E	හිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය	මහජන බැංකුව
F	වීසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය	ලංකා බැංකුව
G	විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය	ජාතික සංවර්ධන බැංකුව
H	මැද්දිහිරිය බෙදා හැරීම් අදියර 11	ලංකා බැංකුව
I	කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර නගර ජල සප්තාරම්භාදන ව්‍යාපෘතිය	ලංකා බැංකුව
J	මිලියන 3.5 ව්‍යාපෘතිය (ව්‍යාපෘති 22 කි)	ලංකා බැංකුව

විදේශයන් විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්

1. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (1 වැනි අදියර)

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) විසින් (ජපන් යෙන් මිලියන 5,166) හා ශ්‍රී ලංකා රජය විසින් (රුපියල් මිලියන 2,789) අරමුදල් සපයනු ලබන අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (1 වැනි අදියර) 2013 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කරන ලද අතර මුළු ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 11,515 ක් වේ.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ 2034 වර්ෂය වන විට අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි මැදවච්චිය හා රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වාසය කරන 115600 ක් වූ ජන ගහණයක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වේ.

මෙම ව්‍යාපෘතියේ අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 39600 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් ද, දිනකට ජලය ඝණ මීටර 9900 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, මුළු ධාරිතාවය ඝණ මීටර 7000 ක් වූ ඔසොව් ජල කුළුණු 4 ක සංඛ්‍යාවක් හා බිම් දෙණ 3 ක සංඛ්‍යාවක් ද, කිලෝ මීටර 89 ක දිගින් යුත් සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් ද, කිලෝ මීටර 520 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීමේ නල මාර්ග පද්ධතියක් හා (ස්ථාන භාර නිලධාරී කාර්යාල, රැක බලා ගන්නන්ගේ නිල නිවාස හා ප්‍රාදේශීය ඉංජිනේරු වරයාගේ නිල නිවාසය ආදී) මෙහෙයුම් ගොඩනැගිලි ද වන්නේය.

2020 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 57% ක් වූ අතර 2020 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිමා කොට සේවයේ යොදවනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත.



ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර වැඩ බිම - තුළු මුව

2. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (11 වැනි අදියර)

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 11 වැනි අදියරේ ප්‍රධාන විෂය පථය වන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි පදවිය, හොරොව්පොතාන, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් හා රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් තුළ වාසය කරන ජනතාව වෙත ආරක්ෂාකාරී පානීය ජලය නල මාර්ගයෙන් සම්පාදනය කර දීම සහතික කිරීම වන්නේය.

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ 11 වැනි අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ජපන් යෙන් මිලියන 23,137 ක ණය මුදලක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් 2016 නොවැම්බර් 17 වැනි දින ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) සමග ණය හිවිසුමක් අත්සන් කරනු ලැබ ඇත. මේ අතර මෙම ව්‍යාපෘතිය සඳහා වූ ශ්‍රී ලංකා රජයේ දායකත්වය රුපියල් මිලියන 4,732 ක් වනු ඇත. අදාළ ණය ගණුදෙනුව 2017 ජූනි 14 වැනි දින සිට බල සහිත වී ඇති අතර විස්තරාත්මක සැලැසුම හා ලංසු තැබීමේ සහාය පිළිබඳ කොන්ත්‍රාත්තුව 2018 මැයි මස 1 වැනි දින ආරම්භ විය.

මෙම ව්‍යාපෘතියේ අංගයන් වන්නේ යාන් ඔය ජලාශය තුළ දිනකට ජලය ඝණ මීටර 34800 ක ධාරිතාවයකින් යුත් තුළු මුව ඉදි කිරීම, දිනකට ජලය ඝණ මීටර 16500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම, තුළු මුව හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ හා ස්වයංක්‍රිය කරණ පද්ධතිය සකස් කිරීම, බිම් දෙණ 10 ක් ඉදි කිරීම, ඔසොව් කුළුණු 9 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, කිලෝ මීටර 147 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල ජාලය වැලීම හා කිලෝ මීටර 1050 ක දිගින් යුත් ජලය බෙදා හැරීමේ නල ජාලය වැලීම ද වන්නේය.

ව්‍යාපෘතිය පැකේජ 12 කට බෙදනු ලැබ ඇත. සැලැසුම හා ලංසු තැබීමේ සහාය පිළිබඳ කොන්ත්‍රාත්තුව දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. විස්තරාත්මක සැලැසුම පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එය දැනට ලංසු තැබීමේ සහාය පියවර තුළ පවතී. එහි භෞතික ප්‍රගතිය 90% ක් වන අතර 54.54% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත. ප්‍රස්තුත 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කරගනු ලැබ තිබී සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 10.3% ක් හා 0.73% ක් විය.

3. වියලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකු 5 වැනි ව්‍යාපෘතිය)

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම වියලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ වයඹ හා උතුරු පලාත් තුළ සේවා වැඩි දියුණු කිරීම් ඇති කිරීමේ අපේක්ෂාවෙන් වන්නේය. මෙම ව්‍යාපෘතිය යටතේ වවුනියාව, මන්නාරම, හලාවත හා පුත්තලම යන නගරයන් වෙත ඉහළ නංවන ලද ජල සම්පාදන හා සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දෙනු ලබනවා ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු ගත කරනු ලැබ ඇති පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 163.33 ක් වේ. (සත්‍ය පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 18,400 ක් වනු ඇත). 2020 දෙසැම්බර් අවසානය වන විට සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය 98% ක් වේ.

කලාපයන් හතර තුළම ඇති ව්‍යාපෘති අංගයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ඒවා අදාල බලධාරීන් වෙත භාර දෙනු ලැබ ඇත.



හලාවත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

4. යාපනය - කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුවේ 6 වැනි ව්‍යාපෘතිය)

මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කරනු ලබන්නේ දිනකට ආසන්න වශයෙන් පානීය ජලය ඝණ මීටර 24000 ක් නිෂ්පාදනය කළ හැකි වන පරිදි සමුද්‍ර ජල විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරය (SWRO) සංවර්ධනය කිරීම මගින් යාපනය නගරය, ඒ හා ආශ්‍රිත උප නගර, හා යාපනය අර්ධ ද්වීපය තුළ පිහිටි වෙනත් නාගරික ප්‍රදේශයන් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 300000 ක පමණ ජන ගහණයක් වෙත සපයනු ලබන පානීය ජල සම්පාදන පහසුකම් වැඩි දියුණු කිරීම වේ. යෝජිත

ප්‍රති ව්‍යුහගත කිරීම් ද සමග සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 23,256.00 ක අතිරේක මූල්‍යකරණය ද සමග රුපියල් මිලියන 35,881.49 ක් වේ.

ඔසොව් ජල කුළුණු 15 ක සංඛ්‍යාවක ඉදි කිරීම් වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඉතිරි ඔසොව් කුළුණු 5 ට අදාල ඉදි කිරීම් වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. කිලෝ මීටර 143.5 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රතිකාරිත ජලය සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධාන නල මාර්ගයේ වැඩ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර කිලෝ මීටර 42.4 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ගයේ ද වාත කපාටයන් සවි කිරීම හා උපාංග සවි කිරීම හැර අනිකුත් සියළුම කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. කිලෝ මීටර 79.4 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීමේ ජල නල මාර්ගයේ වැඩ කටයුතු ද සම්පූර්ණයෙන් නිම කොට ඇති අතර කිලෝ මීටර 247 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ගයේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. සමුද්‍ර ජල විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරය (SWRO) පැකේජයට, යාපනය නගරයේ කිලෝ මීටර 283 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීම් නල පද්ධති පැකේජයට හා කිලෝ මීටර 25 ක දිග ප්‍රමාණයකින් යුත් දූපත් අතර ජලය බෙදා හැරීමේ නල පද්ධති පැකේජයට අදාල ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී. චුන්නාකම් ජල සම්පාදන කොන්ත්‍රාත්තුව හා ශේෂය බෙදා හැරීම දැනට සැලැසුම් කිරීමේ පියවරෙහි පවතී. ව්‍යාපෘති පසු විපරම් අධීක්ෂණ උපදේශක කොන්ත්‍රාත්තුව හා මුහුදු ජලයෙන් ලාවණ්‍යතාවය ඉවත් කිරීමේ යන්ත්‍රාගාරය වෙනුවෙන් වූ පාරිසරික පසු විපරම් කණ්ඩායම් කොන්ත්‍රාත්තුව ද දැනට ප්‍රදානය කිරීමේ පියවරෙහි පවතී.

2020 වර්ෂයේ අවසානයට සාක්ෂාත් කර ගන්නා ලද භෞතික ප්‍රගතිය හා අතිරේක මූල්‍යකරණය ඇතුළු මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 47.37% ක් හා 46.41% ක් විය. (විනිමය අනුපාතිකයන් : මුල් ණය මුදල සඳහා එක් ඇමෙරිකානු ඩොලරය = ලංකා රුපියල් 111.73 ක් වූ අතර අතිරේක ණය මුදල සඳහා එක් ඇමෙරිකානු ඩොලරය = ලංකා රුපියල් 152.00 ක් විය).



සම්පූර්ණයෙන් වැඩ නිම කරන ලද පවිත්‍ර ජල දෙණ හා පොම්පාගාරය

5. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීම් ආයෝජන වැඩ සටහන- (GCWWMIIP) ව්‍යාපෘති අංක 01 හා ව්‍යාපෘති අංක 02.

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීම් ආයෝජන වැඩ සටහන- (GCWWMIIP) ව්‍යාපෘතිය විසින් අරමුණු කරනු ලබන්නේ පැරණි නල වෙනුවට අළුත් නල යෙදීම මගින්, සේවා සම්බන්ධතාවයන් මාරු කිරීම හා අළුත්වැඩියා කිරීම මගින් හා එම ප්‍රදේශය තුළ දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් (DMAs) ස්ථාපිත කිරීම මගින් කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදන ජාලය පුනරුත්ථාපනය කිරීමට වේ. මෙම පරමාර්ථය සඳහා ඉටු කළ යුතු වැඩ කටයුතු කොන්ත්‍රාත්තු පැකේජ හතරකට බෙදනු ලැබ ඇති අතර එම වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර සිවිල් වැඩ කොන්ත්‍රාත් කරුවන් සම්බන්ධ කරගනු ලැබ ඇත. ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරනු ලබන ප්‍රධාන ප්‍රතිඵලයන් වන්නේ කිලෝ මීටර 766 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ගයන් වෙනුවට අළුත් නල මාර්ග එලීම, කොළඹ නාගරික මායිම මත පද්ධති යෙදවුම් මීටර (SIV) 17 ක් ස්ථාපිත කිරීම, සේවා සම්බන්ධතා ජල මණු 140000 ක සංඛ්‍යාවක් ප්‍රති ස්ථාන ගත කිරීම හා දෝෂ සහිත ජල මණු වෙනුවට අළුත් මණු යෙදීම, භූගෝලීය තොරතුරු පද්ධති ජාලය ක්‍රමාංකනය කිරීම හා යාවත්කාලීන කිරීම හා සහාය ක්‍රියාකාරකම් සඳහා ගොඩනැගිලි හා පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම ද වන්නේය.

ප්‍රධාන වශයෙන්ම කොළඹ පිහිටි කොළඹ මහ නගර සභා ප්‍රදේශය ආවරණය කරනු ලබන අතර එම ප්‍රදේශය දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් (DMAs) 78 කට බෙදා වෙන් කරනු ලැබ ඇත. එම ප්‍රදේශයන් තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන්නේ ප්‍රධාන කොන්ත්‍රාත්තු පැකේජ සතරක් මගින් වේ. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රධානතම සම්පාදනයන් වන්නේ කිලෝ මීටර 720 ක දිග ප්‍රමාණයකින් යුත් නල මාර්ගය ප්‍රති ස්ථාපනය කිරීම, පද්ධති යෙදවුම් මනු 17 ක සංඛ්‍යාවක් ස්ථාපිත කිරීම, ජල මනු ප්‍රති ස්ථාන ගත කිරීම හා දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු යෙදීම, භූගෝලීය තොරතුරු පද්ධති ජාලය ක්‍රමාංකනය කිරීම හා යාවත්කාලීන කිරීම හා සහාය දීමේ ක්‍රියාකාරකම් සඳහා පුහුණු කිරීම් මධ්‍යස්ථානයක් ඇතුළු ගොඩනැගිලි ඉදි කිරීම ද වන්නේය.

ව්‍යාපෘති අංක 01 හා ව්‍යාපෘති අංක 02 විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය පිළිවෙලින් 84% ක් හා 61% ක් වන අතර ව්‍යාපෘති අංක 01 හා ව්‍යාපෘති අංක 02 විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 82% ක් හා 48% ක් වේ.

2020 වර්ෂය තුළ බල පවත්වන ලද කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ වුව ද ව්‍යාපෘතිය විසින් ප්‍රස්තුත වර්ෂය තුළදී ආසන්න වශයෙන් කිලෝ මීටර 126 ක දිග ප්‍රමාණයකට නල එලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. (මේ වන විට නල එලීම සම්පූර්ණ කරනු ලැබ ඇති මුළු දිග ප්‍රමාණය ආසන්න වශයෙන් කිලෝ මීටර 640 ක් වේ). ඊට අමතරව දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් 10 ක ඉදි කිරීම් කටයුතු ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් 45 ක සංඛ්‍යාවක් තුළ නල එලීමේ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර ඒ අතුරින් දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් 17 ක සංඛ්‍යාවක් තුළ නල එලීම් කටයුතු නිම කරනු ලැබීමට ආසන්න තත්ත්වයේ පවතී. සම්පූර්ණයෙන් වැඩ කටයුතු නිම කරන ලද දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් 26 අතුරින් 20 ක සංඛ්‍යාවක් තුළ ආදායම් රහිත ජල පරිමාවන් තක්සේරුවට බඳුන් කරනු ලැබිණි.

එම තක්සේරු කිරීමේ ප්‍රතිඵල අනුව වැඩ කටයුතු මුළුමනින්ම අවසන් කරනු ලැබ ඇති දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් වැඩිම සංඛ්‍යාවක් තුළ දක්නට ලැබෙන ආදායම් රහිත ජල පරිමාව 18% කට අඩු වේ. බොහෝ සෙයින් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන ආදායම් රහිත ජල පරිමාව ගණනය කිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා ලද්දේ ඇස්තමේන්තු කරන ලද පරිභෝජන පරිමාවක් විය. තවද කොළඹ නගරයේ ප්‍රදේශ කිහිපයක් වසංගත තත්ත්වය නිසා වසා දමා තිබුණ හෙයින් වැඩ කටයුතු අවසන් කිරීමට ආසන්න තත්ත්වයේ පැවැති දිස්ත්‍රික් මානක ප්‍රදේශයන් 17 ක් තුළ එම ගණනය කිරීම් සම්පූර්ණයෙන් නිම කළ නොහැකි විය. මේ හේතූන් කරණකොට ගෙන කොළඹ මහ නගර සීමාව තුළ ආදායම් රහිත ජල පරිමාවේ සැලැකිය යුතු වැඩි දියුණුවක් දක්නට ලැබෙන්නේ නැත.

ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කරනු ලබන සහාය ක්‍රියාකාරකම් යටතේ එලි හවුස් ප්‍රදේශයේ ඉංජිනේරු කාර්යාලය සම්පූර්ණයෙන් නිම කොට මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙන ලදි. එලී හවුස්හි ඉදි කරනු ලැබූ හුවන පොම්පාගාරය මුළුමනින්ම නිම කරනු ලැබ ඇති අතර එය මෙහෙයුම් කටයුතු සඳහා සේවයෙහි යෙදවීමට නියමිතව ඇත. මාලිගාකන්දේ ඉදි කරනු ලබන ආදායම් රහිත ජල ගොඩනැගිල්ලේ හා තෙලවල ඉදි කරනු ලබන පුහුණු කිරීම් ගොඩනැගිල්ලේ හා නවාතැන් පහසුකම් ගොඩනැගිල්ලේ ඉදි කිරීම් නිම කිරීමේ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.



නව පුහුණු කිරීම් මධ්‍යස්ථානය හා නවාතැන් පහසුකම්.

6. අම්පාර දිස්ත්‍රික්කයේ සේවා නොලබන ප්‍රදේශයන් වෙනුවෙන් වූ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 111 ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලබන ප්‍රදේශයන් තුළ මෙන්ම මොනරාගල හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි ඇතැම් ප්‍රදේශ තුළ වාසය කරන ආසන්න වශයෙන් 200000 ක් පමණ වූ ජනතාවක් වෙත සේවා සැපැයීම වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 20,825 ක් වශයෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ සේවා ආවරණය ඉහළ නැංවීම තුළින් ආවරණය කරනු ලබන ප්‍රදේශය තුළ වාසය කරනු ලබන දිළිඳු ජනතාව වෙත නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 40000 ක සංඛ්‍යාවක් ලබා දීම වේ.

1 වැනි ව්‍යාපෘති අංගය : විදේශීය අරමුදල් හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් දායකත්වයෙන් කොටසක් භාවිතා කරමින් ක්‍රියාත්මක කරන ලද දිනකට ජලය ඝණ මීටර 27000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, සම්ප්‍රේෂණ නල පද්ධතිය, දෙණ හා පොම්පාගාර සහ කිලෝ මීටර 698 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීම් නල පද්ධතිය සම්පාදනය කිරීම ද ඇතුලත් ව්‍යාපෘතියේ 1 වැන අංගය විදේශීය කොන්ත්‍රාත් කරු විසින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත.

2 වැනි ව්‍යාපෘති අංගය : ඔසොව් ජල ටැංකි 6 ක සංඛ්‍යාවක් ඉදි කිරීම වෙනුවෙන් වූ ව්‍යාපෘතියේ 2 වැනි අංගය වෙන් වෙන් කොන්ත්‍රාත්තු දෙකක් යටතේ හා ශ්‍රී ලංකා රජයේ සංෂටකය යටතේ දේශීය කොන්ත්‍රාත් කරුවන් දෙදෙනෙකු වෙත පවරන ලදි. කෙසේ වුව ද පාරිභෝගිකයින් මුහුණ පා සිටින ගැටළුව කඩිනමින් විසඳීමේ අවශ්‍යතාවය හා කොන්ත්‍රාත් කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය පදනම් කර ගනිමින් කොන්ත්‍රාත්තු වල කොන්දේසි අනුව කටයුතු කරමින් 2020 අගෝස්තු 24 වැනි දින කොන්ත්‍රාත්තු දෙක අවසන් කරන ලදි. කොන්ත්‍රාත්තු අවසන් කරන අවස්ථාව වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබුණ භෞතික ප්‍රගතිය 59% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 58% ක් විය. ඉතිරි වැඩ කර ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ වැඩ කටයුතු දැනට සිදු කර ගෙන යමින් පවතී.

3 වැනි ව්‍යාපෘති අංගය : ස්ථානීය නල පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා වූ 3 වැනි අංගය පිළිබඳ කොන්ත්‍රාත්තුව දේශීය කොන්ත්‍රාත් කරුවකු වෙත ප්‍රදානය කරන ලදි. අදාල වැඩ කටයුතු දැනට කරගෙන යනු ලබන අතර සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 80% ක් වේ.



හිමිදුරාව තුළු මුව

7. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය.

ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පරමාර්ථය වන්නේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 443 ක් වෙත නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 88000 ක සංඛ්‍යාවක් සැපැයීම හා එම ග්‍රාම නිලධාරී වසම් තුළ දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා සේවා සම්බන්ධතාවයන් 22000 ක සංඛ්‍යාවේ සේවා තත්ත්වය වැඩි දියුණු කිරීමත් වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ දිනකට ජලය ඝණ මීටර 54000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම ද, ජලය ඝණ මීටර 1500 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණු 5 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද, ජලය ඝණ මීටර 10000 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් ඉදි කිරීම ද, කිලෝ මීටර 90 ක දිග ප්‍රමාණයකින් යුතු සම්ප්‍රේෂණ නල මාර්ගයක් ඉදි කිරීම හා කිලෝ මීටර 630 දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල පද්ධතියක් ඉදි කිරීම ද ක්‍රියාත්මක කරනු ලැබීමට නියමිතව ඇත. ඊට අමතර වශයෙන්, ජලය ලබා ගන්නා ප්‍රධාන ප්‍රභවය වශයෙන් ජලය ඝණ මීටර මිලියන 3.5 ක ධාරිතාවයකින් යුත් ජලාශයක් නිර්මාණය කිරීම පිණිස බස්නාගොඩ වේල්ලක් ඉදි කරනු ලබනවා ඇත.

අත් පත් කර ගැනීමේදී හා වන්දි ගෙවීමේදී ඇති වූ ප්‍රමාදයන් හේතුකොට ගෙන වේල්ල හා තුළු මුව ඉදි කිරීමේ කටයුතු වල ප්‍රමාදයක් ඇති විය. දැනට එම කටයුතු ආරම්භ කිරීමට සූදානම්ව පවතී. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ඔසොව් කුළුණු 4 හා ජලාශය ඉදි කිරීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. පස්යාල, නයිවල, මිනුවන්ගොඩ, බැලුම්මහර හා අත්තනගල්ල කිලෝ මීටර 35 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගය හා කිලෝ මීටර 335 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීමේ නල මාර්ග පද්ධතිය සම්පූර්ණයෙන් නිම කොට ඇති නමුත් නිට්ටඹුව හා ගම්පහ කොන්ත්‍රාත්තු පැකේජයන් මෙතෙක් ප්‍රදානය කරනු ලැබ නොමැත.

ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය ආසන්න වශයෙන් 63% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 31,000 ක් වේ.

8. අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩිදියුණුකිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩිදියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ (2012/2013) කොළඹ ප්‍රධාන ක්‍රම සම්පාදන ව්‍යාපෘතියේ නිර්දේශය අනුව වේ. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ නිෂ්පාදන විශ්වාසනීයත්වය නංවා ලීම, බල ශක්ති සංරක්ෂණ පියවර හඳුන්වා දීම හා අඹතලේ ජල සම්පාදන පද්ධතියේ බෙදා හැරීමේ පහසුකම් වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම ද වන්නේය. සම අරමුදල් සම්පාදකයින් වන ආසියානු සංවර්ධන බැංකුවේ. හා ප්‍රංශ සංවර්ධන ඒජන්සියේ සහාය සහිතව ශ්‍රී ලංකා රජය විසින් අඹතලේ ජල සම්පාදන පද්ධති වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි. ව්‍යාපෘතිය සඳහා

ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක් වන අතර 2020 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය විසින් 38.46 ක භෞතික ප්‍රගතියක් හා 25.95% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බෙහි වූ විශේෂයෙන්ම කොවිඩ් 19 වසංගතයේ බල පෑම ආදී හේතූන් ගණනාවක් කරනකොට ගෙන ඉදි කිරීම් කොන්ත්‍රාත්තු හා උපදේශක කොන්ත්‍රාත්තු ප්‍රමාද විය. මේ හේතුකොට ගෙන කොන්ත්‍රාත් කරුවන් හා උපදේශක විසින් කාලය දීර්ඝ කිරීමක් ඉල්ලනු ලැබ ඇති අතර නිවැරදි සමාලෝචනයකින් හා ඉංජිනේරු වරයාගේ අනුමැතියෙන් පසුව මෙම කාලය දීර්ඝ කිරීම් ලබා දෙනු ලබන අතර ෂකට් 03 දරණ කොන්ත්‍රාත් පැකේජය 2020.08.04 වැනි දින ප්‍රදානය කරන ලදි. එම නිසා ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම තව දුරටත් දීර්ඝ කිරීම ප්‍රංශ සංවර්ධන ඒජන්සියේ ණය පහසුකම් ගිවිසුමේ දීර්ඝ කිරීමත් සමග සිදු විය යුත්තකි.

එසේම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කොට භාර දීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් ඉදි කිරීම් කොන්ත්‍රාත්තු පැකේජයන් සමීප ලෙස පසු විපරමට භාජනය කරනු ලබමින් තිබේ.

9. ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ ස්පාඤ්ඤ රජය හා ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව විසිනි. ප්‍රස්තුත ව්‍යාපෘතිය විසින් ආනමඩුව, කොටවෙහෙර, නවගත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ හා පුත්තලම, ගල්ගමුව, මුන්දලම හා මහ කුඹුක්කඩවල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි කොටසක් තුල බල පවත්වනු ලබන පානීය ජල ගැටළු වලට ස්ථිර විසඳුම් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය විසින් දිනකට ජලය ඝණ මීටර 12500 ක ධාරිතාවයකින් යුත් අළුත් තුළු මුවක් ඉඟිනිමිටිය ජලාශය තුළ ඉදි කරනු ලැබීමට යෝජිත අතර ඊට අමතර ලෙස කිලෝ මීටර 1 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක් සහිත දිනකට ජලය ඝණ මීටර 11000 ක ධාරිතාවයකින් යුත් පූර්ණ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද ඉදි කරනු ලබනවා ඇත. කිලෝ මීටර 61 ක දිගින් යුත් ප්‍රධාන පිරිසිදු ජල සම්ප්‍රේෂණ නල මාර්ගයක් මගින් ජලය ඝණ මීටර 1500 ක, ජලය ඝණ මීටර 1000 ක හා ජලය ඝණ මීටර 300 ක ධාරිතාවයන්ගෙන් යුත් ජල කුළුණු 4 ක සංඛ්‍යාවක් වෙත සේවා සපයනු ලබන අතර සියළු විද්‍යුත් යාන්ත්‍රික උපකරණ ඇතුලත් කිලෝ මීටර 328 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතියකින් ද ව්‍යාපෘතිය සමන්විත වනු ඇත. ආයතන සංවර්ධන කටයුතු ද ව්‍යාපෘතියට ඇතුලත් වේ. ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 45% ක් හා 33.84% ක් වේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන ඇති වූ දුෂ්කරතාවයන් හා බාධකයන් මධ්‍යයේ වුවද නල එලීමේ වැඩ කටයුතු හා කුළුණු ඉදි කිරීමේ වැඩ කටයුතු සැලැකිය යුතු ප්‍රමාණයකට නිම කිරීමට ව්‍යාපෘතියට හැකි වූ අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ඉදි කිරීම් කටයුතු 2021 වර්ෂයේ ජනවාරි මස මැද භාගය තුළ ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලැබේ. තවද 2020 දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතිය විසින් 55% ක භෞතික ප්‍රගතියක් හා 43.24% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කරගනු ලැබ ඇත.

10. කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි පියවර

කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - 11 වැනි පියවර ක්‍රියාත්මක කරනු ලබන්නේ ජලය සඳහා වැඩි වෙමින් පවතින ඉල්ලුමක් ඇති කොළඹින් උතුර නගරයන් වෙත සුරක්ෂිත ජල සම්පාදනයක් ලබා දීම සහතික කිරීමේ මූලික අරමුණ ඇතිව වේ. එසේ කිරීමට අදහස් කරනු ලබන්නේ බියගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ආසන්න ප්‍රදේශය තුළ දිනකට ජලය ඝණ මීටර 180000 ක ධාරිතාවයක් සහිත නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම මගින් වන්නේය.

මෙම ව්‍යාපෘතිය යටතේ බියගම, කැළණිය, මහර, ජා ඇල , වත්තල හා කටාන ග්‍රාම නිලධාරී වසම් වල පානීය ජල අවශ්‍යතා සපුරා ලීම සඳහා ආසන්න වශයෙන් කිලෝ මීටර 24 ක දිග ප්‍රමාණයකින් යුත් මෘදු යකඩ නල මාර්ගයක් එලීම මගින් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයේ වැඩි දියුණු කිරීම් සිදු කරනු ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ආසන්න වශයෙන් නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 120000 ක සංඛ්‍යාවක් ලබා දීම මගින් 1750000 ක පමණ ජන ගහණයක් වෙත සේවාවන් සම්පාදනය කර දෙනු ලැබීමට නියමිත වේ.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සපයන නියෝජිත ආයතනයන් වන්නේ ක්‍රෙඩිට් ඇග්‍රිකෝල් කෝර්පරේට්, ප්‍රංශ ආයෝජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ලංකා බැංකුව හා ශ්‍රී ලංකා රජයද වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැය වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන මුළු ව්‍යාපෘති පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 32,700 ක් වේ. ව්‍යාපෘතිය 2017 ජනවාරි මාසයේ ආරම්භ කරන ලද අතර ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් 2020 නොවැම්බර් 18 වැනි දින නව යන්ත්‍රාගාරය විවෘත කරන ලදුව මහ ජනතාව වෙත පිළිගන්වන ලදි.

2020 දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබූ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 97% ක් හා 84% ක් විය.



පොම්පාගාරය

11. අළුත්ගම මතුගම අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් සාක්ෂාත් කර ගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන අරමුණු නම් කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය විස්තාරණය කිරීම මගින් මතුගම, දොඩංගොඩ, කළුතර, බේරුවල, අගලවත්ත හා මාදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 269 ක් තුළ වාසය කරනු ලබන ජනතාවගේ වර්ධනය වෙමින් පවත්නා ජල ඉල්ලුම සපුරා ලීම පිණිස සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම හා කොලේමෝදර නව තුළු මුවක් ඉදි කිරීම මගින් කුඩා ගඟ සිට අමු ජලය සම්ප්‍රේෂණය කොට දැනට බල පවත්නා ලාවණ්‍යතා ආක්‍රාන්ති ගැටළුව අඩු කිරීමට කටයුතු කිරීම ද වේ.

ව්‍යාපෘතිය සැලැසුම් කරන ලද්දේ නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 32000 ක සංඛ්‍යාවක් සපයා දීමේ හා දැනට සිටින පාරිභෝගිකයින් වෙත සපයනු ලබන සේවාවන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ සහිතව වේ. 300000 ක මුළු ජන සංඛ්‍යාවක් (පවුල් 60000 ක්) මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රතිලාභ ලබනු ඇත.

ව්‍යාපෘතිය වෙනුවෙන් මූල්‍ය පහසුකම් සපයා දෙනු ලබන්නේ ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව, ලංකා බැංකුව හා ශ්‍රී ලංකා රජය විසින් වන අතර ව්‍යාපෘතිය සඳහා වැය වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 32,278 ක් වේ. මෙම ව්‍යාපෘතිය 2017. 05. 15 වැනි දින ආරම්භ කරන ලද අතර 2021

වර්ෂයේ මාර්තු මස 31 වැනි දින වන විට එය සම්පූර්ණයෙන් නිම කළ හැකි වෙතැයි අපේක්ෂා කරනු ලැබේ. (කාලය දීර්ඝ කිරීම ලබා දෙනු ලබනවා ඇත).

කොලේමෝදර නව තුළු මුව, කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා බෙදා හැරීමේ පද්ධතිය ඉදි කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. දොඩංගොඩ භූමි ජලාශය ඉදි කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර මතුගම, මතුගම කන්ද, අගලවත්ත හා නෑබොඩ කුළුණු වල නල මාර්ග වැලීමේ කටයුතු හැර සෙසු කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ප්‍රස්තුත 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 70.55% ක් හා 70.52% ක් විය.



කොලේමෝදර නව තුළු මුව ඉදි කිරීම.

12. පොල්ගහවෙල, පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

පොල්ගහවෙල, පොතුහැර හා අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය වනාහී ව්‍යාපෘති ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ග්‍රාම නිලධාරී වසම් 167 ක් තුළ ජීවත් වන 162725 ක ජන සංඛ්‍යාවක් වෙත සුරක්ෂිත පානීය ජලය සපයා බෙදා දීම පිණිස ක්‍රම සම්පාදනය කොට සැලැසුම් කර ගොඩ නැගීමේ කොන්ත්‍රාත්තුවක් වේ. ව්‍යාපෘතිය වෙනුවෙන් ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව විසින් අවශ්‍ය අරමුදල් වලින් 85% ක් සපයනු ලබන අතර ලංකා බැංකුව විසින් අරමුදල් අවශ්‍යතාවයෙන් 15% ක් සපයා දෙනු ලැබේ. මුළු ව්‍යාපෘති පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 108 ක් වනු ඇත.

2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 81.1% ක් හා 79% ක් වූ අතර ව්‍යාපෘතිය 2021 මාර්තු අවසානය වන විට සම්පූර්ණයෙන් නිම කළ හැකි වෙතැයි අපේක්ෂා කරනු ලැබේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී බොහෝ අභියෝගයන්ට අබිභවා යාමට සිදු විය. මාර්ග ගැට්ට දිගට නල වැලීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය අවසර දුන්නේ නැත. සියළුම සම්ප්‍රේෂණ නල මාර්ගයන් දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා වෙන් කරනු ලැබ ඇති ප්‍රදේශයන් වෙත විතැන් කිරීමට හා දුම්රිය මාර්ග පැන්නීම් කිරීමට සිදු විය. මාර්ගයන් කපා හරස් පැන්නීම් කිරීමට ඉඩ නොදුන් අතර මාර්ග හරස් පැන්නීම් 60 ක සංඛ්‍යාවක් වෙනුවෙන් HDD කිරීමට සිදු විය. තවද අධිවේගී මාර්ග වලට ඇතුළු වන ස්ථානයන් තුළ පස් පිරවීම් සම්පූර්ණ කරන තෙක් ස්ථාන 6 ක පාර හරහා නල වැලීම් සිදු කළ නොහැකි විය. ඒ අතර මෝසම් වැසි සමයන්හිදී ගංගා ගලනයේ සිදු වන උච්චාවචනයන් තුළු මුව ඉදි කිරීම කෙරෙහි බල පෑම් වැල්ල කළේය.

13. විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය (සමස්ත ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 75000 ක ධාරිතාවයක් සහිත) ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 5 කින් ද, තුළු මුව 5 කින් ද, සේවා ජලාශයන් 10 කින් හා කිලෝ මීටර 433 ක දිග ප්‍රමාණයකින් යුත් ජල නල වැලීමකින් ද සමන්විත වේ. කොන්ත්‍රාත්තුව සැලැසුම් කොට ඉදි කිරීම වර්ගයේ කොන්ත්‍රාත්තුවක් වන අතර එය යුරෝ 105,645,791 + රුපියල් 8,210,959 ක් සඳහා ප්‍රදානය කරනු ලැබ ඇත. කොන්ත්‍රාත්තු කාලය මාස 36 ක් වන අතර එයට අදාල වැඩ කටයුතු 2017 වර්ෂයේ අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලදි.

2020 වර්ෂයේ අවසානය වන විට ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර ඉදි කිරීම් කටයුතු 91% ක් ද, ජලාශ ඉදි කිරීම් කටයුතු 94% ක් ද, තුළු මුව ඉදි කිරීම් කටයුතු 85% ක් හා නල වැලීමේ වැඩ කටයුතු 66% ක් ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබුණ අතර යාන්ත්‍රික අයිතමයන් 90% ක් සපයනු ලැබ ඇති අතර ඒවා ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. 80% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත.

ව්‍යාපෘතියේ ප්‍රගතිය සැලැසුම් කළ ආකාරයට සිදු නොවන්නට හේතු වූ ගැටළු කිහිපයකට මුහුණ දීමට ව්‍යාපෘතියට සිදු විය. රත්තොට ප්‍රදේශයට ජලය සම්පාදනය කර දීම සඳහා යෝජිත ජල ප්‍රභවය වූ වෙරළුගස් තැන්න අතු ගංගාවෙන් ජලය උකහා ගැනීම සම්බන්ධයෙන් ගොවි ජනතාව විසින් දක්වන ලද විරෝධය පිළිබඳ ගැටළුව මේ වන තෙක් විසඳා ගැනීමට නොහැකි වී ඇත. ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය මන්දගාමී වී ඇති අතර අවශ්‍ය ඉඩම් කැබැලි 9 ක සංඛ්‍යාවක් අත් පත් කර ගැනීම මෙතෙක් ඉටු කර ගත නොහැකි විය.

මෙම ව්‍යාපෘතිය අර්ධ වශයෙන් නිම වූ තත්ත්වයෙන් 2021 වර්ෂයේ අප්‍රේල් මාසය තුළදී සේවයේ යෙදවීමට අපේක්ෂා කරනු ලැබේ. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 4 ක සංඛ්‍යාවක් දැනට සම්පූර්ණයෙන් නිමවනු ලැබ ඇති අතර බෙදා හැරීම් පද්ධතිය 72% ක් නිමවනු ලැබ ඇත. ඉතිරි වී ඇති වැඩ කොටස් 2021 අගෝස්තු මාසය වන විට නිම කරනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ.



අඹන්ගඟ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

14. මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි පාතදුම්බර, අකුරන, හාරිස්පත්තුව, පූජාපිටිය, මහනුවර කඩවත් සතර හා තුම්පනේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ක සංඛ්‍යාවක් ආවරණය කරනු ලබන අතර දැනට ක්‍රියාත්මක කරනු ලබන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 50000 සිට දිනකට ජලය ඝණ මීටර 100000 ක් දක්වා වැඩි කිරීම මගින් එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 තුළ ජීවත් වන 470000 ක් වූ ප්‍රතිලාභී ජන ගහණයක් වෙත පානීය ජල සම්පාදන සේවාවන් සපයා දීමට ඉලක්ක කරනු ලැබ ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයනු ලබන ප්‍රභවයන් වන්නේ චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය වේ. අදාල කොන්ත්‍රාත්තුව ඇමෙරිකානු ඩොලර් මිලියන 194.83 ක හා

රුපියල් මිලියන 8,356.25 ක හා ශ්‍රී ලංකා ජන රජය විසින් සපයන ලද මුදල් ප්‍රමාණයක් වූ රුපියල් මිලියන 7,313.94 ක මුදලද ඇතුලත් කොන්ත්‍රාත්තු මුදලකට ප්‍රදානය කරන ලදි. කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම වර්ෂ 2019 අගෝස්තු 21 වැනි දින ආරම්භ කරන ලද අතර එය වර්ෂ 2022 අගෝස්තු මස 20 වැනි දින සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිතය.

මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන්ම සමන්විත වන්නේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා තුළු මුව වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු, සේවා ජලාශයන් 27 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, නව පොම්පාගාරයන් 17 ක සංඛ්‍යාවක් ඉදි කිරීම සහ කිලෝ මීටර 570 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල පද්ධතියක් හා කිලෝ මීටර 83 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ග සපයා එලීම යන අංගයන්ගෙනි. ග්‍රාමීය ජල සම්පාදනය සඳහා වූ විධි විධාන මෙන්ම ආදායම් රහිත ජලය වැලැක්වීමේ හා පරිමාව අඩු කිරීමේ වැඩ සටහනක් ද ඊට ඇතුලත් වේ. 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 28.5% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 24.5 ක් වේ.

15. ඔරුගොඩ වත්තේ සිට කඩුවෙල දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග හා ප්‍රධාන බෙදා හැරීමේ නල මාර්ග ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ ලබුගම, කලටුවාව හා අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්හි සිට එලනු ලැබ ඇති සම්ප්‍රේෂණ නල මාර්ගයන් වෙනුවට ඔරුගොඩවත්ත ගුවන් පාලමේ සිට කඩුවෙල අධි වේගී මාර්ග අතුරු මාරුව දක්වා පහළ මට්ටමේ මාර්ගය ඔස්සේ විෂ්කම්භය මිලි මීටර 1200 හා මිලි මීටර 1000 මෘදු යකඩ නල යොදා ගනිමින් නව නල මාර්ග එලනු ලබනවා ඇත. ඊට අමතර වශයෙන් මෙම කොටස තුළ මිලි මීටර 355 ක විෂ්කම්භයකින් යුත් හා මිලි මීටර 160 ක විෂ්කම්භයකින් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් (HDPE) නල මාර්ගයන් ද එලනු ලබනවා ඇත.

ප්‍රස්තුත වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 62.09% ක් හා 59.85% ක් විය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දියත් කරනු ලැබ ඇති මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හා සමගාමී ලෙස වේ. ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු අසම්පූර්ණ තත්ත්වයේ තිබීම නිසා හා කණ්ඩි පිරවීමේ වැඩ කටයුතු හේතුකොට ගෙන මාර්ගයේ ඇතැම් කොටස් වල නල එලීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයක් ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය හා සම්බන්ධ ගැටළු වලට අමතර වශයෙන් ඇතැම් ස්ථානයන්හි ඇති (ලංකා විදුලි බල මණ්ඩලයට, LECO ට හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත්) උපයෝජ්‍යතා මාර්ගයන් හා කණු ද විතැන් කිරීමේ අවශ්‍යතාවය පැන නගී.



මෘදු යකඩ නල එලීම

16. කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 46 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් (කටාන දකුණ, කටාන මධ්‍යම හා කටාන උතුර යන) කලාපයන් තුන තුළ ජීවත් වන ජනතාව වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලබන අතර ඒ මගින් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන්ගේ මුළු සංඛ්‍යාව 156000 ක් වනු ඇත.

කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය සැලැසුම් කොට ඉදි කිරීමේ ව්‍යාපෘතියක් වන අතර මෙම ව්‍යාපෘතියට ඇතුළත් වන්නේ ඝණ මීටර 2000 ක ධාරිතාවයකින් යුත් ඉහළ ඔසොව් ජල කුළුණු 3 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, කිලෝ මීටර 12 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක් ඉදි කිරීම, කිලෝ මීටර 240 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතියක් ඉදි කිරීම, අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත් පත් කර ගැනීමේ (SCADA) පද්ධතිය හඳුන්වා දීම ඇතුළු යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු හා ස්ථාන හාර නිලධාරී කාර්යාල 2 ක්, අව්වාහක නිල නිවාස 1 ක් හා පොම්පාගාර 2 ක් ඇතුළු ගොඩනැගිලි ඉදි කිරීම ද වේ. 2020 දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබුණ භෞතික ප්‍රගතිය 96.76% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 85.3% ක් විය. නල මාර්ග සෝදා පිරිසිදු කිරීමේ වැඩ කටයුතු හා යාන්ත්‍රික හා විද්‍යුත් ස්ථාපිත කිරීම් වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරගෙන යනු ලබමින් පවතී. මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ පෙබරවාරි මාසයේ අවසානය වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිත වේ.



උතුරු කුළුණ - බම්බුකුලිය

17. තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ තඹුත්තේගම, තලාව හා ගල්නෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 42 ක සංඛ්‍යාවක් තුළ ජීවත් වන ජනතාව වෙත ආරක්ෂිත හා විශ්වාසදායක නල මාර්ග ජල සම්පාදනයක් ලබා දීම වේ. ව්‍යාපෘතියේ කාල සීමාව 2018 ජූලි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වන්නේය.

කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා හා රාජාංගන වැව යටතේ කෘෂි කාර්මික කටයුතු වල යෙදෙන ගොවීන්ගේ ගොවි සංවිධානයන් විසින් දියත් කරන ලද ඒකාබද්ධ විරෝධතාවය නිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය කෙරෙහි දැඩි බල පෑම් එල්ල විය. ඊට අමතරව තුළු මුව ඉදි කිරීම සඳහා වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉඩමක් නිදහස් නොකිරීම ද ව්‍යාපෘතියේ ප්‍රගතියට මහත් බාධාවක් විය. මේ හේතූන් මත පදනම් වෙමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දැනටමත් ව්‍යාපෘතියේ කාලය 2021 දෙසැම්බර් 31 වැනි දිනය දක්වා දීර්ඝ කරනු ලැබ ඇත.

රාජාංගන වැවෙන් ජලය උකහා ගැනීම සඳහා වූ අනුමැතිය මෙතෙක් ලබා දී නැති අතර තුළු මුව ගොඩනැගීම සඳහා ඉඩමක් අත් පත් කර ගැනීම ද මෙතෙක් කරගත නොහැකි වී ඇත. කෙසේ වුව ද

ව්‍යාපෘතිය සඳහා විකල්ප ජල ප්‍රභවයක් වශයෙන් දැනට අන්ගමුව ජලාශය යෝජනා කරනු ලැබ ඇති අතර ඒ හා සම්බන්ධ අධ්‍යයනයන් දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී.

18. කිරම - කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

කිරම - කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත්තේ කටුවන හා වලස්මුල්ල යන ප්‍රදේශයන් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 34 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් ඒවායේ වාසය කරන ජනතාව වෙත විශ්වාසනීය පානීය ජල සම්පාදනයක් ලබා දීම අරමුණු කර ගනිමින් වේ.

ඕස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව විසින් සපයන ලද යුරෝ මිලියන 10,485.611 හා ශ්‍රී ලංකා ජන රජය විසින් සපයන ලද රුපියල් මිලියන 700 ක දේශීය අරමුදල් වෙනුවෙන් අදාල කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදි. ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2019 ජනවාරි 31 වැනි දින ආරම්භ කරන ලද අතර තුළු මුව ඉදි කිරීමට මුලින් අදහස් කරන ලද ස්ථානය වෙනස් වීම හේතුකොට ගෙන හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට ගෙන අනපේක්ෂිත පරිදි පැන නැගුන ගැටළු නිසා ව්‍යාපෘතියේ කාල සීමාව 2021 වර්ෂයේ අගෝස්තු 31 වැනි දින දක්වා දීර්ඝ කරන්නට සිදු විය.

දිනකට ජලය ඝණ මීටර 3500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම හා ඒ හා සමග කිරම හා කටුවන යන ප්‍රදේශයන් දෙකම ආවරණය වන පරිදි කිලෝ මීටර 7.5 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගයක් ඉදි කිරීම හා කිලෝ මීටර 45 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල ජාලයක් ඉදි කිරීම ද ව්‍යාපෘතියේ අංගයන්ට ඇතුලත් වේ. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 26000 ක් වන අතර ඔවුන් වෙත නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 3200 ක සංඛ්‍යාවක් සැපයීම හා දැනටමත් දෙනු ලැබ ඇති සේවා සම්බන්ධතාවයන් වැඩි දියුණු කිරීම් 2000 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ප්‍රස්තුත 2020 වර්ෂයේ අවසානය වන විට අදාල ප්‍රධාන වැඩ කටයුතු අතුරින් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ඉදි කිරීම් කටයුතු 76% ක ප්‍රතිශතයක් ද, ජලය බෙදා හැරීම් හා සම්ප්‍රේෂණය කිරීම් නල ජාලය ඉදි කිරීම් කටයුතු 85% ක ප්‍රතිශතයක් ද, ජලාශ ඉදි කිරීමේ කටයුතු වලින් 79% ක ප්‍රතිශතයක් හා තුළු මුව ඉදි කිරීමේ කටයුතු වලින් 14% ක ප්‍රතිශතයක් ද සම්පූර්ණ කරනු ලැබ තිබුණ අතර ඒ අනුව ව්‍යාපෘතිය විසින් 73% ක භෞතික ප්‍රගතියක් සාක්ෂාත් කරගෙන තිබුණ අතර කාලය තුළ සාක්ෂාත් කර ගනු ලැබ තිබුණ මූල්‍ය ප්‍රගතිය 82.36% ක් විය. මේ හැර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ව්‍යාපෘතියේ නව ජල ප්‍රභවය වශයෙන් කිරම ජලාශය තෝරා ගැනීම ද සිදු කරන ලදි.

19. හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය

හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය දියත් කරනු ලැබ ඇත්තේ සබරගමුව පලාතේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි මාවනැල්ල, අරනායක හා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ට අයත් ග්‍රාම නිලධාරී වසම් 135 ක සංඛ්‍යාවක් තුළ වාසය කරනු ලබන 169000 ක ජන ගහණයක් වෙත (2042 වර්ෂය වන විට) නල මාර්ගික ජලය ලබා දීම සඳහා නව ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිණිස වේ. මුළු ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 17,422.29 ක් වන අතර ව්‍යාපෘති කාලය 2018 දෙසැම්බර් මාසයේ සිට 2020 අගෝස්තු මාසය දක්වා වූ මාස 44 ක් වේ.

ව්‍යාපෘතිය දිනකට ජලය ඝණ මීටර 21000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක්, දිනකට ජලය ඝණ මීටර 24000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක්, භූමි ජලාශ 07 ක සංඛ්‍යාවක්, කිලෝ මීටර 0.63 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක්, කිලෝ මීටර 37 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල ජාලයක් හා කිලෝ මීටර් 74 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල පද්ධතියක් යන ව්‍යාපෘති අංගයන්ගෙන් සමන්විත වේ.

2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 26.35% ක් හා 35.99% ක් විය. වතු අංශයෙන් ඉඩම් අත් පත් කර ගැනීම ව්‍යාපෘතිය විසින් දැනට හඳුනාගනු ලැබ ඇති ප්‍රධාන ගැටළුවක් වන අතර එකී ඉඩම් සඳහා වූ වන්දි මුදල් මෙතෙක් ගෙවනු ලැබ නොමැත. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ වැඩ කටයුතු දැනට ආරම්භ කරනු ලැබ ඇති අතර ජලාශයන් ඉදි කිරීමේ වැඩ කටයුතු වල දැනට ප්‍රගතිය 44% ක් වේ.

20. රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය දිනකට ජලය ඝණ මීටර 4400 ක ධාරිතාවයකින් යුතු තුළු මුවකින් හා ප්‍රධාන අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගයකින් ද, දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් හා ගබඩා ජලාශයන් පහක සංඛ්‍යාවකින් ද සමන්විත වේ. සම්ප්‍රේෂණ හා ජලය බෙදා හැරීමේ නල මාර්ග පද්ධති පිළිවෙලින් ආසන්න වශයෙන් කිලෝ මීටර 20 ක දිග ප්‍රමාණයකින් හා කිලෝ මීටර 90 ක දිග ප්‍රමාණයකින් යුක්ත වේ. මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලද්දේ 2020 වර්ෂයේ ආරම්භයේදීය. කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වීම ආරම්භ වූ පළමු අවස්ථාවේ ක්ෂේත්‍ර වැඩ කටයුතු සම්බන්ධයෙන් පනවන්නට යෙදුණ සීමාවන් හේතුකොට ගෙන හා සංශෝධිත සැලැසුම් ක්ෂිතිජය සමග ඇති වූ ධාරිතා වර්ධනය හේතුකොට ගෙන අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීම කළ නොහැකි විය.

මේ වන විට සැලැසුම් කිරීමේ වැඩ කටයුතු බොහෝ සෙයින් අවසන් කරනු ලැබ අතර ඉදි කිරීම් කටයුතු ආරම්භ කළ හැකි තත්ත්වයක් උදා වී ඇත. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර වැඩ බිම තුළ සැලැසුම් කිරීමේ කටයුතු, ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු හා ගල් පුපුරවා හැරීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබ ඇත. විෂය පථයේ සිදු කරනු ලැබ ඇති වෙනස් වීම් සඳහා විචලන කමිටුවේ හා ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවේ (PAC) අනුමැතිය ලබා ගෙන ඇත. කන්නතොට හා මහල්ල පිහිටුවනු ලැබ ඇති ජලාශයන් දෙකෙහි උස ප්‍රමාණයන් අඩු කිරීම මගින් ව්‍යාපෘතිය තුළ බල ශක්ති සංරක්ෂණය ආරම්භ කරන ලදි. ඉන් පසුව හුවන පොම්ප ස්ථානයක් හා අඩු ධාරිතාවයෙන් යුත් ජලාශයක් හඳුන්වා දෙන ලදි. 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 8.02% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 19.44% ක් විය.

21. මාතර IV වැනි පියවර ජල සම්පාදන ව්‍යාපෘතිය

මාතර IV වැනි පියවර ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ දැනට ක්‍රියාත්මක වන පද්ධතිය හරහා සම්පාදනය කරනු ලබන ජලයෙහි ගුණාත්මය හා ප්‍රමාණය නංවා ලීම හා මාතර දිස්ත්‍රික්කය තුළ (දැනට සේවාව නොලබන) නව ප්‍රදේශයන් වෙත නල මාර්ගික ජල සම්පාදන සේවාව ව්‍යාප්ත කිරීම ආරම්භ කිරීම ද වන්නේය. මෙම ව්‍යාපෘතිය දොරටු 05 කින් සමන්විත ලාවණ්‍යතා බාධකයකින් ද, දිනකට ජලය ඝණ මීටර 60000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවකින් ද, දිනකට ජලය ඝණ මීටර 30000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද, සේවා ජලාශයන් 05 ක සංඛ්‍යාවකින් හා උස් ඔසොව් ජල කුළුණු 04 ක සංඛ්‍යාවකින් ද, කිලෝ මීටර 75 ක දිග ප්‍රමාණයකින් යුත් සම්ප්‍රේෂණ නල පද්ධතියකින් ද, කිලෝ මීටර 105 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල පද්ධතියකින් ද, ප්‍රධාන රසායනාගාරයකින් ද, ස්ථාන භාර නිලධාරී කාර්යාල දෙකකින් හා කාර්ය මණ්ඩල නිල නිවාස 08 ක සංඛ්‍යාවකින් ද සමන්විත වේ. ව්‍යාපෘතිය විසින් ආවරණය කරනු ලබන ප්‍රදේශයට මාතර දිස්ත්‍රික්කය හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොටසක් අයත් වන අතර ඊට ග්‍රාම නිලධාරී වසම් 236 ක සංඛ්‍යාවක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක සංඛ්‍යාවක් අයත් වේ. අරමුදල් සපයන ආයතනයන් වන්නේ ශ්‍රී ලංකා ජන රජය හා ජාතික සංවර්ධන බැංකුවයි. ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලද දිනය 2017.10.10 වන අතර ඉඩම් අත් පත් කර ගැනීමේදී ඇති වූ ප්‍රමාදයන් හේතුකොට ගෙන සංශෝධනය කරන ලද ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කළ යුතුව ඇති දිනය 2021.10.02 වේ. රුපියලට සාපේක්ෂක ලෙස ඩොලරයේ අගය ඉහළ යාම නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති ව්‍යාපෘති පිරිවැය ආසන්න වශයෙන් (දේශීය බැංකු

අරමුදල් දායකත්වය) රුපියල් මිලියන 20,700 ක් හා (ශ්‍රී ලංකා ජන රජයේ දායකත්වය) රුපියල් මිලියන 4000 ක් වේ. 2020 දෙසැම්බර් අවසානයට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 65% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය (මුල් කොන්ත්‍රාත්තු මුදල අනුව) 56.3% ක් හා (සංශෝධිත කොන්ත්‍රාත් මුදල අනුව) 47.9% ක් විය.

22. දදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය

දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරන ලද්දේ 2016 දෙසැම්බර් 22 වැනි දින වන අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කළ යුතු දිනය වශයෙන් මුලින් යොදා ගනු ලැබ තිබුනේ 2019 මාර්තු 21 වැනි දිනයයි. විවිධ හේතූන් නිසා කාලය දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දීමෙන් අනතුරුව ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කළ යුතු නව දිනය 2021 පෙබරවාරි 28 වැනි දින වශයෙන් තීරණය කරනු ලැබිණි. ප්‍රස්තුත ව්‍යාපෘතිය සමන්විත වන්නේ දිනකට ජලය ඝණ මීටර 34500 ක ධාරිතාවයකින් යුත් තුළු මුව, දිනකට ජලය ඝණ මීටර 15000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ඔසොව් ජල කුළුණු තුනක සංඛ්‍යාවක් හා ජලය ඝණ මීටර 3750 ක් ගබඩා කිරීම සඳහා වූ බිම් ටැංකියක්, කිලෝ මීටර 39 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ග යක්, කිලෝ මීටර 266 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධති ජාලයක් හා (ස්ථාන භාර නිලධාරී කාර්යාලය හා නිල නිවාස 3 ක සංඛ්‍යාවකින් යුක්ත වූ) මෙහෙයුම් ගොඩනැගිලි ඉදි කිරීම යන ව්‍යාපෘති අංගයන්ගෙන් වේ. ප්‍රස්තුත 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබුණ භෞතික ප්‍රගතිය 99% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 84.5% ක් විය.

මෙම ව්‍යාපෘතිය මගින් ඉලක්ක කරනු ලබන්නේ මහව හා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 104 ක සංඛ්‍යාවක් තුළ වාසය කරනු ලබන ආසන්න වශයෙන් 25000 ක් පමණ වූ පවුල් සංඛ්‍යාවක් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට වේ. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කළ පසුව හඳුනා නොගත් හේතූන් නිසා පීඩාවට පත්ව සිටින ජනතාව වෙත මහත් ප්‍රතිලාභ ලැබෙනු ඇත.

සියළුම ඉදි කිරීම් වැඩ කටයුතු හා කාර්ය සාධන පරීක්ෂණ කිරීම් 2020 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත. ආරම්භයක් වශයෙන් මහව ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙතින් දැනට සේවය ලබන පාරිභෝගිකයින් වෙත ජලය ලබා දෙනු ලබන අතර නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් ලබා දීම 2021 වර්ෂයේ මුල් කාර්තුව තුළදී කළ හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

ජල මූලාශ්‍රය තුළ (දැදුරු ඔය ජලාශය තුළ) වාර්කව ඇති වන හරිතප්‍රද සහිත සරල ශාඛ වල ශීඝ්‍ර බෝ වීම සම්බන්ධයෙන් කටයුතු කළ හැකි වන පරිදි ජල ප්‍රතිකාරක පහසුකම් නංවා ලීම අවශ්‍ය වන අතර ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන සියළු ජනතාවට ජලය ලබා ගත හැකි වන සේ බෙදා හැරීමේ පද්ධතිය තුළ ඇති අඩු පාඩු සකස් කළ යුතුව ඇත.

23. කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කරනු ලබන්නේ කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමු වැනි අදියර කලාපය තුළ ඇති චම ව්‍යාපෘතියේ සේවාවන් නොලබන ප්‍රදේශයන් වෙත නල මාර්ගික ජල සම්පාදන සේවා දීර්ඝ කිරීම මගින් හා කළු ගඟ ජල සම්පාදන පහසුකම් වල මා වැඩ හා සම්ප්‍රේෂණ කටයුතු විස්තාරණය කිරීම මගින් කළුතර හා කොළඹ දිස්ත්‍රික්කයන් තුළ දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන ජාලයේ කාර්යක්ෂමතාවය නංවා ලීම මගින් හා ජලය බෙදා හැරීමේ ජාලයන් ප්‍රති ව්‍යුහගත කිරීම මගින් සාමාන්‍ය මහ ජනතාව වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වන්නේය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දැනට සම්පාදනය කර දෙනු ලැබ ඇති ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව යටත්පිරිසෙයින් 75000 ක සංඛ්‍යාවකින් වර්ධනය වනු ඇත. මේ අනුව විස්තාරණ ව්‍යාපෘතීන් 1 හා 2 සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමත් සමග පවුල් 500984 ක සංඛ්‍යාවක් වෙත ප්‍රතිලාභ ලැබෙනු ඇති අතර ආසන්න වශයෙන් සේවා සම්බන්ධතාවයන් 200000 ක සේවා තත්ත්වයන් වැඩි දියුණු වනු ඇත.

ප්‍රස්තුත ව්‍යාපෘතිය යටතේ පිළිවෙලින් දිනකට ජලය ඝණ මීටර 294000 ක හා දිනකට ජලය ඝණ මීටර 140000 ක ධාරිතාවයන්ගෙන් යුත් තුළු මුවක් හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් කඳුනේ ඉදි කිරීම මගින් මා වැඩ වැඩි දියුණු කිරීම සිදු කරනු ලබනවා ඇත. මීට අමතර ලෙස ආසන්න වශයෙන් කිලෝ මීටර 38 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක් ද, ආසන්න වශයෙන් කිලෝ මීටර 100 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන බෙදා හැරීම් පෝෂණ නල පද්ධතියක් ද ඉදි කරනු ලැබීමට නියමිතය. භූමි ජලාශයන් 6 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, දෙහිවල තිබෙන නල වෙනුවට අළුත් නල යෙදීම හා නව ස්ථාපිත කිරීම්, මෙහෙයුම් හා නඩත්තු ගොඩනැගිලි හා උපකරණ ප්‍රතිසම්පාදනය කිරීම ද ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබනවා ඇත.

2020 වර්ෂයේ දෙසැම්බර් 04 වැනි දින උපදේශක වැඩ කටයුතු නිල වශයෙන් ආරම්භ විය. ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර වැඩ බිම් බහුතරයක් වෙත ප්‍රවේශ වීමේ හැකියාව දැනටමත් ලැබී තිබේ. විස්තරාත්මක සැලැසුම් සකස් කිරීමේ මූලික පියවර සඳහා අවශ්‍ය ඉඩම් සමීක්ෂණ කටයුතු හා පාංශු විමර්ෂණයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කළ යුතුව ඇත්තේ 2026 මැයි මාසය වන විට වේ.

දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්

940000 ක ජන ගහණ සංඛ්‍යාවක් වෙත ප්‍රතිලාභ ලබා දීමේ අරමුණ සහිතව ජල සම්පාදන පහසුකම් නංවා ලීම සඳහා ක්‍රියාත්මක කරනු ලබමින් පවතින ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතීන් 16 ක සංඛ්‍යාවක් ඇතුලත් බිලියන 3.5 ක දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය හා බිලියන 53 ක දේශීය බැංකු ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. මේ අතරින් බෙන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය, රුහුණුපුර ජල සම්පාදන යෝජනා ක්‍රමය, කොළඹ මහ නගර ජල සම්පාදන ව්‍යාපෘතිය, අම්පාර ජල සම්පාදන යෝජනා ක්‍රමය, අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය හා ගලගෙදර මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය හා කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර නගර ජල සම්පාදන ව්‍යාපෘතිය පැකේජ අංක 1 හා පැකේජ අංක 11 නම් වූ ව්‍යාපෘති අටක සංඛ්‍යාව දැනට සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර අනිකුත් ව්‍යාපෘතීන් අතුරින් ඉතා වැඩි සංඛ්‍යාවක් වර්ෂ 2021 තුළදී සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබීමට නියමිතව ඇත.

(අ) ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය

රුපියල් බිලියන 2.2 ක පිරිවැයකින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ව්‍යාපෘතිය මගින් බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරී වසම් 13 කට වැඩි සංඛ්‍යාවක ජනතාව වෙත ප්‍රතිලාභ ලැබෙනු ඇත. ව්‍යාපෘතිය සඳහා අමු ජලය ලබා ගනු ලබන්නේ මීටර 4000 ක දිගින් යුත් නල මාර්ගයක් මගින් උමා ඔය ජලාශය වෙතින් වේ. ව්‍යාපෘතියේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 3000 ක් වේ. පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය ආසන්න වශයෙන් මීටර 7000 ක දිග ප්‍රමාණයකින් යුක්ත වේ. එකක් ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුත් ටැංකි දෙකක් ද, ඝණ මීටර 80 ක ධාරිතාවයකින් යුත් දැඩියම් කළ සිමෙන්ති ටැංකියක් හා ඝණ මීටර 800 ක ධාරිතාවයකින් යුත් ටැංකියක් ද ව්‍යාපෘතිය සතු වේ. මෙහි ජලය බෙදා හැරීමේ නල මාර්ග ජාලය කිලෝ මීටර 120 කට වැඩි දිග ප්‍රමාණයකින් යුක්ත වේ. 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික ප්‍රගතිය ආසන්න වශයෙන් 95% ක් වූ අතර ඊට සැලැසුම් කරන ලද පාරිභෝගික සම්බන්ධතාවයන් අතුරින් දෙන ලද පාරිභෝගික සම්බන්ධතාවයන් 1890 ක සංඛ්‍යාවක් ඇතුලත් වූ අතර එය සැලැසුම් කළ සංඛ්‍යාවෙන් අඩකට වැඩි සංඛ්‍යාවකි. මේ අතර සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 1,688 ක් හෙවත් ආසන්න වශයෙන් 77% ක් විය. 2020 පෙබරවාරි මස මැද භාගයේදී ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විවෘත කරන ලද අතර ඒ අවස්ථාවේ සිට යන්ත්‍රාගාරය මෙහෙයුම් කටයුතු වල යොදවනු ලැබ තිබේ. මහ ජනතාව වෙතින් ලැබෙන ඉල්ලීම් නිසා එහි ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 1000 කින් වැඩි කිරීමට දැනට සැලැසුම් කරගෙන යනු ලැබේ. නල වැලීම් සිදු කොට මහජන ඉල්ලීම් මත ඉතිරි ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් සැපයීම ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරි වී ඇති වක් කර්තව්‍යයක් වේ.



ඇටම්පිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

(ආ) ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය

ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය හේතුකොට ගෙන අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවන ලද ප්‍රදේශය වෙත පානීය ජල පහසුකම් සැපැයීම සඳහා වන්නේය.

සැලැසුම් කෂිතිජ වර්ෂය වන 2036 වන විට ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ජන සංඛ්‍යාව 24438 ක් වනු ඇත. ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 4,496 ක් වන අතර ඒ සඳහා අරමුදල් සපයනු ලබන්නේ හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව විසිනි. ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2016 ජුලි මස ආරම්භ වූ අතර 2018 වර්ෂයේ ජුලි මාසය වන විට ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ඇතැයි මුලදී අපේක්ෂා කරන ලදි. ඉන් පසු කොන්ත්‍රාත් කාලය 2021 . 10. 14 දිනය දක්වා දීර්ඝ කරන ලදි.

ව්‍යාපෘතියේ ජල ප්‍රභවය වන්නේ කළු ගඟයි. මහජන විරෝධය හේතුකොට ගෙන තුළු මුව ඉදි කිරීමට තෝරාගෙන තිබී ස්ථානය වෙනස් කරන ලද අතර ඒ අනුව අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගය ද, ප්‍රතිකාරිත ජල නල මාර්ගය හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කරන ස්ථානය ද වෙනස් කරන ලදි. දිනකට ජලය ඝණ මීටර 4250 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් ද, දිනකට ජලය ඝණ මීටර 4000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ද, සේවා ජලාශයන් 3 ක සංඛ්‍යාවක් ද, පිළිවෙලින් කිලෝ මීටර 6.4 ක, කිලෝ මීටර 29 ක හා කිලෝ මීටර 190 ක දිග ප්‍රමාණයන්ගෙන් යුත් අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ගයකින් ද, ප්‍රතිකාරිත ජල සම්ප්‍රේෂණ නල මාර්ගයකින් ද, ජලය බෙදා හැරීමේ නල පද්ධතියකින් හා අනුයාත ගොඩනැගිලි වලින් ද සංශෝධනය කරන ලද විෂය පථය සමන්විත වේ. අරමුදල් සපයන බැංකුව (හැටන් නැෂනල් බැංකුව) විසින් 2019 ජුලි මාසයේ සිට ගෙවීම් මුදා හැරීම ප්‍රමාද කරන ලද හෙයින් වැඩ කටයුතු වල ප්‍රගතිය ප්‍රමාද විය. එම නිසා මහජන බැංකුව සමග නව ණය ගිවිසුමක් අත්සන් කරන ලද අතර ඉන් පසු හිඟ ගෙවීම් 2020 අගෝස්තු මාසය තුළ මුදා හරින ලදි. දැනට බල පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය ද ව්‍යාපෘතිය ප්‍රමාද වීම කෙරෙහි බල පෑවේය.

ව්‍යාපෘතියේ සමුච්චිත වියදම රුපියල් මිලියන 2,081.3 ක් වූ අතර 2020 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී සමස්ත භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 55.93% ක් හා 46.3% ක් විය.



තුළු මුව

(ඇ) ගලගෙදර / මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය

ගලගෙදර / මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම හා මල්ලවපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වන අතර මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාම නිලධාරී වසම් 29 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් ආසන්න වශයෙන් 33000 ක ජන සංඛ්‍යාවක් වෙත ජල සම්පාදන සේවාවන් සපයා දෙනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත.

ව්‍යාපෘතිය කිලෝ මීටර 27 ක දිග ප්‍රමාණයකින් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලීන් / මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයකින් ද, ජලය ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණක් මාවතගම ඉදි කිරීම ද, ජලය ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් පිලැස්සේ ඉදි කිරීම හා කිලෝ මීටර 146 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීම් නල ජාලය ද, රසායනික ගොඩනැගිලි 2 ක සංඛ්‍යාවක් ද, තුළනය කිරීමේ ජලාශයක් හා ස්ථාන භාර නිලධාරී කාර්යාල ගොඩනැගිල්ලක් ද යන අංගයන්ගෙන් සමන්විත වන්නේය. මධ්‍යම පලාත් සභාය සේවා මධ්‍යස්ථානයට අයත් කටුගස්තොට පිහිටි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙතින් ලබා ගනු ලබන ජලයෙන් දිනකට ජලය ඝණ මීටර 2000 ක පරිමාවක් ගලගෙදර ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත හා දිනකට ජලය ඝණ මීටර 3000 ක පරිමාවක් මාවතගම ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත ලබා දීමට ව්‍යාපෘතිය අදහස් කරයි.

2019 මැයි 31 වැනි දිනය වන විට ව්‍යාපෘතිය සැලැකිය යුතු මට්ටමකට සම්පූර්ණ කරනු ලැබ තිබුණ අතර ඉතිරි වැඩ කටයුතු වශයෙන් හඳුනාගනු ලැබ ඇති දීර්ඝ කිරීම් දෙකක් හා ස්ථාන භාර නිලධාරී කාර්යාලයේ අවසන් අදියරේ වැඩ කටයුතු ව්‍යාපෘතියේ ඉතිරි මුදල් උපයෝගී කර ගනිමින් දැනට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ව්‍යාපෘතියේ කාර්ය සාධනය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති බවට වූ සහතිකය 2020. 08. 07 වැනි දින නිකුත් කරන ලදි. ව්‍යාපෘතියේ සියළුම වැඩ සම්පූර්ණයෙන් නිම කොට අවසන් බිල් පත ද පියවන ලදි.

මධ්‍යම පලාතේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙතින් දිනකට ජලය ඝණ මීටර 5000 ක් ලබා ගත නොහැකි හෙයින් ව්‍යාපෘතිය සේවයේ යෙදවීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති අතර එම ජල ප්‍රමාණය මුදා හැරීමට නම් මහනුවර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කළ යුතුව ඇතැයි පවසනු ලැබේ.



නල එලීම

(ඈ). ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය

ප්‍රස්තුත ව්‍යාපෘතිය වැලිගම, උඉරගස්මන්හන්දිය, ගෝනාපීනුවල හා දික්කුඹුර යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අනුබද්ධිත ජලය බෙදා හැරීමේ නල ජාලයන් වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු වලින් සමන්විත වන අතර සමස්තයක් වශයෙන් ගත් කල එයින් ග්‍රාම නිලධාරී වසම් 56 ක සංඛ්‍යාවක් ආවරණය වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ පිරිවැය රුපියල් මිලියන 1,755 ක් වන අතර අරමුදල් සම්පාදනය කර දෙනු ලබන්නේ ලංකා බැංකුව විසින් රුපියල් මිලියන 754 ක් හා මහජන බැංකුව විසින් රුපියල් මිලියන 1,000 ක් වශයෙනි. සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලබන ජල සම්පාදන සේවා සම්බන්ධතා සංඛ්‍යාව 13900 ක් වන අතර ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 55600 ක් වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ කිලෝ මීටර 85 ක දිග ප්‍රමාණයකින් යුත් පොලි විනිල් ක්ලෝරයිඩ් නල හා මෘදු යකඩ නල සැපැයීම, මෘදු යකඩ හා වාත්තු යකඩ කපාට හා උපාංග යන් සැපැයීම, කිලෝ මීටර 109 ක මුළු දිග ප්‍රමාණයකට පොලි විනිල් ක්ලෝරයිඩ් නල, මෘදු යකඩ නල හා උපාංගයන් එලීම සහ උඉරග ස්මන්හන්දිය, බද්දේගම, කොවුල්හේන, වක්වැල්ල හා වැලිගම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ පෝම්ප ස්ථාපනය කිරීමත් වේ. තවද උඉරගස්මන්හන්දියේ ඝණ මීටර 100 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් හා ඉහළ ඔසොව් පොම්පාගාරයක් ඉදි කිරීම හා වැලිගම ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් ඉදි කිරීම, ආරක්ෂක නිල නිවාසය ඉදි කිරීම හා පොම්පාගාරයක් ඉදි කිරීම ද ව්‍යාපෘතියේ විෂය පථය යටතේ ක්‍රියාත්මක කරනු ලබන සෙසු වැඩ කටයුතු වේ. මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේ මාර්තු මාසයේ ආරම්භ කරන ලද අතර එය 2020 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කර ගනු ලැබ තිබි සමස්ත භෞතිකහා ා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 70.6% ක් හා 53.5% ක් විය. ගෝනාපීනුවල, දික්කුඹුර හා වැලිගම ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල වැඩ කටයුතු 2021 වර්ෂයේ ජනවාරි 29 වැනි දින වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට අපේක්ෂා කරනු ලබන අතර උඉරගස්මංහන්දිය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල වැඩ කටයුතු ආරම්භ කිරීමේ තීරණය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් ගනු ලබනවා ඇත.



පොම්ප ස්ථාපනය කිරීම

(ඉ). ගිරිදර ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැය වනු ඇතැයි අපේක්ෂා කරනු ලබන පිරිවැය රුපියල් මිලියන 513.28 ක් වන අතර ව්‍යාපෘතිය සමන්විත වන්නේ මිලි මීටර 63 සිට මිලි මීටර 225 ක් දක්වා වූ විෂ්කම්භයන්ගෙන් යුත් පොලි විනිල් ක්ලෝරයිඩ් නල හා මිලි මීටර 250 සිට මිලි මීටර 350 ක් දක්වා වූ විෂ්කම්භයන්ගෙන් යුත් මෘදු යකඩ නල භාවිතා කරමින් මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 100 ක නල එලීමේ වැඩ කටයුතු වලිනි.

දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 18 ක සංඛ්‍යාවක් මෙම ව්‍යාපෘතිය විසින් ආවරණය කරනු ලබයි. ලබුගම කලටුවාව සිට වෙන අංක ඩී 20 දරන සම්ප්‍රේෂණ නල මාර්ගයෙන්

හංවැල්ල පාලම අසලදී ජලය ලබාගෙන එම ජලය මිලි මීටර 350 ක විෂ්කම්භයකින් යුත් මෘදු යකඩ නල මාර්ගයක් මගින් හංවැල්ල පාලමෙහි දැනට තිබෙන නාලය භාවිතා කරමින් කැළණි ගඟ හරහා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම වීමෙන් අනතුරුව ඒ මගින් ගෘහස්ත ජල සම්පාදන සම්බන්ධතාවයන් 4500 ක සංඛ්‍යාවක් හා වාණිජ ජල සම්පාදන සම්බන්ධතාවයන් 500 ක සංඛ්‍යාවක් ලබා දීමේ හැකියාව ලැබෙනු ඇත.

ව්‍යාපෘතිය විසින් මේ වන විට සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 38% ක් හා 31% ක් වේ. ව්‍යාපෘතියේ වැඩ කටයුතු දැනට අඛණ්ඩ ලෙස කරගෙන යන නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වයට අදාල පසු බෑම් හා කොන්ත්‍රාත් කරුගේ මූල්‍ය කළමනාකරණ ගැටළු හේතුවෙන් යම් යම් ප්‍රමාදයන් ඇති වේ



නල එලීම

(ඊ). විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය (බෙදා හැරීම)

විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය පිහිටවනු ලැබ ඇත්තේ සබරගමුව පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයේය. මෙම ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත්තේ ග්‍රාම නිලධාරී වසම් 24 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් ආසන්න වශයෙන් 35000 ක ජන සංඛ්‍යාවක් වෙත ජල සම්පාදන සේවාවන් සැපැයීම ඉලක්ක කර ගනිමින් වේ.

ව්‍යාපෘතිය යටතේ කිලෝ මීටර 178 ක දිග ප්‍රමාණයකින් යුත් ජලය බෙදා හැරීමේ නල ජාලයක් වශයෙන් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් නල ද, මෙලෙක් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් නල හා මෘදු යකඩ නල එලීම සිදු කරනු ලබන අතර එම නල මිලි මීටර 450 සිට මිලි මීටර 63 ක විෂ්කම්භ ප්‍රමාණයන්ගෙන් යුක්ත වනු ඇත. රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඇති ගෘහස්තයන් 7000 ක සංඛ්‍යාවක් වෙත ජලය බෙදා දීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.

ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2019 ජනවාරි මාසයේදී ආරම්භ කරන්නට යෙදුන අතර එහි වැඩ කටයුතු අවසන් කරන්නට තිබුණ මුල් දිනය 2020.6.02 වැනි දිනය වූ නමුත් නොයෙක් හේතූන් කරණකොට ගෙන ව්‍යාපෘතියේ කාලය 2021. 06. 30 දක්වා දීර්ඝ කරන ලදි.

2020 දෙසැම්බර් 31 වැනි දිනට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික ප්‍රගතිය 40% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 30% ක් විය.

අවශ්‍ය මෘදු යකඩ සැපැයීමේදී සිදු වූ ප්‍රමාදයන් නිසා ව්‍යාපෘතියේ ප්‍රගතිය බෙහෙවින් මන්දගාමී විය.

(උ). විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය

මාතලේ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය ග්‍රාම නිලධාරී වසම් 39 ක් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 35000 ක ජන සංඛ්‍යාවක් වෙත ජල සම්පාදන සේවාවන් සම්පාදනය කර දීමට සැලැසුම් කරනු ලබයි.

දිනකට ජලය ඝණ මීටර 6000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක් සැලැසුම් කොට ඉදි කිරීම, දිනකට ජලය ඝණ මීටර 5500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම, මීටර 1000 ක දිග ප්‍රමාණයකින් යුත් ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ග යක් ඉදි කිරීම, කිලෝ මීටර 26 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රතිකාරිත ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගයක් ඉදි කිරීම, ඝණ මීටර 225 ක හා ඝණ මීටර 300 ක ධාරිතාවයන්ගෙන් යුත් ජල කුළුණු ඉදි කිරීම, කිලෝ මීටර 115 ක දිග ප්‍රමාණයකින් යුත් බෙදා හැරීමේ ප්‍රධාන නල පද්ධතියක් ඉදි කිරීම හා ස්ථාන භාර නිලධාරී කාර්යාලය හා නිල නිවාස තුනක සංඛ්‍යාවක් ඉදි කිරීම ද ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් විය.

කොන්ත්‍රාත් කරු විසින් මුහුණ දෙන ලද මූල්‍ය ගැටළු නිසා 2020 මුල් හත් මාසය තුළ කාර්ය සාධනය බෙහෙවින් දුර්වල තත්ත්වයක පැවැතිණි. කෙසේ වුව ද කොන්ත්‍රාත් කරු විසින් 2019 අගෝස්තු මාසයේදී ව්‍යාපෘතියේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලදි. ඒ අනුව ඉදි කිරීම් කටයුතු 2021 සැප්තැම්බර් 30 වැනි දින වන විට සම්පූර්ණයෙන් නිම කළ හැකි වනු ඇත.

2020 දෙසැම්බර් 31 වැනි දිනය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික ප්‍රගතිය 54.88% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 34.36% ක් විය.



ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

(ඌ). මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය 11 වැනි අදියර

මැදිරිගිරිය ප්‍රාදේශී ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 31 ක සංඛ්‍යාවක් වෙත කිලෝ මීටර 230 ක දිග ප්‍රමාණයකට මෙලෙක් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් නල සපයා එලීම මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ. මෙලෙක් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් නල හා මෘදු යකඩ නල සපයා එලීම, පැරණි නගර කුළුණ බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ගය වෙනුවෙන් හා නව නගර / පැරණි නගර කුළුණ අභ්‍යන්තර බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ගය වෙනුවෙන් සවි කිරීම් හා විශේෂ උපාංගයන් සවි කිරීම, කවුඩුල්ල ඔය හරහා නල පාලම ඉදි කිරීම, නිල නිවාස සැලැසුම් කොට ඉදි කිරීම හා ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 5000 ක් සපයා දීම ව්‍යාපෘතියේ වැඩ කටයුතු වලට ඇතුලත් වේ.

සැපැයිය යුතු සියළුම අයිතමයන් සම්පූර්ණයෙන් සපයනු ලැබ ඇත. මුල් විෂය පථය (කිලෝ මීටර 230) හා අතිරේක මිලි මීටර 63 ක විෂ්කම්භයකින් යුත් නල එලීමේ කටයුතු (VO 25) (කිලෝ මීටර 141) සම්පූර්ණයෙන් නිම කොට භාර දෙනු ලැබ ඇත. මෙහෙයුම් හා නඩත්තු ගොඩනැගිලි සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. අතිරේක මිලි මීටර 63 විෂ්කම්භයේ නල (VO 42) එලීමට නියමිත කිලෝ මීටර 42 දුර ප්‍රමාණයෙන් කිලෝ මීටර 20 ක දිග ප්‍රමාණයක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ගෘහස්ත සම්බන්ධතාවයන් 3395 ක සංඛ්‍යාවක් සපයා දෙනු ලැබ ඇත.

2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර

ගනු ලැබ තිබී හෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99.78% ක් හා 86.75% ක් විය.



නල එලීම



මිලි මීටර 1000 මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයෙහි වායු කපාටය සවි කිරීම

(ඔ). කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය

කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර කොටසේ ජීවත් වන ජනතාව වෙත ආරක්ෂාකාරී නල මාර්ගික පානීය ජලය සම්පාදනය කර දීම සඳහා වේ. සීතාවක, කඩුවෙල, පාදුක්ක, හෝමාගම හා හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ට අයත් ග්‍රාම නිලධාරී වසම් 118 ක සංඛ්‍යාවක් ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වේ.

කොළඹ දිස්ත්‍රික්කයෙන් නැගෙනහිර පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා හඳුනාගනු ලැබ ඇති ජල ප්‍රභවයන් වන්නේ ලබුගම හා කලටුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වේ. වර්ෂ 2040 වන විට නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 91000 කට අධික සංඛ්‍යාවක් මගින් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබනු ඇතැයි තක්සේරු කරනු ලැබ ඇති ජන සංඛ්‍යාව 373304 ක් වේ.

මෙම ව්‍යාපෘතිය පැකේජ 03 ක සංඛ්‍යාවකින් සමන්විත වන අතර එම පැකේජයන්ගේ දැනට පවත්නා තත්ත්වය පහත සඳහන් පරිදි වේ:

පැකේජ අංක 1 - ප්‍රවාහ මණු සම්බන්ධතාවයන් 07 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2020 වර්ෂය අවසන් වන විට පැකේජය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී හෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 74.8% ක් විය.

පැකේජ අංක 2 - කුළුණු ශක්තිමත් කිරීමේ :චසකසබට අදරන* කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. පාදම් කොන්ක්‍රීට් තහඩුවේ කොටස් 6 අතුරින් කොටස් අංක 1, කොටස් අංක 2 හා කොටස් අංක 3 සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. අභ්‍යන්තර කුළුණු හා අනුපළු වැටි (baffle walls) වලට අදාල වැඩ වලින් 5% ක් නිම කරනු ලැබ ඇත. 2020 වර්ෂය අවසන් වන විට පැකේජය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී හෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 74.10% ක් හා 50.11% ක් විය.

පැකේජ අංක 3 - ප්‍රවාහ මණු සම්බන්ධතාවයන් 26 ක සංඛ්‍යාවක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2020 වර්ෂය අවසන් වන විට පැකේජය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී හෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99.43% ක් හා 79.33% ක් විය.

පැකේජ අංක 1 හා 2 සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගැටළු මත ආරාවුල් පැන නැගී ඇති අතර එම ආරාවුල් තීරකකරණය සඳහා යොමු කරනු ලැබ ඇත.

ඕ. දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන බිලියන 3.5 ක ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ජලය බෙදා හැරීමේ පද්ධතීන් තුළ නල මාර්ග දීර්ඝ කිරීමේ කටයුතු හා හිඩැස් පිරවීමේ කටයුතු සිදු කිරීම මගින් උඹව, දකුණු, උතුරු, බටහිර මධ්‍යම, බටහිර උතුරු, බටහිර දකුණු, නැගෙනහිර, වයඹ, උතුරු මැද, මධ්‍යම හා සබරගමුව යන පලාත් තුළ ක්‍රියාත්මක වන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් 11 තුළ ඇති ජල සම්පාදන සම්බන්ධතාවයන් සංඛ්‍යාව වැඩි දියුණු කිරීමේ අරමුණ ඉලක්ක කර ගනිමින් වේ. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් බිලියන 3.5 ක් වන අතර ව්‍යාපෘතිය අවසාන වන විට ජල සම්පාදන සම්බන්ධතාවයන් සංඛ්‍යාව 33250 ක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් 10 කට අදාල නල මාර්ග දීර්ඝ කිරීමේ කටයුතු හා හිඩැස් පිරවීමේ කටයුතු සම්පූර්ණයෙන් නිමවනු ලැබ ඇති අතර නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අදාල වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. ව්‍යාපෘතිය 2014 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර එය 2021 වර්ෂය දක්වා දීර්ඝ කරනු ලැබ ඇත. 2020 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත හෞතික ප්‍රගතිය 98.5% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 72.4% ක් විය.



නල එලීම

ශ්‍රී ලංකා රජයේ අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන්

මාතර කෙටි කාලීන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මාතර කෙටි කාලීන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 300 ක් වේ. මාතර කණ්ඩායමේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජල සම්පාදන ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 6000 කින් වැඩි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබ ඇති අතර එම කටයුතු වල ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රදේශය තුළ ජල සම්පාදනයේ වැඩි දියුණුවක් හා ජල සම්පාදනය කිරීම අඩු කරන කාල සීමාවන් අඩු වීමද සිදු වී ඇත. එසේම, තිහගොඩ ප්‍රදේශය තුළ ඇති ආන්තික ග්‍රාමීය ප්‍රදේශයන් තුළ ජීවත් වන පවුල් 100 ක් වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම ද මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට අපේක්ෂිත වේ.

ව්‍යාපෘතිය විසින් 2020 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිලිවෙලින් 53% ක් හා රුපියල් මිලියන 164.47 ක් විය.

අන්දරගස්යාය භූගත ටැංකියේ සිට ගොන්නොරුව දක්වා නල එලීමේ වැඩ කටයුතු

අන්දරගස්යාය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ අරමුණ අන්දරගස්යාය හා බන්දගිරිය ප්‍රදේශයන් වෙත සේවය සැපැයීම වන අතර අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 12000 ක් වේ. ජල සම්පාදන සේවාවන්ගේ මට්ටම වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඇතැම් කොන්ත්‍රාත්තු මෙම යෝජනා ක්‍රමය යටතේ ආරම්භ කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 93% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 68.47 ක් විය.

තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම වැඩ සටහනේ විෂය පථය තුළට ඇතුලත් වන්නේ ජලයේ ගුණාත්මය නංවා ලීමේ අරමුණින් තිස්සමහාරාම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වර්ධනය කිරීම වේ. ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 393 ක් වන අතර අපේක්ෂිත ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව ආසන්න වශයෙන් 10000 ක් පමණ වේ. වායු ගන්වනය ඉදි කිරීම, අවසාදන ටැංකිය ඉදි කිරීම, රසායනික කුටිය ඉදි කිරීම හා මෙහෙයුම් ගොඩනැගිල්ල ඉදි කිරීම හා සම්බන්ධ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇති අතර 2020 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 37% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 54.5 ක් විය.

රුපියල් මිලියන 600 ක අරමුදල් වෙන් කිරීම යටතේ වූ ත්‍රිකුණාමලය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ත්‍රිකුණාමලය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය කලාපය වෙනුවෙන් රුපියල් මිලියන 600 ක මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබ ඇති අතර 2020 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබුණ භෞතික ප්‍රගතිය 77% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 291.67 ක් විය.

කෑගල්ල නැවත පදිංචි කරවීම්

2016 වර්ෂය තුළදී නාය යාමේ සිද්ධීන්ගේ බල පෑමට භාජනය වූ ආසන්න වශයෙන් පවුල් 2000 ක පමණ සංඛ්‍යාවක් වෙත පානීය ජලය සපයා දීමේ විශාල අභියෝගයට මුහුණ දීමට කෑගල්ල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සිදු විය. 2016 වර්ෂයේ මැද භාගය තුළ එකී පවුල් කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 කට වැඩි සංඛ්‍යාවක් තුළ නැවත පදිංචි කරවීමට පියවර ගනු ලැබ තිබිණි. එම කඩිනම් නැවත පදිංචි කරවීමේ වැඩ සටහන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) විසින් සපයන ලද මූල්‍ය සහාය යටතේ සම්පූර්ණයෙන් නිම කරන ලදි. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ නාය යාමේ උවදුරට භාජනය වූ වින්දිතයින් නැවත පදිංචි කරවන ලද ගම්මානයන් වෙත ජල සම්පාදන පහසුකම් සපයා දීම සඳහා කැබිනට් අනුමැතිය අනුව රුපියල් මිලියන 455 ක මුදල් ප්‍රමාණයක් ප්‍රදානය කරන ලදි. 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 90% ක් හා රුපියල් මිලියන 82.34 විය.

දන්කොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය

දන්කොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය යනු ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 6000 ක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා දිනකට ප්‍රතිකාරිත ජලය ඝණ මීටර 4000 ක පරිමාවක් නිෂ්පාදනය කරනු ලබන දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයක් වේ. නව ව්‍යාපෘතිය විසින් ගොහොදු මඩ ප්‍රතිකාරිත කිරීමේ පහසුකම් ද සහිතව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ධාරිතාව වැඩි දියුණු කිරීමට යෝජිත අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 500 ක සංඛ්‍යාවක් ජනනය වනු ඇත. දැනට ක්‍රියාත්මක වන මා ඔය තුළු මුව මෙම ව්‍යාපෘතිය විසින් ජල ප්‍රභවය වශයෙන් භාවිතා කරනු ලබනවා ඇත. ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුත් බිම් දෙණක්, බාදිය ප්‍රතිසාධන ටැංකියක්, ගොහොදු මඩ රඳවා ගැනීමේ ටැංකියක් හා ගොහොදු මඩ කලපුවක් ද ඉදි කරනු ලැබීමට නියමිත වේ. ජලය බෙදා හැරීම ව්‍යාප්ත කිරීමේ කටයුතු පහසුකරණය කිරීම සඳහා නල මාර්ග වලීම හා පෝම්ප ස්ථාපිත කිරීම ක්‍රියාත්මක කරනු ලබනවා ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වූ මුළු පිරිවැය රුපියල් මිලියන 200 ක් වනු ඇත. 2020 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික ප්‍රගතිය 14.72% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 14.72 ක් විය.

බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා වත්කම් කළමනාකරණය කිරීමේ හැකියාව නංවා ලීම

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ බටහිර දකුණ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය යටතේ වේ. මෙය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) විසින් දෙන ලද රුපියල් මිලියන 527 ක ප්‍රදානයක් හා දේශීය වශයෙන් ලැබුන රුපියල් මිලියන 40 ක දායකත්වයක් යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. ව්‍යාපෘති කාල සීමාව 2018 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට 2020 වර්ෂයේ අගෝස්තු මාසය දක්වා වන්නේය.

ප්‍රස්තුත ව්‍යාපෘතිය ප්‍රධාන කොටස් 3 කින් සමන්විත වේ. ඒ අතුරින් 1 වැනි කොටස වූ නල මාර්ග වත්කම් කළමනාකරණය හඳුන්වා දීම (සම්පාදන අංක 01) අවසන් කරනු ලැබ ඇති අතර සෙසු කොටස් වන්නේ ජල කාන්දු පාලනය නංවා ලීම (සම්පාදන අංක 02) 2 වැනි කොටස හා ජල කාන්දු පාලනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබා දෙන පුහුණු කරුවන් සඳහා වූ පුහුණු කරුවන් පුහුණු කිරීම (සම්පාදන අංක 03) 3 වැනි කොටස ද වේ.

සම්පාදන අංක 02 න් බලාපොරොත්තු වන ප්‍රතිඵලයන් වන්නේ නියමු කලාපය තුළ ජල කාන්දු පාලනය කිරීමේ හැකියාව නංවා ලීම ද, නව තාක්ෂණ වේදයන් හා උපකරණ පිළිබඳ දැනුම අවශෝෂණය කර ගැනීම ඇතුළු දැනුම බෙදා හදා ගැනීම හා අවශ්‍ය මග පෙන්වීම් ඇතුලත් ජල හානි කළමනාකරණය කිරීම සම්බන්ධ අත් පොතක් පිළියෙල කිරීම මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත නිවැරදි ආදායම් රහිත ජල පරිමාව කළමනාකරණය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම ද වන්නේය.

ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් රුපියල් මිලියන 279.70 ක් හා 69% ක් විය.

බණ්ඩාරවෙල ජල සම්පාදනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උමං මාර්ග ඉදි කිරීම් කටයුතු ක්‍රියාත්මක කර ගෙන යන අතරතුර ප්‍රධාන උමං මාර්ගය ඉදි කිරීමේ වැඩ බිම තුළ ජල ආයානය ඇති වූ අතර ඒ හේතුකොට ගෙන බණ්ඩාරවෙල හා ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක තුළ පිහිටි බොහෝ ගම්මානයන් තුළ පිහිටි සෑරූ ළිං වල ජල මට්ටම අඩු වූ අතර ඇතැම් ළිං සම්පූර්ණයෙන්ම වියලී යන ලදි. පානීය ජලය හිඟ වීමේ බල පෑමට ගොදුරු වී ඇති පවුල් ආසන්න වශයෙන් 2000 ක පමණ සංඛ්‍යාවක් මෙම ගම්මානයන් තුළ පීවත් වෙති. මෙම ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලද්දේ එම බල පෑමට ගොදුරු වී ඇති පවුල් වෙත ලබා දිය හැකි ජල සම්පාදන පහසුකම් වැඩි කිරීමේ පරමාර්ථයෙන් වේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වූයේ දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත අතිරේක තුළු මුව පෝම්ප හා හුවන පෝම්ප සපයා දීම හා බණ්ඩාරවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ දැනට ක්‍රියාත්මක වෙමින් පැවැති සම්ප්‍රේෂණ හා ජලය බෙදා හැරීමේ පද්ධතීන් වැඩි දියුණු කිරීම ද වන්නේය. 2020 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබී භෞතික ප්‍රගතිය 100% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 32.60 ක් විය.

බැතිමතුන් වෙත පානීය ජලය සම්පාදනය කර දීම සඳහා වූ මඩු දේවස්ථානයේ ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ මඩු දේවස්ථානය වෙත හා යාබද ගම්මානයන් වෙත ජලය සම්පාදනය කර දීමේ පරමාර්ථය ඇතිව වේ. ඒ වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 790.62 ක් වන අතර අරමුදල් සපයා දෙනු ලබන්නේ ශ්‍රී ලංකා ජන රජය විසිනි. තක්සේරු කරනු ලැබ ඇති ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 12600 ක් වේ. 2020 වර්ෂයේ අවසානය වන විට දෙමර යෝජනා ක්‍රමය විසින් සාක්ෂාත් කර ගෙන තිබී භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 15% ක් හා රුපියල් මිලියන 64.65 ක් විය.

පෙළ ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන්

2025 වර්ෂය වන විට රටේ මුළු ජන ගහණය වෙත (100%) පවිත්‍ර හා ආරක්ෂාකාරී පානීය ජලය හා නල මාර්ගික ජලය ලබා ගැනීමේ හැකියාව ලබා දීමේ රජයේ අභිලාෂය මල් පල ගැන්වීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පූර්ණ ලෙස කැප වීමෙන් යුතුව හා මනා සූදානමකින් යුතුව සැදී පැහැදී සිටියි. "සෞභාග්‍යයේ දැක්ම" තුළ රජය විසින් පොරොන්දු වනු ලැබ ඇති පානීය ජලය පිළිබඳ දැක්ම සපුරා ලීමේ අපේක්ෂාවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය 2020 - 2025 සංස්ථානික සැලැසුම සංවර්ධනය කරනු ලැබ 2020 නොවැම්බර් 18 වැනි දින දියත් කරන ලදි. මෙම ලේඛනය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වත්මන් තත්ත්වය හා අංක 1 සිට 6 දක්වා වූ සංස්ථානික ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කර ගනිමින් මණ්ඩලය විසින් පිළියෙල කරනු ලැබ ඇති සැලැසුම් සැකෙවින් විස්තර කරයි.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය තුළ ඇති හිඩැස් පිරවීම සඳහා ක්‍රියාත්මක කළ යුතුව ඇති ව්‍යාපෘතීන් හඳුනාගෙන ප්‍රධාන ප්‍රවර්ගයන් පහක් යටතේ ඒවා සැලැසුම් කරනු ලැබ ඇත. (i) දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ජලයේ ගුණාත්මය හා ප්‍රමාණය වර්ධනය කිරීම, (ii) මුල් කොන්ත්‍රාත්තු තුළට ඇතුලත් කරනු ලැබ ඇති නල සංඛ්‍යාව අය වැය වෙන් කිරීම් සීමාවන් හේතුකොට ගෙන මහජනතාව වෙත ජලය බෙදා හැරීමට ප්‍රමාණවත් නොවන හෙයින් දැනටමත් ඉදි කරනු ලැබ ඇති හෝ ඉදි කරනු ලබමින් පවතින එවැනි මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතීන්ගේ බෙදා හැරීම් පද්ධතීන් තුළ ඇති හිඩැස් පිරවීම, (iii) ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතීන් (ජල සම්පාදන සේවාවනන්ගේ හා සනීපාරක්ෂණ සේවාවන්ගේ ආදායම් රහිත ජල පරිමාව අවම කිරීමේ හා බල ශක්තිය ඉතිරි කිරීමේ ව්‍යාපෘතීන්), (iv) දැනට සේවාවන් නොලබන ප්‍රදේශයන් වෙත සේවා සම්පාදනය කර දීමේ නව ජල සම්පාදන හා මල අපවහන යෝජනා ක්‍රමයන් හා (v) ප්‍රවර්ගයන් 1. 2 හා 4 මගින් ආවරණය නොවන ප්‍රදේශයන් වෙනුවෙන් පලාත් පාලන අධිකාරීන් විසින් හෝ ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පිහිටුවා ලීම ද වේ. අංක එකේ සිට හතර දක්වා වූ ප්‍රවර්ගයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබනවා ඇත.

ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් පෙර හඳුනාගනු ලැබ ඇති කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ හා විශාල පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන්ට අදාල ක්‍රම සම්පාදන හා සැලැසුම් කටයුතු කිරීම කඩිනම් කිරීම සඳහා 2020 වර්ෂය තුළදී දැනටමත් ආරම්භක වැඩ කටයුතු පටන් ගනු ලැබ ඇත. ඉදිරියේදී විළඹෙන වර්ෂයන් තුළදී දීප ව්‍යාප්ත ලෙස 100% ක් නල මාර්ගික ජල සම්පාදනය ව්‍යාප්ත කිරීමේ රජයේ අභිලාෂය මස්තකප්‍රාප්ත කිරීමට හැකි වන පරිදි දෙනු ලබන සහායක් වශයෙන් දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වර්ධනය කිරීමට හා ඒවායේ බෙදා හැරීම් කටයුතු හා සම්ප්‍රේෂණ කටයුතු වැඩි දියුණු කිරීමට අදාල ක්‍රම සම්පාදන හා සැලැසුම් පිළියෙල කිරීම දැනටමත් ආරම්භ කරනු ලැබ ඇත.

2020 - 2025 සංස්ථානික සැලැසුමේ අංක 1 දරණ කාණ්ඩය යටතේ සැලැකිල්ලට ගනු ලබන ව්‍යාපෘතීන්ට අදාල සියළුම ක්‍රම සම්පාදන හා සැලැසුම් ක්‍රියාකාරකම්, මූලික හා සවිස්තරාත්මක රූප සටහන් පිළියෙල කිරීම, ප්‍රමාණ පත්‍ර හා ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ටෙන්ඩර ලිපි ලේඛන පිළියෙල කිරීම ආදී වැඩ කටයුතු වලට ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය සම්බන්ධ වී අදාල ආරම්භක පියවර ගනු ලැබ ඇත. (කරුණාකර "ව්‍යාපෘතීන්ගේ සැලැසුම් අදියරෙහි විස්තර" යනුවෙන් වූ වගුව බලන්න).

සේවා මට්ටමේ වැඩි දියුණු කිරීම්, විශේෂයෙන්ම වර්ධනය කිරීමේ හා හැකියා නංවා ලීමේ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා දීප ව්‍යාප්ත ජල සම්පාදන හා මල අපවහන ආවරණය වර්ධනය කිරීම ප්‍රධාන සැලැසුම් දෙකක් යටතේ ක්‍රියාත්මක කළ යුතුයැයි යෝජනා කරනු ලැබේ. (i) දැනට ඉදි කිරීම් කටයුතු කරගෙන යනු ලබමින් පවතින ජල සම්පාදන හා මල අපවහන් ව්‍යාපෘතීන් 47 ක වැඩ කටයුතු කෙටි කාලීන ලෙස නිම කිරීම හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 95 ක් තුළ ධාරිතාව හා ගුණාත්මය නංවා ලීම හා (ii) දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජල සම්පාදන හා මළ අපවහන යෝජනා ක්‍රමයන් 81 ක සංඛ්‍යාවක් තුළ ඇති පූර්ණ ධාරිතාවය ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි මධ්‍ය කාලීන ලෙස වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම හා මළ අපවහන යෝජනා ක්‍රමයන් 9 ක සංඛ්‍යාවක් තුළ කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම. ආවරණය නව ප්‍රදේශයන් වෙත දීර්ඝ කොට ගෘහස්ත හා වාණිජ ඉල්ලුම සපුරා ලීම සඳහා නව ජල සම්පාදන ව්‍යාපෘතීන් හා මළ අපවහන ව්‍යාපෘතීන් 102 ක සංඛ්‍යාවක් ආරම්භ කිරීමේ අවශ්‍යතාවය ද හඳුනා ගනු ලැබ ඇත.

ඉහතින් පෙන්වනු ලැබ ඇති ලැයිස්තුව තුළ ඇතුළත් කරනු ලැබ ඇති සියළුම ජල සම්පාදන හා මළ අපවහන ව්‍යාපෘතීන් ප්‍රස්තුත සංස්ථානික සැලැසුමේ නිමැවුම් ලෙස 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබනවා ඇත.

ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (ජල සම්පාදන ව්‍යාපෘති)

අංක				ව්‍යාපෘතියේ විෂය පථය	
				ඕ වැඩ ධාරිතාව	ෂම්ප්‍රේෂණ සමග බෙදා හැරීම් ජාලය (කි මී*
	ව්‍යාපෘතිය	**දිස්ත්‍රික්කය**	**ආවරණය කරනු ලබන ප්‍රදේශය**		
01	අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විස්තාරණය කිරීම	කොළඹ		50000	-
02	අවිස්සාවේල්ලේ නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය	කොළඹ	අවිස්සාවේල්ල ප්‍රා ලේ කොට්ඨාශය	5000	-
03	මීරිගම ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1	ගම්පහ	මීරිගම ප්‍රා ලේ කොට්ඨාශයේ ග්‍රා නි වසම් 115 ක්	20000	779
04	දිවුලපිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1	ගම්පහ	දිවුලපිටිය ප්‍රදේශය තුළ ග්‍රා නි වසම් 123 ක්	20000	851
05	කටුපොත බමුණාකොටුව පඩුවස්නුවර ජල සම්පාදන ව්‍යාපෘතිය	කුරුණෑගල	කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ග්‍රා නි වසම් 249 ක්	20000	722
06	බිංගිරිය, උඩුබද්දාව හා මාකඳුර, පන්නල කුලියාපිටිය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1	කුරුණෑගල		40000	1010
07	දන්කොටුව ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1	පුත්තලම	පුත්තලමේ දන්කොටුව, නාත්තන්ඩිය හා වෙන්නප්පුව ප්‍රා ලේ කොට්ඨාශ	20000	231
08	හලාවත ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 11	පුත්තලම	හලාවත, බිංගිරිය, මහවැව ප්‍රා ලේ කොට්ඨාශ ඇතුළු ග්‍රා නි වසම් 25 ක්	12000	267
09	පුත්තලම ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 11	පුත්තලම	පුත්තලම හා වනාතවිල්ලුව ප්‍රා ලේ කොට්ඨාශ ඇතුළු ග්‍රා නි වසම් 39 ක්	12000	533
10	කුරුණෑගල, කුන්ඩසාලේ, මහනුවර නැගෙනහිර ප්‍රදේශය වෙත ජල සම්පාදනය කිරීම (KEWSP)	මහනුවර/කුරුණෑගල	මැද දුම්බර ප්‍රා ලේ කොට්ඨාශය, කුණ්ඩසාලේ ප්‍රා ලේ කොට්ඨාශය, ගඟවට කෝරලේ ප්‍රා ලේ කොට්ඨාශය, පාත දුම්බර ප්‍රා ලේ කොට්ඨාශය, පන්විල ප්‍රාලේ කොට්ඨාශය හා පාත හේවාහැට ප්‍රා ලේ කොට්ඨාශය තුළ පිහිටි ග්‍රා නි වසම් 167 ක්	50000	40 (සම්ප්‍රේෂණ)
11	නානුඔය ජල සම්පාදන ව්‍යාපෘතිය	නුවරඑලිය	නුවරඑලිය ප්‍රා ලේ කොට්ඨාශය තුළ ග්‍රා නි වසම් 06 ක්	2000	70.5
12	හපුගස්තලාව ජල සම්පාදන ව්‍යාපෘතිය	නුවරඑලිය	කොත්මලේ ප්‍රා ලේ කොට්ඨාශය තුළ ග්‍රා නි වසම් 17 ක්	7500	128
13	දෙල්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය	මහනුවර	දෙල්තොට ප්‍රා ලේ කොට්ඨාශය තුළ ග්‍රා නි වසම් 23 ක්	5000	84
14	මැද දුම්බර පන්විල ජල සම්පාදන ව්‍යාපෘතිය	මහනුවර	මැද දුම්බර හා පන්විල ප්‍රා ලේ කොට්ඨාශ තුළ ග්‍රා නි වසම් 88 ක්	10000	295
15	විසල් ගාල්ල පියවර 111 ජල සම්පාදන ව්‍යාපෘතිය	ගාල්ල	අක්මීමන, බෝපේ, පෝද්දල, හික්කඩුව, හබරාදුව, බද්දෙගම, ඉමදුව, ගාලු කඩවත් සතර හා යක්කලමුල්ල ප්‍රා ලේ කොට්ඨාශ තුළ පිහිටි ග්‍රා නි වසම් 221 ක්	50000	384
16	බද්දෙගම ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1	ගාල්ල	බද්දෙගම, ගෝනාපිනුවල, අම්බලන්ගොඩ, වැලිවිටිය, දිවිතුර, නියාගම, කරන්දෙනිය, ඇල්පිටිය, බලපිටිය, හික්කඩුව හා බෙන්තොට ප්‍රා ලේ කොට්ඨාශ	30000	217
17	ලුනුගම්වෙහෙර 1 ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1 හා 1	හම්බන්තොට	ලුනුගම් වෙහෙර, යම්බන්තොට, තිස්සමහාරාම, ප්‍රා ලේ කොට්ඨාශය තුළ හා මොනරාගල තනමල්විට ප්‍රා ලේ කොට්ඨාශයේ පිහිටි ග්‍රා නි වසම් 83 ක්	25000	334
18	ඇහැලියගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය	රත්නපුර	රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි ග්‍රා නි වසම් 44 ක් හා කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි ග්‍රා නි වසම් 7 ක්	15000	118

ක්‍රියාත්මක වන මලාපවහන යෝජනා ක්‍රම.



පලාත	ව්‍යාපෘති සංඛ්‍යාව
මධ්‍යම	01
නැගෙනහිර	00
උතුරු මැද	00
වයඹ	01
උතුරු	00
සබරගමුව	00
දකුණු	01
ඌව	01
බටහිර මධ්‍යම	07
බටහිර උතුර	03
බටහිර දකුණ	01
එකතුව	**15***

* කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන මල අපවහන යෝජනා ක්‍රමය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන යෝජනා ක්‍රම ද මීට ඇතුලත්ව ඇත.

ක්‍රියාත්මක කරනු ලබමින් පවතින මලාපවහන ව්‍යාපෘතීන්.

නගර සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන මලාපවහන ව්‍යාපෘතීන් විසින් අත් කර ගනු ලැබ ඇති සාර්ථකත්වයන්.
2020 වර්ෂය තුළදී විදේශීය අරමුදලින් ඉදි කෙරෙමින් පැවැති / වැඩි වර්ධනය කෙරෙමින් පැවැති ස්ථානයන් දැක්වෙන සිතියම.



ව්‍යාපෘතියේ නම	අරමුදල් සපයන ඒජන්සිය
01. රත්මලාන / මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය පියවර 1 අදියර 2	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය
02. මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපාරය	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
03. නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා ව්‍යාපෘතිය	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය

විදේශීය අරමුදල් යටතේ වූ මල අපවහන ව්‍යාපෘතීන්.

1) රත්මලාන / මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය පියවර 1 අදියර 2

රත්මලාන / මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය පියවර 1 අදියර 2 සැලැසුම් කරනු ලැබ ඇත්තේ රත්මලාන හා මොරටුව ප්‍රදේශය තුළ දැනට ක්‍රියාත්මක වන ආවරණය වැඩි කිරීම සඳහා දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා රැස් කිරීමේ ජාලය විස්තීර්ණ කිරීමේ පරමාර්ථය ඇතිව වේ. නව පොම්ප කිරීමේ ස්ථානයන් 06 ක සංඛ්‍යාවක් හා දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා පොම්ප කිරීමේ ස්ථානයන් හා අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීමේ කටයුතු ද ඇතුලත් (ආසන්න වශයෙන් කිලෝ මීටර 24 ක දිග ප්‍රමාණයකින් යුත් ආරෝහක ප්‍රධාන මාර්ග සහිත) කිලෝ මීටර 128 ක දිග ප්‍රමාණයකින් යුක්ත වූ නව රැස් කිරීමේ ජාලයක් ඉදි කිරීම ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වේ. ව්‍යාපෘතිය දැනට පෙර කොන්ත්‍රාත් අවස්ථාවේ තිබේ. පල් දෝරු රැස්කිරීමේ ජාලයට අදාල ලංසු තැබීමේ ලියවිලි ඔවුන්ගේ විරෝධතාවයක් නොමැති බව සැක හැර දැනගැනීම සඳහා අරමුදල් සපයන්නා වූ ප්‍රංශ සංවර්ධන ඒජන්සිය (AFD) වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අතර පොම්ප කිරීමේ ස්ථානයන් හා ඒවායේ රූපාන්තර කරණයන් හා සම්බන්ධ ලංසු තැබීමේ ලියවිලි සම්බන්ධයෙන් දැනට වැඩ කටයුතු කරගෙන යනු ලැබේ. පොම්ප කිරීමේ ස්ථානයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීමේ / මිළ දී ගැනීමේ වැඩ කටයුතු දැනට කරගෙන යනු ලැබේ. ව්‍යාපෘතිය වෙනුවෙන් වූ යාවත්කාල පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 16,073 ක් වන අතර ව්‍යාපෘතිය අවසන් වූ විට අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 45000 ක් වේ. සැලැසුම් ක්ෂිතිජ වර්ෂය වූ 2050 වර්ෂයේදී ප්‍රතිලාභීන් 170890 ක සංඛ්‍යාවක් සම්බන්ධ කර ගැනීමට සැලැසුම් කරනු ලැබේ. ඉදි කිරීම් අධීක්ෂණ උපදේශක කොන්ත්‍රාත්තුවට අදාල ඇඟ ලියවිල්ලට ප්‍රංශ සංවර්ධන ඒජන්සියේ විරෝධතාවයක් නොමැති බව දැනුම් දීම ලැබී ඇත. 2020 දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 4.35% ක් හා 0.86% ක් (රුපියල් මිලියන 137.39 ක්) විය. ශ්‍රී ලංකා ජන රජය හා ප්‍රංශ සංවර්ධන ඒජන්සිය අතර ණය පහසුකම් ගිවිසුම 2019 පෙබරවාරි 18 වැනි දින අත්සන් තබන ලදි.



පොම්ප කිරීමේ ස්ථාන ඉදි කරන භූමියේ පාංශු විමර්ෂණ කටයුතු

2). මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය.

මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සතුව හෙක්ටෙයාර 733 ක මුළු ආවරණයක් ඇති අතර 2030 වර්ෂය වන විට ඒ මඟින් සේවා ලබන ජන ගහණයේ සංඛ්‍යාව 55000 ක් වනු ඇත. මහනුවර වැව තුළ ද, මහවැලි නදිය තුළ හා මහනුවර නගරය තුළ ගලා බස්නා ඇල දොළ තුළ ද ඇති ජලයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වන අතර ඉන් පසුව ඒ මඟින් අධික ජන ගහණයකින් යුත් ප්‍රදේශයන් තුළ සනීපාරක්ෂණ තත්ත්වයන් වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මෙම තත්ත්වය සාක්ෂාත් කර ගැනීමේ අරමුණ ඇතිව ව්‍යාපෘතිය විසින් අපජලය රැස් කිරීමේ පද්ධතියක් ද, දිනකට ජලය ඝණ මීටර 14000 ක ධාරිතාවයකින් යුත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හා අපවාහ බැහැර කිරීමේ පද්ධතියක් ද ඉදි කිරීමට නියමිතව ඇති අතර ඊට අමතර වශයෙන් නිවෙස් වෙත සම්බන්ධතාවයන් ලබා දීමට හා ඉන් අනතුරුව අඩු ආදායම් ප්‍රදේශයන් තුළ සනීපාරක්ෂණ පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කිරීමට ද සැලැසුම් කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන ප්‍රධාන ඒජන්සිය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) වන අතර මුළු ව්‍යාපෘති පිරිවැය ආසන්න වශයෙන් රුපියල් බිලියන 22.588 ක් වේ. 2020 වර්ෂයේ දෙසැම්බර මාසය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය 78% ක් වන අතර භෞතික ප්‍රගතිය 83% ක් විය. අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය 2020 මාර්තු මාසය තුළ සේවයෙහි යොදවන ලද අතර දැනට එය දිනකට ඝණ මීටර 1850 ක සාමාන්‍ය පල්දෝරු ප්‍රවාහයකින් යුතුව ක්‍රියාත්මක කරනු ලබමින් තිබේ. භූමියෙහි ඇති දුෂ්කරතාවයන්, රට තුළ පවත්නා තත්ත්වය හා අහිතකර කාලගුණික තත්ත්වයන් වැනි පොදු ගැටළු නිසා වැඩ කටයුතු ප්‍රමාද වේ. තවද සේවයේ යෙදවීමට අදාල ඉතිරි වැඩ කොටස් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර නල වලීමේ කටයුතු හා ඉඩම් වෙත සම්බන්ධතා ලබා දීමේ කටයුතු 2021 වර්ෂයේ අවසානය වන විට සම්පූර්ණයෙන් නිම කළ හැකි වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.



කෂුදු උමං කැණීම්

3. නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා (SHIFT) ව්‍යාපෘතිය

නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා (SHIFT) ව්‍යාපෘතිය විසින් මීගමුව, ගාල්ල - උනවටුන හා කැළණිය - පෑලියගොඩ තුළ ජීවත් වන 200000 ක් වූ ජන සංඛ්‍යාවක් වෙත අපජල බැහැර කිරීම සඳහා වූ යටිතල පහසුකම් සම්පාදනය කර දීම ඉලක්ක කරනු ලබයි. නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා (SHIFT) ව්‍යාපෘතියේ පළමු වැනි අදියර තුළට ඇතුලත් වන්නේ මීගමුව නගරය වෙත අපජල බැහැර කිරීමේ යටිතල පහසුකම් සම්පාදනය කර දීම හා ගාල්ල - උනවටුන කැළණිය - පෑලියගොඩ කලාපයන් වෙනුවෙන් සාධ්‍යතා අධ්‍යයනයන් කිරීම හා සවිස්තරාත්මක සැලැසුම් හා ටෙන්ඩර් ලියවිලි සකස් කිරීම සහ ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන අඩු ආදායම් ලාභී පුද්ගලයින් වෙත සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දීම සඳහා දිළිඳු අරමුදලක් පිහිටුවීම ද වේ. ඊට අමතර වශයෙන් ජල හා සනීපාරක්ෂණ අංශයේ ආයතනික රාමුව නංවා ලීම සඳහා ද, එහි තිරසාර මූල්‍යකරණය සහතික කිරීම සඳහා සහ මළ අපවහන කළමනාකරණ කුසලතාවයන් සංවර්ධනය කිරීම් සැලැසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ද අවශ්‍ය නිර්දේශයන් ලබා දීම

සඳහා ව්‍යාපෘතිය විසින් තාක්ෂණික සහාය වැඩ සටහනක් දියත් කරනු ලබනවා ඇත. නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා (SHIFT) ව්‍යාපෘතියේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ප්‍රංශ සංවර්ධන ඒජන්සිය මගින් ලබාගෙන ඇති අතර තාක්ෂණික සහාය සහභාගය සඳහා අරමුදල් සපයනු ලබන්නේ ප්‍රංශ සංවර්ධන ඒජන්සිය හරහා යුරෝපීය සංගමය විසිනි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 17,665 ක් (යුරෝ මිලියන 107.7 ක්) වනු ඇත. සැලැසුම් හා අධීක්ෂණ උපදේශක සේවාව සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. කලාපයන් තුනම වෙනුවෙන් වූ සාධ්‍යතා අධ්‍යයන වාර්තාව හා මීගමුව, ගාල්ල හා උනවටුන වෙනුවෙන් වූ මූලික සැලැසුම් හා මීගමුව වෙනුවෙන් වූ සවිස්තරාත්මක සැලැසුම සම්පූර්ණයෙන්ම මෙන් නිම කරනු ලැබ ඇත. සාධ්‍යතා අධ්‍යයන වාර්තාව තුළ උපදේශක විසින් නිරීක්ෂණය කරනු ලැබ ඇති කරුණු පදනම් කර ගනිමින් කැළණිය හා පෑලියගොඩ මූලික සැලැසුම හා විස්තරාත්මක සැලැසුම බැහැර කරනු ලැබ ඇත. කැළණිය - පෑලියගොඩ ප්‍රදේශය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර සැලැසුම අනුව පුතික ප්‍රතිකාරක (ස්ථානීය සනීපාරක්ෂණ) යන්ත්‍රාගාරයක් සැලැසුම් කොට ඉදි කරනු ලබනවා ඇත. 2020 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතිය විසින් 6.52% ක භෞතික ප්‍රගතියක් හා 4.94% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගනු ලැබ ඇත. මීගමුව හා ගාල්ල - උනවටුන නගරයන් වෙනුවෙන් වූ සැලැසුම් සම්පූර්ණයෙන් නිම කිරීම හා ලංසු ලියවිලි සකස් කිරීම 2021 අප්‍රේල් මාසය වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට හා ඒ අනුව මීගමුව නගරයට අදාල ප්‍රතිසම්පාදන කටයුතු 2021 වර්ෂයේ අවසානය වන විට සම්පූර්ණයෙන් නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය - (මළ අපවහන)

ක්‍රම සම්පාදන හා සැලැසුම් (මළ අපවහන) අංශයට අයත් මූලික කර්තව්‍යයන් වන්නේ මළ අපවහන ව්‍යාපෘති ප්‍රමුඛතා ලැයිස්තුවට අනුව මහ නගර අපලප කළමනාකරණ ව්‍යාපෘතීන් වෙනුවෙන් සාධ්‍යතා අධ්‍යයනයන් පැවැත්වීමත්, පුතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් සඳහා ක්‍රම සම්පාදන හා සැලැසුම් කටයුතු කිරීමත්, දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අපජල කළමනාකරණ ව්‍යාපෘතීන්ට අදාල සැලැසුම් සමාලෝචනයට භාජනය කිරීමත්, නගර සඳහා වූ අපජල කළමනාකරණ පද්ධතීන්ට අදාල ක්‍රම සම්පාදනය හා විස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීමත්, පිරිවැය අය කර ගැනීමේ පදනම මත බාහිර පැවැරුම් භාර ගැනීම හා යෝජිත අපජල කළමනාකරණ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් බාහිර උපදේශකයින් විසින් ක්‍රියාත්මක කරනු ලැබ ඇති පාරිසරික බල පෑම් තක්සේරු කිරීමේ හා මූලික පාරිසරික පරීක්ෂණ පරිපාලනය කිරීම හා පසු විපරම් කිරීමත් වේ.

කළුතර නාගරික ප්‍රදේශය වෙත නල මාර්ගික අපජල යටිතල පහසුකම් සම්පාදනය කර දීම සඳහා ඒ වන විටත් පෙර වර්ෂය තුළ ආරම්භ කරනු ලැබ තිබුණ සාධ්‍යතා අධ්‍යයනය 2020 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලද අතර අළුත්ගම බේරුවල නාගරික ප්‍රදේශය වෙත න මාර්ගික අපජල යටිතල පහසුකම් සම්පාදනය කර දීමට අදාල සාධ්‍යතා අධ්‍යයන වැඩ කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළදී දිගටම කරගෙන යන ලදී. තවද චත්තල, කොලොන්නාව හා ත්‍රිකුණාමලය යන ව්‍යාපෘති ප්‍රදේශයන් තුළ අපලප ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය වන ඉඩම් හඳුනා ගැනීම ආදියට අදාල කාර්යාල අධ්‍යයනයන් ප්‍රස්තුත වර්ෂය තුළදී ආරම්භ කරන ලදී. මහා නගර අමාත්‍යංශයේ ක්‍රමෝපායික මහා නගර සංවර්ධන වැඩ සටහන යටතේ ආරම්භ කරන ලද අනුරාධපුර නගරයේ අපජල කළමනාකරණය වෙනුවෙන් ප්‍රංශ සංවර්ධන ඒජන්සියේ මූල්‍යාධාර යටතේ පවත්වන ලද සාධ්‍යතා අධ්‍යයනයේ වැඩ කටයුතු ප්‍රස්තුත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදී. මෙම සාධ්‍යතා අධ්‍යයනය උපදේශක සමාගමක් විසින් ක්‍රියාත්මක කරන ලද අතර එය අධීක්ෂණය කරන ලද්දේ ක්‍රම සම්පාදන හා සැලැසුම් (මළ අපවහන) අංශය විසිනි. ලෝක බැංකුවේ මූල්‍ය සම්පාදනය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත බදුලු දිස්ත්‍රික්කය වෙනුවෙන් වූ සනීපාරක්ෂණය නංවා ලීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ක්‍රම සම්පාදන වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. ඒ අනුව බදුල්ල නාගරික ප්‍රදේශයේ අපජල කළමනාකරණ පද්ධතිය හා දිස්ත්‍රික් සංඝටකයන් වෙනුවෙන් සවිස්තරාත්මක සාධ්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම සඳහා උපදේශක වරයුගේ සේවය ලබා ගැනීම පිණිස යොමු නියමයන් (TOR) පිළියෙල කොට ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) වෙත ඉදිරිපත් කරන ලදී.

ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට යෝජිත පුතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ඉදි කිරීම හා සම්බන්ධ ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීමේ වැඩ කටයුතු ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී ද අඛණ්ඩ ලෙස කරගෙන යන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ මොනරාගල, ගොඩකවෙල, වැලිගෙපොල, බදුල්ල හා ඇල්ල ප්‍රාදේශීය සභා වෙනුවෙන් යාන්ත්‍රිකකරණය කරන ලදී පුතික ප්‍රතිකාරක යන්ත්‍රාගාර සැලැසුම් කරන ලදී. තවද කොළඹ උතුර - කැළණිය, කොළඹ දකුණ - පානදුර, කොළඹ නැගෙනහිර - කැස්බෑව, හික්කඩුව, වැලිගම හා කුරුණෑගල යන ඉහල ඉල්ලුමක් ඇති ප්‍රදේශයන් වෙනුවෙන් පුතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හයක සංඛ්‍යාවක් ඉදි කිරීම සම්බන්ධයෙන් වූ ක්‍රම සම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව පුතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 6 ක සංඛ්‍යාවක් ඉදි කිරීම වෙනුවෙන් වූ සාධ්‍යතා වාර්තාව ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී බොහෝ දුරට නිම කරනු ලැබ ඇති අතර 2021 වර්ෂයේ මුල් කාලය තුළදී එය අනුමැතිය සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව (PAC) වෙත ඉදිරිපත් කරනු ලැබීමට අපේක්ෂිතය.

ආයෝජන මණ්ඩලයට අයත් මීරිගම අපනයන සකස් කිරීමේ කලාපය (EPZ) වෙනුවෙන් අපජල රැස් කිරීමේ පද්ධතියක් සැලැසුම් කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර දැනට ක්‍රියාත්මක කරනු ලබන අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ ලිපි ලේඛන සකස් කරනු ලැබ ඇත. ආයෝජන මණ්ඩලයට අයත් බියගම අපනයන සකස් කිරීමේ කලාපය (EPZ) තුළ ක්‍රියාත්මක කරනු ලබන අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා පාර ජම්බුල (UV) විෂබීජ නාශක ක්‍රමයක් ලබා ගැනීමට අදාලව ටෙන්ඩර් ලියවිල්ලක් පිළියෙල කරන ලද අතර එරාවුර්හි ආයෝජන මණ්ඩලයට අයත් රෙදි පිළි කලාපය වෙනුවෙන් ඉදි කිරීමට යෝජිත අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අදාල ක්‍රම සම්පාදන වැඩ කටයුතු ද ආරම්භ කරනු ලැබ ඇත.

දෙහිවල උසස් තාක්ෂණවේදී ආයතනය (ATI) වෙනුවෙන් ඉදි කරනු ලැබීමට යෝජිත පල්දෝරු කාණු පද්ධතිය සම්බන්ධ සවිස්තරාත්මක සැලැසුම් වැඩ කටයුතු දැනට කරගෙන යනු ලබමින් පවතී. ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඇතුල්කෝට්ටේ ඉදි කරනු ලැබීමට යෝජිත පල්දෝරු පොම්ප කිරීමේ පද්ධතියට අදාල සැලැසුම් පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිමවන ලද අතර අදාල රූප සටහන් ලංකා විදුලි බල මණ්ඩලය වෙත භාර දෙනු ලැබ ඇත. ගල්කිස්සේ පිහිටි MLP 2 පොම්පාගාරයේ පූතික බෑම කරනු ලබන ස්ථානය වෙනුවෙන් රළු වැලි ඉවත් කිරීමේ පද්ධතියක් ඉදි කිරීම සඳහා වූ ටෙන්ඩර ලියවිලි පිළියෙල කිරීම සම්පූර්ණයයෙන් නිම කරන ලදී. මත්තෙගොඩ පොකුණු පද්ධතිය පුනරුත්ථාපනය කිරීමට අදාල සැලැසුම් පිළියෙල කිරීම ප්‍රස්තුත 2020 වර්ෂය තුළදී ආරම්භ කරන ලදී. ජල සම්පාද අමාත්‍යංශ ගොඩනැගිල්ල වෙනුවෙන් අපජලය ප්‍රතිකාරිත කිරීමේ හා නැවත භාවිතා කිරීමේ පද්ධතියක් ඉදි කිරීම සඳහා වූ තාක්ෂණික යෝජනාව හා ඇස්තමේන්තුව සහිත ටෙන්ඩර් ලියවිල්ල පිළියෙල කරන ලදී. මහරගම අපේක්ෂා ආරෝග්‍ය ශාලාවේ අපජලය බැහැර කිරීම වැඩි දියුණු කිරීමේ වැඩ කටයුත සඳහා ව්‍යාපෘති යෝජනාවක් පිළියෙල කරන ලදුව එය නව අයොඩින් චිකිත්සක ඒකකයේ අපජලය ප්‍රතිකාරිත කිරීම සඳහා ඉදිරිපත් කරන ලදී.

පෙළ ගස්වනු ලැබ ඇති ප්‍රධාන මළ අපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් ප්‍රලේඛන සකස් කිරීම්, ටෙන්ඩර් කිරීම් හා පාරිසරික බල පෑම් තක්සේරු කිරීම් (EIA) හා මූලික පාරිසරික පරීක්ෂණයන් සිදු කිරීම් (IEE) ආදි වැඩ කටයුතු කරනු ලබන්නේ ක්‍රම සම්පාදන හා සැලැසුම් (මළ අපවහන) අංශය විසිනි. මේ යටතේ දෙහිවල - ගල්කිස්ස, මහරගම, බොරලැස්ගමුව, හලාවත - පුත්තලම හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජලය බැහැර කිරීම් ව්‍යාපෘතීන් වෙනුවෙන් වූ පාරිසරික බල පෑම් තක්සේරු කිරීම් (EIA) 2020 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදී. තවද දෙහිවල - ගල්කිස්ස හා මහරගම - බොරලැස්ගමුව අපජල කළමනාකරණ ව්‍යාපෘතීන් වෙනුවෙනන් මධ්‍යම පරිසර අධිකාරියේ අවසරය ලබා ගන්නා ලදී.

පෙළ ගස්වනු ලැබ ඇති අපජල කළමනාකරන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය වන ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු යටතේ දෙහිවල - ගල්කිස්ස, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මාතර, හලාවත - පුත්තලම, මහරගම - බොරලැස්ගමුව, බදුල්ල, ගම්පහ, අළුත්ගම / බේරුවල, කළුතර, පොලොන්නරුව, කාත්තන්කුඩි, මඩකලපුව, කල්මුනෙයි හා එරාවුර් යන ප්‍රදේශයන් තුළ අපජල බැහැර කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා පොම්ප කිරීමේ ස්ථානයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීමේ හා අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී.

ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) යටතේ ක්‍රියාත්මක කරනු ලබන පරිග්‍රාහක ක්‍රමෝපායික ආයෝජන වැඩ සටහන (CSIP) හා සම්බන්ධ ප්‍රධාන සැලසුම් අධ්‍යයනයේ සනීපාරක්ෂණ සංඝටකය අධීක්ෂණය කිරීම හා සම්පූර්ණයෙන් නිම කිරීම ක්‍රම සම්පාදන හා සැලැසුම් (මළ අපවහන) අංශය විසින් ඉටු කරනු ලැබ ඇත. සේදවත්ත, කොලොන්නාව, ඇල්ල, ජල සම්පාදන අමාත්‍යංශය හා වේරහැර ණෘඹ වෙනුවෙන් වූ ව්‍යාපෘති හඳුනා ගැනීමේ වාර්තා පිළියෙල කරනු ලැබ ඇත.

අපේක්ෂා කරනු ලබන ප්‍රධාන කාර්ය සාධනය

2018 හා 2020 කාල සීමාව සඳහා ප්‍රධාන කාර්ය සාධනය

ජල සම්පාදන හා මලාපවහන ආවරණය

	සැබෑ කාර්ය සාධනය		ප්‍රක්ෂේපිත කාර්ය සාධනය
	2018	2019	2020
ජන ගහණය (තක්සේරු කරන ලද)	21670000	21886700	22105567
නල මාර්ග ජල සම්පාදන ආවරණය (ජන ගහණය)	10943950	11337311	12162465
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන සම්බන්ධතා මගින් කරනු ලබන නල මාර්ග ජල සම්පාදන ආවරණය (%)	40.1	41.5	43.2
ජල සම්පාදන සම්බන්ධතා මගින් කරනු ලබන සමස්ත නල මාර්ග ජල සම්පාදන ආවරණය (%)	50.5	51.8	53.1
නල මාර්ග මලාපවහන ආවරණය (ජන ගහණය)	447503	453055	496669
නල මාර්ග මලාපවහන ආවරණය (%)	2.06	2.07	2.05

ආරක්ෂිත ජල ආවරණය වෙත අපේක්ෂිත ප්‍රවේශනය (%)

	සැබෑ		ප්‍රක්ෂේපිත %
	2018	2019	2020
මුළු නල මාර්ග ජල සම්පාදනය	50.5	51.8	53.1
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කරනු ලබන නල මාර්ග ජල සම්පාදනය	40.1	41.5	43.2
සාරන ලද ආරක්ෂිත ළිං	36.4	36.4	36.4
නල ළිං / අත් පොම්ප	3.2	3.2	3.2
වැසි ජලය රැස් කිරීම හා වෙනත්	0.5	0.5	0.5
ආරක්ෂිත ජලය ලබා ගැනීමේ සමස්ත හැකියාව	90.6	91.9	93.2

තිරසාර භාවය හා හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විදිනෙදා ක්‍රියාකාරකම් සියල්ලක්ම ස්වභාවයෙන්ම "සියළු දෙනාම වෙනුවෙන් ජලය සුලභව තිබෙන බව හා එය තිරසාර ලෙස කළමනාකරණය කරන බව සහතික කිරීම" නම් වූ අංක 6 දරණ තිරසාර සංවර්ධන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම කෙරෙහි දිශානත වී ඇති අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් සමග ක්‍රියාශීලී ලෙස සම්බන්ධ වී කටයුතු කරනු ලබයි. සහශ්‍ර සංවර්ධන ඉලක්කයන්හි සිට තිරසාර සංවර්ධන ඉලක්කයන් වෙත පරිනාමණය වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වඩාත් ක්‍රියාත්මක වූ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ ඉලක්ක අංක 6.1, එනම් සියළු දෙනා වෙනුවෙන්ම දැරිය හැකි මිළකට ආරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ සර්ව සාධාරණ හැකියාව ලබා දීම සාක්ෂාත් කර ගැනීම හා ඉලක්ක අංක 6.2, එනම් 2030 වර්ෂය වන විට කාන්තාවන්, ගැහැණු දරුවන් හා අවදානම් තත්ත්වයන්හි සිටින අයවළුන් වෙත විශේෂ අවධානය යොමු කරමින් විවෘත මල පහ කිරීම අවසන් කරමින් සියළු දෙනා විසින්ම සාධාරණ පරිදි සනීපාරක්ෂණය හා ස්වස්ථතාව ලබා ගැනීමේ හැකියාව ලබා දීම සාක්ෂාත් කර ගැනීම යන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම නම් වූ ඉලක්කයන්ට අදාලව දිනාගනු ලබන ජයග්‍රහණයන් පසු විපරම් කිරීම හා වාර්තා කිරීම පිණිස අවශ්‍ය ජාතික මට්ටමේ දර්ශකයන් හා ඉලක්කයන් සංවර්ධනය කිරීමෙහි යෙදී සිටින ලදී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පිලියෙල කරනු ලැබ ඇති සංස්ථාපිත ක්‍රියාත්මක සැලැසුම් සියල්ලක්ම අදාල තිරසාර සංවර්ධන ඉලක්කය කෙරෙහි දිශානත වී ඇත. එසේම එවකට තිබුණ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වරයා විසින් පත් කරන ලද කමිටුවක් විසින් පාද රේඛාව හා ඉලක්කයන් පිහිටුවීමේ වැඩ කටයුතු වල නිරත වන ලදී. මෙම විශේෂ කමිටුව විසින් නිර්දේශ කරන ලද අභිමතාර්ථයන් හා ඉලක්කයන් 2019 ජුනි මාසය තුළදී පරදු ධාරීන් විසින් සම්පූර්ණයෙන් අවසන් කොට වලංගු බවට පත් කරන ලදී. අදාල ක්‍රියාකාරකම් අනාගතය තුළදී පිළියෙල කරනු ලබන මෙහෙයුම් හා සංවර්ධන සැලැසුම් තුළට අන්තර්ගත කිරීමට හා එම සැලැසුම් තුළ පිහිටුවනු ලැබ ඇති ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය අය වැය වෙන් කිරීම් කිරීමට ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අඛන්ඩ ලෙස අවශ්‍ය කටයුතු කරනු ලබමින් පවතී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2019 වර්ෂය තුළදී මෙම පරමාර්ථය වෙනුවෙන් දත්ත රැස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රශ්නාවලිය සම්පාදනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ නායකත්වය හා මග පෙන්වීම යටතේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා වට කිහිපයක් ද පවත්වන්නට යෙදුනි.

2020 වර්ෂය තුළදී ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අදාල රාජ්‍ය ආයතන සමග එක් වී තිරසාර භාවය හා හදිසි අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දැක්වීම හා සම්බන්ධ වැඩ කටයුතු වල දිගින් දිගටම නිරත වන ලද අතර රාජ්‍ය ආයතන විසින් මෙහෙයවන්නට යෙදුන වැඩ මුළු කිහිපයකට ද සිය දායකත්වය ලබා දෙන ලද අතර එම වැඩ මුළු වල විස්තර මෙහි පහත සඳහන් වේ :

i. ශ්‍රී ලංකා ජාතික ස්වේච්ඡා සමාලෝචනය වෙනුවෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ශ්‍රවනාගාරයේදී 2018.04.24 වැනි දින පවත්වන ලද ජාතික බහු පරදු ධාරී උපදේශක වැඩ මුළුව

ii. නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ශ්‍රවනාගාරය තුළදී පවත්වන්නට යෙදුන නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය විසින් 2018.04.26 වැනි දින මෙහෙයවන ලද අංක 6 දරණ තිරසාර සංවර්ධන ඉලක්කය පසු විපරම් කිරීම පිළිබඳ පරදු ධාරී උපදේශක වැඩ මුළුව.

iii. නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ශ්‍රවනාගාරය තුළදී 2018. 10. 23 වැනි දින පවත්වන්නට යෙදුන තිරසාර සංවර්ධන ඉලක්ක 6, ඉලක්කය 6.1 - ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබීමට නියමිත ගෘහස්ථ සමීක්ෂණය සඳහා අවශ්‍ය ජල ගුණාත්ම පරීක්ෂණ

iv. 2018.08.17 වැනි දින නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේදී පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 දර්ශක කමිටු රැස්වීම.

v. 2018ග03ග28 වැනි දින එවකට තිබුණ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේදී ප්‍රධාන පරදු ධාරීන් සමග පවත්වන්නට යෙදුන ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය ශක්තිමත් කිරීම - තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට සඳහා ඇති සූදානම පිළිබඳ රැස්වීම

vi. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6.1 හා අංක 6.2 සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ සුරක්ෂිත ලෙස කළමනාකරණය කරන ලද ජලය හා සනීපාරක්ෂණය සම්බන්ධයෙන් වන ගෝලීය පසු විපරම් ක්‍රමය පිළිබඳව එවකට තිබුණ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ශ්‍රවණාගාරයේදී 2019.05.28 වැනි දින පවත්වන ලද ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) ඒකාබද්ධ පසු විපරම් වැඩ සටහන විසින් මෙහෙයවන ලද අන්තර්ජාල සම්මන්ත්‍රණය (webinar)

vii. එවකට තිබුණ නගර සැලැසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ශ්‍රවණාගාරයේදී 2019.06.26 වැනි දින පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 ඉලක්කයන් - ජල හා සනීපාරක්ෂණ අංශයන් තුළ තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ඉලක්කයන් සම්පාදනය කිරීම සම්බන්ධයෙන් වූ වැඩ මුළුව

viii. 2019.07.23 වැනි දින වෝටර්ස් එජ් හෝටලයේදී ලෝක සෞඛ්‍ය සංවිධානය හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) ඒකාබද්ධ පසු විපරම් වැඩ සටහන සහාය කර ගනිමින් පවත්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක අංක 6 හා අදාල දර්ශකයන් පිළිබඳ වැඩ මුළුව

ix. 2019.09.20 වැනි දින මොවන්පික් හෝටලයේදී පවත්වන ලද අමාත්‍යංශයන්, රාජ්‍ය දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත සංවිධානයන් වෙනුවෙන් තිරසාර සංවර්ධන ඉලක්ක මුඛ්‍ය ධාරාව කර ගත් මහජන සේවාවක් ලබා දීම සූදානම් කිරීම පිළිබඳව හා තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය සම්බන්ධයෙන් වූ උපදෙස් දීමේ වැඩ මුළුව

x. 2020. 03. 05 වැනි දින පවතවන ලද 2020 - 2021 ඒකාබද්ධ පසු විපරම් වැඩ සටහන් වාර්තාව සමාලෝචනය කිරීමේ රැස්වීම - එවකට තිබුණ නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යංශයේ ශ්‍රවණාගාරය තුළදී මෙම රැස්වීම පවත්වන ලදි.

xi. 2020. 03.12 වැනි දින හා 2021. 03.14 වැනි දින ජයික් හිල්ටන් පෙට්විින්ග් බිලූ හෝටලයේදී පවත්වන ලද තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය සම්බන්ධයෙන් වූ වලංගු කිරීමේ වැඩ මුළුව.

xii. ඔවකට තිබුණ ජල සම්පාදන අමාත්‍යංශයේ ශ්‍රවණාගාරය තුළදී පවත්වන ලද තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රමෝපාය කෙටුම්පත සමාලෝචනය කිරීමේ රැස්වීම.

ශ්‍රී ලංකා ජන රජයේ මානව හිමිකම් ක්‍රියාකාරකම් සැලැසුම හා අනුගත වෙමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2018 වර්ෂය තුළදී "හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුමක්" ද සංවර්ධනය කරන ලද අතර හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුම සැලැසුම් කරනු ලැබ ඇත්තේ ජල සම්පාදන පද්ධතීන් තුළ පැන නැගිය හැකි විවිධ හදිසි අවස්ථාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස මෙන්ම සිය ගණුදෙනු කරුවන් වෙත හා සාමාන්‍ය මහ ජනතාව වෙත සපයනු ලබන ප්‍රාමාණික ජල සම්පාදන සේවාවන් හදිසි අවස්ථා තත්වයක් තුළදී අඩාල වීම අවම කිරීම හා එවැනි තත්ත්වයක් යටතේ පොදු ජන සෞඛ්‍ය ආරක්ෂාව හා සුරක්ෂිත භාවය ලබා දීම සම්බන්ධයෙන් මෙහෙයුම් කරුවන් වෙත හා පරිපාලනය වෙත දෙනු ලබන අත් වැලක් වශයෙන් ද වේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2020 වර්ෂය තුළදී ද මෙම හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුම වරින් වර යාවත්කාලීන කිරීමට ද පියවර ගන්නා ලද්දේය. අළුතින් ඇති වන අදාල තත්ත්වයන් සැලැකිල්ලට භාජනය කරමින් පානීය ජල ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම ද 2020 වර්ෂය තුළදී ද දිගින් දිගටම සිදු කරන ලදි.

වාර්ෂික වාර්තාව - 2020

විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අංක 590 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබ ඇති අංක 2965 (බී) දරණ තීරණය හරහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගනිමින් අංක PF/PE/3 හා 1999 නොවැම්බර් 19 වැනි දින දරණ චක්‍ර ලේඛය අනුව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවන ලදි. වර්ෂය තුළදී (2010/12/14 දින හා) අංක 55 දරණ පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තු (PED) චක්‍ර ලේඛයේ නිර්දිෂ්ට මග පෙන්වීම් අනුගමනය කරමින් ක්‍රියා කරන ලදි.

2020 වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටුව විසින් (අභ්‍යන්තර හා රජයේ) විගණන වාර්තා, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන ක්‍රමයේ හා (සංයුක්ත සැලැසුමට අනුව) ව්‍යාපෘති කාර්ය සාධනයේ කාර්ය සාධකත්වය, මණ්ඩලයේ හා රජයේ චක්‍ර ලේඛයන්ට අනුකූල ලෙස කටයුතු කිරීම හා වත්කම් හා බැර කම් සමාලෝචනයට භාජනය කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට අඛන්ඩ ලෙස සහාය වෙමින් සිය අභිප්‍රේක්ෂණ වගකීම් ඉටු කරන ලදි.

විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

කමිටුව විධායක නොවන අධ්‍යක්ෂ වරුන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් දෙදෙනෙකු අංක 55 දරණ පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තු (PED) චක්‍ර ලේඛයේ අංක 01 අනුව අදාල සංවිධානයන් විසින් නම් කරනු ලැබුවා වූ විධායක නොවන අධ්‍යක්ෂ වරුන් වූහ.

කමිටුවේ සාමාජිකයින් වන්නේ :

- ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය - කමිටුවේ සභාපතිනිය
- ටී.එම්.ආර්.පී. තෙන්නකෝන් මහතා - විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- බී. එන්. දම්මින්ද කුමාර මහතා - විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

කමිටු රැස්වීම් වලට සහභාගි වූ අනිකුත් අය වූයේ :

- ආර්.එච්. රුවිනිස් මහතා, ටී. එස්. විජේතුංග මහතා - සාමාන්‍යාධිකාරී
- අයි. එම්. ඩබ්ලිව්. කේ. ඉලංගසිංහ මිය, එස්. ජී. ජී. රාජ්කුමාර් මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා)
- ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා - අතිරේක සංමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමණාකරණය)
- ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

ආරාධිතයින්

- ඒ. ශ්‍රියාලතා මහත්මිය - වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)

නිරීක්ෂකයින් :

- නිමල් ආර්. රණවක මහතා - උප සභාපති
- ඩී. එන්. පීරිස් මහත්මිය - විගණන අධිකාරී - රජයේ විගණන අංශය
- එස්. ඩබ්ලිව්. ගුණවර්ධන මිය. - ප්‍රධාන අභ්‍යන්තර විගණක - ජල සම්පාදන අමාත්‍යාංශය.
- ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා විගණන හා කළමනාකරණ කමිටුවේ ලේකම්

කමිටුවේ භූමිකාව

අදාල ගැටළු කිසිවක් තිබේනම් ඒවා කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කිරීම සඳහා පහත සඳහන් කරුණු ඉටු කිරීම කමිටුවේ වගකීම් වලට ඇතුලත් වන නමුත් එම වගකීම් ඒවාට සීමා වන්නේ නැත.

- මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනයන්ගේ සම්පූර්ණත්වය හා අවංක කම අභිප්‍රේක්ෂණය කිරීම
- මණ්ඩලයේ ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන් සමාලෝචනය කිරීම හා ඊට අනුගාමී ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා අදාල නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර පාලන ක්‍රමය හා ඊට අදාල ක්‍රියාවලීන් අභිප්‍රේක්ෂණය කිරීම
- මණ්ඩලය විසින් නෛතික හා පාලක අවශ්‍යතාවයන්ට අනුකූල ලෙස ක්‍රියා කිරීම අභිප්‍රේක්ෂණය කිරීම
- බාහිර විගණක වරුන්ගේ ස්වාධීනත්වය අභිප්‍රේක්ෂණය කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඔවුනට ගෙවිය යුතු ගාස්තු නිර්දේශ කිරීම.
- අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් වල ඵලදායීතාවය හා අපක්ෂපාතිත්වය සමාලෝචනයට භාජනය කිරීම.

සමාලෝනයට භාජනය කරනු ලබන වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ අනු කමිටුව තුන් වරක් රැස් වූ අතර එහිදී සැලැකිල්ල යොමු වූ වැදගත් කරුණු හා සාකච්ඡා කරන ලද වැදගත් කරුණු පහත සඳහන් කරනු ලැබ ඇත.

විගණනය හා විමර්ෂණය.

කමිටුව විසින් අනුමත කරන ලද 2020 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැසුම කාර්ය සාධන විගණනය, මූල්‍ය විගණනය හා විමර්ෂණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. වර්ෂය වෙනුවෙන් සැලැසුම් කරනු ලැබ ඇති ප්‍රධාන වර්ගයන් යටතේ මානව සම්පත් විගණනයන්, ප්‍රතිසම්පාදනය හා ගබඩා කළමනාකරණය, වත්කම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය හා අනුකූලතාවයන්, සංයුක්ත සැලැසුම ක්‍රියාත්මක කිරීම හා පද්ධති විගණනයන් කමිටුව විසින් මූලික වශයෙන් සමාලෝචනයට භාජනය කරන ලදි. කෝවිඩ් වසංගත තත්ත්වය හේතුකොට ගෙන වාර්ෂික සැලැසුම මත බල පෑම් ඇති වූ හෙයින් විගණන සැලැසුම නැවතත් වරක් සංශෝධනය කරන ලදි.

ආදායම් රහිත ජල පරිමාව මැණීම හා කාන්දු වීම් වලට අදාලව දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කරන ලද ආදායම් රහිත ජල කාර්ය සාධන විගණනය, පැමිණීමේ පද්ධතිය මත සිදු කරන ලද පද්ධති විගණනයන්, වට්ටෝරු පොත් (ඉන්වෙන්ටරි) පද්ධතිය, භූගෝලීය තොරතුරු පද්ධතිය හා උපකරණ පුවරුව සමාලෝචනයට භාජනය කරන ලදි.

කමිටුව විසින් ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් (KPIs) පිහිටුවීම මගින් ව්‍යාපෘතීන් පසු විපරම් කිරීම සඳහා මාර්ගෝපදේශයන් නිර්දේශ කරන ලදි. ව්‍යාපෘතීන් ප්‍රාග්ධනීකරණය කිරීමට අදාල ගැටළු හා ප්‍රමාදයන්, වෙනස් වීම් හා කොන්ත්‍රාත්තු ආරාවුල් සහ තෝරාගත් ව්‍යාපෘතීන් හා සම්බන්ධ මූල්‍ය කාර්ය සාධනය හා භෞතික කාර්ය සාධනය දීර්ඝ ලෙස සමාලෝචනයට භාජනය කරන ලදි.

තොග වටිනාකම් හා තොග හරි වැරදි බැලීම්, වාහන කුලියට ගැනීම හා සම්බන්ධ විෂමාචාරයන්, විනයානුකූල පරීක්ෂණයන්ගේ ඇතැම් ප්‍රතිඵල හා කරගෙන යමින් තිබෙන කරුණු පිළිබඳ විගණන නිරීක්ෂණයන් සාකච්ඡාවට භාජනය කරන ලදි.

වැදගත් කාරණා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයන් මෙන්ම රජයේ විගණනයන් ඇසුරින් පැන නගින ප්‍රශ්නයන්ට ප්‍රතිචාර දක්වන ආකාරය පසු විපරම් කරමින් සමාලෝචනයට භාජනය කරන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් සංචාරක බංගලාවන් පිළිබඳ අමාත්‍යංශය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණයන් විශේෂයෙන්ම සාකච්ඡාවට භාජනය කරන ලද අතර සිදු වන වැරදි අඩු කිරීමට තුඩු දෙන නිර්දේශයන් විශේෂ අවධානයට යොමු කරවන ලදි.

මූල්‍ය ප්‍රකාශයන්.

2019 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය ද, 2020 ජුනි 30 වැනි දිනයට වූ මූල්‍ය ප්‍රකාශය මෙන්ම 2020 ජුනි මාසය දක්වා වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ණය තත්ත්වය ද කමිටුව විසින් සමාලෝචනයට භාජනය කරන ලදි.

අනුකූලතාවයන්.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් හා අනුකූලතාවයෙන් යුතුව කටයුතු කරනු ලැබ ඇති බව කමිටුවේ සැලැකිල්ලට ලක් විය.

- 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර 2018 හා 2019 යන වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තාවන් පිළියෙල කරනු ලැබීමේ ක්‍රියාවලිය තුළ පැවැතිනි.
- කෝප් කමිටුවේ මග පෙන්වීම අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පිළියෙල කිරීම / සංශෝධනය කිරීම සඳහා වූ නිර්දේශයන් කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

කමිටුවේ සියළුම නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත් වූ අකර ඒවා පිළිගනු ලැබ ඇත.



ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය

සභාපති, විගණන හා කළමනාකරණ කමිටුව

මූල්‍ය ප්‍රකාශය

81 - 82 විස්තීරණ ආදායම් ප්‍රකාශය

83 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

84 ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

85 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

86 - 105 මූල්‍ය ප්‍රකාශනයන්ට අදාල සටහන්

106 - 130 2020 දෙසැම්බර් 31 වැනි දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණකාධිපතිගේ වාර්තාව




Rs

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

විස්තිරණ ආදායම් ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2020 දෙසැම්බර් 31

අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		අයවැය 2020 රු.	සත්‍ය 2020 රු.	යලිප්‍රකාශිත 2019 රු.
අයභාරය (එ.අ.බදු හැර)	7	27,635,356,800	**27,761,775,794**	26,079,488,608
විකුණුම් පිරිවැය	8	(18,757,530,167)	**(16,754,645,376)**	(16,614,378,349)
දල ලාභය		8,877,826,633	**11,007,130,418**	9,465,110,259
වෙනත් මෙහෙයුම් ආදායම් හා ලාභ	9	1,696,468,200	**1,482,081,558**	1,258,512,779
පරිපාලන වියදම්	10	(13,614,202,833)	**(12,014,966,400)**	(12,058,704,679)
වෙනත් මෙහෙයුම් වියදම්	11	(671,000,000)	**(839,273,459)**	(764,590,969)
මෙහෙයුම් ලාභය / (අලාභය)		(3,710,908,000)	**(365,027,883)**	(2,099,672,610)
මූල්‍ය ආදායම්	12	800,000,000	**1,571,188,666**	1,454,249,803
මූල්‍ය පිරිවැය	13	(5,573,000)	**(543,298,051)**	(465,671,785)
බදු පෙර ලාභය / (අලාභය)		(2,916,481,000)	**662,862,732**	(1,111,094,592)
ආදායම් බද්ද (ආර්ථික සේවා ගාස්තු)	14	(176,352,000)	**(133,867,482)**	(65,383,426)
වර්ෂය සඳහා ලාභය/ අලාභය		(3,092,833,000)	**528,995,250**	(1,176,478,018)

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	අයවැය 2020	සත්‍ය 2020	යලිප්‍රකාශිත 2019
	රු.	රු.	රු.
වර්ෂය සඳහා ලාභය/ අලාභය	(3,092,833,000)	**528,995,250**	(1,176,478,018)
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම්			
වෙනත් විස්තීරණ ආදායම්	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීරන ආදායම්	(3,092,833,000)	**528,995,250**	(1,176,478,018)

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

මූල්‍ය තත්ව ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට

		සත්‍ය	යලිප්‍රකාශිත
		2020	2019
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්	සටහන්		
දේපල පිරියත හා උපකරණ	15	251,997,596,210	246,278,933,112
අස්පෘශ්‍ය වත්කම්	16	14,122,453	4,176,328
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	17	373,462,655,570	291,515,394,453
මූල්‍ය වත්කම්	18	1,853,507	2,050,210
මුළු ජංගම නොවන වත්කම්		625,476,227,740	537,800,554,103
ජංගම වත්කම්			
තොග	19	8,392,700,441	8,730,906,974
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	20	11,266,375,666	6,868,849,172
තැන්පතු සහ අත්තිකාරම්	21	28,708,313,898	40,706,840,162
ආයෝජන	22	23,598,991,188	27,736,376,662
මුදල් හා මුදල් සමාන දෑ	23	1,834,937,637	3,911,730,765
මෙහෙයුම් නොවන වත්කම්		149,681,812	149,681,812
මුළු ජංගම වත්කම්		73,951,000,641	88,104,385,547
මුළු වත්කම්		699,427,228,381	625,904,939,651
ස්කන්ධ හා බැරකම්			
ස්කන්ධය			
රජයේ දෙපාර්තමේන්තු වලින් පවරාගත් වත්කම්	24	185,480,387	185,480,387
රාජ්‍ය ප්‍රාග්ධනය	25	88,531,428,611	85,106,439,687
කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල	26	20,608,827	29,411,874
රඳවාගත් ඉපයුම්		(8,894,719,740)	(9,432,518,036)
රජයේ ප්‍රදාන	27	109,812,274,767	105,903,930,027
ප්‍රාග්ධන ප්‍රදාන	28	267,293,806,096	241,308,488,604
මුළු ස්කන්ධය		456,948,878,948	423,101,232,544
ජංගම නොවන වගකීම්			
ගෙවිය යුතු ණය	29	198,175,771,364	139,316,053,612
වෙනත් විලම්බිත වගකීම්	30	4,019,409,604	4,057,934,251
මුළු ජංගම නොවන වගකීම්		202,195,180,969	143,373,987,863
ජංගම වගකීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	31	33,744,530,835	39,244,016,264
ගෙවිය යුතු ණය ප්‍රාග්ධනය	29	2,920,569,236	12,034,922,913
ගෙවිය යුතු ණය පොලිය		3,546,140,644	8,078,638,649
මෙහෙයුම් නොවන වගකීම්		71,927,749	72,141,419
මුළු ජංගම වගකීම්		40,283,168,465	59,429,719,245
මුළු ස්කන්ධ හා බැරකම්		699,427,228,381	625,904,939,651

ආර්.එම්.ඒ.එස්.වීරසේන
අතිරේක සාමාන්‍යාධිකාරී (මුදල්)

තිලින එස් විජේතුංග
සාමාන්‍යාධිකාරී

පිටු අංක 08 සිට 14 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරන ප්‍රතිපත්ති හා පිටු අංක 15 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරන සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යාවශ්‍ය අංගයකි. මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඒ වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

එන්.රණතුංග
සභාපති
කොළඹ
2021 මාර්තු

එන්.ආර්. රණවක
උප සභාපති

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	රජයේ දෙපාර්තමේන්තු	රජයේ ප්‍රදාන	රාජ්‍ය ප්‍රාග්ධනය	ප්‍රාග්ධන ප්‍රදාන	කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල	සමුච්චිත ලාභය / පාඩුව	එකතුව
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2019 ජනවාරි 01 දිනට ශේෂය		185,480,387	98,303,838,433	81,053,316,307	218,460,298,409	23,463,597	(8,225,271,493)	**389,801,125,640**
පූර්ව වර්ෂ නිවැරදි කිරීම් -								
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම	**34.1.1**	-	-	-	-	-	(13,517,301)	**(13,517,301)**
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම සඳහා ක්ෂය ගැලපීම	**34.1.2**	-	-	-	-	-	11,981,434	**11,981,434**
පුනරුත්ථාපන හා නිර්මාන වැඩ	**34.2**	-	-	-	-	-	(7,810,955)	**(7,810,955)**
කොග	**34.2**						(1,591,050)	**(1,591,050)**
බැංකුවේ මුදල්	**34.2**	-	-	-	-	-	(14,004,583)	**(14,004,583)**
වෙලඳ හා අනෙකුත් ණය ලැබීම්	**34.2**	-	-	-	-	-	(758,840)	**(758,840)**
වෙලඳ හා අනෙකුත් ණය ගෙවීම්	**34.2**	-	-	-	-	-	1,140,233	**1,140,233**
2019.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය		185,480,387	98,303,838,433	81,053,316,307	218,460,298,409	23,463,597	(8,249,832,554)	**389,776,564,579**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		-	-	-	-	-	(1,176,478,018)	**(1,176,478,018)**
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම	**34.1.1**						3,380,896	**3,380,896**
වර්ෂය තුල ලැබීම් / මාරු කිරීම්		-	7,600,091,594	-	22,848,190,195	-	-	**30,448,281,790**
ණය, ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය (ආරම්භක ශේෂයන්ට ගැලපීම් ඇතුළුව)	**34.2**	-	-	4,053,123,380	-	-	-	**4,053,123,380**
පුනරුත්ථාපන හා ඉදිකිරීම් වැඩ	**34.2**	-	-	-	-	-	(2,170,190)	**(2,170,190)**
වෙලඳ හා අනෙකුත් ලැබිය යුතු හා ආ.සේ.ගා	**34.2**	-	-	-	-	-	(1,469,893)	**(1,469,893)**
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලට මාරුකිරීම්		-	-	-	-	5,948,277	(5,948,277)	-
2019.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය		185,480,387	105,903,930,027	85,106,439,687	241,308,488,604	29,411,874	(9,432,518,036)	**423,101,232,544**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		-	-	-	-	-	528,995,250	**528,995,250**
වර්ෂය තුල ලැබීම් හා මාරුකිරීම්		-	3,908,344,739	-	25,985,317,491	-		**29,893,662,231**
ණය, ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය		-	-	3,424,988,924	-	-	-	**3,424,988,924**
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලට මාරුකිරීම්		-	-	-	-	(8,803,047)	8,803,047	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		**185,480,387**	**109,812,274,767**	**88,531,428,611**	**267,293,806,096**	**20,608,827**	**(8,894,719,739)**	**456,948,878,948**

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
අවසන් වර්ෂය සඳහා		2020	2019
	සටහන්	රු.	රු.
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
බදු වලට පෙර ශුද්ධ ලාභය / (අලාභය)		662,862,732	(1,111,094,592)
ගැලපීම්			
පොලී ආදායම්	12	(1,571,188,666)	(1,454,249,803)
ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය / අලාභය		30,886,759	8,426,050
ක්ෂයවීම්	10.2	4,701,009,454	4,614,775,009
විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	30.1	485,960,193	578,942,828
පොලී වියදම්	13	543,298,051	465,671,785
කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය		4,852,828,522	3,102,471,277
තොග (වැඩිවීම්) / අඩුවීම්		338,206,533	(1,408,206,933)
ණයගැතියන් , ලැබිය යුතු සහ තැන්පතුවල (වැඩිවීම) / අඩුවීම		7,500,714,522	4,987,732,998
ණය හිමියෝ සහ වෙන්කිරීම් සහ තැන්පතුවල වැඩිවීම් / (අඩුවීම)		(5,538,010,076)	22,201,678,025
මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්		7,153,739,501	28,883,675,367
ගෙවූ බදු		(33,795,903)	(138,860,749)
පාරිතෝෂික ගෙවීම්	30.1	(485,960,193)	(578,942,828)
මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල්		6,633,983,405	28,165,871,790
ආයෝජන කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
ස්ථාවර වත්කම් වල හා කෙරිගෙන යන වැඩ වල ආයෝජනය		(82,724,934,026)	(93,001,120,680)
මූල්‍ය වත්කම්		196,703	1,687,375
අපහරණය කළ වත්කම් විකුණුම් වලින් ලැබීම්		39,740,056	17,400
ආයෝජන ආදායම් ලැබීම්		1,571,188,666	1,454,249,803
(ආයෝජන) / ආයෝජනය ඉවත් කිරීම්		4,137,385,474	(15,312,252,655)
ආයෝජන කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(76,976,423,127)	(106,857,418,757)
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
කාල පරිච්ඡේදය තුළ රජයේ ප්‍රදාන		3,908,344,739	7,600,091,594
කාල පරිච්ඡේදය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන		28,169,256,217	24,402,315,887
ස්කන්ධ පරිවර්තනය සඳහා ණය ලැබීම් සහ නව ණය		67,517,911,260	61,968,254,527
ණය ආපසු ගෙවීම්		(14,347,558,260)	(6,844,543,998)
පොලී ගෙවීම්		(16,982,307,363)	(6,100,745,895)
		68,265,646,593	81,025,372,115
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම්		(2,076,793,129)	2,333,825,148
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		3,911,730,765	1,577,905,616
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		1,834,937,637	3,911,730,765

පිටු අංක 08 සිට 26 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

මූල්‍ය ප්‍රකාශනවල සටහන්
2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2020 දෙසැම්බර් 31

මූල්‍ය ප්‍රකාශනවල සටහන්
2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

සංස්ථාගත තොරතුරු

1.1 පොදු කරුණු

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය ගාලු පාර, රත්මලාන යන ස්ථානයේ පිහිටුවා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයද එම පරිශ්‍රයේ පිහිටුවා ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජා.ජ.ජ.ප.ම) ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.

1.2 ප්‍රධාන කාර්යයන්

මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ පිරිපහදු කරන ලද පානීය ජලය නිෂ්පාදනය කිරීම හා ප්‍රජාවට විකිණීම වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අරමුණු වන්නේ රට පුරා පිරිපහදු කළ පානීය ජලය සංවර්ධනය කිරීම සහ එහි සඳහා ශ්‍රී ලංකාවාසී ජනතාවට ප්‍රවේශවීමේ හැකියාව ලබා දීමය.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS) වලට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2.2 අගය කිරීමේ පදනම

මූල්‍ය උපකරණ හා සාධාරන වටිනාකමට අගය කරන ලද විකිනීම සඳහා පවතින අනෙකුත් මූල්‍ය වත්කම් හා වගකීම් හැර මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. විශ්‍රාම පාරිතෝෂිතය සඳහා බැඳීම වර්ථමාන අගයට හඳුනාගෙන ඇත.

3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල , පිරියත හා උපකරණවල පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ යම් සමුච්චිත හානි කරන අලාභයන් නිබේ නම් ඒවා අඩු කොට ශුද්ධ අගයට පෙන්නුම් කරනු ලැබේ. මෙම පිරිවැයෙහි දේපල හා උපකරණ ප්‍රතිසම්පාදන පිරිවැය සහ ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනීත කළ හැකි නිර්නායකයන් සම්පූර්ණ කරනු ලබන , දීර්ඝ කාලීන ව්‍යාපෘති වල ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ. දේපල පිරියත හා උපකරණ වල ප්‍රධාන කොටස් කාලීනව නැවත ප්‍රසම්පාදනය කළ යුතු නම්, ජා.ජ.ජ.ප.ම. එම කොටස් වෙන් වෙන් වශයෙන් වූ වත්කම් වශයෙන් හඳුනාගෙන එම වත්කම් වල නිශ්චිත ඵලදායී ජීවිත කාලය තුළ ක්ෂය කරනු ලැබේ. එසේම, පුළුල් පරීක්ෂාවක් සිදුකළ විට, හඳුනා ගැනීම් නිර්ණායකයන් සම්පූර්ණ කරන්නේ නම්, එහි පිරිවැය පිරියත හා උපකරණ ඉදිරියට ගෙන යනු ලබන මුදලක් ලෙස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියළුම අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලාභ හෝ අලාභ සඳහා දරන ලද වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

ප්‍රයෝජනයට ගැනීමෙන් පසුව, යලි වත්කම් භාවිතයෙන් ඉවත් කිරීම සඳහා දැරීමට සිදුවේ යැයි අපේක්ෂිත පිරිවැයෙහි වර්තමාන අගය, වෙන් කිරීම් සිදුකිරීමට අදාල නිර්ණායකයන්ට අනුකූල වන්නේ නම්, අදාල වත්කම් පිරිවැයට ඇතුළත් කරනු ලැබේ.

3.1.1 ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය පදනම් කර ගෙන අදාල වත්කම් පහත සඳහන් පරිදි සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

දේපල පිරියත හා උපකරණ	අනුපාතය
ගොඩනැගිලි හා ව්‍යුහයන්	1.67% - 2%

පිරියත හා පොම්ප උපකරණ	5%
සේවා හා තොග ජල මනු	10%
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	1.67%
උපකරණ	10%
ලී බඩු සහ සවිකිරීම්	10%
පරිගණක උපාංග හා ජංගම දුරකථන	20% - 33.3%
මෝටර් රථ	10% - 20%
කල් බදු මෝටර් රථ	14.3%

3.1.2 කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍ර දිනට ප්‍රාග්ධනීත නොකරන ලද හා වර්ෂය තුළ දරන ලද ප්‍රාග්ධන වියදම් කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස පෙන්නුම් කරනු ලබන අතර වර්ෂය තුළ ප්‍රාග්ධනීත කරන ලද හා භාවිතයට ගනු ලබන වත්කම් දේපල, පිරියත හා උපකරණ වලට මාරු කරනු ලැබේ.

3.1.3 කල්බදු

කල්බද්ද ආරම්භයේදී නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිතා කිරීමේ අයිතිය ප්‍රමාණවත් ලෙස පැවරීම සම්බන්ධව ඇතිකරගනු ලබන එකඟතාවය හෝ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවකදි පවා වත්කම් භාවිතා කිරීමට එකඟවීම මගින් කල් බද්දක් පවතීද නැද්ද යන්න තීරණය වේ.

3.1.4 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගනු ලබන අස්පෘශ්‍ය වත්කම්වල අග්‍ය මුලිකව පිරිවැයට හඳුනාගනු ලැබේ. මුලික හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් වල අගය, සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභයන් ඇත්නම් එම අගයන් අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ. අභ්‍යන්තරව ජනනය කරනු ලබන අස්පෘශ්‍ය වත්කම්, ප්‍රාග්ධනගත කරන ලද සංවර්ධන වියදම් හැර, ප්‍රාග්ධනීත නොකරන අතර, එම වියදම්, වියදම් දරන ලද වර්ෂයේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කරනු ලැබේ. පරිගනක මෘදුකාංග වසර 7ක් දක්වා හායනය කරනු ලබයි.

3.1.5 පර්යේෂණ හා සංවර්ධන පිරිවැය.

පර්යේෂණ පිරිවැය වියදමක් ලෙස සලකනු ලබයි. ජා.ජ.ජ.ප.ම. විසින් පහත දැ සම්පූර්න වන්නේ නම් පමනක්, තනි ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද සංවර්ධන පිරිවැය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබයි එසේ හඳුනා ගනුයේ,

- වත්කමක් විකිණීමට හෝ භාවිතයට ගත හැකි වන පරිදි තාක්ෂණික ශක්‍යතා මට්ටමක් සම්පූර්ණ කර ඇති අස්පෘශ්‍ය වත්කම්.
- විකිණීමට හෝ භාවිතයට ගත හැකි බව පෙන්නුම් කර ඇති සහ සම්පූර්ණ කිරීමට අදහස් කර ඇති වත්කම්,
- අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කරනු ලබන්නේ කෙසේද යන බව පැහැදිලි වීම,
- වත්කම සම්පූර්ණ කිරීමට අවශ්‍ය සම්පත් පවතින බව,
- වත්කම් සංවර්ධනය කිරීමේදී දරන ලද වියදම් විශ්වාසවන්තව ගණනය කිරීමේ හැකියාව.

සංවර්ධන කටයුතු සඳහා දරන ලද මුලික වියදම් වත්කමක් ලෙස හඳුනාගත් පසුව, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර ඉදිරියට ගෙන යනු ලබයි. සංවර්ධන කටයුතු අවසන් කර අදාල වත්කම භාවිතයට ගන්නා අවස්ථාවේ සිට ක්‍රමක්ෂය කිරීම ආරම්භ කරන අතර වත්කමේ ඵලදායී ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය විකුණුමේ පිරිවැය තුළ දක්වනු ලබන අතර වත්කම සංවර්ධනය කරනු ලබන කාලය තුළ අගය අඩුවීම් පිළිබද පරීක්ෂාවන්ට වාර්ෂිකව භාජනය කරනු ලබයි.

3.1.6 මූල්‍ය නොවන වත්කම්වල අගය අඩුවීම

ජා.ජ.ජ.ප.ම. වත්කම්වල අගය හානිවීමක් පෙන්නුම් කරන්නේ දැයි හඳුනා ගැනීම සඳහා සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තක්සේරුවක් කරනු ලබයි. අගය අඩුවීමක් පෙන්නුම් කරනවිට හෝ වත්කම් සඳහා වාර්ෂික අගය අඩුවීම් පරීක්ෂාවක් අවශ්‍යවිට ජා.ජ.ජ.ප.ම විසින් අදාල වත්කම් අයකර ගත හැකි වටිනාකමට තක්සේරු කරනු ලැබේ. වත්කමකින් මුදල් ජනනය කිරීමක් සිදු නොවන්නේ නම්, එම වත්කම් අනෙකුත් වත්කම් හෝ වත්කම් වර්ගයකින් බොහෝ දුරට

ස්වාධීනව පවතින අවස්ථා වලදී හැර වත්කමක හෝ මුදල් ජනනය කිරීමේ ඒකකයක (cash generating unit) නැවත අයකර ගත හැකි වටිනාකම අතිරික්ත වන විට එහි සාධාරණ අගයෙන් බැහැර කිරීමේ පිරිවැය අඩුකර එක් එක් වත්කමේ භාවිතා කිරීමේ අගය තීරණය කරනු ලබයි. වත්කමක හෝ මුදල් ජනනය කිරීමේ ඒකකයක ඉදිරියට ගෙන එන ලද වටිනාකම එහි අයකර ගත හැකි අගයට වඩා වැඩි වන විට, එය අගය අඩුවීමක් ලෙස සලකා අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා හරිනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තීරණය කිරීමේදී වත්කමක ඇස්තමේන්තු කරන ලද අනාගත මුල්‍ය ප්‍රවාහයෙහි වර්තමාන අගය , වර්තමාන වෙළඳපළ වටිනාකම තක්සේරු කළ හැකි මුදලේ කාල වටිනාකම සහ වත්කමට ආවේනික වූ අවදානම් තත්ත්වය පිළිබිඹු කරණ බදු පෙර වට්ටම් අනුපාතයත් මත වට්ටම් කර තීරණය කරනු ලබයි. සාධාරණ අගය ගණනය කිරීමේදී විකිණීම සඳහා දැරිය යුතු පිරිවැය අඩුකරනු ලබන අතර, විස්තර ඇන්නම් ඒ සඳහා මෑතකදී කරනලද ගනුදෙනු වල විස්තර පදනම් කර ගනු ලැබේ. එවැනි ගනුදෙනු වල විස්තර නොමැතිනම්, සුදුසු තක්සේරු කිරීමේ පදනමක් යොදා ගනු ලැබේ.

3.2.1 තොග

හරිත සාමාන්‍ය මිල කිරීමේ ක්‍රමය මත සහ හානිවූ හා සෙමින් වලනය වන තොග සඳහා සාධාරණ වෙන්කිරීම් කළ පසු, තොග භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකින් වඩා අඩු අගයට තක්සේරු කරනු ලබයි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ විකුණූ ලබන මිලෙන්, එම භාණ්ඩ නිම කිරීමට ඇස්තමේන්තු කරන ලද පිරිවැය සහ විකිණීම සිදුකිරීම සඳහා දැරීමට සිදුවේයැයි ඇස්තමේන්තු කරන ලද පිරිවැය අඩුකර ශුද්ධ උපලබ්ධි අගය තීරණය කරනු ලැබේ.

තොග මැනීම

3.2.2 තොග පිරිවැය

අමු ද්‍රව්‍ය

ගැණුම් පිරිවැය හා යම්කිසි දැරීමට සිදුවිය හැකි පිරිවැය ඇතුළුව.

අනෙකුත් තොග

හරිත කළ සාමාන්‍ය මිල මත

3.3. මුදල් හා මුදලට සමාන වත්කම්

අතැති මුදල් , බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන වලින් ගෙවීමට ඇති බැංකු අයිරාවක් අඩුකළ පසු වටිනාකම්වින් මුදල් හා මුදලට සමාන වත්කම් සමන්විත වේ.

4. වගකීම්, වෙන්කිරීම් සහ ඝකන්ධය

4.1. විශ්‍රාම පාරිතෝෂික සඳහා බැඳීම්

4.1.1 විශ්‍රාම පාරිතෝෂික සඳහා බැඳීම් (ශ්‍රීලංගිප්‍ර 19)

අ) ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS-19) අනුකූල වන පරිදි සෑම සේවකයෙකුගේම සේවා කාලයෙහි ආරම්භක වර්ෂයේ සිට පාරිතෝෂික සඳහා වෙන්කිරීම් කරනු ලැබේ.

ආ) විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

ජා.ජ.ජ.ප.ම. නම් කරන ලද ප්‍රතිලාභ සැලසුමක් ක්‍රියාත්මක කරනු ලැබේ. නම් කරන ලද සැලසුම යටතේ කරනු ලබන වෙන්කිරීම් ඇස්තමේන්තුගත ඒකක බැර ක්‍රමය (Projected Unit Credit Method) භාවිතා කරමින් තීරණය කරනු ලබයි. ප්‍රතිලාභ සැලසුමෙහි ආයුගණක (Actuarial) ලාභ සහ පාඩු එය ඇතිවූ කාල පරිච්ඡේදයේදී අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ සම්පූර්ණයෙන් හඳුනා ගනු ලැබේ. මෙම ආයුගණක ලාභ සහ පාඩු වහාම රදවාගත් ඉපයීම් වලින් හඳුනාගන්නා අතර පසු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස වර්ගීකරණය කරනු නොලැබේ.

ප්‍රතිලාභ සඳහා හිමිකම ලබන කාල පරිච්ඡේදය වෙනුවෙන් හිමිකම් නොලබන කාල පරිච්ඡේදයේදී දරන ලද ඉකුත් සේවා වියදම්, වියදම් ලෙස හඳුනාගෙන සරල මාර්ග ක්‍රමයකයට සාමාන්‍ය කාලය තුළ ලියා හරිනු ලැබේ. ප්‍රතිලාභ සඳහා දැනටමත් හිමිකම් ලබන්නේ නම්, ඉකුත් සේවා වියදම්, විශ්‍රාම සැලසුමේ සඳහන් පරිදි හෝ සැලසුමට කරන වෙනස් කිරීමක් ලෙස වහාම හඳුනාගත යුතුය.

නම් කරන ලද ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙන් (උසස් තත්ත්වයේ සංස්ථා බැඳුම්කර පදනම් කර ගත් මට්ටම් අනුපාතයක් යොදා ගණනය කරන ලද) හඳුනා නොගත් ඉකුත් සේවා වියදම් හා සැලසුම්කරණය කරන ලද වත්කම් වල සාධාරණ අගයෙන් නිරවුල් කළ යුතු බැඳීම් අඩු කළ පසු වටිනාකම් වලින්, නම් කරන ලද ප්‍රතිලාභ වත්කම් හා වගකීම් සමන්විත වේ.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සෑම වසර තුනකට වරක්ම ක්‍රියාකාරී අගය කරන්නෙකුගේ සේවය හරහා මනිනු ලබන අතර වැටුප් සංශෝධනයට අනුකූලව වසර තුනක කාලය තුළ එවැනි වගකීම් පවත්වාගෙන යයි. එබැවින්, ඉදිරි වසර දෙක සඳහා අඛණ්ඩව සිදු වූ පාරිතෝෂික වගකීම් පළමු වසර තුළ සත්‍ය වශයෙන්ම හඳුනා ගත් වහාම වියදම ලෙස සලකනු ලැබේ.

නම් කරන ලද දායකවීමේ සැලසුම් -සේ.අ.සා හා සේ.නි.හා.අ

සේවක අර්ථ සාධක සේවක භාරකාර අරමුදල දක්වා ඇති නියමයන්ට හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකවීම සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. දළ සේවක ඉපයීම් වලින් 12 % ක් හා 3% ක් මණ්ඩලය විසින් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවනු ලබයි.

4.2 වෙන්කිරීම

පොදු කරුණු

අතීත සිද්ධීන් වල ප්‍රතිඵලයක් ලෙස ජා.ජ.ජ.ම. වර්තමානයේදී මුහුණුදීමට ඇති බැඳීම් (නීතිමය හෝ වටහාගත හැකි ආකාරයට) සඳහා වෙන්කිරීම් කරනු ලබන අතර වෙන්කිරීම් සඳහා බැඳුණු ආර්ථික ප්‍රතිලාභ හා වගකීම් ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පවතී. ජා.ජ.ජ.ප.ම. වෙන් කිරීම් වලින් කොටසක් හෝ සම්පූර්ණ ප්‍රමාණයම ප්‍රතිපූරණය කිරීමට අදහස් කරන්නේ නම් (උදා:- රක්ෂණ ඔප්පුවක් මත) ප්‍රතිපූර්ණය කරනු ලබන ප්‍රමාණය සත්‍ය වශයෙන්ම තහවුරු කර ගත හැකි නම්, වෙන්කිරීම් වලින් ප්‍රතිපූර්ණයන් අඩුකළ පසු අගය ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කරනු ලැබේ.

4.3 රජයේ ආධාර

රාජ්‍ය ආධාර ලැබෙන බවට සාධාරණ තහවුරුවක් ඇතිවීම සහ ආධාර ලැබීමට අවශ්‍ය කොන්දේසි සපුරා ඇති විට අදාල රජයේ ආධාර හඳුනා ගනු ලැබේ. රජයේ ආධාර වියදම් අයිතම හා සම්බන්ධවීම එම වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාලව ක්‍රමානුකූල පදනමක් මත වියදමට විලම්බිත වන පරිදි ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. රජයේ ආධාර වත්කමක් හා සම්බන්ධ වන විට, අදාල වත්කමේ ඵලදායී ජීවිත කාලය තුළ ගණනය කරනු ලබන අගයකින් ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. මූල්‍ය නොවන ආධාර ලැබුණු විට, අදාල වත්කම හා ආධාර නාමික අගය මත සටහන් කර, එම වත්කම උපයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය තුළදී සමාන වාරික වශයෙන් ලාභයට හෝ අලාභයට ගලපනු ලබයි. රජය විසින් හෝ රජයට සම්බන්ධ ආයතන විසින් ණය හෝ සමාන ආධාර ප්‍රදානය කළ විට ගෙවිය යුතු පොලී අනුපාතය වෙළඳපළ පොලී අනුපාතයට වඩා අඩුනම් වෙනස රජයේ ආධාරයක් ලෙස සලකනු ලැබේ.

අංක 20/0974/204/029-VI දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව වසර 15ක කාලයක් සඳහා මහා භාණ්ඩාගාරය විසින් පහසුකම් සපයනු ලබන ණය වලින් පැන නගින පොලී හා අනෙකුත් වියදම් පියවීම සඳහා ජා.ජ.ජ.ම. සඳහා හිමිකම් ප්‍රාග්ධනය ලෙස අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ලබාදීමට නියමිතය. තවද එම ණය වල ප්‍රාග්ධන කොටස, කොටස් ප්‍රාග්ධනය වශයෙන් හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත වලට අනුකූලව පොලී සංරචකය ආදායම් ප්‍රදානයක් ලෙස පිළිගනු ලැබේ.

5. ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා, ජා.ජ.ජ.ප.ම. කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ ලෙස නියෝජනය කරන බැවින්, වියදම් යාකාරිත්ව ක්‍රමයේ අනුගමනය කරනු ලැබේ.

5.1.1 ආදායම් හඳුනාගැනීම

ගෙවීම් කරනු ලබන කාල පරිච්ඡේදය නොසලකා ජා.ජ.ජ.ප.ම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම් ලැබීම් විශ්වාසවන්තව මැනිය හැකි බව පදනම් කර ගෙන ආදායම් හඳුනාගනු ලැබේ. ගිවිසුම් මගින් කීරණය කර ඇති ගෙවීම්

කොන්දේසි සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලවන් වල සාධාරණ අගය මත ආදායම් හඳුනාගනු ලැබේ. ආදායම් හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබේ.

භාණ්ඩ විකිණීම

භාණ්ඩ වල අයිතියට අදාල අවදානම් හා ප්‍රතිලාභ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ගැණුම්කරුවට පවරා ඇති විට, සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදී ඇති විට භාණ්ඩ විකිණීමේ ආදායම හඳුනා ගනු ලැබේ.

ජලය විකිණීම

ජල මනු කියවා දින 30 ක කාලසීමාවක් තුල පාරිභෝගිකයකු විසින් පාරිභෝජනය කරනලද ජල ඒකක ප්‍රමානය පරිගනක පද්ධතියේ යාවත්කාලීනවූ පසු ජලය විකිණීම ආදායමක් ලෙස හඳුනා ගැනේ.

අනෙකුත් ආදායම්
අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

පොලී ආදායම්
සෑම මූල්‍ය වත්කමක්ම ක්‍රමක්ෂය කළ වටිනාකම මත අගය කරන අතර පොලී ආදායම් හිමි මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ග කෙරේ. පොළී ආදායම හෝ වියදම සඵල පොලී අනුපාතය (EIR) යොදා ගනිමින් සටහන් කරන අතර මූල්‍ය වත්කමේ ඵලදායි ජීවිත කාලය තුළ හෝ උචිත වන පරිදි ඊට කෙටි කාලයක් තුළ වත්කමෙන් ඉපයීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රමානයන් මත ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රමානයන් නිශ්චය මවිටම් කරනු ලබන අනුපාතය EIR ලෙස හැදින්වේ. පොලී ආදායම මූල්‍ය ආදායම් ලෙස ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

නැවත අයකළ හැකි වැඩ
ස්ථාවර මිල කොන්ත්‍රාත් මඟින් ලැබෙන ආදායම්, ප්‍රතිශත නිම කිරීම් ක්‍රමය පදනම් කර ගෙන කරන ලද වැඩ ප්‍රමාණය අනුව ගණනය කරනු ලැබේ.

5.1.2 වියදම්
වර්ෂයේ ලාභය හෝ අලාභය නීරණය කිරීම සඳහා ව්‍යාපාරය පවත්වාගෙන යාමට දරනු ලබන වියදම් ආදායමට ලියාහරිනු ලබයි. අළුත්වැඩියා හා අළුත් කිරීමේ ගාස්තු වියදම් දරන ලද වර්ෂයේ ලාභයට හෝ අලාභයට ලියාහරනු ලබයි.

5.2 විලම්බිත බදු

භාවිතා නොකරන ලද බදු අලාභ පැවතීම හා අනාගතයේදී පොලී වැනි අඩුකල හැකි වියදම් හේතුවෙන් බදු අයකල හැකි ආදායම් ඇති නොවීම තහවුරු කරන ප්‍රභල සාක්ෂියක් වේ. ජා.ජ.ප. මණ්ඩලය ආදායම් බදු ගෙවීම් ඉතා අවිනිශ්චිත වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගිණුම්වල විලම්භිත බදු වත්කම්/වගකීම් හඳුනා නොගනී.

6. මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම හා පසුව අගය කිරීම

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මූලික හඳුනාගැනීම හා අගය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS-39) සඳහන් විෂය පථයට අදාලව ලාභ හෝ අලාභ මඟින් ඇතිවන, සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතුදෑ, පරිනතවීම දක්වා තබාගෙන ඇති ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් උචිත වන පරිදි සාධාරණ අගය මත මූලිකව මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබයි. වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නොදැක්වෙන විට වත්කම්වල සාධාරණ අගයට වත්කම් හුවමාරු පිරිවැය ඇතුළත් කොට මූලික අවස්ථාවේදී හඳුනාගනු ලැබේ.

ජා.ජ.ප.ම. මූල්‍ය වත්කම් වලට, මුදල් හා කෙටි කාලීන ආයෝජන, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ, සේවක ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ ඇතුළත් වේ.

6.1.2 පසුගණනය කිරීම

මූල්‍ය වත්කම් වල අගය පසුව හඳුනා ගැනීම පහත සඳහන් පරිදි එම වත්කම් වල වර්ගීකරණය මත තීරණය වේ.

6.1.2.1 ලාභ හෝ අලාභ මඟින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ මඟින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් වලට, විකිණීමට ඇති මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මඟින් ඇති වන සාධාරණ අගයට මුලිකව හඳුනාගත් සහ නම් කරනු ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. විකිණීමේ පරමාර්ථයෙන් හෝ අත්පත් කර ගත් සහ නුදුරු අනාගතයේදී නැවත මිලට ගනු ලබන මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

6.1.2.2 ණය හා ලැබිය යුතු දෑ

සක්‍රීය වෙළඳපලකදී ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් නොකරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ගණයට ණය හා ලැබිය යුතු දේ අයත් වේ. මෙවැනි වත්කම් මුලිකව අගයකළ පසු, සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් අගය අඩුවීම් සඳහා ගැලපීම් කර, අයකරනු ලබන වටිනාකම තීරණය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී දරන ලද වියදම් ලැබුණු වට්ටම් හෝ ගෙවූ අධිමිල සහ පිරිවැය හා ගාස්තු EIR හි මුලිකාංග වේ. EIR අගය මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය ආදායම යටතේ පෙන්නුම් කරනු ලබන අතර අගය අඩුවීමේ අලාභ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වියදමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

6.1.2.3 කල්පිරෙනතුරු තබා ගන්නා ආයෝජන

ජා.ජ.ජ.ප.ම. කල්පිරෙන තුරු තබා ගැනීමට ධනාත්මක ඇල්මක් හා හැකියාවක් තිබෙන විට, ව්‍යුත්පන්න නොවන ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් කරන මූල්‍ය වත්කම් කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන ලෙස වර්ග කෙරේ.මුලික අගය කිරීමෙන් පසුව, කල්පිරීම දක්වා තබා ගන්නා ආයෝජන , එහි අගය අඩුවීම් ගලපා සඵල පොලිය පදනම් කර ගෙන ක්‍රමක්ෂය වටිනාකමට අගය කරනු ලැබේ. අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම්, ලැබුණු වට්ටම හෝ ගෙවූ අධි මිල සහ පිරිවැය හා ගාස්තු සඵල පොලී අනුපාතයෙහි මුලිකාංග වේ. EIR මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය ආදායමක් ලෙස පෙන්නුම් කරන අතර අගය අඩුවීමේ අලාභ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වියදමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

6.1.2.4 විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

ස්කන්ධය හා ණය සුරකුම් විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන වලට ඇතුළත් වේ. විකිණීම සඳහා නොවන සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට දන්වා නොමැති අයිතම ස්කන්ධ ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලබයි. ද්‍රවශීල අවශ්‍යතා සහ වෙළඳපොළ තත්ත්වයෙන් වෙනස්වීම් වලට අනුගතවීම සඳහා අවිනිශ්චිත කාලයක් තබා ගැනීමට අපේක්ෂා කරන ආයෝජන ණය සුරකුම් පත් ලෙස වර්ග කෙරේ. මුලික අගය කිරීමෙන් පසුව, විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන නැවත අගය කිරීම එම වත්කම් වල දක්වා සාධාරණ වටිනාකම මත සිදුකරයි. උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු විස්තිර්ණ ආදායම් ලෙස හඳුනා ගැනේ.

6.1.2.5 හඳුනාගැනීම් ඉවත් කිරීම (Derecognition)

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක අදාල වන කොටස හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක අදාල වන කොටස්) පහත අවස්ථාවලදී හඳුනා ගැනීම ඉවත් කරනු ලබයි. එනම්

(i) වත්කමක කාලය ඉකුත් වී මුදල් ප්‍රවාහයන් ලැබීමට අයිතිය තිබෙන විට

(ii) ජා.ජ.ජ.ප.ම. වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය හෝ ලැබෙන මුදල් ප්‍රමාණයන් ප්‍රමාණාත්මක කාල පමාවකින් තොරව තුන්වන පාර්ශ්වයන් වෙත ප්‍රේෂණය කිරීම. (Pass Through) ගිවිසුම් යටතේ කළ යුතු බවට උපකල්පනය කරන විට එසේත් නැත්නම්,

(අ) ජා.ජ.ජ.ප.ම. වත්කම් වල සියළුම අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස පවරා ඇති විට, හෝ

(ආ) ජා.ජ.ජ.ප.ම. විසින් වත්කම් වල සියළුම අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස පවරා නැති අවස්ථාවල අදාල වත්කම් වල පාලනය පවරා ඇතිවිට.

6.1.2.6 මූල්‍ය වත්කම් වල හානිකරණය

එක් එක් වාර්තාකරණ දිනට ඇති මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ වල අගය අඩුවීම පිළිබඳ අරමුණු ගත සාක්ෂි තිබේ දැයි ජා.ජ.ජ.ප.ම. විසින් තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අගය මූලික හඳුනාගැනීමෙන් පසුව, මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අගය හෝ අනාගත මුදල් ප්‍රවාහයක අඩුවීම කෙරෙහි බලපාන එක් සිද්ධියක් හෝ සිද්ධීන් කීපයක් ඇති විය හැකි බව විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ හැකි නම් එම වත්කම් වල අගය අඩුවන බව හා එසේ ඇතිවන බව නිගමනය කරනු ලබයි.

ණය ගැතියන් හෝ ණය ගැතියන් කණ්ඩායමක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවක්, පැහැර හැරීමක් හෝ පැහැර හැරීමක් අත්විඳින බවට ඇඟවීම්, ඔවුන් බංකොලොත් භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් වීමේ සම්භාවිතාව, සහ නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කරන විට, දුර්වලතා පිළිබඳ සාක්ෂි ඇතුළත් විය හැකිය. හිහ මුදල්වල වෙනස්වීම් හෝ පැහැර හැරීම් සමඟ සහසම්බන්ධ වන ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් සැලකේ.

6.1.2.7 මූල්‍ය වත්කම් වල හානිකරණය

ප්‍රතික්ෂේප කරන ලද පිරිවැයක් යටතේ ගෙන යන මූල්‍ය වත්කම් සඳහා, ජා.ජ.ජ.ප.ම.පළමුව තක්සේරු කරන්නේ දුර්වලතා පිළිබඳ වෛෂයික සාක්ෂි තනි තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහාද, නැතහොත් සාමූහිකව තනි තනිව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහාද යන්නයි. සැලකිය යුතු හෝ නැතත් තනි තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා දුර්වලතා පිළිබඳ වෛෂයික සාක්ෂි නොමැති බව ජා.ජ.ජ.ප.ම. තීරණය කරන්නේ නම්, එයට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක වත්කම් ඇතුළත් වන අතර සාමූහිකව ඒවා දුර්වලතා සඳහා තක්සේරු කරයි. දුර්වලතා සඳහා තනි තනිව තක්සේරු කරන ලද සහ අලාභහානි පාඩුවක් හඳුනාගෙන ඇති හෝ දිගටම පවතින වත්කම්, සාමූහික තක්සේරුවකට ඇතුළත් නොවේ.

අලාභහානි අලාභයක් සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේ නම්, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කම් රැගෙන යන මුදල සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස (තවමත් සිදුවී නොමැති අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) . ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම්වල මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කර ඇත.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම සහ මැනීම

LKAS/SLFRS හි විෂය පථය තුළ ඇති මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම් ලෙස, ක්‍රමක්ෂ කළ පිරිවැයක් යටතේ හෝ සුදුසු පරිදි ඵලදායී ඇප සාධන පත්‍ර ලෙස නම් කර ඇති උපකරණ ව්‍යුත්පන්නයන් ලෙස වර්ග කෙරේ. ජා.ජ.ජ.ප.ම.මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරයි.

සියලුම මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමින් මුලින් හඳුනාගෙන ඇති අතර, ණය සහ ණය ගැනීම් සම්බන්ධයෙන්, ක්‍රමක්ෂ වියදම් යටතේ සිදු කෙරේ. මෙයට සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය ඇතුළත් වේ. ජා.ජ.ජ.ප.ම. හි මූල්‍ය වගකීම්වලට වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ.

පසුකාලීන මිනුම්
පසුකාලීන මූල්‍ය වගකීම් මැනීම ක්‍රමක්ෂය කළ පිරිවැයකින් සිදු කෙරේ.

හඳුනා නොගැනීම

මූල්‍ය වගකීමක් වගකීම් යටතේ ඇති වගකීම ඉවත් කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට හඳුනා නොගනී.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

සත්‍ය යලිප්‍රකාශිත

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2020 Rs.	2019 Rs.
7. අයභාරය			
මනුගත විකුණුම්		**25,218,395,326**	23,579,412,927
තොග විකුණුම්		**309,583,406**	319,246,904
බවුසර් සැපයුම්		**80,113,424**	96,978,817
ප්‍රධාන මෙහෙයුමෙන් වූ ආදායම	7.1	**2,153,683,639**	2,083,849,960
		27,761,775,794	26,079,488,608
7.1 ප්‍රධාන මෙහෙයුම් ආදායම්			
ජල සම්බන්ධන හා අනෙකුත් මෙහෙයුම් ආදායම්		**2,850,936,522**	2,442,876,471
ප්‍රාග්ධන ආවරණ ආදායම		**706,609,881**	580,583,247
නව ජලසම්බන්ධන සඳහාවූ වියදම්		**(1,403,862,765)**	(939,609,758)
		2,153,683,639	2,083,849,960
8. විකුණුම් පිරිවැය			
සේවක පිරිස් පිරිවැය		**6,995,067,804**	7,275,051,786
පොම්ප කිරීමේ පිරිවැය		**4,615,722,138**	4,489,139,930
රසායනික ද්‍රව්‍ය		**1,065,876,772**	1,044,325,298
අළුත් වැඩියා සහ නඩත්තු		**1,817,938,416**	1,669,196,579
ආයතනික වියදම්		**676,380,644**	643,035,076
ගෙවල් කුලී , වරිපනම් බදු, ආරක්ෂක හා අනෙකුත් වියදම්		**1,487,318,903**	1,379,763,584
සහනාධාර		**96,340,699**	113,866,096
		16,754,645,376	16,614,378,349
9. වෙනත් මෙහෙයුම් ආදායම්			
වෙනත් ආදායම්	9.1	**1,468,557,203**	1,210,780,014
කාර්ය මණ්ඩල ණය ප්‍රතිලාභ		**13,524,354**	47,732,765
		1,482,081,558	1,258,512,779
9.1 වෙනත් ආදායම්			
මලාපවහන හා භූගත ජල ආදායම්		**348,766,415**	308,699,497
අධිඅය හා දන්ඩන ආදායම් ඇතුළු අනෙකුත් ආදායම්		**1,119,790,788**	902,080,516
		1,468,557,203	1,210,780,014

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
		2020	2019
		රු.	රු.
10. පරිපාලන වියදම්			
අළුත් වැඩියා සහ නඩත්තු		**217,803,115**	219,423,427
ආයතනික වියදම්		**744,179,117**	770,622,560
ගෙවල් කුලී , වරිපනම් බදු , ආරක්ෂක හා වෙනත් වියදම්		**605,098,526**	491,222,211
කාර්ය මණ්ඩල පිරිවැය	**10.1**	**5,736,876,187**	5,952,018,101
ක්ෂය	**10.2**	**4,701,009,454**	4,614,418,381
විගණන ගාස්තු-විගණකාධිපති අඛණ්ඩ විගණනය ඇතුළුව		**10,000,000**	11,000,000
		12,014,966,400	12,058,704,679
10.1 කාර්ය මණ්ඩල පිරිවැය			
ලබාදුන් සේවක ණය මත සේවක පිරිවැය		**13,524,354**	47,732,765
පිරිස් පිරිවැය		**5,723,351,833**	5,904,285,336
		5,736,876,187	5,952,018,101
10.2 ක්ෂය			
ගොඩනැඟිලි හා ව්‍යුහයන්		**1,553,395,903**	1,369,619,857
පිරියත හා යන්ත්‍ර		**4,516,046,830**	4,041,069,694
උපකරණ		**416,450,409**	375,967,234
ලී බඩු සහ සවිකිරීම්		**48,094,980**	45,698,527
පරිගනක හා ආශ්‍රිත උපකරණ		**106,921,778**	99,764,809
මොටර්වාහන		**253,984,404**	234,932,539
මුළු ක්ෂය		**6,894,894,304**	6,167,052,660
අඩු කලා - ප්‍රදාන මගින් මූල්‍යනය වූ වත්කම් වල ක්ෂයවීම්		**(2,202,508,903)**	(1,559,491,087)
අඩු කලා - නැවත අයකරනු ලබන වත්කම් වල ක්ෂයවීම්		**(9,569,738)**	(9,557,463)
එකතු කලා: කල්බදු වත්කම් ක්‍රමක්ෂය		**15,949,142**	15,949,142
එකතු කලා - අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය		**2,244,648**	465,128
ක්ෂය පිරිවැය		**4,701,009,454**	4,614,418,381
556,365 ක් වටිනා ක්ෂයවීම් 2019 වර්ෂය සඳහා ගැලපීම් කර ඇත			
11. වෙනත් මෙහෙයුම් වියදම්			
බොල් හා අඩමාන ණය		**233,007,208**	15,772,686
කල් ඉකුත් වූ තොග සඳහා අධි වෙන්කිරීම		**-**	3,983,204
විශ්‍රාම පාරිතෝෂික		**485,960,193**	578,942,828
අයහාර ප්‍රදාන		**120,306,058**	165,892,251
		839,273,459	764,590,969
12. මූල්‍ය ආදායම්			
ආයෝජන ආදායම්		**1,571,188,666**	1,454,249,803
		1,571,188,666	1,454,249,803
13. මූල්‍ය වියදම්			
ණය මත පොලිය		**12,449,809,359**	10,398,657,848
අඩු කලා - නිර්මාන ව්‍යාපෘතිවල ප්‍රාග්ධනීත කළ පොලිය		**(11,906,511,308)**	(9,932,986,062)
		543,298,051	465,671,785
14. බදු			
ආර්ථික සේවා ගාස්තු (අවුරුදු 2කට පසු)		**133,867,482**	65,383,426
		133,867,482	65,383,426

2017 සහ 2018 වර්ෂවල ආ.සේ.ගා වියදම් පිළිවෙලින් 2019 සහ 2020 වියදම් ලෙස හඳුනාගෙන ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15. දේපල පිරියත හා උපකරණ

15.1 දල ධාරණ අගය	2020.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය	ගැලපීම් වලට පසු එකතු කිරීම්	මාරු කිරීම්	ඉවත්කිරීම්	2020.12.31 දිනට ශේෂය
පිරිවැය සින්නක්කර වත්කම්	රු.	රු.	රු.	රු.	රු.
සින්නක්කර ඉඩම්	8,642,267,971	44,181,799	5,857,294	-	**8,692,307,065**
කල්බදු ඉඩම්	626,761,182	-	(27,260,928)	-	**599,500,254**
යටිතල පහසුකම්	8,778,262,503	49,674,283	260,570,870	-	**9,088,507,657**
සින්නක්කර ගොඩනැඟිලි	17,412,764,260	360,159,111	1,528,689,488	(448,000)	**19,301,164,859**
ව්‍යුහයන්	61,478,225,048	436,437,987	(1,985,286,844)	(7,996,472)	**59,921,379,719**
පිරියත හා පොම්ප උපකරණ	47,539,012,073	1,174,717,309	14,125,585	(115,512,948)	**48,612,342,019**
සේවා මනු	19,513,655	-	(15,723,838)	-	**3,789,817**
තොග ජල මනු	624,000,681	22,284,898	19,606,775	-	**665,892,353**
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	125,568,421,108	10,897,858,627	(1,367,334,411)	-	**135,098,945,324**
ජංගම උපකරණ	1,200,554,432	65,152,012	(6,202,897)	(11,225,000)	**1,248,278,546**
මැනුම් උපකරණ	51,638,530	40,859,290	7,233,710	-	**99,731,530**
රසායනාගාර උපකරණ	897,819,592	39,750,825	6,733,408	-	**944,303,825**
වෙනත් උපකරණ	2,885,018,298	458,594,261	178,110,184	(378,386)	**3,521,344,357**
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	660,511,232	74,182,107	(37,429,625)	(10,600)	**697,253,114**
පරිගණක හා පර්යන්ත උපකරණ	693,841,134	147,017,575	(5,519,701)	(34,500)	**835,304,508**
මෝටර් වාහන - කාර් රථ	211,112,404	52,520,356	453,333,549	(5,900,000)	**711,066,309**
වෑන්, බස් හා ජීප් රථ	531,581,337	10,775,000	(27,569,985)	(11,700,000)	**503,086,352**
ලොරි හා ට්‍රක් රථ	2,522,319,121	195,670,776	(528,408,604)	(16,108,152)	**2,173,473,141**
ට්‍රැක්ටර් සහ ට්‍රෙලර්	60,345,191	2,526,470	(5,126,470)	(2,175,000)	**55,570,191**
ජල බවුසර් හා බර වාහන	1,577,451,896	77,537,305	48,695,137	(2,850,000)	**1,700,834,338**
මෝටර් සයිකල්	26,026,213	1,276,587	(76,316)	(56,000)	**27,170,484**
ත්‍රී රෝද රථ	7,659,975	3,210,365	35,100,179	-	**45,970,519**
කල් බදු වාහන	23,180,000	-	(23,180,000)	-	**-**
මුළු ක්ෂය කළ හැකි වත්කම් වල වටිනාකම්	282,038,287,838	14,154,386,942	(1,471,063,441)	(174,395,059)	**294,547,216,280**

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15.2	ක්ෂය	2020.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය	වර්ෂය සඳහා ක්ෂය	ගැලපීම්	ඉවත්කිරීම්	2020.12.31 දිනට ශේෂය
		රු.	රු.	රු.	රු.	රු.
	ක්ෂය					
	සින්නක්කර වත්කම්					
	සින්නක්කර ඉඩම්	-	-	-	-	-
	කල්බදු ඉඩම්	-	-	-	-	-
	යටිතල පහසුකම්	961,390,924	175,917,217	-	-	**1,137,308,141**
	සින්නක්කර ගොඩනැඟිලි	1,946,829,047	350,126,563	(212,194)	(111,253)	**2,296,632,162**
	ව්‍යුහයන්	6,147,383,008	1,027,352,123	-	(1,604,038)	**7,173,131,092**
	පිරියත හා පොම්ප උපකරණ	10,738,281,293	2,303,591,386	-	(71,335,341)	**12,970,537,339**
	සේවා මනු	18,568,187	465,109	(15,723,838)	-	**3,309,458**
	තොග ජල මනු	297,130,723	53,792,990	15,723,838	-	**366,647,551**
	සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	10,840,733,187	2,158,197,344	183,997	-	**12,999,114,528**
	ජංගම උපකරණ	355,781,032	103,633,075	-	(8,797,594)	**450,616,514**
	මැනුම් උපකරණ	18,720,780	3,927,447	-	-	**22,648,228**
	රසායනාගාර උපකරණ	428,051,251	58,933,339	-	-	**486,984,590**
	වෙනත් උපකරණ	1,354,687,892	249,956,548	-	(367,067)	**1,604,277,373**
	ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	342,584,684	48,094,980	(844,517)	(8,922)	**389,826,225**
	පරිගණක හා පර්යන්ත උපකරන	570,941,439	106,921,778	11,998	(9,775)	**677,865,440**
	මෝටර් වාහන - කාර් රථ	141,810,922	24,335,070	12,651,777	(1,141,140)	**177,656,629**
	වෑන්, බස් හා ජීප් රථ	421,030,273	25,631,859	(2,435,447)	(8,540,690)	**435,685,995**
	ලොරි හා ට්‍රක් රථ	713,238,570	121,317,099	-	(8,661,255)	**825,894,414**
	ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	50,117,123	4,347,466	-	(2,066,250)	**52,398,339**
	ජල බවුසර් හා බර වාහන	386,527,042	76,713,415	-	(1,071,719)	**462,168,738**
	මෝටර් සයිකල්	12,442,725	828,032	-	(53,200)	**13,217,557**
	ත්‍රී රෝද රථ	2,888,294	811,463	-	-	**3,699,757**
	කල් බදු වාහන	10,216,329	-	(10,216,329)	-	**0**
		35,759,354,725	6,894,894,304	(860,715)	(103,768,244)	**42,549,620,070**

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15. දේපල පිරියත හා උපකරණ

15.3 ශුද්ධ පොත් අගය	2020 රු.	2019 රු.
පිරිවැය		
සින්නක්කර ඉඩම්	**8,692,307,065**	8,642,267,971
කල්බදු ඉඩම්	**599,500,254**	626,761,182
යටිතල පහසුකම්	**7,951,199,516**	7,816,871,579
සින්නක්කර ගොඩනැඟිලි	**17,004,532,696**	15,465,935,213
ව්‍යුහයන්	**52,748,248,627**	55,330,842,040
පිරියත හා පොම්ප උපකරණ	**35,641,804,681**	36,800,730,780
සේවා මනු	**480,360**	945,468
තොග ජල මනු	**299,244,802**	326,869,958
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	**122,099,830,796**	114,727,687,921
ජංගම උපකරණ	**797,662,033**	844,773,399
මැනුම් උපකරණ	**77,083,302**	32,917,750
රසායනාගාර උපකරණ	**457,319,235**	469,768,341
වෙනත් උපකරණ	**1,917,066,984**	1,530,330,406
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	**307,426,888**	317,926,548
පරිගණක හා පර්යන්ත උපකරන	**157,439,068**	122,899,695
මෝටර් වාහන - කාර් රථ	**533,409,679**	69,301,482
වෑන්, බස් හා ජීප් රථ	**67,400,357**	110,551,064
ලොරි හා ට්‍රක් රථ	**1,347,578,725**	1,809,080,551
ට්‍රැක්ටර් සහ ටෙලර්	**3,171,852**	10,228,068
ජල බවුසර් හා බර වාහන	**1,238,665,600**	1,190,924,854
මෝටර් සයිකල්	**13,952,927**	13,583,488
ත්‍රී රෝද රථ	**42,270,762**	4,771,681
කල් බදු වාහන	**(0)**	12,963,671
දේපල පිරියත හා උපකරණ වල මුළු ධාරන අගය.	**251,997,596,210**	246,278,933,112

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
		2020	2019
		රු.	රු.
16.	**අස්පෘශ්‍ය වත්කම්**		
	පරිගණක මෘදුකාංග	**14,122,453**	4,176,328
		14,122,453	4,176,328

වර්ෂය තුළ ඉහත මෘදුකාංග සඳහා ක්‍රමක්ෂය සඳහා රුපියල් 3,374,221 ක් ලබා දී ඇති අතර නව මෘදුකාංග 17,500 ක් එකතු කර ඇත.

17.	**කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ**			
	ඉදිකිරීම් වැඩ	**34.2**	**366,959,156,027**	285,664,819,677
	පුනරුත්ථාපන		**6,503,499,543**	5,850,574,775
			373,462,655,570	291,515,394,453
18.	**මූල්‍ය වත්කම්**			
	සේවක නිවාස ණය සඳහා HDFC හි ආයෝජනය.		**441,068**	688,527
	ලංකා බැංකුව ඉතුරුම් - II		**1,412,440**	1,361,683
			1,853,507	2,050,210
19.	**තොග**			
	පිවීසි වානේ පයිප්ප		**5,032,247,170**	5,328,992,075
	ජලමනු හා පිත්තල අයිතම		**745,219,930**	815,140,804
	රසායනික ද්‍රව්‍ය		**328,604,834**	191,847,637
	විදුලි උපකරණ		**735,849,788**	720,232,246
	ගොඩනැගිලි ද්‍රව්‍ය		**70,345,208**	32,798,463
	පයිප්ප හා අමතර උපාංග	**34.2**	**1,249,805,822**	1,220,749,686
	වාහන අමතර කොටස්		**308,596,261**	334,782,918
	ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	**34.2**	**76,141,325**	83,882,174
	වෙනත් අයිතම	**34.2**	**561,631,653**	467,932,626
	තොග ගැලපුම්		**35,732,252**	131,870,865
			9,144,174,242	9,328,229,494
	අඩුකලා- ප්‍රධාන අමතර කොටස්			
	ගබඩාවල තිබෙන දේපල පිරියත හා උපකරණ		**(606,941,540)**	(442,927,939)
	කල් ඉකුත් වූ තොග සඳහා වෙන්කිරීම		**(144,532,262)**	(154,394,581)
			8,392,700,441	8,730,906,974

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
		2020	2019
		රු.	රු.
20. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ			
වෙළඳ ණයගැතියෝ	34.2	8,030,015,131	4,706,427,817
වෙනත් ණයගැතියෝ		359,403,706	377,412,918
අඩුකළා : ණයගැති හානිකරණ		(1,466,952,481)	(1,233,945,273)
ණයගැති පාලන ගිණුම	34.2	479,699,404	(723,553,484)
ලැබිය යුතු එ.අ.බදු		11,888,233	6,117,059
ලැබිය යුතු රඳවා ගැනීම් බදු		247,129,963	244,221,362
ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තුව	34.2	172,656,652	272,728,231
සේවක අත්තිකාරම්		19,984,791	13,099,604
සේවක ණය		2,704,816,354	3,068,896,781
මහා භාණ්ඩාගාරයෙන් අයවිය යුතු මුදල්		659,277,280	-
ලැබිය යුතු පොලී හා වෙනත්		48,456,634	137,444,157
		11,266,375,666	6,868,849,172

වාර්තාකරණ ක්‍රියාවලිය වෙගවත් කිරීම සඳහා, 2020 දෙසැම්බර් මාසයේ ප්‍රධාන ආදායම 2020 නොවැම්බරයේ සත්‍ය ප්‍රධාන ආදායම මත පදනම්ව ඇතැම් කාර්යයාල සඳහා ඇස්තමේන්තු කර ඇත.

21. තැන්පතු සහ අත්තිකාරම්			
කලින් ගෙවීම්		956,151	8,096,500
අත්තිකාරම්		28,412,896,392	40,406,847,644
තැන්පතු		294,461,356	291,896,019
		28,708,313,898	40,706,840,162
22. ආයෝජන			
පරිණතිය තෙක් තබාගන්නා (නැවත අයකරගන්නා අරමුදල් අයත් ආයෝජන ඇතුළුව)		23,598,991,188	27,736,376,662
		23,598,991,188	27,736,376,662
23. මුදල් හා මුදල් සමාන දෑ			
බැංකුවේ මුදල්	34.2	1,575,845,777	3,567,782,050
ප්‍රධාන කාර්යාලයේ මුදල් අග්‍රිමය		4,107,362	2,629,300
ප්‍රාදේශීය මුදල් අග්‍රිමය		6,272,935	6,243,980
මාර්ගස්ථ මුදල්		166,479,620	251,931,795
ඉතිරි කිරීමේ ගිණුම්		82,231,943	83,143,640
		1,834,937,637	3,911,730,765
24. රජයෙන් අත්පත් කරගත් වත්කම්			
රජයේ දෙපාර්තමේන්තු වලින් අත්පත් කර ගත් වත්කම්		185,480,387	185,480,387
		185,480,387	185,480,387
25. රාජ්‍ය ස්කන්ධය			
ණය, ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය		74,631,444,685	71,206,455,762
රාජ්‍ය දායකත්වය (බැදුම්කර)		13,899,983,925	13,899,983,925
		88,531,428,611	85,106,439,687

2014.12.31 දිනට ගෙවිය යුතු විදේශ අරමුදල් සහ පොලිය රජයේ ස්කන්ධය බවට පරිවර්තනය කිරීමට ශ්‍රී ලංකා රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේ. තවද, ඇතැම් විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරය විසින් සිදු කරන ලද ණය සේවාව ද වර්ෂය තුළ රජයේ දායකත්වය ලෙස පිළිගැනීමට ලක්විය.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		සත්‍ය	යලිප්‍රකාශිත
		2020	2019
		රු.	රු.
26. සේවක සුභසාධන අරමුදල			
ආරම්භක ශේෂය		**29,411,874**	23,463,597
වර්ෂය තුළ ලැබීම් /(ගෙවීම්)		**(8,803,047)**	5,948,277
		20,608,827	29,411,874
27. රජයේ ප්‍රදාන			
භාණ්ඩාගාර ප්‍රදාන		**109,812,274,767**	105,903,930,027
		109,812,274,767	105,903,930,027
28. ප්‍රාග්ධන ප්‍රදාන			
විදේශීය ප්‍රදාන		**265,549,744,453**	239,719,094,394
දේශීය ප්‍රදාන		**1,744,061,642**	1,589,394,210
		267,293,806,096	241,308,488,604
29. ගෙවිය යුතු ණය			
විදේශ ණය		**163,342,347,199**	115,484,776,594
දේශීය ණය		**34,833,424,166**	23,831,277,018
ගෙවිය යුතු ණය වල දිගුකාලීන කොටස		**198,175,771,364**	139,316,053,612
ගෙවිය යුතු ණය වල කෙටිකාලීන කොටස		**2,920,569,236**	12,034,922,913
ගෙවිය යුතු ණය		**201,096,340,601**	151,350,976,525
30. වෙනත් අසම්භාව්‍යය වගකීම්			
විශ්‍රම ප්‍රතිලාභ සැලැස්ම සඳහා වෙන් කිරීම	**30.1**	**4,003,984,078**	4,003,984,078
ගනුදෙනුකරු හා සේවක ආරක්ෂිත තැම්පතු		**15,425,526**	53,950,172
		4,019,409,604	4,057,934,251
30.1 විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මේ වෙනස්වීම			
කාලපරිච්ඡේදය ආරම්භක ශේෂය		**4,003,984,078**	4,003,984,078
එකතු කළා - කාල පරිච්ඡේදය සඳහා වෙන්කිරීම්		**485,960,193**	578,942,828
අඩුකලා - කාල පරිච්ඡේදය තුළ පාරිතෝෂික ගෙවීම් සහ ආයුසණක ලාභ		**(485,960,193)**	(578,942,828)
අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම සඳහා ප්‍රතිපාදන		**4,003,984,078**	4,003,984,078
31. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ			
නැවත අයකර ගත හැකි වැඩ සඳහා			
ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම්		**9,285,334,967**	11,061,757,655
කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා ගැනීම්		**15,016,366,516**	13,256,692,526
කල් බදු ණය හිමියෝ		**-**	3,190,775
අඩුකලා - අවිනිශ්චිත පොලිය		**-**	(76,347)
ණයහිමි පාලන ගිණුම	**34.2**	**2,127,054,981**	1,677,303,246
වෙනත් ණයහිමියෝ		**339,170,471**	338,462,216
උපචිත වියදම්	**34.2**	**6,314,782,183**	12,310,204,618
තැන්පතු		**283,501,586**	248,578,020
ගෙවිය යුතු එකතු කළ අගය මත බදු		**200,605,713**	156,097,480
රඳවා ගැනීම් බදු		**141,677**	7,459,405
වැටුප් හා වෙනත් ගෙවිය යුතු දෑ		**177,572,741**	184,346,670
		33,744,530,835	39,244,016,264

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

32. සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු

රජයේ සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ ගනුදෙනු.

මණ්ඩලය විසින් සිදුකරනු ලබන සාමාන්‍ය ගනුදෙනු සමඟ සම්බන්ධිත පාර්ශවයන් සමඟ ද ගනුදෙනු කරනු ලැබේ. ශ්‍රී ලංකා රජය (මණ්ඩලයේ අවසන් බලාධිරිකාරිය දක්වනු ලබන) විවිධ වූ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සම්බන්ධිත පාර්ශව වලට අයත් වේ. රජයේ සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන වලට අදාළ තනි තනි වශයෙන් වැදගත් වන සහ තනි තනි වශයෙන් වැදගත් නොවූවද සාමූහික වශයෙන් ගත්කළ වැදගත් වන, මණ්ඩලය විසින් සිදු කරන ලද ගනුදෙනු සහ විධිවිධානයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

33. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

සියලුම ප්‍රමාණාත්මක ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු ගැලපීම් අවශ්‍ය වන පරිදි මූල්‍ය වාර්තා වල සිදුකර ඒවා අනාවරණය කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

34. පූර්ව වර්ෂ ගැලපීම්

34.1 2007.12.31 දිනට පැවති මණ්ඩලය සතු වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුවේ සහය ඇතිව ප්‍රත්‍යාගණනය කරන ලදී.මෙම ප්‍රත්‍යාගනික අගයන් 2010 වර්ෂයේදී පොත් වලට ගන්නා ලද අතර මෙම අගයන් මේවන තෙක් ධාරණ අගය ලෙස පොත් වල පවතී. වත්කම් ප්‍රමානය අතිවිශාල වීම නිසා 2010 වර්ෂයේ සිදුවූ යම් අත්හැරීම් හා ද්විගණනය වීම් පූර්ව වර්ෂ ගැලපීම් යටතේ පෙර වර්ෂ වලට බලපෑන පරිදි නිවැරදි කර ඇත. මේ අනුව දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගයට වන ශුද්ධ බලපෑම වන රු.මිලියන 10,136,405 ක් ගලපන ලද අතර 2019.12.31 දිනට ක්ෂය වීම් ලෙස රු.මිලියන 12,338,062 ක් ගලපන ලදී.

34.1.1 දල ධාරණ අගය

පිරිවැය සින්නක්කර වත්කම්	2019.12.31 දිනට ශේෂය රු.	පූර්ව වර්ෂ ගැලපීම් රු.	2019.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය රු.
සින්නක්කර ඉඩම්	8,642,267,971	-	8,642,267,971
කල්බදු ඉඩම්	626,761,182	-	626,761,182
යටිතල පහසුකම්	8,778,290,484	(27,981)	8,778,262,503
සින්නක්කර ගොඩනැඟිලි	17,412,764,260	-	17,412,764,260
ව්‍යුහයන්	61,478,244,218	(19,170)	61,478,225,048
පිරියත හා පොම්ප උපකරණ	47,539,026,163	(14,090)	47,539,012,073
සේවා මනු	19,513,655	-	19,513,655
තොග ජල මනු	624,016,577	(15,896)	624,000,681
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	125,568,430,655	(9,547)	125,568,421,108
ජංගම උපකරණ	1,201,158,339	(603,907)	1,200,554,432
මැනුම් උපකරණ	51,638,530	-	51,638,530
රසායනාගාර උපකරණ	898,105,578	(285,986)	897,819,592
වෙනත් උපකරණ	2,882,094,302	2,923,996	2,885,018,298
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	671,768,393	(11,257,162)	660,511,232
පරිගණක හා පර්යන්ත උපකරන	694,667,797	(826,663)	693,841,134
මෝටර් වාහන - කාර් රථ	211,112,404	-	211,112,404
වෑන්, බස් හා ජීප් රථ	531,581,337	-	531,581,337
ලොරි හා ට්‍රක් රථ	2,522,319,121	-	2,522,319,121
ට්‍රැක්ටර් සහ ට්ලර්	60,345,191	-	60,345,191
ජල බවුසර් හා බර වාහන	1,577,451,896	-	1,577,451,896
මෝටර් සයිකල්	26,026,213	-	26,026,213
ත්‍රී රෝද රථ	7,659,975	-	7,659,975
කල් බදු වාහන	23,180,000	-	23,180,000
මුළු ක්ෂය කළ හැකි වත්කම් වල වටිනාකම	282,048,424,242	(10,136,405)	282,038,287,838

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

34.1.2 ක්ෂය	2019.12.31 දිනට ශේෂය	පූර්ව වර්ෂ ගැලපීම්	2019.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය
සින්නක්කර වත්කම්	රු.	රු.	රු.
සින්නක්කර ඉඩම්	-	-	-
කල්බදු ඉඩම්	-	-	-
යටිතල පහසුකම්	961,396,314	(5,390)	961,390,924
සින්නක්කර ගොඩනැඟිලි	1,946,829,047	-	1,946,829,047
ව්‍යුහයන්	6,147,387,144	(4,136)	6,147,383,008
පිරියත හා පොම්ප උපකරණ	10,738,289,956	(8,663)	10,738,281,293
සේවා මනු	18,568,187	-	18,568,187
තොග ජල මනු	297,146,464	(15,741)	297,130,723
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	10,840,745,243	(12,056)	10,840,733,187
ජංගම උපකරණ	355,981,354	(200,321)	355,781,032
මැනුම් උපකරණ	18,720,780	-	18,720,780
රසායනාගාර උපකරණ	428,216,030	(164,779)	428,051,251
වෙනත් උපකරණ	1,354,821,638	(133,746)	1,354,687,892
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	351,737,678	(9,152,994)	342,584,684
පරිගණක හා පර්යන්ත උපකරන	571,681,676	(740,237)	570,941,439
මෝටර් වාහන - කාර් රථ	141,810,922	-	141,810,922
වෑන්, බස් හා ජීප් රථ	421,030,273	-	421,030,273
ලොරි හා ට්‍රක් රථ	713,238,570	-	713,238,570
ට්‍රැක්ටර් සහ ට්ලර්	54,867,123	(4,750,000)	50,117,123
ජල බවුසර් හා බර වාහන	383,677,042	2,850,000	386,527,042
මෝටර් සයිකල්	12,442,725	-	12,442,725
ත්‍රී රෝද රථ	2,888,294	-	2,888,294
කල් බදු වාහන	10,216,329	-	10,216,329
මුළු ක්ෂය වල වටිනාකම	35,771,692,788	(12,338,062)	35,759,354,725

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

34.2 දේපල පිරියක උපකරණ වලට අදාල පෙර වර්ෂ ගැලපීම් වලට අමතරව පහත සඳහන් අයිතමද පූර්ව වර්ෂ සඳහා බලපාන ලෙස ගලපා ඇත.

	2019.12.31 දිනට ශේෂය	පූර්ව වර්ෂ ගැලපීම්	2020 වර්ෂයට අදාල ගැලපීම්	2020.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය
	රු	රු	රු	රු
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ (සටහන් 17)				
ඉදිකිරීම් වැඩ	285,674,800,823	(7,810,955)	(2,170,190)	285,664,819,677
තොග (සටහන් 19)				
පයිප්ප හා අමතර උපාංග	1,219,549,844	1,199,842	-	1,220,749,686
ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	83,875,792	6,382	-	83,882,174
වෙනත් අයිතම	470,729,900	(2,797,274)	-	467,932,626
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (සටහන් 20)				
වෙනත් ණයගැතියෝ	4,707,186,657	(758,840)	-	4,706,427,817
ණය ගැනි එකතු කිරීමේ පාලන ගිණුම	(722,383,592)	-	(1,169,893)	(723,553,484)
ලැබිය යුතු ආ.සේ.ගා	273,028,231	-	(300,000)	272,728,231
මුදල් හා මුදල් සමාන දෑ (සටහන් 23)				
මාර්ගස්ථ මුදල්	3,581,786,632	(14,004,583)	-	3,567,782,050
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ (සටහන් 31)				
ණයහිමි පාලන ගිණුම	1,680,514,246	(3,211,000)	-	1,677,303,246
උපචිත වියදම්	12,308,133,852	2,070,767	-	12,310,204,618

ඩබ්එස්එස්/ඒ/එන්ඩබ්එස්ඩීබී/එෆ්ඒ/01/2020 2021 ජූනි 25

සභාපති

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) (“මණ්ඩලය”) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිතයෙන් බැහැරවීම (එල්කේඒඑස්/එස්එල්එෆ්ආර්එස්)

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 32 ට පටහැනි ලෙස ජංගම වත්කම් නියෝජනය කරනු ලබන වෙළෙඳ ලැබිය යුතු දෑ හි රු.8,506,031ක අසාමාන්‍ය බැර ශේෂය බැරකම් වලට හිලව් කොට සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. ඊට සමානව ජංගම වගකීම් නියෝජනය කරන රු. 1,078,112 ක රඳවා ගැනීමේ හර ශේෂයක් ලැබිය යුතු දෑට එරෙහිව හිලව් කොට සමාලෝචනය කළ වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 60 ට පටහැනි ලෙස තොග, ණය ගැති සහ අත්තිකාරම් ඇතුලත් වන රු. 149,681,812 ක ක්‍රියාකාරී නොවන වත්කම් වටිනාකමක් හඳුනා ගෙන තිබූ අතර ඒවායේ ද්‍රවශීලතාවය සැලකිල්ලට ගැනීමකින් තොරව එය මුදල් හා මුදල් හා සමාන දෑට පහතින් දක්වා තිබුණි.

(ඇ) තොග පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 02) 9 වෙනි ඡේදයට පටහැනිව, වසර තුනකට වඩා වැඩි කාලයක් වලනය නොවූ මුළු වටිනාකම රු. 496,204,232 ක් වූ තොග ඒවායෙහි ශුද්ධ උපලබ්ධි වටිනාකම තක්සේරු නොකර එහි පිරිවැයට වාර්තා කර තිබුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණය ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර.07) 07 වන වන වගන්තියට පටහැනිව, ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කරනු ලැබූ රු. 1,412,440 ක් සහ එස්ක්‍රෝ ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කර තිබූ රු.මිලියන 12,887.03 ක් මුදල් හා මුදල් හා සමාන දෑ යටතේ දැක්වීමකින් තොරව මූල්‍ය වත්කම් හා ආයෝජන යටතේ වර්ගීකරණය කර තිබුණි.

(ඉ) ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 08) 41 සහ 42 වෙනි ඡේදයන්ට පටහැනිව රු.65,430,227 ක්වූ 2019 වර්ෂයට අදාල ඩොලර් තැන්පත් තුනක පොළී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගෙන තිබුණි.

(ඊ) දේපල,පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 16) 51 වන වගන්තිය ප්‍රකාරව, වත්කම් වල ඵලදායී ජීවිත කාලය අවම වශයෙන් ඒ ඒ ගිණුම් වර්ෂය අවසානයේදී සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තු සමග වෙනස් වේ නම් එම වෙනස ශ්‍රී.ලං. ගි.ප්‍ර 08 ට අනුව ගිණුම්ගත කල යුතුය. කෙසේවෙතත්, තවමත් භාවිතයේ පවතින ස්ථාවර වත්කම් කාණ්ඩ 17 කට අයත් වටිනාකම රු.1,888,920,123 ක් වන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම් ගත කර නොතිබුණි.

(උ) වවිනියාව භූගත ජල අංශයේ පැවති 2012 ජූලි 17 වන දින මිලදී ගත් වායු සම්පීඩක උපකරණය 2018 සැප්තැම්බර් 27 දින ගිනි ගෙන තිබුණි. කෙසේ වෙතත්, දේපල,පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං. ගි.ප්‍ර 16) 7 වන ඡේදයට පටහැනිව 2012 සැප්තැම්බර් 28 දින සිට 2020 ඔක්තෝබර් 31 දක්වා රු..2, 221,615ක් ක්ෂය ප්‍රතිපාදනය කොට තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත කළ වර්ෂයේ ලාභය රු. 888,646 කින් අඩුවෙන් දක්වා තිබූ අතර වර්ෂය ආරම්භයේ සමුච්ඡිත අලාභය රු. 1,332,969 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, මෙම වත්කම සමාලෝචිත වර්ෂය තුළදී බැහැර කිරීම හේතුවෙන් රු.2,221,615 ක ඉවත් කිරීම් අතිරික්ත ලාභයක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන තිබුණි.

(ඌ) සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 19) හි 66 සහ 144 වගන්තීන් අනුව, මණ්ඩලය විසින් ආයුගණක තක්සේරුකරණක්‍රමයක් භාවිතා කර නොතිබූ බවත් සමාලෝචිත වර්ෂයේ පශ්චාත් රැකියා ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම හා අදාල වර්තමාන සේවා පිරිවැය අගය කිරීම සඳහා ආයුගණක උපකල්පන භාවිතා කොට ඒවා හෙළි දරව් කර නොමැති බවත් විගණනයේදී අනාවරණය විය. තවද, ප්‍රමිතියේ 58 වන ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා (පාරිතෝෂික ප්‍රතිපාදන) ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. ඒ වෙනුවට සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වශයෙන් ගෙවනු ලැබූ (ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හැර) රු. 485,960,193 ට සමාන මුදලක් සමාලෝචිත වර්ෂයේ වෙන් කිරීම් ලෙස හඳුනාගෙන තිබුණි.

(එ) රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) විධිවිධානවලට පටහැනිව, වසර 9 සිට 13 දක්වා කාලයක් තුළ නොවෙනස්ව පැවති ව්‍යාපෘති 34 කට අදාළව එකතුව රු.මිලියන 13,704.8 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන් ක්‍රමක්ෂය කිරීමෙන් තොරව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන

තිබුණි. එම විදේශීය ප්‍රදානවලට අදාළ තොරතුරු කිසිවක් නොමැති හෙයින් මූල්‍ය ප්‍රකාශන සඳහා ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී නිශ්චය කර ගත නොහැකි විය.

(ඒ) ගාල්ල කළමණාකරන කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ සිදුකල භාණ්ඩ සමීක්ෂණය තුලදී හඳුනාගත් රු. 3,399,965 ක පීවීසී උපාංග, රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) 03 වන වගන්තිය ප්‍රකාරව මූලාශ්‍රය විධිමත්ව හඳුනා ගැනීමකින් තොරව විදේශ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනා ගෙන තිබුණි.

(ඔ) ආයෝජන දේපල පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) විධිවිධාන වලට පටහැනිව, ධාරණ අගය රු.333,020,680 ක් වූ අයෝජන දේපළ 2020 දෙසැම්බර් 31 දිනට ආයෝජන දේපළ ලෙස දැක්වීම වෙනුවට දේපළ පිරියත හා උපකරණ ලෙස දක්වා තිබුණි.තවද, ප්‍රමිතියේ 75 (ඊ) (i) සහ 79 වගන්තිවලට අනුව, ආයෝජන දේපල වලින් ලැබෙන ආදායම හෙළිදරව් කර නොතිබූ අතර, ක්ෂය කිරීමේ ක්‍රමය, ඵලදායී ජීවිත කාලය හෝ ක්ෂය වීමේ අනුපාතය, දළ ධාරණ වටිනාකම සහ කාල පරිච්ඡේදය ආරම්භක හා අවසාන දිනට සමුච්චිත ක්ෂය සහ අපහායන වටිනාකම ආදිය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි හෙළිදරවිකිරීම් සිදු කර නොතිබුණි.

(ඕ) මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (එස්එල්එෆ්ආර්එස් 09) 5.5 වගන්තියට පටහැනිව, අපේක්ෂිත ණය අලාභය හඳුනා නොගෙන ස්ථාවර අනුපාතයක් මත මලපවහන ණය ගැතියන් සහ අනෙකුත් ණය ගැතියන් සඳහා අපහයන වෙන්කිරීම් සිදු කර තිබුණි.

(ක) කල්බදු පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ (එස්එල්එෆ්ආර්එස් 16) හි 53 වන වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 599.5 ක පොත් අගයක් සහිත කල්බදු ඉඩම් වල කල්බදු වගකීම් සඳහා පොලී වියදම්, කල්බදු සඳහා මුළු මුදල් ගලායාම, සමාලෝචිත වර්ෂය අවසානයේදී යටත් වත්කම් වගී අනුව භාවිත කිරීමේ අයිතිය සහිත වත්කම්වල ධාරණ වටිනාකම යනාදී හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සිදු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ජල සම්පාදන යෝජනා ක්‍රම 16 කට අදාළ එකතු වටිනාකම රු.65,852,393 ක් වූ ස්ථාවර වත්කම් භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින අතර දිගු කාලයක් තිස්සේ ස්ථාවර වත්කම් ලෙස පවතින බව 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී නිරීක්ෂණය

විය. කෙසේ වෙතත්, ඒවා ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.තවද, විගණනය විසින් සිදු කල ගණනය කිරීම් අනුව, වටිනාකම රු.40,605,148 ක් වන ක්ෂය කල හැකි අයිතම 42 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.851,398 ක ක්ෂය ප්‍රතිපාදන සිදු කර තිබූ බව විගණනයට අනාවරණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ සඳහා සත්‍ය ආදායම් බදු වියදම හඳුනාගැනීමට විස්තරාත්මක අදායම් බදු ගණනය කිරීමක් සිදු කිරීමකින් තොරව 2018 වර්ෂය තුළ ගෙවන ලද රු.133,867,477 ක ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි.

(ඇ) 2016 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 0.5 දක්වා අනුපාත සංශෝධනය කර තිබුණද 2016/2017 තක්සේරු වර්ෂය සඳහා වූ ආර්ථික සේවා ගාස්තුව සියයට 0.25 ක් පදනම් කරගෙන ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය දෙපාර්තමේන්තුව විසින් දඩ මුදලක්ද ඇතුළුව රු. මිලියන 128.76 ක තක්සේරු දැන්වීමක් ඉදිරිපත් කර තිබුණි. මණ්ඩලයේ වාර්තා වලට අනුව අනුපාත වෙනස්වීම් හේතුවෙන් රු. මිලියන 66.37 ක මුදලක්(දඩ මුදල් රහිතව) මණ්ඩලය විසින් ගෙවිය යුතු ව ඇත. කෙසේ වෙතත්, ගෙවිය යුතු ඉතිරි බදු සඳහා ගිණුම් පොත්වල කිසිදු ප්‍රතිපාදනක් සිදු කර නොතිබුණි.

(ඈ) අම්පාර, යාපනය, මඩකලපුව,සබරගමුව සහ වව්නියාව ප්‍රාදේශීකයන්හි පිරිවැය මධ්‍යස්ථාන දොළහකට (12) අදාලව එකතු වටිනාකම රු.453,636,398 ක ස්ථාවර වත්කම් සත්‍යාපනය කර ගත නොහැකි වූ අතර භෞතිකව නොතිබුණි. කෙසේ වෙතත්,ඒවා පොත් වලින් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග නොගෙන සමාලෝචිත වර්ෂය තුලදී ක්ෂය වීම් සඳහා රු.17,171,243 ක ප්‍රතිපාදන සිදු කර තිබුණි.

(ඉ) අම්පාර, යාපනය සහ මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයන්හි භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව පිරිවැය මධ්‍යස්ථාන හතකට අදාල එකතු වටිනාකම රු.20,829,745 ක් වන ගොඩනැගිලි ආකෘතීන්, පිරියත සහ උපකරණ,ජංගම උපකරණ,නිදහස් ගොඩනැගිලි සහ තොග ජල මනු හානියට පත්ව, භාවිතයෙන් ඉවත් කර හා කඩා දමා තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ක්ෂය වීම් සඳහා රු.616,308 ක ප්‍රතිපාදන සිදු කර තිබුණි.

(ඊ) මඩකලපුව, අම්පාර, වවුනියාව සහ නැගෙනහිර ප්‍රදේශිකයන්හි භෞතිකව පවතින නිශ්චල ඉඩම්, යටිතල පහසුකම්, නිදහස් ගොඩනැගිලි, ව්‍යුහයන් වැනි ස්ථාවර වත්කම් අයිතම 196 ක් මණ්ඩලයේ ස්ථාවර වත්කම් ලේඛනයන්ට සහ ගිණුම් පොත්වල ඇතුළත් කර නැති බව නිරීක්ෂණය විය. විගණන විසින් සිදුකල ගණනය කිරීම් වලට අනුව ඉහත අයිතම 196 න් වටිනාකම රු.4,385,262,876 ක් වන අයිතම 74 ක් සඳහා රු. 102,843,910 ක ක්ෂය ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය ඊට සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.තවද, වවුනියාව ප්‍රාදේශිකයට අයත් ඉඩම් හයක (06) සහ මන්නාරම ප්‍රාදේශිකයට අයත් ඉඩම් (10) ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛණ වල වත්කම් ලෙස හඳුනාගෙන තිබුණද, ගිණුම් පොත්වල ගිණුම් ගත කොට නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට නව සම්බන්ධතා ණයගැතියන් ද ඇතුළුව වෙළෙඳ ණයගැති ශේෂය රු. 8,213,888,162 ක් විය. කෙසේ වෙතත්, වටිනාකම රු. 7,978,854,614 ක් වන ණයගැතියන් (නව සම්බන්ධතා ණය ගැතියන් ද ඇතුළුව) සඳහා පමණක් අපහනය වෙන්කිරීම් කර තිබුණි. එබැවින් එකතු වටිනාකම රු.235,033,548 ක් වන මෙම ණය ගැතියන් සඳහා ප්‍රතිපාදනය සිදු කර නොතිබුණි.

(ඌ) ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන්ට එකතු කළ අගය මත බදු වශයෙන් මණ්ඩලය ගෙවූ රු.12,430,354 ක් ඒවා මණ්ඩලයේ නිමැවුම් මත වන එකතු කළ අගය මත බදු වලට එරෙහිව දැනටමත් හිමිකම් ලබා තිබූයෙන් ඒවා ලැබිය යුතු එකතු කළ අගය මත බදු ලෙස ගිණුම් ගත නොකර වැරදි ලෙස කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින් ඒ සමාන අගයකින් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ශේෂය වැඩියෙන් දක්වා තිබූ අතර ලැබිය යුතු එකතු කළ අගය මත බදු අඩුවෙන් දක්වා තිබුණි.

(එ) ලැබී ඇති තොරතුරු වලට අනුව, රු.5,246,945,547 ක් වටිනා නිම කර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති හතළිස් හතරක (44) පිරිවැය ප්‍රාග්ධනිත ගත නොකර 2020 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ තුළ පැවතුණි.

(ඒ) නැවත අයකර ගැනීමේ වැඩ සඳහා ලද අත්තිකාරම් අතරින් කළුතර ප්‍රාදේශිකයට,කෑගල්ල සහ බටහිර මධ්‍යම ප්‍රාදේශිකයට අයත් ව්‍යාපෘති 06කට අදාල සහ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයට (මධ්‍යම) අයත් රු.3,997,933 ක් වටිනා නැවත අයකර ගැනීමේ භූගත ජල කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසානයට නිම කර තිබුණි. කෙසේවෙතත්, 2021 අප්‍රේල් 30 වන විටත් එය අදාල ආදායම් ගිණුමට ගෙන නොතිබුණි.

(ඔ) 2017, 2018 සහ 2019 වර්ෂවලට අදාළව 2019 සහ 2020 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනයන්හි මණ්ඩලය විසින් පෙර වර්ෂයේ ගැලපුම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසර අවසානයට වූ සමුච්චිත අලාභය රු. මිලියන 192.12 කින් විකෘති වී තිබුණි. එබැවින්, ඉදිරි වර්ෂය තුළදී සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කර නොහැක.

(ඕ) ව්‍යාපෘති හතක් (07) සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන මුළු ශේෂය රු.198,729,791 ක් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා විමර්ශනය නොකර වසර එකොළහකට වඩා වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි.

(ක) සුභසාධන අරමුදලේ රු.8,803,047 ක් මූලික ගාස්තු අයකර ගැනීමේ ආදායම් ප්‍රභවයට එරෙහිව කිසිදු හේතුවක් නොමැතිව ගලපා ඇති බව නිරීක්ෂණය වූ අතර එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) 200934 අංකය දරන ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය රු. 54, 980,079 ක් වූ බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු.53,06,335 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් ජංගම වත්කම් සහ පොලී ආදායම රු. 1,914,744 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ච) වෙනත් ණයගැතියෝ, අත්තිකාරම්, වෙළඳ ණයහිමියෝ, ඉල්ලුම් නොකළ වේතන යනාදිය ඇතුලත් දීර්ඝ කාලීනව පැවත එන පිළිවෙලින් රු.149,681,812 ක් හා රු.71,927,749 ක වත්කම් හා වගකීම් ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ක්‍රියාකාරී නොවන වත්කම් හා ක්‍රියාකාරී නොවන වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද, රු.95,796,513 ක හඳුනා නොගත් පූර්ව වර්ෂ ශේෂයක්ද, රු.22,007,307 ක ප්‍රාදේශික හතරක තොග ශේෂයද, රු.5,906,882 ක බැංකු ශේෂයක් ද විමර්ශනය කොට නිරවුල් කිරීමට පියවර ගැනීමකින් තොරව ඉහත සඳහන් ශේෂය තුල ක්‍රියාකාරී නොවන වත්කම් ලෙස පැවතුණි.

(ජ) මීට වසර පහකට පෙර කැලණිය ප්‍රාදේශිකයේ රු.2,549,788 ක සොරකම් කරන ලද තොග ශේෂය සහ බටහිර මධ්‍යම සහය සේවා මධ්‍යස්ථානයේ (කොහුවල) රු. 1,211,323 ක තොග ඌනතාවය 2020 දෙසැම්බර් 31 දිනටද තොගයට ඇතුළත් කර තිබුණි. කෙසේවෙතත්, එම අලාභයන් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ට) උතුරු මහනුවර ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය යටතේ ඇති මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට සුදුසුකම් ලත් ගබඩා භාරකරුවෙකු අනුයුක්ත කිරීමට අසමත් වීම හේතුවෙන්, තොග ලැබීම් සහ නිකුත් කිරීම් නිසියාකාරව සටහන් වී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට 41,739,680 ක තොග ඌනතාවයක් වාර්තා වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය ආරම්භයේදී සමුච්ඡිත අලාභය රු. 26,604,682 කින් අවප්‍රමාණය වී තිබූ අතර වර්ෂයේ ලාභය රු.15,134,998 කින් වැඩියෙන් දක්වා තිබූ අතර අවසන් තොගය රු. 41,739,680 කින් වැඩියෙන් දක්වා තිබුණි. කෙසේ වෙතත්, 2021 අප්‍රේල් 01 දින වන විටත් තොග ඌනතාවයට හේතු හඳුනාගෙන ඒවා ගිණුම් පොත් වලින් ඉවත් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඩ) 2020 ජූලි 02 දින ගත් කැබිනට් මණ්ඩල තීරණය ප්‍රකාරව, ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගත් රු.බිලියන 30 ණය මුදල සඳහා පොලී පිරිවැය මහා භාණ්ඩාගාරය විසින් දරා ගනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුලදී එම ණය සඳහා රු.699,702,314ක් මණ්ඩලය විසින් පොලිය වශයෙන් දරා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන වල රු.659,277,279 ක් පමණක් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් වශයෙන් හඳුනාගෙන තිබුණි.

(ණ) විදේශ මූල්‍යන ව්‍යාපෘති දෙකක (02) හිඟ ණය ශේෂය සම්බන්ධයෙන් බැංකුවලින් ලද තහවුරු කිරීම මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් සමඟ සැසඳීමේදී, මුල්‍ය ප්‍රකාශනවල හිඟ ණය ශේෂය රු. 1,723,847,989 කින් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

(ත) දේශීය මූල්‍යන ව්‍යාපෘති නවයක (09) හිඟ ණය ශේෂය මත වන උපචිත පොළිය සම්බන්ධයෙන් බැංකුවලින් ලද තහවුරු කිරීම සමඟ සැසඳීමේදී, සමාලෝචිත වර්ෂය අවසානයට රු. 10,254,724 ක ඌන ප්‍රතිපාදනයක් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය.

(ද) කෝට්ටේ ප්‍රාදේශිකය(බත්තරමුල්ල) හා සම්බන්ධව 2019 දෙසැම්බර් මාසය සඳහා වූ රු. 59,129,751ක ජල මනු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස වැරදි ලෙස සලකා තිබූ හෙයින් සමාලෝචිත වර්ෂයේ ලාභය ඒ සමාන අගයකින් වැඩියෙන් දක්වා තිබුණි.

(න) මාතර අදියර (iv) ව්‍යාපෘතියේ පාරිසරික තක්සේරු ගාස්තුව වශයෙන් 2016 දී ගෙවූ රු. 2,074,821 ක මුදලක් සහ නිල්වලා ගඟ හරහා ලවණ බාධකය ඉදිකිරීම සඳහා වූ උපදේශක ගාස්තුව වශයෙන් 2016 සහ 2017 කාල පරිච්ඡේදය තුළ ගෙවන ලද රු. 9,590,000 ක් අදාළ ව්‍යාපෘතිවල කෙරී ගෙන යන වැඩ ලෙස හෝ පුනරාවර්තන වියදම් ලෙස සමුච්ඡිත අලාභයට ගැලපීම වෙනුවට විලම්භිත වගකීම් වලින් අඩුකොට ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

(ප) නව සම්බන්ධතාවලට අදාළ රු. 81,502,527 ක ආපසු ගෙවිය හැකි හා ආපසු නොගෙවිය හැකි තැන්පතු වල ශේෂය කිසිදු මණ්ඩල අනුමැතියකින් තොරව වර්ෂයේ ආදායමට මාරු කර තිබුණි. තවද වසරක් තුළ වන ආපසු ගෙවිය හැකි හා ආපසු නොගෙවිය හැකි තැන්පතුවලට අයත් රු. 42,600,938 ට සමාන මුදලක් ද ඊට ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය.

(බ) භාණ්ඩ සමීක්ෂණයේදී භෞතිකව සත්‍යාපනය කර නොතිබූ රු.16,731,847 ක් වූ අනෙකුත් තොග අයිතමයන් මුල්‍ය ප්‍රකාශන වල තොගය ලෙස හඳුනාගෙන තිබුණි.

(ම) මොනරාගල ප්‍රාදේශිකයේ සහ ප්‍රධාන කාර්යාලයේ සැපයුම් මත එකතු කල අගය මත බදු ලෙස පිළිවෙලින් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ අය කරගෙන තිබූ රු.2,327,771 ක් සහ රු. 99,121ක් ගෙවිය යුතු එකතු කල අගය මත බදු ලෙස දැක්වීම වෙනුවට වැරදි ලෙස ආදායම ලෙස ගිණුම් ගත කොට තිබුණි. එබැවින් ඒ හා සමාන ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් දක්වා තිබූ අතර වර්ෂය ආරම්භයේ සමුච්ඡිත අලාභය අඩුවෙන් දක්වා තිබුණි.

1.2.3 නොසැසඳූ ශේෂ

(අ) මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් හා මණ්ඩලයේ වාණිජ අංශය විසින් ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණ උපලේඛනයේ සඳහන් ශේෂයන් අතර වෙළඳ ණයගැතියන්ගේ රු. 131,472,986 ක සහ නව සම්බන්ධතා ණයගැතියන්ගේ රු.103,560,564 ක වෙනස්කම් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ප්‍රාදේශිකයන් 13 කට අදාලව රු.3,149,283,146 ක වෙළඳ ණයගැතියන් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට සැසඳුම් කර තිබුණි. එම සැසඳුම් අතරින් එකතුව රු.96,700,258 ක් හා රු.39,773,142 ක් වන ආරම්භක ශේෂ වෙනස්කම් හා හඳුනා නොගත් වෙනස්කම් විධිමත්ව විමර්ශනය කර නිරවුල් කර නොතිබුණි.

(ආ) මනුගත විකුණුම් සහ තොග විකුණුම් වටිනාකමෙහි වාණිජ අංශ වාර්තා සහ මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ වටිනාකම් අතර රු. මිලියන 530.38 ක සැසඳුම් නොකළ වෙනසක් නිරීක්ෂණය විය. තවද, නව සම්බන්ධතා ආදායම් වටිනාකමෙහි මූල්‍ය ප්‍රකාශ අනුව සහ වාර්ෂික එකතු කල අගය මත බදු වාර්තාවන්හි ප්‍රකාශයට පත් කල ආදායම් අතර රු. මිලියන 383.42 ක සැසඳුම් නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අදාළ ඒ ඒ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සමඟ සන්සන්දනය කිරීමේදී මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ, දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ හා වියළි

කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් ව්‍යාපෘතියේ විදේශ ප්‍රදානයන්හි එකතු වටිනාකම රු.මිලියන 19,342.19 ක වෙනසක් නිරීක්ෂණය විය. ඉහත වෙනස අතරින් මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ රු.මිලියන 10,756.71 ක වෙනස සඳහා පමණක් සැසඳුම් පිළියෙල කොට තිබූ අතර එම ව්‍යාපෘතියට අදාලව රු.මිලියන 97.08 ක ගනුදෙනුවක් මණ්ඩලයේ ගිණුම් පොත් තුළ වාර්තා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) සිදු කරන ලද නියැදි පරීක්ෂණයට අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ මූල්‍යන ව්‍යාපෘති පහක (05) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අනුරූප ශේෂයන් අතර එකතු වටිනාකම රු. මිලියන 2,346.26ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, සකස් කරන ලද සැසඳුම් විශ්ලේෂණය කිරීමේදී තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය සහ මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘතිය iii) සම්බන්ධව රු. මිලියන 1,274.81 ක වටිනාකමකින් යුත් ගනුදෙනු මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) බැංකු ගිණුම් දොළහක් (12) සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශවල 2008 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා, දක්වා තිබූ පිළිවෙලින් රු.7,250,860 ක සහ රු.33,929,517 ක හඳුනානොගත් හර ශේෂයන් සහ බැර ශේෂයන් නිරවුල් කර නොතිබුණි.

(ඊ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2015 ජූලි 08 දිනැති ඔහුගේ පීඊ/ඩබ්එස්/එන්ඩබ්එස්ඩීබී/ජීඊඑන්/2015 ලිපිය මඟින් ලබා දුන් උපදෙස් මත සහ 2016 පෙබරවාරි 04 දින ගත් කැබිනට් තීරණය ප්‍රකාරව, හිඟ ණය ශේෂය රු. 88,531,428,611 ක් 2015 වසරේ සිට බලපැවැත්වෙන පරිදි රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබුණි. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ වාර්තා වලට අනුව රු.62,415,763,525 ට සමාන මුදලක් මණ්ඩලයට දුන් ප්‍රාග්ධන දායකත්වය ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින් විදේශීය ණය වශයෙන් මණ්ඩලය විසින් ගෙවිය යුතු රු. 26,115,665,086 ට සමාන මුදලක් කිසිදු අනුමැතියකින් තොරව රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබූ බව නිරීක්ෂණය විය.

1.2.3 විගණනයට සාක්ෂි නොවීම්

පහත දක්වා ඇති එක් එක් අයිතමයන් සඳහා වන සාක්ෂීන් විගණනය වෙත ඉදිරිපත් නොවීය.

	අයිතමය	වටිනාකම රු.	නොසැපයූ විගණන සාක්ෂි
	---	---	---
(අ)	නව සම්බන්ධතා ණයගැතියන්	177,496,727	විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණ
(ආ)	වෙනත් ණයගැතියන්	51,690,693	විස්තරාත්මක උපලේඛන
(ඇ)	චලනය නොවන හා සෙමින් චලනය වන තොග	1,139,127,273	වයස් විශ්ලේෂණය
(ඈ)	වෙළඳ ණය හිමියන්	34,727,558	විස්තරාත්මක උපලේඛන
(ඉ)	බදු වියදම	133,867,482	වර්ෂය සඳහා විස්තරාත්මක ආදායම් බදු ගණනය කිරීම්
(ඊ)	වෙනත් ආයතනවල තබා ඇති කෙටිකාලීන තැන්පත්	12,779,730	විස්තරාත්මක උපලේඛන
(උ)	නිවාස ණය සඳහා එච්ඩීඑෆ්සී ආයෝජන	441,068	බැංකු සනාථ කිරීම්
(ඌ)	දේශීය බැංකු ණය	20,713,132	බැංකු සනාථ කිරීම්
(එ)	කොන්ත්‍රාත් රඳවා ගැනීම්	67,376,711	විස්තරාත්මක උපලේඛන
(ඒ)	කොන්ත්‍රාත් අත්තිකාරම්	104,564,741	විස්තරාත්මක උපලේඛන
(ඔ)	පුනුරුත්ථාපන බදු	1,757,515	විස්තරාත්මක බදු ගණනය, උපලේඛන
(ඕ)	රජයේ දෙපාර්තමේන්තු වලින් පවරා ගත් වත්කම්	185,480,387	පවරා ගත් විස්තරාත්මක වත්කම් වාර්තාව

(ක)	උපචිත වියදම්	110,578,062	විස්තරාත්මක උපචිත වියදම් උපලේඛන
(ග)	කොන්ත්‍රාත් අත්තිකාරම් (විශේෂ ව්‍යාපෘති)	11,474,470	විස්තරාත්මක උපලේඛන

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.2.1(I), 1.2.1(IV), 1.2.1(VI), 1.2.1(VIII), 1.2.1(IX), 1.2.1(X), 1.2.2(I), 1.2.2(II), 1.2.2(VII), 1.2.2(IX), 1.2.2(XI), 1.2.2(XII), 1.2.2(XV) , 1.2.3(I), 1.2.3(II), 1.2.3(III), 1.2.3(IV), 1.2.3(V), 1.2.3(VI) and 1.2.4 වගන්තීන් හැර ඉකුත් වර්ෂයේ අවසන් වාර්තාවේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත අවස්ථාවලදී හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති/මගපෙන්වීම් ආදියට යොමුව	විස්තරය
(අ)	**සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ**	
(i)	2015 අගෝස්තු 12 දිනැති පාලන/ 12/2015	විසන්ධි කිරීමෙන් මාස 3 ක් ඇතුලත හිඟ හිටි ණය ගැනි ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගත යුතු වේ. කෙසේවෙතත්, එකතු වටිනාකම රු.617,878,548ක් වන රු.50,000 වඩා වැඩි බිල්පත් වටිනාකමක් සහිත විසන්ධි කරන ලද පාරිභෝගිකයින් 2173 ක් සම්බන්ධයෙන් හිඟ ණයගැනි ශේෂය අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.
(ii)	2018 සැප්තැම්බර් 26 දිනැති පාලන/ 09/2018 හි 2 වැනි ඡේදය	වෙළඳපල කුලියට සමාන මාසික කුලියක් සහ වැටුපෙන් සියයට 12.5 ක අධිභාරයක් වසර 5 කට වඩා වැඩි කාලයක් නිල නිවාසයන්හි පදිංචි සේවකයින්ගෙන් අය කල යුතු වේ. කෙසේවෙතත්, ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (උෟව) සේවකයින් දෙදෙනෙකුගෙන් 2019 අගෝස්තු සිට 2020 සැප්තැම්බර් දක්වා රු.230,010 ක ද ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (මධ්‍යම) සේවකයින් 19 ගෙන් 2019 සිට 2021 මාර්තු දක්වා රු.4,688,010ක දඩකුලිය (අධිභාර ඇතුලත් කුලිය), ඔවුන් වසර 5 කට වඩා වැඩි කාලයක් නිවාසයන්හි පදිංචිවී සිටියද, 2021 අප්‍රේල් 30 වන විටත් අය කර නොතිබුණි.
(ආ)	2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය	මණ්ඩලයේ බදවා ගැනීම් හා උසස්කිරීම් පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඇ)	2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	

	(i) 1.2 ඡේදය	සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට මැයි දක්වා කාලය තුළ සභාපතිවරයා සඳහා වාහන දෙකක් වෙන් කර තිබුණි.
	(ii) 1.4 ඡේදය	2020 ජූනි සිට 2021 ජනවාරි දක්වා උප සභාපතිවරයා සඳහා වාහන දෙකක් වෙන් කර තිබුණි.
	(iii) 1.5 ඡේදය	භාණ්ඩාගාර ලේකම්ගේ නිර්දේශය ලබා නොගෙන 2020 ජූලි 22 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත පදනම්ව, සභාපතිවරයා සහ උප සභාපතිවරයා සඳහා හිමි ලීටර 150 ක මාසික ඉන්ධන සීමාවට අමතරව 2020 ජනවාරි සිට රු. 60,000 ක මාසික ඉන්ධන අග්‍රිමයක් අනුමත කර තිබුණි.
(ඇ)	2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1.4 ඡේදය	2019 ජනවාරි සිට 2020 ජූලි දක්වා කාලය තුළ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (ඌව) සහකාර සාමාන්‍යාධිකාරීවරයාගේ ඉන්ධන වියදම වශයෙන් රු. 280,281 ක් වැය කර තිබුණි.
(ඉ)	ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ 2 වන උපලේඛනයේ 3.1,18.15(ඇ) කොටස සහ එස්ක්‍රෝ ගිවිසුමේ 11.1 වගන්තිය	නිදහස් කරන ලද ණය මුදලින්, ඇමරිකානු ඩොලර් 140,641,551 ක මුදලක් 2019 සහ 2020 වර්ෂවල අනුමැතියකින් තොරව එක්සත් ජනපද ඩොලර් තැන්පතු ගිණුම් නවයක (09) ආයෝජනය කර තිබුණි.
(ඊ)	2017 පෙබරවාරි 15 දිනැති අංක 1/2017 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය	විදේශීය අරමුදල් මගින් මූල්‍යයනය වන සංවර්ධන ව්‍යාපෘති සඳහා එක් අභ්‍යන්තර විගණකවරයකු පමණක් පත් කර තිබුණි.
(උ)	2003 ජූනි 02 දිනැති පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය	2020 දෙසැම්බර් 31 වන විට රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් දහහත් (17) දෙනෙකුගේ වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන

		18.94 ක් සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2020 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද සේවකයින් සඳහා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් රු. මිලියන 187.39 ක් ප්‍රතිපූරණය කළ යුතුය.
(ඌ)	මූදල් රෙගුලාසිහි 156(8) ඡේදය සහ මණ්ඩලීය කාර්ය සංග්‍රහයේ 1.12 වගන්තිය	බණ්ඩාරවෙල කළමනාකරු කාර්යාලයේ සේවා කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයින් යෙදවීමෙන් මනු කියවන්නෙකු විසින් රු. 706,205 ක අයුතු ලාභයක් උපයාගෙන තිබුණි.
(එ)	2002 අංක 14 දරන සංශෝධිත එකතු කල අගය මත බදු පනත	
	(i) 22 (6) (iv) ඡේදය	වටිනාකම රු. 2,224,236 ක් වන වසරකට වැඩි යෙදවුම් වැට් බදු ඉන්වොයිසි 48ක් 2019 වර්ෂයේ දෙවන, තුන්වන සහ හතරවන කාර්තුවන්හි නිමැවුම් වැට් බදුවලින් හිමිකම් ලබා ගෙන තිබුණි.
	(ii) 26(i) ඡේදය	2019 සිව්වන කාර්තුව සඳහා ගෙවිය යුතු වැට් බදු රු. 38,802,349 ක් මාස හයක ප්‍රමාදයකින් ගෙවා තිබූ අතර 2020 වසරේ මුල් කාර්තු තුන සඳහා එකතු කල අගය මත බදු වාර්තා මාස 1 1/2 සිට මාස තුන දක්වා ප්‍රමාදයකින් යුතුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.
(ඒ)	2019 ජූලි 09 දිනැති අංක සීජීඅයිආර්/2019/3වී(අයිඑන්එස් ඇන්ඩ් සීඅයිආර්) දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3 ඡේදය	සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, වැට් බදු අක්‍රීය සැපයුම්කරුවන්ට සමාලෝචිත වර්ෂය තුළදී රු. 501,513ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි.

(ඔ) 2002 අංක 14 දරණ එකතු කළ බදු පනතේ 2 ඒ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද 2019 නොවැම්බර් 29 දිනැති අංක 2151/52 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශය

දෙහිවල, අනුරාධපුර සහ පොළොන්නරුව ප්‍රාදේශිකයේ සහ ප්‍රධාන කාර්යාලයේ විශේෂ ව්‍යාපෘති ඒකකයේ ජනවාරි මාසයේදී භූගත ජල ආදායම, නව සම්බන්ධතා ආදායම, මලාපවහන ආදායම, මනුගත විකුණුම්, බවුසර් සැපයුම සඳහා සියයට 8 ක් වෙනුවට සියයට 15 ක් අය කර තිබුණි. ඒ හැරුණු විට 2020 මාස හයක් තුළදී ප්‍රධාන කාර්යාලයේ යලි අයකර ගත හැකි ආදායම මත සියයට 8 ක් වෙනුවට සියයට 15 ක් අය කර තිබුණි. එබැවින් අතිරේක එකතු කළ අගය මත බදු වශයෙන් රු. 7,096,144 ක මුදලක් අය කර ප්‍රකාශයට පත් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුව පහත අවස්ථාවලදී හැර මණ්ඩලය විසින් එහි බලතල, කාර්යයන් හා රාජකාරී වලට අනුව කටයුතු කර නොතිබූ බව සඳහන් කිරීමට

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුව පහත අවස්ථාවලදී හැර මණ්ඩලයේ සම්පත් අදාළ කාල රාමුව ඇතුළත හා අදාළ වන නීතිවලට අනුකූලව අර්ථිකමය වශයෙන්, කාර්යක්ෂම හා සඵලදායී ලෙස ප්‍රසම්පාදනය හා උපයෝජනය කර නොතිබූ බව සඳහන් කිරීමට

(අ) යාපනය කිලිනොච්චිය ප්‍රදේශය සඳහා ජල සැපයුම සැපයීම සඳහා මුහුදු ජලයෙන් ලුණු ඉවත් කිරීමේ බලාගාරය ඉදිකිරීම 2023 දී අවසන් කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව රු. මිලියන 1,140 ක වියදමින් ජල කුළුණු 15 ක් ඉදිකිරීම සහ රු. මිලියන 5,536 ක වියදමින් පිරිපහදු ජල සම්ප්‍රේෂණ නල එළීම 2018 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ජල මූලාශ්‍රයක් නොතිබීම හේතුවෙන් මෙම ඉදිකිරීම් සියල්ල නිෂ්ක්‍රීයව පැවතුනි.

(ආ) කුණ්ඩසාලේ හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව මුලින් 2016 දී ප්‍රදානය කර තිබූ අතර එය අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අකාර්යක්ෂම වීම හේතුවෙන් 2019 ජුනි මාසයේදී නව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට තවත් වසර තුනක් ගත වී තිබුණි. කෙසේ වෙතත්, අකාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ අවිධිමත් සැලසුම්කරණය මත

හා මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරභාවය පිළිබඳ නිසි තක්සේරුවක් නොමැතිව මණ්ඩලය විසින් ව්‍යාපෘති ආරම්භ කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු. මිලියන 75.12 වැය කිරීමෙන් පසුව ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි.

(ඇ) 2011 පෙබරවාරි 21 දින මූල්‍ය යෝජනාව ඉදිරිපත් කළ දින සිට වසර අටකට පසු 2019 ජනවාරි 22 දින වාලව්වේනි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා වූ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්කරුවන්ට පිරිනමා තිබුණි. එබැවින් ණය නියෝජිත ආයතනය විසින් ලබා දුන් අරමුදල් වසර 2 මාස 6 ක කාලයක් භාවිතා කර නොතිබුණි. අනතුරුව මූල්‍ය ගිවිසුම අවලංගු කරනු ලැබූ අතර ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි.

(ඈ) අවිස්සාවේල්ල සහ කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ විචලනයන් විමර්ශනය සඳහා පත්කල කමිටුව විසින් කොන්ත්‍රාත් ගිවිසුමේ 3.7 වගන්තිය සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තිය සඳහා වන හා ව්‍යතිරේක 14 අනුව කටයුතු කිරීම වෙනුවට කොන්ත්‍රාත් ගෙවීම් අත්හිටුවීම හේතුවෙන් ආරවුල් විනිශ්චය මණ්ඩල (ඩීඒබී) තීරණය මත, පිළිවෙලින් ප්‍රමාද ගාස්තු වශයෙන් කොන්ත්ත්‍රාකරුට රු.මිලියන 44.93 ක් සහ ආරවුල් විනිශ්චය මණ්ඩල සහ බේරුම්කරණ සාමාජිකයින්ගේ වෘත්තීය ගාස්තු වශයෙන් රු.මිලියන 1.57 ක් ගෙවීමට මණ්ඩලයට සිදු විය.

(ඉ) එකතු වටිනාකම රු.7.602,006 ක් වන පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ පවතින ජල මනු අමතර කොටස් තුන් දහස් දෙසිය අසූහතරක් (3284) වසර 3 සිට 7 දක්වා කාල පරාසයකට වඩා වැඩි කාලයක් අපේක්ෂිත අරමුණ සඳහා නොයොදා සමාලෝචිත වර්ෂය අවසානය වන විට රත්මලාන ගබඩාවේ පැවතුණි.

(ඊ) වෙනස් විෂ්කම්භයන් හතකට අයත් රු.43,293,308 ක් වටිනා ජල මනු තුන්දහස් පන්සිය හැට අටක් (3568) වසර 3 සිට 7 දක්වා කාල පරාසයකට වඩා වැඩි කාලයක් අපේක්ෂිත අරමුණ සඳහා නොයොදා සමාලෝචිත වර්ෂය අවසානය වන විට ප්‍රධාන ගබඩාවේ පැවතුණි.තවද, ඇතැම් ජල මනුවන්හි වගකීම් කාලය මේ වන විටත් ඉකුත් වී ඇති බව නිරීක්ෂණය විය.

(උ) 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වසර 4 කට ආසන්න කාලයක් ගත වී ඇතත් ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු සහ මණ්ඩලය අතර ඇති කර ගත් උප කොන්ත්‍රාත් ගිවිසුම යටතේ නිවටඹුව සහ ගම්පහ ප්‍රදේශයේ නල එළීම් සහ ජල කුළුණු ඉදිකිරීමේ කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් අවසන් කොට තිබූ පස්යාලේ ජල කුළුණු ඉදිකිරීම් සහ එළීම් වැඩ කොන්ත්‍රාත්තුව 2021 පෙබරවාරි අවසානය වන

විටත් ප්‍රදානය කර නොතිබුණි. ඊට අමතරව, දැනටමත් ප්‍රදානය කොට ඇති ඉතිරි නල එළීම් කොන්ත්‍රාත්තුවන් 2020 අගෝස්තු 20 දින වන අවසන් කිරීමට නියමිතව තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(උ) කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය, ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු, කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාදය, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය, භූගතව ඇති අනපේක්ෂිත උපයෝගිතා හේතුවෙන් මාර්ග වෙනස් කිරීම ආදිය හේතුවෙන් විදේශ මූල්‍යන ව්‍යාපෘති දොළහකට සහ දේශීය මූල්‍යන ව්‍යාපෘති තුනකට අදාලව දින 82 සිට දින 1460 දක්වා කාල පරාසයක සැලකිය යුතු ප්‍රමාදයක් පවතින බව ද නිරීක්ෂණය විය.

(එ) FIDIC (ඉදිකිරීම් කොන්ත්‍රාත් කොන්දේසි) මාර්ගෝපදේශ සංග්‍රහයේ 14.6 වගන්තියට පටහැනිව, මාතර අදියර (iv) ජල සම්පාදන ව්‍යාපෘතියේ අංක .07 සහ 08 දරන අතුරු ගෙවීම් සහතික වල මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 2.5 ට වඩා අඩු බිල්පත් සඳහා ගෙවීම් කර තිබුණි.

(ඒ) එක් විදේශ මූල්‍යන ව්‍යාපෘතියක් සහ දේශීය මූල්‍යන ව්‍යාපෘති තුනකට අදාලව සම්බන්ධව මණ්ඩලය විසින් වාරික ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් රු. 7,653,137 ට සමාන මුදලක් දඩ පොළී ලෙස ගෙවීමට සිදුව තිබුණි.

(ඔ) කොන්ත්‍රාත්කරුගේ අධි ඇස්තමේන්තුගත ප්‍රමාණ බිල්පත් හේතුවෙන් බදුල්ල හාලිඇල්ල ජල සම්පාදන ව්‍යාපෘතියේ නිල නිවාස 7 ක් ඉදි කිරීම සඳහා 2016 වසර තුළදී පවා පැවති වෙළඳපල අනුපාත හා සැසඳීමේදී රු. මිලියන 39.92 ක අතිරේක ගෙවීමක් කොන්ත්‍රාත්කරුට සිදු කොට තිබුණි.

(ඕ) ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ව්‍යාපෘතිය සඳහා ලැබුණු අරමුදල්, ණය සඳහා ගෙවිය යුතු පොලියට වඩා සියයට 0.6 කින් අඩු ප්‍රතිලාභයක් ලබා දුන් එක්සත් ජනපද ඩොලර් තැන්පතු වල ආයෝජනය කිරීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 18 සිට 2020 ඔක්තෝබර් 30 දක්වා කාලය තුළ එක්සත් ජනපද ඩොලර් 502,779 කට සමාන රු.මිලියන 93 අලාභයක් මණ්ඩලයට දැරීමට සිදුව තිබුණි.

3. වෙනත් විගණන ගැටළු

(අ) එකතුව රු. මිලියන 1,447 ක් වූ වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, මලාපවහන ණයගැතියන් සහ වෙනත් ණයගැතියන් ආපසු අයකර නොගෙන වසර දෙකකට වැඩි කාලයක්

පැවතුණි. ඉහත ණයගැතියන් අතරින් සියයට 54 ක් කොළඹ, කැලණිය, කෝට්ටේ , දෙහිවල, කොළඹ දකුණ සහ කොළඹ උතුර ප්‍රාදේශිකයන් නියෝජනය කරනු ලැබේ.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ඇමති නිවාස සඳහා ලබා දුන් ජල සම්බන්ධතා 22 කට අදාළව රු. 7,357,065 ක මුදලක් අය කර ගැනීමට නොහැකිව පැවතුණි. ඒ අතුරින් රු. 2,823,630 ක මුදලක් වසර දෙකකට වැඩි කාලයක් අයකර නොගෙන පැවතුණි. තවද, රු.100,000 ට වැඩි බිල්පත් වටිනාකමක් ඇති රජයේ ආයතන සඳහා ලබා දී තිබූ සම්බන්ධතා 37 න් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. 28,316,137 ක් හිඟව පැවතුණි.

(ඇ) 2020 දෙසැම්බර් 31 වන විට විසන්ධි කල හිඟ ණයගැති ශේෂය රු.1,276,725,598 ක් විය. එම ණයගැතියන්ගෙන් රු.1,088,634,725 ක් හෙවත් සියයට 85 කට සමාන ප්‍රමාණයක් අයකර ගැනීමෙන් තොරව වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි.

(ඈ) හිටපු සේවකයින් සඳහා ලබා දුන් රු. 18,030,810 ක ණය සහ අත්තිකාරම් වශයෙන් වසර තුනකට වැඩි කාලයක් ගිණුම් වල පැවතුනි. කෙසේ වෙතත් ඒවා අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) ප්‍රාදේශික 18 ක වෙළඳ ණයහිමි සහ වෙනත් ණයහිමියන්ගේ පිළිවෙලින් රු. 141,422,678 ක සහ රු. 65,002,525 ක නොපියවූ ශේෂයක් 2020 දෙසැම්බර් 31 දිනට වසර තුනකට (03) වැඩි කාලයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) මධ්‍යම ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානයේ අවසන් කරන ලද ව්‍යාපෘති සඳහා 2003 සිට 2008 දක්වා කාලය තුළ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් එකතු වටිනාකම රු. 9,278,335ක් වන අත්තිකාරම් මුදල් සහ පුනුරුත්ථාපන ව්‍යාපෘති සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ලබා දුන් රු. 4,049,022 ක අත්තිකාරම් අය කර ගැනීමට 2021 අප්‍රේල් 30 වන විටත් නීතිමය පියවර ගෙන නොතිබුණි. තවද,2014 ජූලි 08 දින ප්‍රධාන කාර්යාලයෙන් කොන්ත්‍රාත්කරුට ලබා දුන් රු. 1,148,885 ක අත්තිකාරම් 2021 අප්‍රේල් 30 දින වන විටත් අයකරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(උ) මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය , රත්නපුර ප්‍රාදේශීය සභාව සහ බේරුවල මහ නගර සභාව ඇතුළු බාහිර ආයතනවල තබා ඇති රු.43,538,237 ක කෙටිකාලීන තැන්පතු ආපසු අයකර නොගෙන වසර තුනකට වඩා වැඩි කාලයක් හිඟව පැවතුනි.තවද, රේඛීය අමාත්‍යාංශයේ තබා තිබූ රු.4,378,828 ක අත්තිකාරම් අයකර නොගෙන වසර අටකට වඩා වැඩි කාලයක් හිඟව පැවතුන අතර විස්තරාත්මක තොරතුරු නොමැති වීම හේතුවෙන් එය විගණනයේදී සත්‍යාක්ෂණය කර ගත නොහැකි විය.

(ඌ) කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා තබා ගැනීම් සහ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු පිළිවෙලින් රු.මිලියන 1,144.86 ක් සහ රු.මිලියන 2.61 ක් අදාල පාර්ශවයන්ට නිදහස් කිරීමකින් හෝ ආදායම් ලෙස සැලකීමකින් තොරව වසර තුනකට වඩා වැඩි කාලයක් පැවතුනි. තවද, එම රඳවා තබා ගැනීම් හා තැන්පතු සම්බන්ධ කොන්ත්‍රාත්තු අවසන් වී ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා විගණනයට කිසිදු සාක්ෂියක් ලබා දී නොමැත.

(එ) මොනරාගල ප්‍රාදේශිකයට අදාළව ගෙවිය යුතු වැට් බදු හිඟ ශේෂය රු. 1,854,980 ක් වසර තුනකට වැඩි කාලයක් තිස්සේ විමර්ශනය කොට නිරවුල් කර නොතිබුණි.

(ඒ) ගාලු ප්‍රදේශයේ අපජල අපහරණ කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා මණ්ඩලය විසින් ඉඩමක් මිලදී ගෙන තිබූ අතර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම රු. මිලියන 71.5 කට තක්සේරු තිබුණි. ඉඩමේ වටිනාකමින් සියයට 30 කට සමාන රු.මිලියන 21.25 ක් අත්තිකාරමක් ලෙස මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරීගේ නිර්දේශය මත 2014 අප්‍රේල් මාසයේ දී ඉඩම් හිමියාට ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ඉඩමේ හිමිකාරිත්වය පිළිබඳ අනතුරුව මතුවූ මතභේද හේතුවෙන් ගෙවූ අත්තිකාරම ආපසු අය කර ගැනීම සඳහා උසාවියේ නඩුවක් ගොනු කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට පවුල් කිහිපයක් විසින් ඉඩම අත්පත් කර ගෙන තිබුණි. ගෙවූ අත්තිකාරම සහ ඒ මත වන දඩ මුදල ඉඩම් හිමියාගෙන් හෝ මණ්ඩලයේ වගකිවයුතු නිලධාරීන්ගෙන් 2021 අප්‍රේල් 30 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඔ) ගබඩාවක් සහ සේවක නිල නිවාස ඉදිකිරීම සඳහා මණ්ඩලය විසින් 1981 දී කළුතර ඉඩමක් අත්පත් කර ගත් අතර අයිතිකරුවන්ට වන්දි ගෙවීම සඳහා 1991 දී රු. 531,000 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එම ඉඩමෙහි පවුල් කිහිපයක් නීති විරෝධී ලෙස දැනටමත් පදිංචි වී ඇත. කෙසේ වෙතත්, ඉඩම අත්පත් කර ගැනීමෙන් වසර 39 ක ප්‍රමාදයකින් පසුව 2020 ජූලි 21 දින අයිතිය නිරවුල් කර ගැනීමට නීතිමය පියවර ගෙන තිබුණි.

(ඕ) 1999 සිට 2006 දක්වා වර්ෂයන් තුළ ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර ප්‍රාදේශිකවල සිදු කරන ලද රු.මිලියන 246.64 ක මුදල් වංචාවන් 2021 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, ත්‍රිකුණාමලය ප්‍රාදේශිකය හා සම්බන්ධව රු. මිලියන 171.9 ක මුදල් වංචාව අතරින් රු.මිලියන 24.15 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට ණය ගැතියන් ලෙස වාර්තා කොට තිබුණි. තවද, 2001 වසර තුළ බණ්ඩාරවෙල ප්‍රාදේශිකයේ සිදු කළ රු. 272,735 ක තවත් මුදල් වංචාවක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කරගෙන නොතිබුණි.

(ක) මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2020 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොග (දේශීය මිලදී ගැණුම්) සහ ආනයනික මාර්ගස්ථ තොග රු.60,344,917 ක් සහ රු. 1,425,133,927 ක් විය.ඒ අතරින් වටිනාකම රු.1,898,285 ක් සහ රු.325,687,234ක් වන තොග විමර්ශනයකින් තොරව වසරකට වඩා වැඩි කාලයක් පැවතුණි.තවද, බණ්ඩාරගම වැඩ භාර නිලධාරී කාර්යාලයේ අස්ථානගත වූ රු.906,957 ක තොග, පොලොන්නරුව ප්‍රාදේශිකයයේ රු.330,000 ක පරිගණක උපකරණද සමාලෝචිත වර්ෂය අවසානයට තොග වලින් ඉවත් නොකර මාර්ගස්ථ තොග ලෙස හඳුනාගෙන ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ග) මුළු නිෂ්පාදනයෙන් සියයට 24.63 ක් ආදායම් නොලබන ජලය ලෙස සමාලෝචිත වර්ෂයේදී සලකනු ලබයි. කාන්දු වීම, නීත්‍යානුකූල නොවන සම්බන්ධතා, නොමිලේ සැපයීම සහ පරිපාලන අකාර්යක්ෂමතාව යනාදිය හේතුවෙන් මණ්ඩලයට සැලකිය යුතු පාඩුවක් සිදු වුවද ආදායම් නොලබන ජලයේ වටිනාකම වෙනම ගිණුම් ගත කරනු වෙනුවට එය සාමාන්‍ය පිරිවැයක් ලෙස සලකා ගිණුම් වලට ගෙන තිබුණි.තවද,සමාලෝචිත වර්ෂය තුළ කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සියයට 39 ක් වාර්තා කර තිබූ අතර කෝට්ටේ, දෙහිවල, ගාල්ල, මහනුවර, කෑගල්ල, බණ්ඩාරවෙල සහ ත්‍රිකුණාමලය යන ප්‍රාදේශිකයන්හි සියයට 25 කට වඩා වාර්තා වී තිබුණි.තවද, කොළඹ නගරයේ ආදායම් නොවන ජලය අඩු කිරීම අරමුණු කරගත් මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘති 01 සහ 02) කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාද වීම, ප්‍රමාණවත් ශ්‍රමයක් නොයෙදවීම සහ කොන්ත්‍රාත්කරුගේ සහ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කරයි.

(ච) නිවාස සංවර්ධන අධිකාරියට සම්බන්ධතා 06 ක් ලබා දී ඇති බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේ වාර්ෂික පරිභෝජනය ඝන මීටර 439,607 ක් විය. කෙසේ වෙතත්, එය 2021 මාර්තු 31 වන විටත් බිල්ගත කර නොතිබුණි.

(ජ) බණ්ඩාරවෙල ප්‍රාදේශිකයයේ රු.22,217,467 ක් වූ වෙළෙඳ ණයහිමියන්ගේ අසාමාන්‍ය හර ශේෂය වසර තුනකටත් වැඩි කාලයක් ගිණුම් වල පැවතුනු අතර, රු. 28,714,980 ක අසාමාන්‍ය හර ශේෂයක් මාස හයකටත් අඩු කාලයක් තිස්සේ විමර්ශනය කොට නිරවුල් කිරීමකින් තොරව මඩකලපුව සහ ගාල්ල ප්‍රාදේශිකයේ පැවතුණි. තවද, ඌව ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ රු. 143,507,022 ක් වූ මුළු ණයහිමියන්ගෙන් රු.12,820,102 ක අසාමාන්‍ය හර ශේෂය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ට) මාර්ගස්ථ මුදල්හි රු.1,708,659 ක අසාමාන්‍ය බැර ශේෂයක් වසරකට වැඩි කාලයක් නිරවුල් නොකර 2021 අප්‍රේල් 30 වන විටත් පැවතුණි.

(ඩ) අක්කරෙයිපත්තු ප්‍රාදේශිකයේ සහ මාතලේ ප්‍රාදේශිකයේ රු. 18,200,656 ක සහ රු.50,000 ක මාර්ගස්ථ තොගයේ අසාමාන්‍ය බැර ශේෂය 2021 අප්‍රේල් 01 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ණ) මහ කොළඹ ජල හා අපජල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අදියර 03) සංචලන අත්තිකාරම්හි රු. 107,837 අසාමාන්‍ය බැර ශේෂයක් විමර්ශනයකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති බව නිරීක්ෂණය විය.

(ත) රු.127,794,411 ක් වටිනා යල්පැනගිය හා සේවා කළ නොහැකි තොග ටෙන්ඩර් කොට බැහැර කිරීමට 2019 අගෝස්තු 20 දින අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද, ඒවා බැහැර කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

කෙටි යෙදුම්

AC	ඇස්බෙස්ටෝ සිමෙන්ති
ADB	ආසියානු සංවර්ධන බැංකුව
ADRA	ඇඩ්වෙන්ටිස්ට් සංවර්ධන හා සහන ඒජන්සිය
AE	ප්‍රාදේශීය ඉංජිනේරු
AFD	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය
AGM	සහකාර සාමාන්‍යාධිකාරී
AIWSP	ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
AWSSIP	අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය
BMICH	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
BOC	ලංකා බැංකුව
BOQ	ප්‍රමාණ පත්‍රය
BOI	ආයෝජන මණ්ඩලය
CBO	ප්‍රජා මූල සංවිධානය
CCN	කොළඹ නගරය උතුර
CCS	කොළඹ නගරය දකුණ
CCTV	සංවෘත පරිපථ රූපවාහිනිය
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEB	ලංකා විදුලිබල මණ්ඩලය
CETRAC	ඉදි කිරීම් උපකරණ පුහුණු කිරීම් මධ්‍යස්ථානය
CH PB	නිවාස සැලැසුම් කිරීම හා ඉදි කිරීම වෙනුවෙන් වූ මධ්‍යස්ථානය
CI	වාත්තු යකඩ
CIPM	පුද්ගල කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනය
CKDu	හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය
CMC	කොළඹ මහනගර සභාව
CP	සාමූහික සැලසුම්
CRIP	දේශගුණය මත යැපීම වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
CRIWMP	දේශගුණයට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය
CS	සාමූහික සේවා
Cu. m	ඝණ මීටර
DAB	ආරාවුල් විනිශ්චය කිරීමේ මණ්ඩලය
DEWATS	විමධ්‍යගත අපජල ප්‍රතිකාරක හා බැහැර කිරීමේ ක්‍රමය
DGM	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
DGM (WC)	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර මධ්‍යම)
DI	මෘදු යකඩ
DMA	දිස්ත්‍රික් මානන ප්‍රදේශයන්
DoNCWS	ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව
DS	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
DSC	සැලැසුම් කිරීමේ හා අධීක්ෂණය කිරීමේ උපදේශකත්වය
DSD	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
DZUWSP	වියලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය
EIA	පාරිසරික බලපෑම් තක්සේරුව
EPZ	නිර්යාත සැකැසුම් කලාපය
EWSP	ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය
GCWWMIIP	මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන
GIS	භූගෝලීය තොරතුරු පද්ධතිය
GM	සාමාන්‍යාධිකාරී
GMWSP	විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය
GN	ග්‍රාම නිලධාරී
GND	ග්‍රාම නිලධාරී වසම
GoSL	ශ්‍රී ලංකා ජන රජය
GPOBA	නිමැවුම පදනම් වූ ආධාර පිළිබඳ ගෝලීය හවුල
GR	භූමි ජලාශය
GVWSP	වීසල් වවුනියාව ජල සම්පාදන ව්‍යාපෘතිය
HDPE	ඉහල ඝණත්වයේ පොලි එතිලින්
HRM	මානව සම්පත් කළමනාකරණය
IEC	ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණික කොමිසම
ICT	තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේදය
ICTAD	ඉදි කිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය
IWA	අන්තර්ජාතික ජල සංගමය
IWSP	ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
IEE	මූලික පාරිසරික පරීක්ෂණය
IESL	ශ්‍රී ලංකාවේ ඉංජිනේරුවන්ගේ ආයතනය
IMS	ඉන්වෙන්ටරි කළමනාකරණ ක්‍රමය
IoT	දේවල් වල අන්තර්ජාලය
ISO	ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය
IT	තොරතුරු තාක්ෂණය
ITEC	ඉන්දියානු තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය
IPVPN	අන්තර්ජාල නිල පට්ටපාටි අතථ්‍ය පෞද්ගලික ජාලය
JICA	ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
JPY	ජපන් යෙන්
KCWMP	ඔහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය
km	කිලෝ මීටර
KRB	කැළණි දකුණු ඉවුර
LBF	දේශීය බැංකු අරමුදල
LKR	ශ්‍රී ලංකා රුපියල්
M&E	යාන්ත්‍රික හා විද්‍යුත්
MD&T	මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම්

MIS	කළමනාකරණ තොරතුරු පද්ධතිය
MoU	අවබෝධතා ගිවිසුම
MSc	විද්‍යාපති
MMDC	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
NAITA	ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීමේ අධිකාරිය
NBRO	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
NC	උතුරු මැද
NCP	උතුරු මැද පලාත
NDB	ජාතික සංවර්ධන බැංකුව
NDT	ජාතික තාක්ෂණවේදී ඩිප්ලෝමාව
NGOs	රාජ්‍ය නොවන සංවිධාන
NHDA	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
NIBM	ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය
NPD	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
NRW	ආදායම් රහිත ජලය
NWSDB	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
O & M	මෙහෙයුම් හා නඩත්තු
OKP	ඔරේන්ජ් දැනුම වැඩ සටහන
PAM	පොලිඇක්‍රිලමයිඩ්
PE	පොලි එත්ලින්
PVC	පොලිවිනිල් ක්ලෝරයිඩ්
OIC	ස්ථානය භාර නිලධාරි
P&D	ක්‍රම සම්පාදන හා සැලැසුම්
PAC	ව්‍යාපෘති අගැයීම් කමිටුව
PDMRC	ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුව
PMU	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
PRDA	පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය
PTB	Physikalisch Technische Bundesansdalt
PWD	පොදු වැඩ දෙපාර්තමේන්තුව
R&D	පර්යේෂණ හා සංවර්ධන
RDA	මාර්ග සංවර්ධන අධිකාරිය
RDB	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
RFP	යෝජනා ඉල්ලා සිටීම
RIDEP	ග්‍රාමීය යටිතල පහසු කම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
RM	කලාපීය කළමනාකරු
RO	විලෝම ආශ්‍රැති
RSC	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය
RSC (WN)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර උතුර)
RSC (WS)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර දකුණ)
RSC (N)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (උතුර)
RSC (NW)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (වයඹ)
RWS	ග්‍රාමීය ජල සම්පාදනය
SBD	සම්මත ලංසු තැබීමේ ලිපි ලේඛන
SCADA	අධීක්ෂණාත්මක පාලනය හා දත්ත ප්‍රතිග්‍රහණය
SCAPC	අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව
SDG	තිරසාර සංවර්ධන ඉලක්ක
SEP	සනීපාරක්ෂණය නංවා ලීමේ ව්‍යාපෘතිය
SHIFT	නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය
SIDA	ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය
SLIDA	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
SLSI	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
SMS	කෙටි පණිවුඩ සේවාව
ST	කුඩා නගරය
STPs	පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාර
TA	තාක්ෂණික සහාය
TCE	මුළු පිරිවැය ඇස්තමේන්තුව
THM	ට්හාලෝමීතේන්
ToR	යොමු නියමයන්
ToT	පුහුණු කරන්නන් පුහුණු කිරීම
UDA	නාගරික සංවර්ධන අධිකාරිය
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
UNICEF	එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල
UPVC	මොළොක් නොකරන ලද පොලි විනිල් ක්ලෝරයිඩ්
USD	එක්සත් ජනපද ඩොලර
VPN	අතථ්‍ය පෞද්ගලික ජාලය
VPP	වවුනියා සහභාගිත්ව ක්‍රම සම්පාදනය
VAT	අගය එකතු කළ බද්ද
WASSIP	ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය
WDCE	ජලය හා සංවර්ධනය පිළිබඳ සමුළුව හා ප්‍රදර්ශනය
WHO	ලෝක සෞඛ්‍ය සංවිධානය
WSP	ජල සම්පාදන ව්‍යාපෘතිය / ජල සුරක්ෂිතතා සැලැසුම
WSS	ජල සම්පාදන යෝජනා ක්‍රමය
WTP	ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය
WWDS	අපජලය බැහැර කිරීමේ පද්ධතිය / ක්‍රමය
WWTP	අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

සංස්ථානික තොරතුරු.

සංවිධානයේ නාමය :
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

නෛතික ආකෘතිය:
රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලය

ස්ථාපිත කළ දිනය:
1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතිය නම් පාර්ලිමේන්තු පණත මගින් 1974. 03. 01 වැනි දින ස්ථාපිත කරන ලදි. 1992 අංක 13 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන (සංශෝධිත) පණත මගින් 1992. 03. 11 වැනි දින පණත සංශෝධනය කරන ලදි.

බදු හඳුනාගැනීමේ අංකය:
4090 31820

අගය එකතු කළ බදු ලියාපදිංචි අංකය:
4090 31820 7000

සම්බන්ධතා - ප්‍රධාන කාර්යාලය:
ගාලු පාර, රත්මලාන, ශ්‍රී ලංකාව
දුර කථන අංක : +94 11 2638999 (නිසැරුම්)
+94 11 2637194, +94 11 2611589
ෆැක්ස් : + 94 11 2636449
විද්‍යුත් තැපෑල : gm@waterboard.lk
වෙබ් අඩවිය : www.waterboard.lk

රේඛීය අමාත්‍යාංශය
ජල සම්පාදන අමාත්‍යාංශය

ඇමතුම් මධ්‍යස්ථානය
1939 (පැය 24 පුරා)

ගණුදෙනුකාර සේවා ඒකකය - ප්‍රධාන කාර්යාලය
+94 11 2623623 (කාර්යාල වේලාවන් තුළ)

බැංකු කරු
ලංකා බැංකුව

විගණකවරුන්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
රජයේ විගණන ඒකකය.

අධ්‍යක්ෂ මණ්ඩලය
නිශාන්ත රණතුංග මහතා - සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2020. 01. 16 දින සිට)

නිමල් ආර්. රණවක මහතා - උප සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2020. 01. 23 දින සිට)

වෛද්‍ය චිල්. ටී. ගම්ලත් මහතා- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2019. 06. 04 සිට)

ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2020. 01. 11 සිට)

ඉංජිනේරු ටී.එම්.ආර්. පී. තෙන්නකෝන් මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2020. 01. 19 සිට)

ඉංජිනේරු ආර්. ඒ. එස්. චිල්. රණසිංහ මහතා- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2020 02. 18 සිට)

බී., එන්. දම්මිත්ද කුමාර මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2020. 06. 22 සිට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය :
ඉංජිනේරු ආර්. එච්. රුවිහිස්, සාමාන්‍යාධිකාරී (2020. 09. 06 දක්වා)
ඉංජිනේරු ටී. එස්. විජේතුංග, සාමාන්‍යාධිකාරී (2020. 10. 15 සිට)

ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන - අතිරේක සාමාන්‍යාධිකාරී
(උතුර/ මධ්‍යම)

ඉංජිනේරු එන්. එච්. ආර්. කුලනාථ - අතිරේක සාමාන්‍යාධිකාරී
(මළ අපවහන)

ඉංජිනේරු වසන්තා ඉලංගසිංහ (මහත්මිය) - අතිරේක සාමාන්‍යාධිකාරී
(ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)

ඉංජිනේරු ආර්. ඒ. ඒ. රණවක - අතිරේක සාමාන්‍යාධිකාරී
(දකුණු / නැගෙනහිර)

ඉංජිනේරු ටී. ඩබ්ලිව්. එස්. පෙරේරා - අතිරේක සාමාන්‍යාධිකාරී
(ජල සම්පාදන ව්‍යාපෘති)

ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු - අතිරේක සාමාන්‍යාධිකාරී
(බටහිර)

ඉංජිනේරු එස්. ජී. ජී. රාජ්කුමාර් -
අතිරේක සාමාන්‍යාධිකාරී (සාමූහික සේවා)

ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් කළමනාකරණය)

ආර්. ඒ. එම්. එස්. වීරසේන මහතා - අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්
එන්. වයි. එස්. අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සම්බන්ධතා)
ඩබ්ලිව්. ඒ. එස්. සුමනසූරිය මහතා (මානව සම්පත්)
ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය)
එම්. එම්. පීරිස් මහත්මිය (මූල්‍ය)
ඒ. ජී. එස්. කුමාර මහතා (පිරිවැය කරණය) - කාර්ය ආවරණය කිරීම
ඉංජිනේරු එස්. ජී. ජී. රාජ්කුමාර් (වාණිජ)
ඉංජිනේරු අයි. ඒ. ඩබ්ලිව්. එදිරිවීර (සාමූහික සැලසුම්)
ඉංජිනේරු එම්. ඒ. සී. හේමචන්ද්‍ර (කුඩා නගර / ග්‍රාමීය ජල සම්පාදන සේවා)
ඉංජිනේරු ඩී. එම්. එල්. සී. පිටවල (මහත්මිය) (සංවර්ධන)
ඉංජිනේරු ජේ. එල්. සීක්කුගේ (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති)
ඉංජිනේරු ටී. එම්. ඩබ්ලිව්. සුනිල් බණ්ඩාර (යාන්ත්‍රික හා විද්‍යුත්)
ඉංජිනේරු ඒ. මුණසිංහ (ක්‍රම සම්පාදන හා සැලැසුම් කරණය)
ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණය) - වැඩ බලන
ඉංජිනේරු ධනේෂ් ගුණතිලක (මල අපවහන)
ඒ. ශ්‍රියාලතා මහත්මිය (අභ්‍යන්තර විගණන) කාර්ය ආවරණය කිරීම

පලාත්/කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්
ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (බටහිර මධ්‍යම)
ඉංජිනේරු එම්. ටී. එම්. රසිල් (බටහිර දකුණ)
ඉංජිනේරු එන්. යූ. කේ. රණතුංග (බටහිර උතුර)
ඉංජිනේරු ඩබ්ලිව්. එන්. ප්‍රේමසිරි (නිෂ්පාදන)
ඉංජිනේරු ඩබ්ලිව්. ජී. සී. චිල්. වීරසේකර (වයඹ)
ඉංජිනේරු ජී වී විජේරත්න (උතුරු මැද)
ඉංජිනේරු එම් කේ ඩී ජේ එච් මීගොඩ (මධ්‍යම)
ඉංජිනේරු ටී. බරතිදාසන් (උතුරු)
ඉංජිනේරු ආර් එස් ලියනගේ (ඌව)
ඉංජිනේරු ඒ. කේ. කපුරුගේ (සබරගමුව)
ඉංජිනේරු එම්. කේ. ඒ. ජේ. එම්. විජේසිංහ මහත්මිය (දකුණු)
ඉංජිනේරු එන්. සුදේසන් (නැගෙනහිර)

ව්‍යාපෘති අධ්‍යක්ෂ වරුන් වශයෙන් කටයුතු කරන අතිරේක සාමාන්‍යාධිකාරී වරුන් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්
ඉංජිනේරු එස්. ඒ. රෂීඩ්
(කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය)
ඉංජිනේරු ටී. අර්. ජේ. ප්‍රනාන්දු (කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය)
ඉංජිනේරු එන්. ඒ. එස්. ශාන්ත
(කැළණිය දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය)
ඉංජිනේරු එන්. එච්. ඩී. පී. ධර්මපාල -
(ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය)